320 වන කාණ්ඩය - 4 වන කලාපය
தொகுதி 320 - இல. 4
Volume 320 - No. 4

2025 ජුලි 22වන අඟහරුවාදා
2025 யூலை 22, செவ்வாய்க்கிழமை
Tuesday, 22nd July, 2025

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

එක්සත් රාජධානියේ මහජන මන්ත්‍රී මණ්ඩලය, පොදුරාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ වෙස්ට්මින්ස්ටර් පදනම සමඟ සහයෝගයෙන් පවත්වන අලුතින් තේරී පත් වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන [තීරුව 505]

ටී.එම්.ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් නගන ලද චෝදනා පිළිබඳව විමර්ශන හා පරීක්ෂණ කර වාර්තා කිරීම සඳහා 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 06 වන වගන්තිය යටතේ පත් කරන ලද පරීක්ෂණ කමිටුවේ අවසන් වාර්තාව [තීරුව 506]

විගණකාධිපතිවරයාගේ වාර්තාව [තීරුව 508]

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා [තීරුව 511]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 514-567]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

අලි-මිනිස් ගැටුම අවම කිරීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම [තීරුව 569]

තලෙයිමන්නාරම-රාමේෂ්වරම් පාරු සේවාව නැවත ආරම්භ කිරීම [තීරුව 581]

වරප්‍රසාද:

2025.07.06 දින කොළඹ කොටුව පොලීසිය විසින් කළ චෝදනාව [තීරුව 585]

2025.07.17 දින කෝප් කමිටුවේදී කරන ලද චෝදනාව [තීරුව 588]

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:

ඉඩම් සංවර්ධන (සංශෝධන) - [ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය] - පළමුවන වර කියවන ලදී [තීරුව 590]

සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත් කෙටුම්පත:

දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී [තීරු 590-682]

සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන) පනත් කෙටුම්පත:

දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී [තීරු 683-694]

සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත:

දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [තීරු 694-696]

කල්තැබීමේ යෝජනාව:

දේශීය සීනි කර්මාන්තය රැකගැනීම [තීරු 697-716]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

பிரித்தானியப் பாராளுமன்றத்தின் பிரதிநிதிகள் சபை, பொதுநலவாயப் பாராளுமன்றச் சங்கம் மற்றும் சனநாயகத்துக்கான வெஸ்ட்மினிஸ்டர் மன்றம் என்பவற்றின் ஒத்துழைப்புடன் இடம்பெறும் புதிதாகத் தேர்ந்தெடுக்கப்பட்ட பாராளுமன்ற உறுப்பினர்கள் மற்றும் பாராளுமன்ற ஊழியர்களுக்கான விழிப்புணர்வு நிகழ்ச்சித்திட்டம் [ப: 505]

திரு. ரி.எம்.டபிள்யூ. தேசபந்து தென்னகோன் அவர்களைப் பொலிசுப் பரிசோதகர் தலைமையதிபதி பதவியிலிருந்து அகற்றுமாறு கோரும் குற்றச்சாட்டுகளுக்கான காரணங்கள் தொடர்பில் புலனாய்வு மற்றும் விசாரணை செய்து அறிக்கையிடுவதற்காக 2002ஆம் ஆண்டின் 05ஆம் இலக்க, அலுவலர்களை அகற்றுதல் (நடவடிக்கைமுறை) சட்டத்தின் 06ஆம் பிரிவின்கீழ் நியமிக்கப்பட்ட விசாரணைக் குழுவின் இறுதி அறிக்கை [ப: 506]

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை [ப: 508]

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள் [ப: 511]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 514-567]

தனி அறிவித்தல் மூல வினா:

யானை-மனித மோதலைக் குறைக்கும் தேசிய செயற்றிட்டத்தை நடைமுறைப்படுத்தல் [ப: 569]

தலைமன்னார் - இராமேஸ்வரம் படகுச் சேவையை மீள ஆரம்பித்தல் [ப: 581]

சிறப்புரிமை:

2025.07.06ஆம் திகதியன்று கொழும்பு கோட்டை பொலிஸாரால் முன்வைக்கப்பட்ட குற்றச்சாட்டு [ப: 585]

2025.07.17ஆம் திகதி 'கோப்' குழுவில் முன்வைக்கப்பட்ட குற்றச்சாட்டு [ப: 588]

தனி உறுப்பினர் சட்டமூலங்கள்:

காணி அபிவிருத்தி (திருத்தம்) - [மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன] - முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 590]

வேலையாட்களின் வரவுசெலவுத்திட்ட நிவாரணப்படி (திருத்தம்) சட்டமூலம்:

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 590-682]

வேலையாளர்களின் வரவுசெலவுத்திட்ட நிவாரணப்படி (திருத்தம்) சட்டமூலம்:

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 683-694]

வேலையாளர்களின் தேசிய குறைந்தபட்ச வேதனம் (திருத்தம்) சட்டமூலம்:

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 694-696]

ஒத்திவைப்புப் பிரேரணை:

உள்நாட்டு சீனிக் கைத்தொழிலைப் பாதுகாத்தல் [ப: 697-716]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Awareness Programme for Newly Elected Members of Parliament and Parliamentary Staff in Collaboration with UK House of Commons, Commonwealth Parliamentary Association and Westminster Foundation for Democracy [Col. 505]

THE FINAL REPORT OF THE COMMITTEE OF INQUIRY APPOINTED IN TERMS OF SECTION 06 OF THE REMOVAL OF OFFICERS (PROCEDURE) ACT, No. 5 OF 2002 TO INVESTIGATE AND INQUIRE INTO THE ALLEGED GROUNDS ON WHICH THE REMOVAL OF MR. T.M.W. DESHABANDU TENNAKOON FROM THE OFFICE OF THE IGP HAS BEEN SOUGHT [Col. 506]

AUDITOR-GENERAL'S REPORT [Col. 508]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 511]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 514-567]

QUESTION BY PRIVATE NOTICE:
Implementation of National Action Plan for the Mitigation of Human-Elephant Conflict [Col. 569]
Resumption of Thalaimannar-Rameswaram Ferry Service [Col. 581]

PRIVILEGE:
Allegation Made by Colombo Fort Police on 06.07.2025 [Col. 585]
Allegation Made at COPE Held on 17.07.2025 [Col. 588]

PRIVATE MEMBERS' BILLS:
Land Development (Amendment) – [The Hon. (Mrs.) Rohini Kumari Wijerathna] – Read the First time [Col. 590]

BUDGETARY RELIEF ALLOWANCE OF WORKERS (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed [Cols. 590-682]

BUDGETARY RELIEF ALLOWANCE OF WORKERS (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed [Cols. 683-694]

NATIONAL MINIMUM WAGE OF WORKERS (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended [Cols. 694-696]

ADJOURNMENT MOTION:
Safeguarding Local Sugar Industry [Cols. 697-716]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 ජූලි 22වන අඟහරුවාදා
2025 யூலை 22, செவ்வாய்க்கிழமை
Tuesday, 22nd July, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

එක්සත් රාජධානියේ මහජන මන්ත්‍රී මණ්ඩලය, පොදුරාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ වෙස්ට්මින්ස්ටර් පදනම සමඟ සහයෝගයෙන් පවත්වන අලුතින් තේරී පත් වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන
பிரித்தானியப் பாராளுமன்றத்தின் பிரதிநிதிகள் சபை, பொதுநலவாயப் பாராளுமன்றச் சங்கம் மற்றும் சனநாயகத்துக்கான வெஸ்ட்மினிஸ்டர் மன்றம் என்பவற்றின் ஒத்துழைப்புடன் இடம்பெறும் புதிதாகத் தேர்ந்தெடுக்கப்பட்ட பாராளுமன்ற உறுப்பினர்கள் மற்றும் பாராளுமன்ற ஊழியர்களுக்கான விழிப்புணர்வு நிகழ்ச்சித்திட்டம்
AWARENESS PROGRAMME FOR NEWLY ELECTED MEMBERS OF PARLIAMENT AND PARLIAMENTARY STAFF IN COLLABORATION WITH UK HOUSE OF COMMONS, COMMONWEALTH PARLIAMENTARY ASSOCIATION AND WESTMINSTER FOUNDATION FOR DEMOCRACY

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

I wish to inform that an awareness programme for newly elected Members of Parliament and Parliamentary staff in collaboration with the UK House of Commons, the Commonwealth Parliamentary Association UK (CPA UK) and the Westminster Foundation for Democracy has been arranged from 22nd to 24th July, 2025 at the Parliamentary Complex and all the Members of Parliament are kindly requested to be present at this programme.

II
පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2025 ජූලි 22 අඟහරුවාදා, එනම් අද දින අපර භාග 1.15ට කාරක සභා කාමර අංක 2 හි දී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගී වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

I wish to announce that this House cordially welcomes the Delegation from the House of Commons of the UK Parliament led by Yasmin Qureshi, MP, Chair of the Westminster Foundation for Democracy now present at the Speaker's Gallery.

ටී.එම්.ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් නගන ලද චෝදනා පිළිබඳව විමර්ශන හා පරීක්ෂණ කර වාර්තා කිරීම සඳහා 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 06 වන වගන්තිය යටතේ පත් කරන ලද පරීක්ෂණ කමිටුවේ අවසන් වාර්තාව
திரு. ரி.எம்.டபிள்யூ. தேசபந்து தென்னகோன் அவர்களைப் பொலிசுப் பரிசோதகர் தலைமையதிபதி பதவியிலிருந்து அகற்றுமாறு கோரும் குற்றச்சாட்டுகளுக்கான காரணங்கள் தொடர்பில் புலனாய்வு மற்றும் விசாரணை செய்து அறிக்கையிடுவதற்காக 2002ஆம் ஆண்டின் 05ஆம் இலக்க, அலுவலர்களை அகற்றுதல் (நடவடிக்கைமுறை) சட்டத்தின் 06ஆம் பிரிவின்கீழ் நியமிக்கப்பட்ட விசாரணைக் குழுவின் இறுதி அறிக்கை
THE FINAL REPORT OF THE COMMITTEE OF INQUIRY APPOINTED IN TERMS OF SECTION 06 OF THE REMOVAL OF OFFICERS (PROCEDURE) ACT, No. 5 OF 2002 TO INVESTIGATE AND INQUIRE INTO THE ALLEGED GROUNDS ON WHICH THE REMOVAL OF MR. T.M.W. DESHABANDU TENNAKOON FROM THE OFFICE OF THE IGP HAS BEEN SOUGHT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Today, I wish to bring to the attention of this august Assembly a matter of profound constitutional and institutional significance.

As you are aware, under the provisions of the Removal of Officers (Procedure) Act, No. 5 of 2002, a Committee of Inquiry was appointed to investigate and report on the grounds for the removal of the current Inspector General of Police (IGP).

I have now received the formal findings of the Committee, duly constituted in accordance with the Act.

[ගරු කථානායකතුමා]

In this connection, I wish to place on record our sincere gratitude and appreciation to the distinguished Members of the Committee for their diligence, integrity, and commitment to the rule of law:

- Hon. Justice Padman Surasena, Judge of the Supreme Court - Chairman
- Hon. Justice Neil Iddawala, Judge of the Court of Appeal - Member
- Mr. Lalith Ekanayake, Chairman, National Police Commission - Member

This Committee, having conducted its inquiries, has unanimously found the officer in question guilty of the allegations brought against him, in accordance with Section 8(2) of the Act.

This marks a historic moment in our constitutional journey, the first time in the history of the Republic of Sri Lanka that such a Committee has submitted its findings, recommending the removal of an Inspector General of Police under the provisions of the law enacted by Parliament.

As mandated under Section 17 of the Removal of Officers (Procedure) Act, I am obliged and hereby undertake to place the finding of guilt in the form of a Resolution in the Order Paper of Parliament for the consideration and vote of this House.

Further, for the information of the Hon. Members and in the interest of transparency and public accountability, I have directed the Secretary-General of Parliament to table the Committee's Report as a Parliamentary Paper, and arrangements will be made for Members to receive copies in the Official Languages in due course. I also intend to authorize its release to the general public, mindful of the public interest and the fundamental importance of upholding the trust reposed in institutions.

This Parliament, representing the sovereign will of the people, now bears the solemn responsibility of considering the Resolution to give effect to the Committee's findings. The House shall be notified in due course of the scheduled date for debate and vote.

Let me reiterate that in executing this duty, we uphold the values of constitutional governance, institutional accountability and the supremacy of the law, the principles that are foundational to a functioning democracy.

I urge the Hon. Members to approach the forthcoming proceedings with dignity, objectivity and responsibility they demand.

Accordingly, I table the Report of the said Committee of Inquiry only in the English language with special leave of the House and a soft copy of the Report in the English language will be uploaded to the Parliament website for easy reference.

Thank you.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එම වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LXII කොටස;
- 2021 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LXI කොටස;
- 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ XIX කොටස සහ නවවැනි කාණ්ඩයේ XXVIII කොටස; සහ
- 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ II කොටස මම ඉදිරිපත් කරමි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Reports be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
Hon. Speaker, I present the -

(i) Annual Report of the University of Colombo for the year 2023;

(ii) Annual Report of the National Apprentice and Industrial Training Authority for the year 2023; and

(iii) Annual Performance Report of the Department of Examinations of Sri Lanka for the year 2024.

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, I present the Regulations made by the President under Section 35 read with Sections 19, 20, 21, 22 and 23 of the Public Debt Management Act, No. 33 of 2024 and the proviso to Article 44(3) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka, on the Recommendation of the Public Debt Coordination Committee and published in Gazette Extraordinary No. 2443/14 of 30th June, 2025.

I move that these Regulations be referred to the Committee on Public Finance.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2022 වර්ෂය සඳහා ලංකා සතොස ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(iii) 2024 වර්ෂය සඳහා සමුපකාර සේවක කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(iv) 2023/2024 වර්ෂය සඳහා සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
Hon. Speaker, I present the -

(i) Annual Report of the Petroleum Development Authority of Sri Lanka for the year 2022;

(ii) Annual Report of the Ceylon Petroleum Storage Terminals Limited for the year 2023;

(iii) Annual Report of the Lanka Coal Company (Pvt.) Limited for the year 2023; and

(iv) Annual Performance Report of the Ministry of Energy for the year 2024.

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Infrastructure and Strategic Development.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2024 වර්ෂය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවෙන් මම 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45(1අ) වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 ජූනි 13 දිනැති අංක 2440/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කරමි.

මෙම නියෝග අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී විශේෂ කාරණයක් කීමට මා කැමැතියි. ආංශික අධීක්ෂණ කාරක සභා කියන්නේ පාර්ලිමේන්තුවට විතරක් නොවෙයි, සමස්ත රටට සහ විශේෂයෙන් ආණ්ඩුවේ ආයතන සියල්ලට ඉතාම වැදගත් කාරක සභා විශේෂයක්. වැදගත්කමින් යුත් මෙම කාරක සභාවලට පසුගිය වතාවේ විශේෂඥ දැනුම - expertise - තිබෙන කණ්ඩායම් සම්බන්ධ කරගන්න UNDP එක විසින් අපට අවස්ථාවක් ලබා දීලා තිබුණා. අපි රජයෙන් ඉල්ලා සිටිනවා, මෙවරත් ඒ අවස්ථාව ලබා දෙන්න කියලා. මෙම කාරක සභා සඳහා විශේෂඥ දැනුම තිබෙන කණ්ඩායම් ඒක රාශි කර ගත්තොත්, ඒක මේ රටට බෙහෙවින්ම වැදගත් වෙනවා. මොකද, රටේ ජනතාවට සේවය කිරීමේදී අලුත්, නිර්මාණශීලී වැඩසටහන් සකස් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරින් සමඟ සාකච්ඡා කරන්න, පාර්ලිමේන්තුවත් එක්ක ඒ දැනුම බෙදා හදාගන්න එමඟින් පුළුවන්. රජයට යම්කිසි සහයෝගයක් තමයි එමඟින් ලැබෙන්නේ. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා මේ සඳහා අවස්ථාවක් ලබා දෙන්න කියලා. මොකද, ඕනෑ තරම් ආයතන තිබෙනවා අපට උපකාර ලබා ගන්න. හැබැයි, ඒ උපකාර ලබා ගන්න පුළුවන් වෙන්නේ, ඔබතුමා මාර්ගයෙන් සහ පාර්ලිමේන්තුව මාර්ගයෙන්. ඒ සඳහා අවස්ථාවක් ලබා දෙන්න කියලා විශේෂයෙන් ඉල්ලීමක් කරනවා.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු කථානායකතුමනි, අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත

(2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත සංශෝධනය කිරීම සඳහා);

(ii) සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන) පනත් කෙටුම්පත

(2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත සංශෝධනය කිරීම සඳහා);

(iii) සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත් කෙටුම්පත

(2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත සංශෝධනය කිරීම සඳහා);

(iv) 2022 වර්ෂය සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(v) 2022 වර්ෂය සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, ඇත්තවශයෙන්ම මේ පනත් කෙටුම්පත පිළිබඳව රටේම අවධානය යොමු වෙලා තිබෙන නිසා,

එක වතාවක් නොවෙයි තුන් වතාවක් අපේ කමිටුව රැස් වුණා. විශේෂයෙන්ම බාහිර පාර්ශ්වකරුවන් වූ මහජන උපයෝගිතා කොමිසම, ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, Solar Industries Association ආදී වශයෙන් වූ දෙවෙනි පාර්ශ්ව ගෙන්වලා, ඔවුන්ගේ අදහස්වලට ඇහුම්කන් දීලා, ඒවා පිළිබඳව විදුලිබල අමාත්‍යාංශයේ එකඟතාව පිළිබඳව තව දවසක් රැස්වෙලා සාකච්ඡා කරලා තමයි මේ තීරණය ගත්තේ.

ගරු කථානායකතුමනි, මේ කමිටු වාර්තාව සැකසීමේදී විශාල වශයෙන් අපට අවධානය යොමු කරන්න සිද්ධ වුණා පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් තහවුරු කරන ආකාරය පිළිබඳව. ඒක විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. ඒ පිළිබඳව අපේ කමිටුවත්, අමාත්‍යාංශයත්, මහජන උපයෝගිතා කොමිෂන් සභාවත් සාකච්ඡා කරලා මාසයක් ඇතුළත වාර්තාවක් දෙන්න ඉදිරිපත් වුණා. ඒ වාගේම කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කරන යම් කරුණු කිහිපයක් නීතිපතිවරයාගේ එකඟතාව ඇතුව මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ කියලාත් එකඟ වුණා. ඉදිරි කාලයේදී ජාතික බලශක්ති පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම සඳහා අනුකමිටුවක් පත් කිරීමේ වැඩ කටයුතු අවසාන මොහොතේ ආරම්භ කරන්නේ නැතිව, මේ මොහොතේ ඉඳලා ආරම්භ කරන්නත් එකඟ වුණා. විශේෂයෙන්ම මෙතැන සාධනීය ම කාර්යය මේකයි. 2024 පනතට සංශෝධනයක් විධියට තමයි මේක ඉදිරිපත් කරන්නේ. විදුලිය සම්ප්‍රේෂණය, ජනනය සහ බෙදා හැරීම එකට කරලා, රජය රාජ්‍ය අයිතිය විධියට තියාගෙන තිබෙන්නේ, අවුරුදු දෙකකින් unbundle කරන්න. ඒකට තමයි එකඟ වුණේ. නමුත්, මේ කමිටුවට හැකියාවක් ලැබුණා අමාත්‍යාංශය එකඟ කර ගන්න අවුරුද්දක් ඇතුළත පෞද්ගලික ආයෝජන ආකර්ෂණය කර ගන්න පුළුවන් විධියට ඒ කටයුතු කරන්න. මම දන්නේ නැහැ, තවම ඒකට සැලසුමක් හදලා නැතිව ඇති.

හැබැයි ඒකට එකඟ වුණා. මොකද, සම්ප්‍රේෂණ පද්ධතිය කඩිනමින් දියුණු කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ සඳහා ඇමෙරිකානු ඩොලර් බිලියන 5කට ආසන්න ප්‍රමාණයක් යන නිසාත්, මේ වෙලාවේ විශාල වශයෙන් මුදල් ආයෝජනය කිරීමේ හැකියාවක් නැති නිසාත් රජය පෞද්ගලික ආයෝජන ආකර්ෂණය කර ගැනීම වැදගත්.

අවසාන වශයෙන් මම තව කරුණු දෙකක් කියන්න කැමැතියි. මේ සම්ප්‍රේෂණ කොරිඩෝවල, සම්ප්‍රේෂණ වත්කම්වල අයිතිය, විශේෂයෙන් ඉඩම් අයිතිය සියයට 100ක් රජය සතු තත්ත්වයට පත් කර ගැනීමට කමිටුව තීරණයක් අරගෙන තිබෙනවා.

ඒ වාගේම, දැනට තිබෙන කමිටුව අහෝසි කරලා ඇමතිවරයාට උපදෙස් ලබා ගන්න එතුමා විසින් පත් කරලා තිබෙනවා කමිටුවක්. ඒ නිසා වෘත්තීය සුදුසුකම් සහ අත්දැකීම් තිබෙන අය ඒ කමිටුවට පත් කළ යුතුමයි කියන එක මේ පනත් කෙටුම්පතට අපි ඇතුළත් කර තිබෙනවා. ඒ වාගේම, දේශපාලන බලපෑම් එල්ල වෙනවාය කියන මතය නැති කරන්න වාගේම, බහු සමාගම්වල අධ්‍යක්ෂවරුන් වශයෙන් තනි පුද්ගලයන් පත් කරන්න බැහැ කියන කාරණාත් ඇතුළත් කර තිබෙනවා.

මේ පනත හරහා පාරිභෝගිකයාට නොලැබිච්ච දේවල් තිබෙනවා නම්, නව පාරිභෝගික අයිතිවාසිකම් රෙගුලාසියක් ගෙන එන්නටත් අවශ්‍ය කටයුතු සඳහා ආරම්භයක් අරගෙන තිබෙනවා.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුනපිළිගන්වමි.

(1) පිළියන්දල, ජාලියගොඩ, සමගි මාවත, අංක 17/4/ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩී.එච්.එම්.එම්.බී. ගුණරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) පිළියන්දල, හොන්නන්තර උතුර, සමූපකාර මාවත, අංක 131/11 දරන ස්ථානයෙහි පදිංචි ප්‍රියන්ත ඉලංගකෝන් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) පිළියන්දල, තුම්බෝවිල, දූවවත්ත පාර, අංක 3/ඒ දරන ස්ථානයෙහි පදිංචි ආර්. ධර්මරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දෙක මම පිළිගන්වමි.

(1) කුරුණෑගල, මීගමු පාර, නන්දසේන මාවත, අංක 88 දරන ස්ථානයෙහි පදිංචි ඩී.එම්.එම්.බී. දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කුරුණෑගල, විල්බාව පාර, වඩුරාගල රෙග්ලන්ඩ් වත්ත, අංක 121/2 දරන ස්ථානයෙහි පදිංචි එම්.ජී. සුමනදාස මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

ගරු කථානායකතුමනි, පිටබැද්දර, කිරිවැල්කැලේ, 2 පියවර, අංක 51 දරන ස්ථානයෙහි පදිංචි ඒ.පී. සෝමපාල මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

2023.09.21 සිට 2024.09.20 දක්වා ඛනිජ තෙල් අළෙවිය: බදු ආදායම සහ ලාභය
2023.09.21 தொடக்கம் 2024.09.20 வரை எரிபொருள் விற்பனை: வரி வருமானம் மற்றும் இலாபம்
SALE OF PETROLEUM FROM 21.09.2023 TO 20.09.2024: TAX INCOME AND PROFIT

162/2024

1. ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

(අ) (i) 2023.09.21 සිට 2024.09.20 දක්වා ඛනිජ තෙල් අලෙවි කිරීමෙන් රජය විසින් උපයන ලද බදු ආදායම කොපමණද;

(ii) එම කාලසීමාව තුළදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව උපයන ලද ලාභය/අලාභය කොපමණද;

(iii) එම කාලසීමාව තුළදී ඉන්ධන අලෙවි කිරීමේදී වංචා සිදු වී තිබේද;

(iv) එසේ නම්, ඉන්ධන ලීටරයකින් වංචා කරන ලද මුදල, එක් එක් ඉන්ධන වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) වංචා කරන ලද මුළු මුදල කොපමණද;

(vi) ඉන්ධන ලීටරයකින් වංචා කරන ලද මුදල අඩු කිරීමෙන් පසු ලැබිය යුතු සහනය මේ වනවිට පාරිභෝගිකයන් වෙත ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2023.09.21 தொடக்கம் 2024.09.20 வரை பெற்றோலிய விற்பனைமூலம் அரசாங்கம் ஈட்டிய வரி வருமானம் எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி காலப்பகுதியினுள் இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனம் ஈட்டிய இலாபம்/நட்டம் எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி காலப்பகுதியினுள் எரிபொருள் விற்பனையில் மோசடிகள் இடம் பெற்றுள்ளனவா என்பதையும்;

(iv) ஆமெனில், ஒரு லீற்றர் எரிபொருளில் இருந்து மோசடி செய்யப்பட்ட தொகை, ஒவ்வொரு எரிபொருள் வகையின் அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(v) மோசடி செய்யப்பட்ட மொத்த பணத் தொகை எவ்வளவு என்பதையும்;

(vi) ஒவ்வொரு லீற்றர் எரிபொருளிலும் இருந்து மோசடி செய்யப்பட்ட தொகை குறைக்கப்பட்டதன் பின்னர் குறைவடையும் விலையின் ஊடாகக் கிடைக்கவேண்டிய நிவாரணம் தற்பொழுது நுகர்வோருக்கு வழங்கப்படுகிறதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) the amount earned as tax income by the Government by selling petroleum oils from 21.09.2023 to 20.09.2024;

(ii) the profit earned/ loss incurred by the Ceylon Petroleum Corporation during the period referred to above;

(iii) whether frauds have occurred in selling fuel during the period concerned;

(iv) if so, the amount that was defrauded per litre in respect of each fuel, separately;

(v) the total amount of money so defrauded; and

(vi) whether the amount so defrauded from each litre is deducted from the price of fuels and its benefit is given to consumers as a relief at present?

(b) If not, why?

ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) බදු ආදායම - රුපියල් මිලියන 284,431.80කි.

වර්ෂය	2023			
මාසය	සැප්තැම්බර් 21- 30	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්
බදු ආදායම රු.මිලියන	8,578.00	26,984.00	14,870.00	24,574.46

වර්ෂය	2024								
මාසය	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජුනි	ජූලි	අගෝස්තු	සැප්. 01-20
බදු ආදායම රු.මිලියන	22,753.00	22,848.00	30,254.00	27,238.20	26,794.80	23,737.00	26,307.00	10,574.00	18,919.34

(ii) ලාභය - රුපියල් මිලියන 52,312.23

වර්ෂය	2023			
මාසය	සැප්තැම්බර් 21- 30	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්
ලාභය රු.මිලියන	3,508.36	7,481.14	5771.42	7,886.65

වර්ෂය	2024								
මාසය	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර් 01-20
ලාභය රු.මිලියන	(6,495.08)	1,028.12	9,588.07	9,518.39	3,811.21	3,255.58	3,294.15	3,442.51	221.71

(iii) ඉන්ධන අලෙවියේදී වංචා සිදු වී තිබේද යන්න පිළිබඳව විමර්ශන කටයුතු සිදු කරමින් පවතී. එම විමර්ශන අවසානයේදී වංචා සිදු වී තිබේද, නැද්ද යන්න පිළිබඳව තීරණය වේ. එබැවින් මෙම අවස්ථාවේදී වංචාවන් සිදුවී ඇති ද, නැද්ද යන්න පිළිබඳව නිශ්චිතව ප්‍රකාශ කළ නොහැක.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(vi) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය අපේ ඇමතිතුමාට යොමු කළේ මෙන්න මේ කාරණය නිසායි. මේ ආණ්ඩුවේ අය විපක්ෂයේ සිටියදී, විශේෂයෙන්ම වත්මන් ජනාධිපතිතුමාත්, මේ ගරු සභාවේ දැන් සිටින අපේ හඳුන්නෙත්ති මැතිතුමාත් මේ පිළිබඳව කරුණු ගණනාවක් සඳහන් කළා. හැම ඉන්ධන ලීටරයකින්ම අතිවිශාල මුදලක් එවකට විෂය භාර අමාත්‍යවරයා විධියට කටයුතු කරපු කංචන විජේසේකර මහත්මයාගේ සාක්කුවට යනවා කියලා එදා එතුමන්ලා කිව්වා. මේ වාගේ විශාල චෝදනා ගණනාවක් කළා. මම ඒකයි මෙවැනි ප්‍රශ්නයක් ඉදිරිපත් කරමින් මේ ගැන ඇහුවේ. ඔබතුමන්ලා ඒවා නැති කරනවා කියලා නේ බලයට ආවේ. තවමත් ඒ ක්‍රියාවලිය සිදු වෙනවා ද කියන කාරණය තමයි මම මුලින් මතු කළේ. ගරු කථානායකතුමනි, ඉන්ධන මිලදී ගන්නා ක්‍රියාවලිය සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් හැම මාසයකම මිල සූත්‍රය ක්‍රියාත්මක වුණා. නමුත්, ඒ මිල සූත්‍රය අප්‍රේල්වලින් පස්සේ ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ කියන්නේ, ලංකාවට ගෙනෙන ඉන්ධනවල මිල කොච්චරද, ගොඩබෑමේ කුලිය කීයද, processing cost එක කීයද, stock holding cost එක කීයද, taxation එක කීයද කියලා දැන් වෙබ් අඩවියේ නැහැ. මේක පසුගිය අප්‍රේල් මාසය වෙනකම් තිබුණා. මේවායින් හොරකම් කරනවා, ඉන්ධන ලීටරයකින් මෙච්චර ගාණක් හොරකම් කරනවා කියලා ඔබතුමන්ලා මේ රටේ ජනතාවට කිව්වා නේ. එහෙම කිව්වා නම්, ඒ කාලයේ තත්ත්වය මේකයි, මේ කාලයේ තත්ත්වය මේකයි කියලා ඇත්තටම අද පෙන්වන්න තිබුණා නේ. ඒක තමයි ඇත්තටම කරන්න තිබුණේ. ගරු කථානායකතුමනි, ජූනි මාසයේ තෙල් ගොඩබෑමේ තත්ත්වය සටහන් කළ ලේඛනයක් දැන් මා ළඟ තිබෙනවා. මේකෙදි landed cost එක ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරයකට රුපියල් 161.18යි. හැබැයි, ඔබතුමන්ලා රුපියල් 120.42ක් බදු වශයෙන් මේ රටේ ජනතාවගෙන් ගන්නවා.

කංචන විජේසේකර මහත්මයාගේ සාක්කුවට යනවා, හරමයි මෙහෙමයි කියලා නේ කිව්වේ. පෙට්‍රල් ලීටරයක් ගෙනෙන්නේ රුපියල් 154.39ට. ඔබතුමන්ලා ඔක්ටේන් 95 පෙට්‍රල් ලීටරයකට බදු ගහනවා, රුපියල් 145.29ක්. ලංකා ඔටෝ ඩීසල් ලීටරයක් ගෙනෙන්නේ රුපියල් 185.67ට. ඔබතුමන්ලා ඒකට බදු ගහනවා, රුපියල් 97.47ක්. ලංකා සුපර් ඩීසල් ලීටරයක් ගොඩබාන්නේ රුපියල් 157.84ට. ඔබතුමන්ලා ඒකට රුපියල් 120.67ක බද්දක් ගහනවා. ඔබතුමන්ලා කිව්වා, මේ බද්ද අඩු කරලා ජනතාවට සහනයක් දෙනවා කියලා. කවදාද, මේ බදු ටික අයින් කරලා මේ රටේ ජනතාවට ඒ සහනය දෙන්නේ? රුපියල් 161.18ට පෙට්‍රල් ලීටරයක් දෙන්න පුළුවන්. ඒ ගණන මම හරියටම දන්නේ නැහැ, මේ තිබෙන තොරතුරුවල හැටියටයි මා එය කිව්වේ. ඔබතුමන්ලා කිව්වේ, ඒවා කරන්නේ නැහැ කියලායි. ඔබතුමන්ලා කිව්වේ, පසුගිය රජය බදු ගහලා ජනතාවගේ බදු මුදල් හොරකම් කරනවා කියලා නේ. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, කංචන විජේසේකර මහත්මයාගේ සාක්කුවට ගියාය කියන මේ මුදල් තවදුරටත් යන එක නවත්වන්නේ කවදාද කියලා. මම ඒකයි ඇහුවේ, වංචාවක් වෙලා තිබෙනවාද කියලා. මම අහන්න කැමැතියි, ඔබතුමන්ලා ඒක නතර කරලා, මේ බද්ද අයින් කරලා, මේ රටේ ජනතාවට ඒ සහනය දෙන්නේ කවදාද කියලා.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, ඕකේ ප්‍රභේද දෙකක් තිබෙනවා. එකක් තමයි, premium එක හරහා සාක්කුවට යන එක. ඒ හැරුණු විට බදු සල්ලි සාක්කුවලට යන්නේ නැහැ නේ; ඒවා ආණ්ඩුවට නේ යන්නේ. එතකොට, මෙට්‍රික් ටොන් එකකට ඩොලර් 35ට, 37ට තිබ්බ premium එක දැන් ඩොලර් 5ට අඩුයි. බොහෝ විට ඩොලර් 3කට ආසන්න ප්‍රමාණයක් තමයි අය වෙන්නේ; ගෙවන්නේ. ඒක වෙනම එකක්. එතකොට හිතාගන්න පුළුවන් නේ, කොච්චරද සාක්කුවට ගියේ කියලා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගණන කියන්න.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ඒක වෙනස් වෙනවා, ටෙන්ඩරය අනුව. දෙකයි ගණන්, තුනයි ගණන් වාගේ තමයි average එක යන්නේ; තිස් ගණන් යන්නේ නැහැ.

එතකොට, හිතාගන්න පුළුවන් නේ කෝකද සාක්කුවට ගියේ කියලා. හැබැයි බදු ප්‍රශ්නය ගත්තාම, ඔය එදා ඉඳන්ම වාගේම අපි ආණ්ඩුව ගන්න කොටත් තිබුණු බද්ද. ඕකේ තිබෙනවා, රජයේ සාමාන්‍ය වැට් සහ අනෙක් බදු ටිකට අමතර දෙයක්. අපි ආණ්ඩුව ගන්නකොටත් රුපියල් බිලියන 884ක ණය තිබුණා, රජයට පවරා ගත්. ඒ කියන්නේ, මහා භාණ්ඩාගාරයට පවරා ගත් ණය ටිකක් තිබෙනවා. අපි නොවෙයි කලින් ආණ්ඩුව පවරා ගත්තා, රුපියල් බිලියන 884ක්. ඒ ණය ගෙවීම වෙනුවෙන් රුපියල් 50ක බද්දක් මේකට ඇතුළත් කරලා තිබෙනවා. ඒ රුපියල් 50 තවම තිබෙනවා. මොකද, ඒ ණය මුදල් ගෙවලා ඉවර නැහැ. මම හිතන විධියට, දැන් භාගයකට ආසන්න මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ගෙවලා තිබෙන්නේ. ඒ ණය මුදල ගෙවලා ඉවර වුණාම අපට පුළුවන් වෙයි, ඒ ගැන සලකා බලා ඒ අතිරේක මුදල ඇත්තටම අයින් කරලා දමන්න. ඒ හැරෙන්න, තිබෙන අනෙක් ඒවා රජයේ නියමිත, ස්ථාවර බදු. ඕක තමයි මගේ පිළිතුර.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු ඇමතිතුමා, ඔය තොරතුරු ටික වෙබ් එකට දමන්න. එතකොට අපි දන්නවා, මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. පසුගිය අප්‍රේල් මාසයේ ඉඳලා වෙබ් එකට විස්තර මොකුත් දමන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ජූලි මාසයේ පළමුවැනි දා ඔබතුමන්ලා මිල සූත්‍රයක් ඉදිරිපත් කරලා ඉන්ධන මිල වැඩි කළා. එතකොට ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් මිල අඩු වෙලා තිබුණේ. ඒ විතරක් නොවෙයි. කැබිනට් මාධ්‍ය ප්‍රකාශක නලින්ද ජයතිස්ස ඇමතිතුමා කිව්වා, කිසි දෙයකට හය වෙන්න එපා කියලා. ඔබතුමාත් කිව්වා, මාස තුනකට අවශ්‍ය තෙල් තිබෙනවා කියලා. ඊට පස්සේ නලින්ද ජයතිස්ස මහත්මයාත් කිව්වා, තෙල් තිබෙනවා කියලා. ඊට පස්සේ අපේ මහින්ද ජයසිංහ මහත්මයා කිව්වා, එහෙම තෙල් ගබඩා කරන්න තැන් නැහැ, ඒ බොරු කථාවක්, එහෙම කරන්න බැහැ, එහෙම එකක් නැහැ කියලා. හැබැයි, මයුර නෙත්තිකුමාරගේ මහත්මයා මේ මිල ගණන් සම්බන්ධව ප්‍රස්තාරයක් ඇඳලා තිබෙනවා. එතුමා ෆේස්බුක් එකේ එක එක ඒවා අඳිනවා. අපටත් ඒ තුළ නොයෙක් විට පහර ගහනවා. සාමාන්‍යයෙන් රජයේ නිලධාරින් එහෙම කරන්නේ නැහැ නේ. හැබැයි, එතුමා රජයේ නිලධාරියෙක් වෙලාත් අපි මොනවා හරි කිව්වාම, ඒකට ෆේස්බුක් එකේ යම් පහර ගැසීමක් කරනවා.

කමක් නැහැ, ඒක එතුමාගේ කැමැත්ත නේ. හැබැයි, එතුමා ෆේස් බුක් එකේ දාලා තිබෙනවා, "දින කිහිපයක් තිස්සේ පහළ වැටුණු ලෝක තෙල් මිල අද දිනයේදී නැවතත් පහළ ගොස් ඇත" කියලා. ඒ කියන්නේ, ඇමෙරිකානු ඩොලර් 83 දක්වා ඉහළ ගිහින් තිබුණු එක ඩොලර් 76 දක්වා පහළට ඇවිල්ලා තිබෙනවා. එතුමාගේ ෆේස් බුක් පිටුවේ දිගටම ඒ ගැන ප්‍රස්තාර හදලා දාලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඩොලරයේ අගය ගත්තොත්, මැයි මාසයේ රුපියල් 300යි, ජූනි මාසයේ රුපියල් 299යි. පසුගිය මාස දෙකේදී ඩොලරයේ ගැනුම් මිල තිබුණේ ඔය ගණන්. එතකොට ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල වැඩි වෙලාත් නැත්නම්, අපේ රටේ තව මාස තුනකට තෙල් තිබෙනවා නම්, තෙල් order කරලාත් තිබෙනවා නම්, ජූලි මාසයේ 01වැනි දා සිට පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 12කින් හා ඩීසල් ලීටරයක මිල රුපියල් 15කින් වැඩි කළේ ඇයි? එහෙම වැඩි කරන්න හේතුවක් නැහැ. මාස තුනකට තෙල් ගබඩා කරලා තබාගන්න පුළුවන් කියලා මම විශ්වාස කරන්නේ නැහැ. නමුත්, ඔබතුමන්ලා තෙල් order කරලා තිබුණා. ඒ තෙල් order කළේ, ඩොලරය රුපියල් 299ට තිබියදී. එතකොට බොර තෙල් බැරලයක මිල ඩොලර් 75ට අඩු වෙලා තිබුණා. මයුර නෙත්තිකුමාරගේ මහත්මයා කියන විධියට ඊටත් වඩා අඩු වෙලා තිබෙනවා. ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් බැරලයක මිල තිබුණේ ඩොලර් 75ට, 76ට. එහෙම අඩු වෙලා තිබියදී ඔබතුමන්ලා මේ විධියට තෙල් මිල වැඩි කළේ ඇයි? ඒ කියන්නේ order කරලා තිබුණු තොගයකට මිල වැඩි කළේ ඇයි? එහෙම කරලා මිනිස්සුන්ගේ බඩට ගැහුවේ ඇයි? ඒකෙන් මුළු රටේම ආහාරවල මිල වැඩි වෙලා තිබෙනවා, එළවලු මිල වැඩි වෙලා තිබෙනවා, transport cost එක වැඩි වෙලා තිබෙනවා. ඒ සියල්ල වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම මේ රටේ ව්‍යාපාරිකයන්ගේ cost of production පවා වැඩි වෙලා තිබෙනවා. මේ රටේ මිනිස්සුන්ට සහන දෙන්න ඕනෑ වෙලාවක මෙහෙම කළේ ඇයි?

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා දීර්ඝ කාලයක් තිස්සේ නොකඩවා පාර්ලිමේන්තුව නියෝජනය කරපු මන්ත්‍රීවරයෙකු විධියට මීට වඩා දැනුවත්භාවයෙන් යුක්තව ප්‍රශ්න අහනවා නම් එතුමාට මම වඩාත් ස්තුතිවන්ත වෙනවා.

මොකද, websiteවලත් පැහැදිලිවම තිබෙනවා පාදක කර ගන්න මිල මොකක්ද කියලා. ඒ කියන්නේ, අපි ජූලි පළමුවැනි දාට ගන්නේ ජූනි මාසයේ ආපු actual නැව් තොග ගොඩබාපු දිනයට අදාළ මිල. නමුත්, ඒ දවසේ ගොඩබෑවේ නැහැ. *[බාධා කිරීමක්]* අපි නොදැම්මාට ඔබතුමා දන්නවා නේ. ඔබතුමා දැකපු ටිකේ තිබෙනවා නේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
පැහැදිලි කර ගැනීමටයි මම අහන්නේ.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ඒක තමයි. *[බාධා කිරීමක්]* ක්‍රමය පිළිබඳව උත්තරයක් ලබා දීමට ඉඩ දෙන්න.

ගරු කථානායකතුමනි, ජූනි මාසයේ නැව් තොග ගොඩබාපු දිනයට අදාළ ලෝක වෙළෙඳ පොළේ මිල අනුව තමයි මේ මිල ගණනය වෙන්නේ. මොකද, අපි ටෙන්ඩර් කරලා තිබුණාට, premium එක තමයි ටෙන්ඩර් කරන්නේ. මිල තීරණය වෙන්නේ ගොඩබාන දවසේ මිල අනුව. ඒ අනුව, මිල වැඩි වෙච්ච දවසේ නැවක් කොළඹට ඇවිල්ලා ඉන්ධන බෑවා. ඉතින් ඒ මිල ඒකට එකතු වෙච්ච හින්දා තමයි මිල වැඩි වෙලා තිබෙන්නේ.

ඩීසල් ලීටරයක් ගත්තොත්, ඇත්තටම රුපියල් 8ක් පාඩුවට තමයි අපි දැනටත් -මේ මාසය ඇතුළත- විකුණන්නේ. රුපියල් 23ක් වැඩි වෙන්න තිබ්බ එක තමයි රුපියල් 15ක් වැඩි කරලා ඔය මට්ටමේ තියා ගත්තේ. ඒක හින්දා මේ ක්‍රමය ගැන පොඩි අවබෝධයක් තියා ගත්තා නම් ඔය වාගේ පහළ මට්ටමේ ප්‍රශ්න අහන එක නතර කර ගනියි කියලා මම හිතනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මට පැහැදිලි කර ගැනීමක් කර ගන්නට අවශ්‍යයි. *[බාධා කිරීමක්]*

රාජ්‍ය ඔසුසලක් පිහිටුවීම: මඩකලපුව දිස්ත්‍රික්කය
அரச மருந்தகமொன்றைத் தாபித்தல்: மட்டக்களப்பு மாவட்டம்
ESTABLISHMENT OF RAJYA OSUSALA: BATTICALOA DISTRICT

183/2024

2. **ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනේ දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බලප්‍රදේශයේ රජයේ ඔසුසලක් නොමැති බවත්;

(ii) මේ සම්බන්ධයෙන් අදාළ අංශ දැනුවත් කරන ලද අවස්ථාවේදී රජයේ ඔසුසලක් ස්ථාපිත කිරීම

සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් සහිත ගොඩනැඟිල්ලක් නොමැති බව දැන් වූ බවත්;

(iii) එහෙත්, රජයේ ඔසුසලක් ස්ථාපිත කිරීම වෙනුවෙන්ම කළුවංචිකුඩි මූලික රෝහලේ ගොඩනැඟිල්ලක් ඉදිකර ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) එසේ නම්, කළුවංචිකුඩි මූලික රෝහල් පරිශ්‍රයේ ඉදිකර ඇති ගොඩනැඟිල්ලේ රජයේ ඔසුසලක් ස්ථාපිත කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மாவட்டத்தின் மண்முனை தென் எருவில்பற்று பிரதேச செயலக ஆளுகைப் பிரதேசத்தில் அரச மருந்தகமொன்று இல்லை என்பதையும்;

(ii) இந்த விடயம் தொடர்பாக சம்பந்தப்பட்ட பிரிவுகளுக்குத் தெரிவிக்கப்பட்ட சந்தர்ப்பத்தில் அரச மருந்தகமொன்றைத் தாபிப்பதற்குப் போதுமான இடவசதிகளுடன்கூடிய கட்டிட மொன்று இல்லை என அறிவிக்கப்பட்டது என்பதையும்;

(iii) ஆயினும், அரச மருந்தகமொன்றைத் தாபிப்பதற் கென்றே களுவாஞ்சிக்குடி ஆதார வைத்திய சாலையில் கட்டிடமொன்று நிர்மாணிக்கப் பட்டுள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், களுவாஞ்சிக்குடி ஆதார வைத்தியசாலை வளவில் நிர்மாணிக்கப்பட்டுள்ள கட்டிடத்தில் அரச மருந்தகமொன்றைத் தாபிப்பதற்கு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Is he aware that -

(i) a government pharmacy - Rajya Osusala - is not available within the Manmune South Eruvil Pattu Divisional Secretary's Division in the Batticaloa District;

(ii) the relevant parties, when informed of the above fact, stated that a building with adequate space to establish a government pharmacy is not available; and

(iii) there is nevertheless a building that had been constructed for the very purpose of establishing a government pharmacy at the Kaluvanchikudy Base Hospital?

(b) If so, will he inform this House whether steps will be taken to establish a government pharmacy in the building constructed at the Kaluvanchikudy Base Hospital premises?

(c) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) මඩකලපුව නගරයේ රාජ්‍ය ඔසුසල් ශාඛාවක් ඉදිරි මාස දෙක ඇතුළත ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර, ඒ සඳහා මඩකලපුව සමුපකාර සමිතියට අයත් ගොඩනැඟිල්ලක් කඩිනමින් අලුත්වැඩියා කටයුතු කර රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ලබා දීමට නියමිතය.

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අපේ පැත්තෙන් නොවෙයි මේ ප්‍රමාදය තිබෙන්නේ. සමුපකාර සමිති ගොඩනැඟිල්ල ලබා ගත් වහාම මේ ඔසුසල අපි ආරම්භ කරනවා.

(iii) කළුවංචිකුඩි මූලික රෝහලේ එවැනි ගොඩනැඟිල්ලක් ස්ථාපිත කර නොමැත.

(ආ) සමුපකාර සමිතියට අයත් ගොඩනැඟිල්ලේ ඉදිරි මාස දෙක ඇතුළත රාජ්‍ය ඔසුසල් ශාඛාව ස්ථාපිත කිරීමට නියමිතව ඇත.

(ඇ) පැන නොනඟී.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
கௌரவ அமைச்சர் அவர்களே, உங்களுடைய விடைக்கு நன்றி!

கடந்த வாரம் நீங்கள் மட்டக்களப்பு மாவட்டத்துக்கு விஜயமொன்றை மேற்கொண்டு இருந்தீர்கள். அதன்போது கடந்த காலத்தில் நீங்கள் கடமைபுரிந்த வைத்தியசாலை களையும் பார்வையிட்டீர்கள். நீங்கள் அந்த மாவட்டத்தின் பாராளுமன்ற உறுப்பினர்களையும் அழைத்துச் சந்திப் பொன்றை மேற்கொண்டிருந்தால் இன்னும் சிறப்பாக இருந்திருக்கும். எதிர்காலத்தில் மீண்டும் வருகை தரும்போது அவ்வாறு செய்யுமாறு கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நாங்கள் மட்டக்களப்பு மாவட்டத்தில் வாழைச்சேனை, மட்டக்களப்பு நகரம், களுவாஞ்சிக்குடி ஆகிய மூன்று பிரதேசங்களில் 'ஒசுசல'இன் கிளைகளை அமைத்துத்தருமாறு கேட்டிருந்தோம். ஏனெனில், அந்த மூன்று பிரதேசங்களிலுமுள்ள வைத்தியசாலைகள் பெரும்பாலான மக்களுக்குச் சேவைகளை வழங்கும் வைத்திய சாலைகளாகும். 2018-2019ஆம் ஆண்டு காலப்பகுதியில் 'ஒசுசல' நிறுவனத்தைச் சேர்ந்தவர்கள் களுவாஞ்சிக்குடி ஆதார வைத்தியசாலைக்கு நேரடியாக விஜயம் செய்து, அங்கு 'ஒசுசல'வுக்கென கட்டிடமொன்று இருந்தால், 'ஒசுசல'ஐ அமைக்கலாமெனச் சொல்லியிருந்தார்கள். தற்போது, அந்த வைத்தியசாலை வளாகத்தில் கட்டிடமொன்று கட்டப்பட்டு மூடிய நிலையில் இருக்கின்றது. அதனால்தான் நான் இந்த வினாவைக் கேட்டிருந்தேன்.

முதலில், மாவட்டத்துக்கு ஓர் 'ஒசுசல'ஐத் தருவதாக எங்களுடைய மாவட்ட மட்டக் குழுக் கூட்டத்தில் சொல்லப் பட்டது. அதை மட்டக்களப்பு நகரில் அமைப்பதாகவும் சொல்லப்பட்டது. அதற்காக அங்குள்ள சமுபகார இற்குச் சொந்தமான கட்டிடத்தை விடுவிப்பதற்குரிய நடவடிக்கை களை நாங்கள் எங்களுடைய மாவட்ட அபிவிருத்திக் குழுத் தலைவருடைய தலையீட்டால் விரைவு படுத்தலாம். களுவாஞ்சிக்குடி ஆதார வைத்தியசாலை வளாகத்தில்

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

அதற்கான ஒரு கட்டிடம் அப்படியே இருக்கின்றது. எதுவுமே புதிதாகச் செய்யவேண்டிய அவசியமில்லை. என்னுடைய முதலாவது மேலதிக வினா என்னவெனில், மட்டக்களப்பு நகரில் 'ஒசுசல'இன் கிளையொன்றை அமைக்கும்போது, களுவாஞ்சிக்குடி வைத்தியசாலை வளாகத்துக்குள்ளும் 'ஒசுசல'இன் கிளையொன்றை உங்களுடைய அதிகாரத்தைப் பயன்படுத்தி அமைத்துத் தர முடியுமா? என்பதுதான்.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමා, පළමුවන කරුණ මේකයි. මම මඩකලපුව දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය නිලධාරින් එක්ක සාකච්ඡා කරනවා කියන එක සමහර මන්ත්‍රීවරුන්ට මා දැනුම් දීලා තිබුණා. ඇත්තටම මමත් කල්පනා කරනවා, සියලු මන්ත්‍රීවරු එතැනට සම්බන්ධ වුණා නම් හොඳයි කියලා.

දෙවැනි කාරණය මේකයි. දැනට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් පවත්වාගෙන යන ඔසුසල් තිබෙන්නේ 65ක් පමණයි. අපි බලයට ආවාට පසු අලුතින් ඔසුසල් 4ක් ආරම්භ කළා. මේ ඔසුසල් ආරම්භ කිරීමේදී අපි සැලකිල්ලට ගන්නවා, ඉතාම ඉක්මනට අප යොදන ලද පිරිවැය ආවරණය කරගන්න පුළුවන්ද කියන එක. මොකද, හැම තැනකම එහෙම කිරීමේ හැකියාවක් නැහැ. භාණ්ඩාගාරයෙන් ඔසුසල්වලට කියලා, එහෙම නැත්නම් SPC එකට කියලා වෙනම මුදල් වෙන් වෙන්නේ නැහැ. අපි ඖෂධ මිලදී ගැනීම් සඳහා වෙන් කරන මුදල්වලින් තමයි මේ කටයුතු කරගෙන යන්නේ. ඒ නිසා ඉස්සෙල්ලා අපි මඩකලපුව නගරය ආශ්‍රිතව ඔසුසල ආරම්භ කරමු. ඊට පසු ක්‍රමානුකූලව අවශ්‍යතාව පරිදි කටයුතු කරමු. මම ඒ අවශ්‍යතාව පිළිගන්නවා. නමුත්, operational cost එකත් එක්ක සලකා පියවරෙන් පියවර තමයි මේ කටයුතු කරන්න සිද්ධ වෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන් අපි උතුරු, නැගෙනහිර ප්‍රදේශ පිළිබඳව අවධානය යොමු කරනවා. මොකද, ඒ පැතිවල ඔසුසල් වැඩි ප්‍රමාණයක් ආරම්භ කළොත් තමයි ජනතාවට අඩු මිලට ඖෂධ මිලදී ගැනීමේ පහසුකම සැලසෙන්නේ. එම නිසා ඒ යෝජනාව අපි සැලකිල්ලට ගන්නවා. ඒක අපේ සැලසුමට ඇතුළත් කර ගන්නවා.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, எங்களுடைய மாவட்டத்தில் PMCU, Divisional Base Hospital, District Hospital, Teaching Hospital என நான்கு வகையான வைத்தியசாலைகள் இருக்கின்றன. தற்போது எங்களுடைய மாவட்டத்தில் இருக்கும் பல வைத்தியசாலைகளுக்குப் போதியளவு வளங்கள் கிடைக்காத காரணத்தால், அங்குள்ள எல்லா வைத்திய சாலை களையும் Line Ministry இன்கீழ் அல்லது மத்திய அரசாங்கத்தின் கீழ் கொண்டுவர வேண்டுமெனச் சொல்வதனூடாக மாகாண சபையும் பலவீனமான ஒரு கட்டமைப்பாக எதிர்காலத்தில் மாறக்கூடிய ஓர் அபாயநிலை இருக்கின்றது. இருந்தாலும்கூட, நான் அறிந்த வகையில், மத்திய அரசாங்கத்தின்கீழ் இருக்கும் மட்டக்களப்பு Teaching Hospitalக்கு ADB வங்கியின் நிதி உதவியூடாக cath lab, MRI machine, CT scanner ஆகியவற்றைப் பெற்றுக்கொடுப்பதற்கு அனுமதி கிடைத்திருந்தது. இப்பொழுது, அது procurement processஇல் இருப்பதாக நாங்கள் அறிகின்றோம். கௌரவ அமைச்சர் அவர்களே, இதன் பின்னணியை நான் சொல்கின்றேன். 2021ஆம் ஆண்டில் மட்டக்களப்பு மாவட்டத்துக்கென இறக்குமதி செய்யப்பட்ட cath labஐ தற்பொழுது நீங்கள் பிரதிநிதித்துவப்படுத்தும் மாவட்டமான களுத்துறை மாவட்டத்துக்கு அந்தக் காலப்பகுதியில் இருந்த அமைச்சர் ஒருவர் தனது செல்வாக்கைப் பயன்படுத்திக் கொண்டுசென்றார். இது 2021ஆம் ஆண்டில் நடந்த சம்பவமாகும்.

கௌரவ அமைச்சர் அவர்களே, இப்பொழுதும் மட்டக்களப்பு மாவட்டத்துக்கு வழங்குவதாக இருந்த cath lab, MRI machine, CT scanner என்பவற்றில் CT scanner இந்த மாவட்டத்துக்கு அநாவசியமானதெனக் கூறி நீக்கப் பட்டுள்ளதாக நாங்கள் அறிகின்றோம். ஆனால், நீங்கள் மட்டக்களப்புக்கான விஜயத்தின்போது, MRI machineஐ வழங்குவதாக வாக்குறுதி வழங்கியிருந்தீர்கள். எனக்கு உங்களுடைய வாக்குறுதி தேவை. அதாவது, ADB வங்கியின் நிதி உதவியூடாக மட்டக்களப்பு மாவட்டத்துக்கென ஒதுக்கப்பட்ட cath lab, MRI machine, CT scanner ஆகியவற்றை அந்த மாவட்டத்துக்கு வழங்குவீர்கள் என்ற உறுதிமொழியை நீங்கள் வழங்க வேண்டுமென நான் எதிர்பார்க்கின்றேன்.

நான் ஆரம்பத்தில் சொன்னதுபோல, மட்டக்களப்பு மாவட்டத்திலுள்ள PMCUஆக இருக்கட்டும்; Divisional Base Hospitalஆக இருக்கட்டும். அங்கு அதிகமான குறைபாடுகள் இருக்கின்றன. நாங்கள் இது சம்பந்தமான கோரிக்கைகளை எங்களுடைய பிரதேச அபிவிருத்திக் குழுவின் தலைவர் கௌரவ கந்தசாமி பிரபு அவர்களுடைய தலைமையில் நடந்த அபிவிருத்திக் குழுக் கூட்டங்களில் முன்வைத்து இருக்கின்றோம். அந்தக் கோரிக்கைகளை நாங்கள் உங்களுக்கும் அனுப்புகின்றோம். நேரடியாக Line Ministry ஊடாக இல்லாவிட்டாலும், அதற்கான வளங்களை உங்களால் நேரடியாக வழங்க முடியுமா? எனக் கேட்கின்றேன். அதாவது, எங்களுடைய மாவட்டத்துக்கான cath lab, MRI machine, CT scanner ஆகியவற்றையும் எங்களுடைய வைத்தியசாலை களுக்கான வளங்களை Line Ministry ஊடாகவும் வழங்க முடியுமா? என்பதுதான் என்னுடைய மேலதிக வினாவாகும்.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමනි, මඩකලපුව දිස්ත්‍රික්කයේ තිබෙන අපේ ශික්ෂණ රෝහල -මඩකලපුව ශික්ෂණ රෝහල- මධ්‍යම ආණ්ඩුව යටතේ තමයි පවතින්නේ. ඇත්තටම මඩකලපුව දිස්ත්‍රික්කයේ පවතින මධ්‍යම ආණ්ඩුවට අයත් එකම රෝහල තමයි මඩකලපුව ශික්ෂණ රෝහල. නැගෙනහිර පළාතට තිබෙන්නේ එම ශික්ෂණ රෝහල පමණයි. අනෙක් රෝහල් පළාත් සභා යටතේ පවතින්නේ. ඒවා මධ්‍යම ආණ්ඩුවට ගන්නට දැනට කිසි අදහසක් හෝ සැලසුමක් අපට නැහැ. නමුත්, අපි කල්පනා කරනවා රටේ පවතින දිස්ත්‍රික් මහ රෝහල්,- දැනට මධ්‍යම ආණ්ඩුව සතුව නොමැති දිස්ත්‍රික් මහ රෝහල් 7ක් පවතිනවා- මධ්‍යම ආණ්ඩුව යටතේ පවතිනවා නම් අපට මේ තෘතීයික සත්කාර මීට වඩා විධිමත්ව පවත්වාගෙන යා හැකියි කියලා. එවැනි අදහසක් අපට තිබෙනවා. හැබැයි, ඒ කටයුතු සිදු වන්නේ අනිවාර්ය වශයෙන්ම ඒ පළාත් සභාවල එකඟතාව සහිතවයි. පළාත් සභා බැහැ කියනවා නම් අපට මොකුත් කරන්න වුවමනාවකුත් නැහැ, එහෙම කරන්නත් බැහැ. නමුත්, ඔබතුමා දැන් සඳහන් කරන මූලික රෝහල්, -ද්විතීයික ප්‍රතිකාර ඒකක නියෝජනය කරන බොහෝ මූලික රෝහල්- ප්‍රාථමික ඒකක සියල්ල වාගේ පළාත් සභා යටතේ තමයි පවතින්නේ. ඒවා පළාත් සභා යටතේම පවත්වාගෙන යන්න තමයි අපේ බලාපොරොත්තුව තිබෙන්නේ.

දෙවැනි කාරණය වන ඔබතුමා අහපු මඩකලපුව ශික්ෂණ රෝහල සම්බන්ධ ප්‍රශ්නය ගත්තාම, අපට පුළුවන්කම ලැබේවි මේ අවුරුද්ද අවසන් වනකොට MRI scan යන්ත්‍රයක් ලබා දෙන්නට. දැන් ඒ කටයුතු තිබෙන්නේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ. තවත් CT scan යන්ත්‍රයක් ඉල්ලා තිබුණා. මුලින්ම සෞඛ්‍ය අමාත්‍යාංශය රෝහල් හඳුනාගෙන, මේ උපකරණ ලබා දෙන්නේ කුමකටද කියලා සැලසුම් කර තිබුණා නම් ඔබතුමාගේ ඔය චෝදනා එල්ල වන්නේ නැහැ. මේක මට අදාළ එකක් නොවෙයි. කලින් හිටපු ඇමතිතුමා කරපු එකක් කියලා කියනවා. මම ඒක හරියට දන්නේ නැහැ. මඩකලපුවේ තිබුණු එකක් කළුතරට ගෙන ගියාද, කළුතර තිබුණු එකක් වෙන කොහේට හෝ ගෙන ගියාද කියලා මම දන්නේ නැහැ. සාමාන්‍යයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ තිබෙන ප්‍රශ්නයක් තමයි, කොහේට හෝ ඕනෑ දෙයක් නොලැබුණාම ඒක ඒ ඇමතිවරයාගේ දිස්ත්‍රික්කයට අරගෙන යනවා කියන කථාව. එහෙම කථාවක් හැම තැනම තිබෙනවා. නමුත්, දැන් එහෙම දෙයක් වෙන්නේ නැහැ. අපි හඳුනාගෙන තිබෙනවා මේවා ලබාදිය යුතු තැන් මොනවාද කියලා.

ඒ නිසා එම රෝහලට CT scan යන්ත්‍රයත් අනිවාර්ය වශයෙන්ම ලැබෙනවා. ඊළඟට, cath lab එකේ තත්ත්වයත් එහෙමම තමයි. අපි එදා සාකච්ඡා කළේ එම කටයුතු කඩිනම් කරන්නයි. මොකද, මඩකලපු රෝහලට එම පහසුකම් ලබා දිය යුතුයි. මඩකලපුවේ තිබෙන සියලු රෝහල්වලට අවශ්‍ය කරන පහසුකම් ලබා දිය යුතුයි. නමුත් ඒ මූලික රෝහල් සියල්ලටම විශේෂඥ වෛද්‍යවරුන් අවශ්‍ය ප්‍රමාණයෙන් ලබා දෙන්න මේ වෙලාවේ හැකියාවක් නැහැ. ඒ නිසා මේ මොහොතේ අපේ ප්‍රමුඛතාව තිබෙන්නේ මඩකලපුව ශික්ෂණ රෝහලට අවශ්‍ය කරන විශේෂඥ වෛද්‍යවරුන් ඇතුළු කාර්ය මණ්ඩලය සහ අවශ්‍ය කරන උපකරණ කඩිනමින් ලබා දීලා එම රෝහලට අවශ්‍ය පහසුකම් වැඩිකරන්නයි. ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට අපට මේ වෙලාවේ කළ හැකිව තිබෙන්නේ ඒ කටයුත්තයි. ඒ නිසා ඒ කටයුත්ත අපි අනිවාර්යයෙන්ම සිද්ධ කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -196/2024- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

2015 සිට සේවක අර්ථසාධක අරමුදලේ සක්‍රිය ගිණුම්: ගෙවන ලද වාර්ෂික පොලිය

2015 முதல் ஊழியர் சேமலாப நிதியத்திலுள்ள தொழிற்படும் கணக்குகள்: செலுத்தப்பட்ட வருடாந்த வட்டி

ACTIVE ACCOUNTS IN EMPLOYEES' PROVIDENT FUND FROM 2015: ANNUAL INTEREST PAID

216/2024

4. ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා සේවක අර්ථසාධක අරමුදලේ සක්‍රිය ගිණුම් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලය තුළ දායකයාට ගෙවන ලද වාර්ෂික පොලී අනුපාතය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වාර්ෂික පොලී අනුපාතය තීරණය කිරීමේ දී සලකා බලනු ලබන කරුණු කවරේද;

(iv) සේවක අර්ථසාධක අරමුදල තවදුරටත් ශක්තිමත් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இதுவரை ஊழியர் சேமலாப நிதியத்திலுள்ள தொழிற்படும் கணக்குகளின் எண்ணிக்கை ஒவ்வொரு வருட அடிப்படையில் வெவ்வேறாக எத்தனை;

(ii) மேற்படி காலப்பகுதியினுள் பங்களிப்பாளருக்குச் செலுத்தப்பட்ட வருடாந்த வட்டி வீதம் ஒவ்வொரு வருட அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு;

(iii) வருடாந்த வட்டி வீதம் தீர்மானிக்கப்படுவதில் கவனம் செலுத்தப்படும் விடயங்கள் யாவை;

(iv) ஊழியர் சேமலாப நிதியத்தை மேலும் வலுப்படுத்துவதற்காக மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Labour:

(a) Will he inform this House the -

(i) number of active accounts in the Employees' Provident Fund from 2015 to the present, separately for each year;

(ii) annual interest rate paid to the contributor in each year during that period, separately;

(iii) factors considered in determining the annual interest rate; and

(iv) measures taken to further strengthen the Employees' Provident Fund?

(b) If not, why?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2015 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා පවතින ගිණුම් ප්‍රමාණය නිල වශයෙන් මෙම පිළිතුරෙහි සඳහන් වෙනවා. ඒ නිසා මම එය මෙතැනදී කියවීම අවශ්‍ය කරන්නේ නැහැ. 2015 වර්ෂයේ මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 16.8යි. 2024 වර්ෂය වන විට එම ප්‍රමාණය මිලියන 22.2 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. වාර්ෂිකව දායක මුදල් ලැබෙන ගිණුම් ප්‍රමාණය 2015 වර්ෂයේදී මිලියන 2.5යි. එම ප්‍රමාණය මිලියන 2.9 දක්වා 2024 වර්ෂය වනවිට වැඩි වෙලා තිබෙනවා.

(ii) 2015 සිට 2024 දක්වා සාමාජික ශේෂ මත ගෙවන ලද පොලී අනුපාතය පහත පරිදි වේ.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

වර්ෂය	සාමාජික ශේෂ මත ගෙවන ලද පොලී අනුපාතය
2015	10.50
2016	10.50
2017	10.50
2018	9.50
2019	9.25
2020	9.00
2021	9.00
2022	9.00
2023	13.00
2024	11.00

(iii) පොලී අනුපාතය තීරණය කරද්දී සලකා බලනු ලබන කරුණු කාරණා ගොඩක් තිබෙනවා. ඒ අතර ප්‍රධාන ක්ෂේත්‍ර 2ක් තිබෙනවා. එකක් තමයි, බෙදා හැරිය හැකි ලාභය - distributable profit. එතැනදී විවිධ ක්ෂේත්‍රවලින් සේවක අර්ථසාධක අරමුදලට ලැබෙන ආයෝජනවලින් එම වර්ෂයේ මෙහෙයුම් වියදම් අයින් කරලා, අදාළ බදු අයින් කළාට පසුව බෙදා හැරිය හැකි ලාභය - distributable profit - තීරණය කරනවා. ඊට පසුව ඒ ඒ සාමාජිකයන්ගේ ගිණුම්වල තිබෙන ශේෂයන්ට සාපේක්ෂව ඒ අදාළ පොලී අනුපාත තීරණය කරනවා.

(iv) සේවක අර්ථසාධක අරමුදල තවදුරටත් ශක්තිමත් කිරීමට ප්‍රධාන ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන තිබෙනවා. ඒවා මෙසේයි.

(1) සේවක අර්ථසාධක අරමුදලේ තිබෙන ආයෝජන කළඹ විවිධාංගීකරණයකට ලක් කිරීමට සැලසුම් කරනවා.

(2) ආයෝජන වශයෙන් විශාල මුදල් ප්‍රමාණයක් තිබෙන නිසා එම ආයෝජන ආදායම් අඩු-වැඩිවීමේ අවදානමක් තිබෙන නිසා නිසි පරිදි අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනවා.

(3) වත්කම් කළමනාකරණ ක්‍රමවේදයක් ගැනත් සාකච්ඡා කරනවා. ඒ සඳහා තොරතුරු පද්ධතිය විධිමත් පරිදි වැඩිදියුණු කරනවා.

(4) සමස්ත රාජ්‍ය ක්‍රියාකාරිත්වයේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා ඩිජිටල්කරණයට යොමුවීමේ ප්‍රවණතාවක් අපේ ආණ්ඩුව තුළ තිබෙනවා. එම ඩිජිටල්කරණ පරිවර්තනයත් මෙතැනට සම්බන්ධ කරගන්න ඕනෑ. ඒ අනුව නව ඩිජිටල් ක්‍රමවේද පද්ධතියකට යෑම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබෙනවා.

(5) දායක මුදල් ගෙවීම පැහැර හැර ඇති අවස්ථා අනාවරණය කරගත් පසු ඒවා ඉක්මනින් අය කර ගැනීමටත්, ඒ අනුව අරමුදල තර කර ගැනීමටත්, සාමාජිකයන්ට එහි ප්‍රතිලාභ ලබා දීමටත් පියවර ගනිමින් ඉන්නවා.

(6) සේවක අර්ථසාධක අරමුදල් කළමනාකරණය සඳහා ත්‍රෛපාර්ශ්වීය සහභාගිත්වයෙන් -ප්‍රධාන වශයෙන් වෘත්තිය සමිති, සේවායෝජකයින් හා රජය නියෝජනය කරමින්- නව යන්ත්‍රණයක් සකස් කිරීමේ ක්‍රියාවලියක් ඉදිරියේදී හඳුන්වා දීමට කටයුතු කරනවා.

(ආ) පැන නොනඟී.

ගරු කථානායකතුමනි, වැඩිදුර විස්තර ඇතුළත් පිළිතුර මම **සභාගත*** කරනවා.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ස්තුතියි, ගරු ඇමතිතුමනි. මම හිතන විධියට, සේවක අර්ථසාධක අරමුදල කියන්නේ ලංකාවේ තිබෙන ලොකුම අරමුදලක්. සේවයේ නියුතු ලාංකික ජනතාවගේ -සේවක මහත්ම, මහත්මීන්ගේ- වැටුපෙන් සහ සේවායෝජකයින්ගෙන් එක්කාසු වෙලා එන මුදල් කළමනාකරණය කිරීම තමයි මෙම අරමුදල හරහා කෙරෙන්නේ.

අපි දන්නවා, පසුගිය කාලය පුරාවට මේ සම්බන්ධව යම් යම් චෝදනා එල්ල වී තිබුණු බව, කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කිරීම, විවිධ ආයතනවල ආයෝජනය කිරීම යනාදී වශයෙන් කියැවුණු කාරණාත් එක්ක. ඒ වාගේම මෙහි වැරදි කළමනාකරණය පිළිබඳව ව්‍යවහාරික විගණනයේදී පවා බොහෝ දේවල් පෙන්වා දී තිබුණා. මේ වනවිට ඔබතුමන්ලා ඒ වැරදි කළමනාකරණය සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවාද කියා මා දැන ගන්න කැමැතියි.

මේකේ තිබෙන අනෙක් ගැටලුව තමයි, මේ ආයෝජන සිද්ධ වෙන නමුත් සැබෑ අයිතිකරුවන්ට ඒ ගැන දැන ගන්නවත් අවස්ථාවක් නැතිකම. ආයෝජනය කරන්න සූදානම් වෙනවාද, ආයෝජනය කරලා තිබෙන්නේ මොනවාටද, ඒකෙන් ලැබෙන ප්‍රතිලාභ මොනවාද ආදි කිසි දෙයක් සැබෑ අයිතිකාරයින්ට කවදාකවත් දැනගන්න හැකියාවක් නැහැ. Website එක හරහා බොහෝ තොරතුරු ලබා දිය හැකිව තිබියදී, ඒවා බොහෝ සෙයින් වසන් කරනවා කියන එක තමයි දකින්න තිබෙන්නේ. 2023දී සේවක අර්ථසාධක අරමුදලට අදාළව සංශෝධන කෙටුම්පතක් ඉදිරිපත් වෙලා තිබුණා. වැරදි කළමනාකාරිත්වය සම්බන්ධව ව්‍යවහාරික විගණනයේදී ආපු චෝදනාවලට ගන්නා වූ ක්‍රියාමාර්ගය මොකක්ද කියන ප්‍රශ්නයට සහ අර කියපු සංශෝධන කෙටුම්පත ක්‍රියාත්මක වන තත්ත්වයට පත් කරන්නේ කවදාද කියන ප්‍රශ්නයට තමයි මට මේ වෙලාවේ ඔබතුමාගෙන් පිළිතුරු දැන ගන්න අවශ්‍ය වෙලා තිබෙන්නේ.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මම මුලින්ම එක කොටසකට උත්තර දෙන්නම්. ඒ උත්තරය විධියට දෙන්න තිබෙන්නේ, එය විධිමත් කිරීම සඳහා තාක්ෂණය යොදා ගත යුතු බවයි. තාක්ෂණය හරහා, ඒ කියන්නේ ඩිජිටල්කරණය හරහා එය විධිමත් කිරීමට කැබිනට් අනුමැතිය ලැබී තිබෙනවා. දැන් ඒ වැඩ කටයුත්ත වේගයෙන් කරගෙන යනවා. දැනට එහි මුදල් කළමනාකරණය කෙරෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ. කම්කරු අමාත්‍යාංශයට තමයි එහි පරිපාලන කටයුත්ත පැවරී තිබෙන්නේ. එය විධිමත් කිරීමේ කටයුත්ත දැන්

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

වේගයෙන් කෙරීගෙන යනවා. ගරු මන්ත්‍රීතුමා සඳහන් කරපු කාරණය ඇත්ත. මේකේ සැබෑ අයිතිකාරයෝ තමයි සේවකයෝ. ඒගොල්ලන්ට ඒ ගැන දැන ගැනීමේ අයිතිය තිබෙනවා. ඒ අයිතිය අනුව දැනට ඒ අවස්ථාව ලබා දීම සිදු වන්නේ නැති බව ඇත්ත. ඩිජිටල් ක්‍රමවේදය හරහා ඉදිරියේදී ඔවුන්ට ඒ තොරතුරු ලබා ගැනීමට හැකි වන පරිදි පාරදෘශ්‍ය ක්‍රමවේදයකට යනවා. විශේෂයෙන් සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් සමාජයේ කථා බහට ලක් වුණු එක් අවස්ථාවක් තමයි, පසුගිය කාලයේ තිබුණු ගැටලු. ඊට අමතරව තවත් විශාල ප්‍රමාණයේ ගැටලු තිබෙන්න පුළුවන්. නමුත්, මේ මොහොත වන විට නිශ්චිතව එවැනි ව්‍යවහාරික විගණනයක් ආරම්භ කරලා නැහැ. අපි බලනවා, මේක හෙමින් හෙමින් ක්‍රමවත් කරන්න. විශේෂයෙන්ම එම ඩිජිටල් ක්‍රමවේදය හරහා පළමුවෙන් අදාළ කාර්ය භාරය ඉෂ්ට කරන්න අපි බලනවා. ගැටලු පැන නඟින අවස්ථා බලා අදාළ ක්‍රියාමාර්ග ගන්න අපි සූදානම්.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ඇසීමේ අවස්ථාව ගරු විපක්ෂ නායකතුමාට ලබා දෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු අමාත්‍යතුමනි, අද දින ඉදිරිපත් කරන අණපනත් හරහා විශේෂයෙන්ම සේවකයන්ගේ අවම සේවක වැටුප දෙසැම්බර් මාසය වන විට රුපියල් 21,000 සිට රුපියල් 27,000 දක්වා වර්ධනය වෙනවා. ලබන ජනවාරි මාසයේ සිට එය රුපියල් 30,000 දක්වා වැඩි වෙනවා. ඒක සුබවාදී දෙයක්. ඒකට අපේ සහයෝගය ලබා දෙනවා. හැබැයි, ඒ කර්තව්‍යය ඉෂ්ට සිද්ධ කරන කොට ඔබතුමන්ලාට "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති මාලාවේ 41වැනි පොරොන්දුව අමතක වෙලා තිබෙනවා. ඒ තමයි, මේ රටේ උඩරට, පහතරට වතු ප්‍රජාවට ලබා දෙනවා කියපු රුපියල් 1,700ක දෛනික වැටුප. විශේෂයෙන්ම මම මතක් කරන්නට ඕනෑ, 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥාපනතේ 20 (1) වගන්තිය ගැන. එම වගන්තිය තුළ යම් කර්මාන්තයක යෙදෙන කම්කරුවන්ගේ අවම පඩි ප්‍රමාණය තීරණය කිරීම පිළිබඳ විධිවිධානය සඳහන්ව තිබෙනවා. 1981 අංක 72 දරන වැවිලි කර්මාන්ත සේවකයන්ට දීමනා පනතේ 4වන වගන්තිය යටතේ, පඩිපාලක සභාව විසින් කරන ලද තීරණයක් මඟින් වතු ප්‍රජාවට ගෙවිය යුතු ප්‍රමාණය තීන්දු වෙනවා. එතකොට, රටේ එක ජන කොට්ඨාසයකට ලැබෙන රුපියල් 21,000ක් වන වැටුප මේ වසර අවසන් වන විට රුපියල් 27,000 කරලා, ලබන ජනවාරියේ ඉඳලා එය රුපියල් 30,000 කරනවා. එක ජන කොට්ඨාසයකටයි ඒක කරන්නේ. හැබැයි, මෙතැනදී අමතක වුණු ජන කොට්ඨාසය තමයි, උඩරට, පහතරට වතු ප්‍රජාව. තේ වතු, රබර් වතු, පොල් වතු, සුළු අපනයන බෝග යන ක්ෂේත්‍රවල ජනතාවට ඔබතුමන්ලා ලබා දුන් පොරොන්දුව අමතක වෙලා තිබෙනවා. එය අමතක නම්, ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ 41වන පොරොන්දුව බලන්න. ඔබතුමන්ලා දුන් පොරොන්දුවලින් මේ මොහොත වන විට ඉෂ්ට කරලා තිබෙන්නේ ඉතාම අඩු ප්‍රමාණයක් බව විද්‍යාත්මක සමීක්ෂණයකින් හෙළි වී තිබෙන බව අපට දැන ගන්න ලැබුණා. වතු ප්‍රජාව වෙනුවෙන් ඔබතුමන්ලා ලබා දුන් ඒ පොරොන්දුව ක්‍රියාත්මක කරන්නේ කවදාද, අද දවසේ එය ක්‍රියාත්මක කරන්න කටයුතු නොකරන්නේ ඇයි කියලා මම අහන්න කැමැතියි. විශේෂයෙන්ම වතු කම්කරුවන්ට රුපියල් 1,700ක දෛනික වැටුපක් ලබා දීමේ පොරොන්දුව ක්‍රියාත්මක කිරීම සඳහා මනෝ ගනේසන් මැතිතුමාත්, වී.එස්. රාධක්‍රිෂ්ණන් මැතිතුමාත්, පලනි දිගම්බරම් මැතිතුමාත් අද සංශෝධනයක් ඉදිරිපත් කරනවා. රජය පැත්තෙන් ඔබ ඒ සංශෝධනයට සහයෝගය ලබා දීලා වතු ප්‍රජාවට කළ යුතු සාධාරණත්වය ඉෂ්ට කරන්න කටයුතු කරනවාද?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

එම ප්‍රශ්නය ඇහුවාට බොහොම ස්තුතියි. සේවකයන්ගේ ජාතික අවම වේතනය පනතෙන් වතු කම්කරුවන් ආවරණය වෙන්නේ නැහැ. වතු කම්කරුවන් ඇතුළු තවත් කර්මාන්ත ගණනාවක සේවකයන්ගේ වැටුප තීරණය වන්නේ පඩි පාලක සභා යටතේයි. ඒ අනුව රුපියල් 1,700ක උපරිමයට යෑමේ සාකච්ඡාව පැවැත්වෙමින් තිබෙනවා. දැනට මේ අයගේ දෛනික වැටුප රුපියල් 1,700ක් ලෙස නිර්ණය වෙලා තිබෙනවා, රුපියල් 1,350කුත්, අතිරේක වැඩ විධියට රුපියල් 350කුත් වශයෙන්. අපි සේවකයන් -ඒ කියන්නේ කම්කරුවන්- සහ සේවා යෝජකයා -හාම්පුතුන්- පැත්තෙන් මේ සාකච්ඡාව අඛණ්ඩව ඉදිරියට ගෙන යමින් ඉන්නවා. ඒ ක්ෂේත්‍රයේ ශ්‍රම තත්ත්වය සැලකිල්ලට භාජන කරමින් එය තවදුරටත් වැඩි කර ගන්නයි ඕනෑකම තිබෙන්නේ. මේ පවතින තත්ත්වය තුළ සෑම පාර්ශ්වයක්ම එකතු කරලා සාකච්ඡාව සිදු වෙනවා. කෙසේ වෙතත්, ඒක සංඛ්‍යා දත්ත විධියට ගෙන බලමු. පොදුවේ අවම වේතනය රුපියල් 30,000ක් යැයි නියම කරන්නේ නිශ්චිත කර්මාන්ත අත් හැරලා. එතකොට දැනට වතු කම්කරුවන්ගේ අර අතිරේක වැඩත් එක්ක මේ කියන රුපියල් 1,750 ගත්තොත්, එය දවස් 25න් වැඩි කළොත්, මේ තිබෙන අවම වැටුපට වඩා එය වැඩියි. *[බාධා කිරීමක්]*

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

එහෙම දෙන්නේ නැහැ, ගරු ඇමතිතුමා. එහෙම කියන්න එපා.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මම අංක ගණිතමය වශයෙන් කියන්නේ. ඒක හරිද නැද්ද කියන එක නොවෙයි. *[බාධා කිරීමක්]* වැඩි කරලා බලන්නකෝ. අපි රුපියල් 1,350 ගත්තත්,- *[බාධා කිරීමක්]* රුපියල් 1,350 වැඩි කරලා බලන්නකෝ. *[බාධා කිරීම්]* නිශ්ශබ්ද වෙන්න. මට මේ කාරණය කියන්න ඉඩ දෙන්න. මේක අංක ගණිතයට,- *[බාධා කිරීම්]* සාධාරණද, නැද්ද කියන එක නොවෙයි මම කියන්නේ. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා ඉඳගන්න.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

වැටුප් පනතක සඳහන් ප්‍රමාණය,- *[බාධා කිරීමක්]* වැඩි කරලා බලන්න. දින 25න් තමයි අපි වැඩි කරන්නේ. රුපියල් 1,350 වැඩි කළත්, රුපියල් 33,750යි. *[බාධා කිරීම්]*

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

එහෙම ලැබෙන්නේ නැහැ.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මේ කාරණය තේරුම් ගත යුතුයි. මෙය පටලවාගත යුතු නැහැ. මොකද, සේවකයන්ගේ ජාතික අවම වේතනය, වැටුප හරහා මේ තිබෙන නීති රීති පද්ධතිය ඇතුළේ මේ සංශෝධනය කරන්න බැහැ. විපක්ෂය කිව්වත් නැතත්, මේ මන්ත්‍රීවරුන් සඳහන් කළත් නැතත් ඒ සාකච්ඡාව අපි අඛණ්ඩව ඉදිරියට ගෙන යමින් තිබෙනවා. පසුගිය මාසයේත් සාකච්ඡා කළා; ඉදිරි මාසයේදීත් සාකච්ඡා කරනවා. ඒ අනුව අපි ඉදිරියටත් මේ සාකච්ඡාව අරගෙන යනවා. *[බාධා කිරීම්]* අපි පිළිගන්නේ නැහැ, මේ තිබෙන වැටුප් ජීවත් වෙන්න පුළුවන් මට්ටමක තිබෙනවා කියලා. හැබැයි, මතක තබා ගත යුතුයි අපි ආර්ථිකය ස්ථාවර කරලා තිබෙනවා කියන එක. මොකද, අපට භාර දුන්නේ හිර වෙච්ච, බිඳ වැටිච්ච, ඉදිරියට දුවන්නේ නැති ආර්ථිකයක්. *[බාධා කිරීම්]* ඒක ස්ථායීකරණය කරලා ඉදිරියට ගෙන යනකොට විපක්ෂයේ වගකීම බවට පත් විය යුතු වන්නේ, එහි දෙවන පියවර වන මේ සඳහා ආයෝජන කැඳවීම, සේවකයන් සහ සේවා යෝජකයන් අතර එකමුතුකම පවත්වාගෙන ඉදිරියට අරගෙන යෑම ආදියයි. *[බාධා කිරීම්]* ඒ වෙනුවට මේ සාකච්ඡාවෙන් සිදු කරන්නේ කකුලෙන් ඇදීමක්, ආයෝජකයන්ගේ විශ්වාසය කඩතොලු කිරීමක්, රට ඇතුළේ අවිනිශ්චිතභාවය නිර්මාණය කිරීමක්. ගරු කථානායකතුමනි, රටක් වශයෙන් ගත්තාම මේ ගන්නා ක්‍රියාමාර්ගය ඉතාම වැරැදියි. මොකද, දැන් යම් තැනකට ඇවිල්ලා, ජාතික සහ ජාත්‍යන්තර මට්ටමෙනුත් මේ රට ස්ථාවර වෙලා කියලා පිළිගන්නවා. *[බාධා කිරීම්]*

රට එයින් තවත් ඉදිරි පියවරකට ගෙන යන්න රටේ නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ. ඒ නිසා අපි ඉදිරියේදී මේ හැම ක්ෂේත්‍රයක් පිළිබඳවම සාකච්ඡා කිරීමේ කටයුත්ත කරනවා.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

The people of the plantations are a marginalized section.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමා, මොකක්ද, ඔබතුමාගේ point of Order එක?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, දෙවැනි ප්‍රශ්නය හැටියට මා මතු කළ ප්‍රශ්නයට අදාළව ඇත්තවශයෙන්ම නිවැරැදි පිළිතුරක් නොවෙයි ලැබුණේ. මම පැහැදිලිව කියනවා, පසුගිය ආණ්ඩුව ක්‍රියාත්මක කරපු ප්‍රතිපත්තිය- *[බාධා කිරීමක්]* ඒ කියන්නේ, රුපියල් 1,350 සහ තවත් රුපියල් 350ක් හංගලා දෙන්නේ. ඒක වැරැදියි. රුපියල් 1,700,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, ඒක point of Order එකක් නොවෙයි.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මෙතුමන්ලා අහන මුල් ප්‍රශ්නය එකක්. අතුරු ප්‍රශ්නය විධියට මතු කරන්නේ වෙනත් එකක්. ස්ථාවර නියෝගවල ඉතා පැහැදිලිව තිබෙනවා, අතුරු ප්‍රශ්නය මතු කළ යුතු වන්නේ මුල් ප්‍රශ්නයෙහි පැන නඟින කාරණයක් කියලා. මුල් ප්‍රශ්නයට අදාළ නැති කරුණු යොමු කරන්න එපා, ගරු විපක්ෂ නායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 5, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

ගරු ජීවන් තොන්ඩමන් මහතා
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාගේ point of Order එක මොකක්ද? -*[බාධා කිරීම්]*

ගරු ජීවන් තොන්ඩමන් මහතා
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

Hon. Speaker, - [Interruption.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක point of Order එකක් නොවෙයි. -*[බාධා කිරීම්]* ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

මිල්ලනිය අපනයන සැකසුම් කලාපයේ ඉදිකිරීම්: විස්තර

மில்லனிய ஏற்றுமதி செயலாக்க வலய நிர்மாணப் பணிகள்: விபரம்

CONSTRUCTION OF MILLENIYA EXPORT PROCESSING ZONE: DETAILS

223/2024

5. **ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් කළුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගම, මිල්ලනිය ප්‍රදේශයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද අපනයන සැකසුම් කලාපය සඳහා ඉඩම් පවරා ගැනීමේ ප්‍රගතිය කවරේද;

(ii) පවරා ගන්නා ලද ඉඩම් වෙනුවෙන් මේ වන විට ගෙවා ඇති වන්දි මුදල කොපමණද;

(iii) ඉහත අපනයන සැකසුම් කලාපයේ මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීමට, එම කලාපයට නළ ජලය ලබා දීමට සහ විදුලිය සැපයීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත කලාපයේ මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීමේ ප්‍රගතිය කවරේද;

(v) ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘතියක් ලෙස සලකා ඉහත අපනයන සැකසුම් කලාපයේ ඉතිරි සංවර්ධන කටයුතු සම්පූර්ණ කිරීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை முதலீட்டுச் சபையால் களுத்துறை மாவட்டத்தின் பண்டாரகம, மில்லனிய பிரதேசத்தில் நிர்மாணப் பணிகள் ஆரம்பிக்கப் பட்டுள்ள ஏற்றுமதி செயலாக்க வலயத்துக்கான காணி சுவீகரிப்பின் முன்னேற்றம் யாது என்பதையும்;

(ii) சுவீகரிக்கப்பட்டுள்ள காணிகளுக்கு இதுவரை வழங்கப்பட்டுள்ள இழப்பீட்டுத் தொகை யாது என்பதையும்;

(iii) மேற்படி ஏற்றுமதி செயலாக்க வலயத்தில் வீதிக் கட்டமைப்பை அபிவிருத்தி செய்வதற்கும் மேற்படி வலயத்துக்கு குழாய் நீரை வழங்குவதற்கும் மின்சாரம் வழங்குவதற்கும் இலங்கை முதலீட்டுச் சபையால் வெவ்வேறாகச் செலவிடப்பட்ட தொகை யாது என்பதையும்;

(iv) மேற்படி வலயத்தின் வீதிக் கட்டமைப்பு அபிவிருத்தியின் முன்னேற்றம் யாது என்பதையும்;

(v) தேசிய ரீதியில் முக்கியத்துவம் வாய்ந்த கருத்திட்டமாகக் கருதி, மேற்படி ஏற்றுமதி செயலாக்க வலயத்தில் மீதமாகவுள்ள அபிவிருத்திப் பணிகளைப் பூர்த்திசெய்ய நடவடிக்கைகள் எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(i) the progress of land acquisition process for the Export Processing Zone, in which construction work has been commenced by the Board of Investment of Sri Lanka in the Milleniya area, Bandaragama in the Kalutara District ;

(ii) the amount of compensation that has been paid so far for the lands acquired;

(iii) the amount spent by the Board of Investment of Sri Lanka to develop the road system, provide pipe-borne water and supply electricity to the above-mentioned Export Processing Zone, separately;

(iv) the progress of the development of the road system of the zone concerned; and

(v) whether steps will be taken to complete the remaining development work of the aforementioned Export Development Zone considering this as a project of national importance?

(b) If not, why?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) යෝජිත මිල්ලනිය ආයෝජන ප්‍රවර්ධන කලාපය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට එරෙහිව හොරණ වැව්ලි පුද්ගලික සමාගම අභියාචනාධිකරණයේ නඩුවක් පවරා ඇති බැවින් එහි තීරණය ලැබෙන තුරු ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය තාවකාලිකව නතර කර ඇත.

(ii) පවරා ගන්නා ලද ඉඩම වෙනුවෙන් මේ වන විට ගෙවා ඇති වන්දි මුදල සමස්තයක් වශයෙන් රුපියල් මිලියන 91.2යි.

දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉදි කිරීමට යෝජිත පැල්පොල අන්තර් හුවමාරුව ඉදිකිරීමට අදාළව ඉඩම් කැබලි 115ක් අත්කර ගෙන ඇත. (හෙක්ටෙයාර 3.0385)

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කළ රුපියල් 91,500,000.00 ප්‍රතිපාදන අත්තිකාරම් මුදලින් අත් කර ගත් ඉඩම් කැබලි 115න් කැබලි 45ක් සඳහා වන්දි ගෙවා ඇති අතර, එම වන්දි ගෙවූ කැබලි 45න් 14ක් සඳහා පොලිය ද ගෙවීමට මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් විසින් කටයුතු කර ඇත. මේ වැය වූ මුළු මුදල රුපියල් 91,125,842.04ක් වේ.

(iii) ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර 3ක සංවර්ධන කටයුතු සිදු වෙනවා.

මාර්ග පද්ධතිය සංවර්ධනය	-	රුපියල් 180,000,000.00
ජල පහසුකම් ලබා දීමට	-	රුපියල් 160,363,156.89
විදුලි බලය ලබා දීමට	-	රුපියල් 105,200,241.00

(iv) ඉඩම් අත්පත් කර ගැනීමේදී ඇති වී ඇති නීතිමය ගැටලු හේතුවෙන් තාවකාලිකව අත්හිටුවා ඇති මිල්ලනිය අයෝජන ප්‍රවර්ධන කලාපයට අදාළව පැල්පොල අන්තර් හුවමාරුව හා මිල්ලනිය පැල්පොල මාර්ග සංවර්ධන සැලසුම් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ඉල්ලීම් මත දැනටමත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සකස් කර ඇත.

(v) මෙම යෝජිත මිල්ලනිය ආයෝජන ප්‍රවර්ධන කලාපය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට එරෙහිව පවරා ඇති නඩුව සඳහා තීරණයක් ලැබුණු පසු මේ පිළිබඳව තීරණයක් ලබා දෙනු ඇත.

(ආ) පැන නොනඟී.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට ඔය තොරතුරු දීපු නිලධාරියා සම්බන්ධව විනය පරීක්ෂණයක් තියලා, හෙටම පියවර ගන්න ඕනෑ. ඒකට හේතුවක් තිබෙනවා. අක්කර 244යි, පර්චස් 20.41ක් වන ඔය කියන ඉඩම 2019.03.08වැනි දා අංක 2113/64 අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් 38(අ) අතුරු විධානය යටතේ අත්පත් කරගෙන අවසන්. ඒක අත්පත් කරගෙන ඉවරයි. ඒකේ අත්පත් කරගන්න දෙයක් නැහැ, ඒ කටයුත්ත අවසන්.

ඒ විතරක් නොවෙයි. ඔබතුමා සඳහන් කළ ආකාරයට මේ සඳහා -ජලයට, මාර්ගවලට, විදුලියට- රුපියල් බිලියනයකට වඩා මුදලක් ආයෝජනය කරලා තිබෙනවා. එතකොට, මේක තවමත් අත්පත් කරගෙන නැහැ කියලා ඔබතුමාට උපදෙස් දෙන ඔය නිලධාරියා හෝ නිලධාරීන් කණ්ඩායම පක්ෂපාතීභාවයකින් ක්‍රියා කරනවා. ඔය හොරණ ප්ලාන්ටේෂන් සමාගමේ කොටස් හිමිකාරිත්වයේ වැඩිම පංගුව තිබෙන පුද්ගලයා BoI එකේ හිටපු සභාපතිවරයා. මේ රටේ ජනාධිපතිතුමා මේ වසරේ පෙබරවාරි මාසයේ 17වැනි දා කිව්වා, රාජ්‍ය-පෞද්ගලික සහභාගිත්වයෙන් ලංකාව පුරා ආයෝජන කලාප ගොඩ නඟනවා කියලා. මේ ඉඩම සඳහා යටිතල පහසුකම් දියුණු කරලා, මැනුම් කටයුතු කරලා 38වැනි වගන්තිය යටතේ පවරා ගත්තාට පස්සේ, තවමත් පවරා ගත්තේ නැහැ කියන කියනවා නම්, ඒක බොරු. ඔබතුමා නොමඟ යවනවා.

ඒ වාගේම, 2024.04.22වැනි දා, - ඔබතුමාගේ ආණ්ඩුව එන්න කලින් - මේ ඉඩම් ආපසු හොරණ ප්ලාන්ටේෂන් සමාගමට දෙන්න යෝජනා කරලා තිබෙනවා කියලා ඔබතුමා දන්නවාද? හැබැයි, අතිවිශාල මුදලක් මේ වැඩේට ආයෝජනය කරලා තිබෙනවා. ජල නළ එලලා තිබෙනවා, විදුලිය සඳහා මුදල් ගෙවලා තිබෙනවා, මාර්ග පද්ධතිය බාගෙට හදලා තිබෙනවා. නමුත් මේ වැඩේ නතර වෙලා තිබෙනවා.

ඒ වාගේම නඩුවක් ගැන ඔබතුමා කියනවා. ඇමතිතුමනි, මේ නඩුව පැවරුවේ ඒ රබර් වගාවේ තක්සේරුවට අදාළව පමණයි; රබර් වගාවට දීපු තක්සේරුව මදියි කියලායි. ඒ කියන්නේ ආණ්ඩුවේ තක්සේරුකරුගේ තක්සේරුවට වඩා වැඩියෙන් මේ plantation company එක ඉල්ලුවා. මේ plantation company එකට තිබෙන්නේ බදු අයිතියක් පමණයි; ඒ අයට මහ පොළොවේ අයිතිය නැහැ.

මේවා LRC ඉඩම්. ඉන් පස්සේ නීතිපතිවරයාගේත් නොසැලකිල්ල නිසා මේ නඩුව දිගින් දිගට ඇදිලා තිබෙනවා. ඔබතුමා දන්නේ නැහැ, ඉතා වටිනා, රටේ ආර්ථික සංවර්ධනයට ගැළපෙන, දක්ෂිණ අධිවේගී මාර්ගයට යාබදව තිබෙන මේ අක්කර 244 පවරාගෙන අවසන්. ඔබතුමා නොමඟ යවන නිලධාරීන්ට එරෙහිව ඔබතුමා කටයුතු කරන්න ඕනෑ. ඔබතුමා මොකද ඒ ගැන කියන්නේ? ඒ නිලධාරීන් ඔබතුමා නොමඟ යැව්වාට විනය ක්‍රියාමාර්ග ගන්නවාද, නැද්ද?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මම මේ කරුණු ඉදිරිපත් කරන්නේ ලැබිලා තිබෙන තොරතුරු මත. මේ අක්කර 244න් 166ක් සම්බන්ධයෙන් තමයි,- Neuchattlewatta Land in Millaniya is for the establishment of Millaniya Export Processing Zone. මේ මතු කරලා තිබෙන කාරණය අනුව මේ නඩුව සම්බන්ධ වෙන්නේ වන්දි ගෙවීම සඳහා තමයි. ඒක ඇත්ත. එතකොට නඩු කටයුත්තක් තිබියදී එතැනින් ඉදිරියට යන්න බැහැයි කියන කාරණය තමයි අපට ඉදිරිපත් කරලා තිබෙන්නේ. එතැනදී මෙන්න මෙහෙම තොරතුරු ටිකක් තිබෙනවා. ඉඩම් පවරා ගැනීම සඳහා රුපියල් මිලියන 91.5ක් වෙන් කරලා තිබෙනවා. ඇත්තටම ඒ ඉඩම් LRC එකෙන් BoI එක යටතට ගිහිල්ලා, එතැනින් තමයි අත්පත් කර ගැනීම සිද්ධ වෙන්න ඕනෑ. ඒ වෙන් කරලා තිබෙන මුදල්වලින් -මිලියන 91.5න්- මේ වෙනකොට මිලියන 91.2ක්ම ගෙවලා තිබෙනවා. විශේෂයෙන්ම ඉඩම් කට්ටි 115ක් සඳහා තමයි ඒ වෙන් කිරීම කරලා තිබෙන්නේ. ඒකෙන් 45ක් හඳුනාගෙන තිබෙනවා, 27ක් සඳහා දැනටමත් ගෙවලා තිබෙනවා, පොලී සහිතව. ඊළඟට ගෙවන්න ඕනෑ මුදල් සඳහා ප්‍රතිපාදන ඉල්ලා තිබෙනවා. මේ තොරතුරු අනුව තමයි නඩු කටයුත්තක් තිබෙන්නේ සහ ඉදිරි කටයුතුවලට බාධාවක් වෙලා තිබෙන්නේ කියලායි සඳහන් වෙන්නේ.

නමුත්, අපට මේ කරුණු සැලකිල්ලට භාජන කරලා බලන්න පුළුවන්, ඒ කියන තත්ත්වයේ වෙනසක් තිබෙනවාද කියලා. මොකද, මේ කටයුතු 2017 ඉඳලා පැවතගෙන ඇවිල්ලා සමහර මුදල් වෙන් කිරීම්, මාරුවීම් වෙලා තිබෙනවා මිල්ලනිය ආයෝජන කලාපයේ සංවර්ධන කටයුතු කරන්න කලින්. උදාහරණයක් විධියට කිව්වොත්, වෙන් වෙලා තිබුණු මිලියන 105, වෙනත් සංවර්ධන කටයුත්තකට වෙන් කරලා තිබුණු මිලියන 300 ගාණකින් ආපු එකක්. ඒ තුන්සිය ගණනින් 105ක් තමයි මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ. ඒ කාල පරිච්ඡේදය ඇතුළේ, විශේෂයෙන් 2017 ඉඳලා මේ දක්වා එනකොට යම් යම් සංකීර්ණතා පැන නැඟිලා තිබෙනවා. අපි නිසි පරිදි මේ තොරතුරු අරගෙන ඒ කටයුත්ත ඉදිරියට ගෙන යනවා. අපට කිසි ගැටලුවක් නැහැ. අපිත් බලාපොරොත්තු වෙන්නේ හැකි ඉක්මනින් සංවර්ධනය වේගවත් කරන්නයි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, ආයෝජන කලාප අවශ්‍යයි, විශේෂයෙන් ම විදේශීය ආයෝජකයන් මේ රටට ගෙන්වා ගන්න. කලින් රජයන් විසින් මේ ප්‍රතිපත්තිය අනුගමනය කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ගරු ජනාධිපතිතුමා මුදල් ඇමතිතුමා හැටියට මේ පාර්ලිමේන්තුවේදී පසුගිය පෙබරවාරි මාසයේ 17වෙනි දා අය වැය ඉදිරිපත් කරමින් කිව්වා ආයෝජන කලාප ගොඩනඟනවා කියලා.

අලුතින් ආයෝජන කලාප ගොඩ නඟනවා කියන එක වැදගත් වාගේම, ඉඩම් පවරා ගෙන ගොඩ නැඟීමට කටයුතු කරලා තිබෙන ආයෝජන කලාප, මුදල් භාගෙට වෙන් කරලා සංවර්ධන කටයුතු අඩාළව තිබෙන ආයෝජන කලාප හඳුනා ගෙන, ඒවා දියුණු කරලා, තිබෙන නීතිමය ප්‍රශ්න විසඳා ගෙන ඉදිරියට යන එක තමයි ප්‍රඥා ගෝචර. මේ සඳහා බස්නාහිර පළාතේ ඉඩම් නැහැයි කියනවා. ඊයේ පුවත්පත්වල පළ වුණා, බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධනය සඳහා ඉඩම් නොමැති බවක්. අපි LRC ඉඩම් - අක්කර 244ක් - ඒ වතු සමාගමෙන් පවරාගෙන, Section 38 යටතේ නීත්‍යානුකූලව මැනලා අමාරු වැඩ ටික කරලා දීලා තිබෙන්නේ. එතකොට, ආණ්ඩුවට තිබෙන මේ ඉඩම් ටික, වටිනා ඉඩම් ටික, මූලික වැඩ කරපු ඉඩම් ටික ආපසු හොරණ ප්ලාන්ටේෂන් සමාගමට පවරා දීමේ කුමන්ත්‍රණය පිටුපස ඉන්නේ කවුද? මොකක්ද මේකේ තිබෙන යථාර්ථය? තමුන්නාන්සේලාගේ ආණ්ඩුව අලුතින් ආයෝජන කලාපයක් හදනවා නම්, වැඩ සම්පූර්ණ වෙච්ච, -ගරු නලින්ද ජයතිස්ස මැතිතුමාත් මේ සභාවේ ඉන්නවා- කළුතර දිස්ත්‍රික්කයේ තිබෙන මිල්ලනිය ආයෝජන කලාපය තමයි ලංකාවෙන්ම මේ කටයුත්ත කරන්න පුළුවන් පළමුවෙනි තැන. ඒ ඉඩම් මැනලා, මූලික කටයුතු සැලසුම් කරලා ඒ වැඩ භාගයක් අවසන් කරලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, මේක අපි කරපු වැඩක්. 2024.04.22වන දා මේ ඉඩම අවසතු කරන්න, 39වෙනි වගන්තිය යටතේ ආපසු හොරණ ප්ලාන්ටේෂන්

එකට දෙන්න යෝජනා කරනවා. කවුද ඒ යෝජනාව කරන නිලධාරින්? මේ අවශ්‍යතාව තිබෙන්නේ කාටද? මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් වෙනම පරීක්ෂණයක් තියන්න, ඒ සඳහා අපිත් කැඳවන්න කියලා. මොකද, අපි මේ ගැන කාරණා දන්නවා. ඒ ප්‍රදේශය භාර ඇමතිතුමාත් කැඳවන්න. එතුමාත් කැඳවලා මේ කරුණු පිළිබඳව හොයා බලා වෙනම පරීක්ෂණයක් තියන්න. මොකද එතැන තිබෙන ප්‍රශ්න ටික අපි දන්නවා. ඒ නිසා ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලනවා, ආයෝජන කලාප හදන්න, භාගෙට කරපු මේ වැඩේ ඉදිරියට ගෙන යන්න, ඒ සඳහා පියවර ගන්න, හැබැයි, කෝටි ප්‍රකෝටි ගණන් නාස්ති කරන්න දෙන්න එපා කියලා.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව තව අතිරේක කරුණු තිබෙනවා නම් අපි ඒවාත් පරීක්ෂා කරලා බලලා කටයුතු කරනවා. මේ තත්ත්වය තුළ තිබෙන සංකීර්ණතා ගණනාවක්ම ඔබතුමාත් පිළිගන්නවා. මුදල් එහාට මෙහාට හුවමාරු වීම් වැනි සංකීර්ණතා තිබෙනවා. අපි කිසිම විධියකින් මේ ආයෝජන අධෛර්යවත් කරන්න පෙලඹෙන්නේ නැහැ. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, අතීතයේ පටන් ගත්ත සමහර ව්‍යාපෘතිවල තිබෙන ගැටලු නිසා ඒවා එක තැන හිර වෙලා තිබෙන එක. ඒවාත් බේරා ගනිමින් නව ව්‍යාපෘතිවලට යෑමේ අවශ්‍යතාව තිබෙනවා. බොහොම ස්තුතියි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මේ ගැටලු ටික විසඳා ගෙන මේ ආයෝජන කලාපයේ වැඩ කටයුතු මේ වසර අවසන් වෙන්න කලින් අපි ආරම්භ කරනවා. ඒකට කර්මාන්ත අමාත්‍යාංශය මැදිහත් වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා තව විනාඩි 25යි අපට ඉතිරිව තිබෙන්නේ. තව ප්‍රශ්න 5ක් අහන්න තිබෙනවා. අතුරු ප්‍රශ්නත් තිබෙනවා. ඒ නිසා කරුණාකර ඒ ගැනත් අවධානය යොමු කර කටයුතු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

විදේශගත ශ්‍රමිකයන්: 2015 සිට ප්‍රේෂණ
වெளிநாடு சென்றுள்ள தொழிலாளர்கள்: 2015இலிருந்து பண அனுப்பல்கள்
MIGRANT WORKERS: REMITTANCES FROM 2015

311/2024

6. **ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2024.12.31 වන විට සහ මේ වන විට විදේශයන්හි සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) 2015 වර්ෂයේ සිට මේ දක්වා -

(i) විදේශ රැකියා හරහා ලැබුණු මුළු විදේශ ප්‍රේෂණ ප්‍රමාණය ඇමරිකානු ඩොලර් සහ ශ්‍රී ලංකා රුපියල්වලින් කොපමණද;

(ii) මෙම ප්‍රේෂණ ලැබී ඇත්තේ කුමන රටවල සිටද;

(iii) පැහැර හරින ලද වැඩ කොන්ත්‍රාත්තු හේතුවෙන් පිටුවහල් කරන ලද සංක්‍රමණික සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම සේවකයන් සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(v) විදේශ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රී ලාංකිකයන් සඳහා වන රක්ෂණ ක්‍රමයෙන් උපයාගත් ආදායම කොපමණද;

(vi) මෙම යෝජනා ක්‍රමයෙන් ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන් සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2024.12.31 அன்று உள்ளவாறும் தற்பொழுதும் வெளிநாடுகளில் தொழிலில் ஈடுபட்டுள்ள இலங்கையர்களின் எண்ணிக்கையை வெவ்வேறாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) 2015ஆம் ஆண்டிலிருந்து இன்றுவரை -

(i) வெளிநாட்டு வேலைவாய்ப்புமூலம் பெறப்பட்ட மொத்த வெளிநாட்டுப் பண அனுப்பல்கள் அமெரிக்க டொலர் மற்றும் இலங்கை ரூபாயில் எவ்வளவு என்பதையும்;

(ii) எந்தெந்த நாடுகளிலிருந்து இத்தகைய பண அனுப்பல்கள் மேற்கொள்ளப்பட்டன என்பதையும்;

(iii) வேலை ஒப்பந்தத்தைக் கடைப்பிடிக்கத் தவறியமையால் வெளியேற்றப்பட்ட புலம்பெயர் தொழிலாளர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) இத்தகைய தொழிலாளர்கள் தொடர்பாக மேற்கொள்ளப்பட்ட நடவடிக்கைகள் யாவை என்பதையும்;

(v) வெளிநாட்டு வேலைகளுக்காக வெளியேறும் இலங்கையர்களுக்கான காப்புறுதித் திட்டத்திலிருந்து ஈட்டிய வருமானம் யாது என்பதையும்;

(vi) இலங்கைப் புலம்பெயர் தொழிலாளர்களுக்கு இத்திட்டத்திலிருந்து செலவிடப்பட்ட பணத் தொகை யாது என்பதையும்;

வெவ்வேறாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු රවී කරුණානායක මහතා]

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House the number of Sri Lankans employed overseas, separately as of 31.12.2024 and at present;

(b) Will he also inform this House, separately from 2015 to date the -

(i) total foreign remittances received through foreign employment in US Dollars and Sri Lankan Rupees;

(ii) countries from which these remittances originated;

(iii) number of migrant workers deported due to default working contracts;

(iv) steps taken regarding these workers;

(v) revenue earned from the insurance scheme for Sri Lankans leaving for overseas employments; and

(vi) amount of money spent from this scheme on Sri Lankan migrant workers?

(c) If not, why?

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී ඇති පුද්ගලයන්ගේ දත්ත අනුව, 2024 වර්ෂයේ එක් එක් රටවල් සඳහා කාර්යාංශ ලියාපදිංචිය ලබා ඇති ශ්‍රමිකයන් සංඛ්‍යාව පිළිබඳ කාණ්ඩ වශයෙන් තොරතුරු ඇමුණුම 01 වශයෙන් ඉදිරිපත් කරමි.

කාර්යාංශයේ ලියාපදිංචි වී ඇති පුද්ගලයන්ගේ දත්ත අනුව 2025.01.01 වන දින සිට 2025.07.02 වන දින දක්වා එක් එක් රටවල් සඳහා කාර්යාංශ ලියාපදිංචිය ලබා ඇති ශ්‍රමිකයන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු කාණ්ඩ වශයෙන් ඇමුණුම 02 ලෙස ඉදිරිපත් කරමි.

දීර්ඝ පිළිතුරු සහිත ඇමුණුම් 01 සහ 02 **සභාගත*** කරමි.

2025.02.25 දින වන විට විදේශ රටවල සේවය කරනු ලබන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව ආසන්න වශයෙන් 1,345,801ක් වන අතර එම තොරතුරු **ඇමුණුම 03** වශයෙන් ඉදිරිපත් කරමි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඇමුණුම 03

Report on the number of Sri Lanka Workers Employed abroad as at 2025-02-25

Sno.	Country	Total Stock as at 2025-02-25
1	Kuwait	304,657
2	Saudi Arabia	246,169
3	Qatar	217,586
4	UAE	216,185
5	Oman	57,173
6	Romanla	41,899
7	Maldives	35,371
8	South Korea	35,197
9	Japan	25,598
10	Malaysia	23,728
11	Jordan	23,217
12	Israel	21,562
13	Cyprus	16,365
14	Bahrain	16,151
15	Singapore	11,180
16	United Kingdom	9,687
17	Lebanon	6,913
18	Seychelles	4,471
19	New Zealand	3,726
20	Russia	3,297
21	Hong Kong	2,534
22	Serbia	2,488
23	Turkey	2,291
24	Australia	2,086
25	Bangladesh	1,579
26	Canada	1,125
27	Mauritius	897
28	Ireland	833
29	Malta	823
30	Iraq	776
31	Lithunia	687
32	Other Countries	9,552
	Total	1,345,801

(ආ) (i) ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා අනුව 2015 වර්ෂයේ සිට 2025 මැයි දක්වා විදේශ රැකියා හරහා ලැබුණු මුළු විදේශ ප්‍රේෂණ ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 67,147ක් වන අතර ශ්‍රී ලංකා රුපියල් බිලියන 13,946කි.

(ii) මේ සම්බන්ධව තොරතුරු පවත්වාගනු ලබන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වන බැවින් මේ පිළිබඳ විස්තර ඔවුන්ගෙන් ලබාගන්නේ නම් මැනවි.

(iii) පැහැර හරින ලද වැඩ කොන්ත්‍රාත්තු හේතුවෙන් කාර්යාංශය වෙත පැමිණිලි ඉදිරිපත් කිරීමෙන් පසුව නැවත මෙරටට ගෙන්වා ඇති ශ්‍රමිකයන් සම්බන්ධ තොරතුරු **ඇමුණුම 04** වශයෙන් ඉදිරිපත් කරමි.

ඇමුණුම 04

පැහැර හරින ලද වැඩ කොන්ත්‍රාත්හේතුවෙන් පැමිණිලි ඉදිපත්ව මෙරටට නැවත ගෙන්වා ඇති ශ්‍රමිකයින් සම්බන්ධ තොරතුරු

Complaint Closed Reason	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024	2025
Complainant Informed to close file-Repatriated -No salary dues	34	16	25	68	101	52	28	27	8	3	10
Complaint settled - Employee Repatriated	1516	1258	1307	1026	797	511	1529	784	634	741	383
Complaint settled - Employee Repatriated - Back wages recovered and paid to Complainant	0	0	4	5	3	0	1	3	2	3	0
Complaint settled - Employee Repatriated - Cost born by Employee	18	22	10	3	2	2	2	6	9	0	2
Complaint settled - Employee Repatriated - Cost born by Employer	63	19	13	2	3	1	3	0	0	0	1
Complaint settled - Employee Repatriated - Cost born by Foreign Agency	0	0	0	2	0	0	0	0	1	0	0
Complaint settled - Employee Repatriated - Cost born by Local Agency	7	4	4	2	2	0	0	4	1	1	1
Complaint settled - Employee Repatriated - Other Costs born under WWF	1	2	1	0	0	0	0	0	0	0	0
Complaint settled - Employee Repatriated - Ticket Fee and levy paid by SLBFE	4	1	0	0	0	0	0	0	1	0	0
Complaint settled - Employee Repatriated - Ticket provided under WWF	2	5	3	4	0	0	0	1	0	0	0
Worker repatriated to Sri Lanka	155	85	24	34	20	13	62	76	134	378	228
Total	1800	1412	1391	1146	928	579	1625	901	790	1126	625

This report is generated according to the available data as at 08/07/2025

(iv) කොන්ත්‍රාත්තු කඩවීමක් සිදු වුවද, පිටුවහල් කිරීමක් සිදු වී නොමැත.

(v) විදේශගත වන රැකියාලාභීන්ගෙන් රක්ෂණ ක්‍රමයක් සඳහා මුදල් එකතු කිරීමක් සිදු නොකරන අතර ලියාපදිංචි ගාස්තු මුදලක් පමණක් අයකරනු ලබයි. එම ලියාපදිංචියට අදාළව නොමිලයේ රක්ෂණාවරණයක් ලබා දෙයි. මෙම රක්ෂණාවරණයට අදාළව රක්ෂණ සමාගමෙන් කාර්යාංශය වෙත කොමිස් ආදායමක් ලැබෙන අතර 2015 වසරේ සිට 2024.12.31 දින දක්වා රුපියල් 296,292,806.00ක මුදලක් රක්ෂණාවරණයට අදාළව ලැබී ඇත.

(vi) මෙම රක්ෂණ ක්‍රමවේදය යටතේ විදේශගත සංක්‍රමණික සේවකයන් සඳහා වන්දි ලෙස 2015 වසරේ සිට 2024.12.31 දක්වා රුපියල් 803,132,052.00ක මුදලක් ගෙවීම් කර ඇත.

(ඇ) පැන නොනඟී.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ලැබුණු උත්තරයට අනුව හැම දේම සභාගත කරලායි තිබෙන්නේ. ඒ නිසා අතුරු ප්‍රශ්න අහන්න සිදු වන්නේ, අපි දන්නා දේ තුළින් මිසක් ඔබතුමාගේ පිළිතුර අනුව නොවෙයි කියන එක මම මතක් කරන්න කැමැතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මා දැනුවත් වූ ආකාරය අනුව විදේශයන්හි වැඩ කරන අහිංසක මිනිසුන් ලක්ෂ 21කගෙන් යූඑස් ඩොලර් මිලියන 784ක් පසුගිය මාසයේ ලැබිලා තිබෙනවා. ඒ අයගේ සල්ලි ලංකාවට ආවාට පසුව බැංකුවෙන් සියයට 4ත්, 5ත් අතර පොලී ප්‍රමාණයක් හම්බ වෙනවා. නමුත් රජයේ ණයබරතාව නිසා ජාත්‍යන්තර සුරැකුම්පත්වලට සියයට 10ත්, 11ත් අතර ප්‍රමාණයක් ගෙවනවා. මේ රට බේරා ගන්නා ඒ අහිංසක සේවක පිරිසට මේ මොහොතේ මීට වැඩිය පොලී අනුපාතයක් ලබා දෙන්න බැරි ඇයි? ඒ වාගේම ඒ අය මේ රටට පැමිණියාම duty-free facilities වාගේ දේවල් ලබා දෙන්නේ නැත්තේ ඇයි කියන එකත් මම ඔබතුමාගෙන් අහනවා.

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

ගරු කථානායකතුමනි, එතුමා අහපු ප්‍රශ්නයට අදාළ පිළිතුරේ තිබෙන සංඛ්‍යාලේඛන ඉතාම දිගයි. අපට වෙලාව සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙන නිසා තමයි ඒවා සභාගත කළේ. විශේෂයෙන් අපට ලැබිලා තිබෙන විදේශ ප්‍රේෂණවලට අදාළව ගත්තොත්, කාණ්ඩ කිහිපයකට ඒක බෙදන්න පුළුවන්.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒක ප්‍රශ්නයක් නැහැ. ප්‍රශ්නය අහන වෙලාවට ඒ පිළිතුර ගැන දැන ගන්න අපට පිළිතුර එවනවා නම් ඒක මීට වැඩිය හරවත් වෙනවා. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ කරන්නේත් එහෙම තමයි. එහිදී ප්‍රශ්නය අහන්න කලින් පිළිතුර ලබා දෙනවා. ඒ නිසා මම කාරුණිකව ඉල්ලනවා, ඔබතුමන්ලාත් ඒ අනුව කටයුතු කරන්න කියලා. අපි ඒ ගැනත් කථා කරමු. *[බාධා කිරීමක්]* මම ඔබතුමාව අගය කරනවා. මම අහපු ප්‍රශ්නයට උත්තර දෙන්නකෝ. සුද්දන්ගේ ණයවලට පොලිය විධියට සියයට 11ක් ගෙවනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විදේශයන්හි ගිහිල්ලා වැඩ කරන අපේ ලක්ෂ 21කගේ සල්ලි අපේ රටට ආවාට පසුව ලංකා බැංකුව, මහජන බැංකුව සියයට 4යි, 5යි ඒවාට පොලී විධියට ගෙවන්නේ. ඒ වාගේ පරස්පරතාවක් තිබෙන්නේ ඇයි? ඒ අය තමයි මේ රට බේරා ගන්නේ.

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

ගරු කථානායකතුමනි, අපි රට භාර ගන්න කොට තිබුණු තත්ත්වය ගත්තොත්, බොහෝ අක්‍රමිකතා සිදු වෙලා තිබුණා. ඒවා ප්‍රේෂණ සම්බන්ධ ප්‍රශ්න වෙන්න පුළුවන්; රක්ෂණය සම්බන්ධ ප්‍රශ්න වෙන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමා සඳහන් කරපු විධියට බොහෝ දේවල් සම්බන්ධව යම් කිසි ආකාරයක අඩු පාඩු, ප්‍රශ්න, ගැටලු තිබුණා. අපි ආණ්ඩුවක් විධියට මේ මොහොත වන කොට විදේශ ශ්‍රමිකයන්ගේ ශුභසාධන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා කමිටුවක් පත් කරලා තිබෙනවා; අපගේ අමාත්‍යාංශයේ විදේශ රැකියා අංශය සහ ඒ වාගේම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය එකතුව අපි කමිටුවක් පත් කරලා තිබෙනවා. එතුමා කිව්වා වාගේ විශේෂයෙන්ම රක්ෂණය සම්බන්ධයෙන් වෙන්න පුළුවන්, පොලී අනුපාත ප්‍රශ්න පිළිබඳව වෙන්න පුළුවන්, විවිධ දේවල් සම්බන්ධව අපි එම කමිටුව හරහා සාකච්ඡා කරමින් තීන්දු, තීරණවලට එනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

විදේශ රැකියා කරන අයගේ ගැටලුව සම්බන්ධයෙනුත් කටයුතු කරනවාද?

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

අනිවාර්යයෙන්. විශේෂයෙන් තව ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා අහපු ප්‍රශ්නයේ තිබෙන වැදගත්ම කාරණය මෙයයි.

පසුගිය කාලවකවානු තුළ විවිධ රක්ෂණ සමාගම්වලට ඒ විදේශ ශ්‍රමිකයන්ගේ රක්ෂණ, අදාළ දේ ලබා දීලා තිබුණා. විශේෂයෙන්ම කලින් Foreign Employment Bureau එකට යම්කිසි ආකාරයක කොමිස් මුදලක් ලැබුණා, මේවා තුළින්. නමුත්, මෙතැන තමන් තෝරා ගත් යම්කිසි ආයතන කිහිපයකට මේවා දෙන එකත් එක්ක, කිසිම කොමිස් මුදලක් අපට ලැබුණේ නැහැ. ඒ වාගේම claims සම්බන්ධව ප්‍රශ්න, ගැටලු රාශියක් මතුවෙලා තිබෙනවා. ඒ නිසා මෙතැන අක්‍රමිකතා රැසක් සිද්ධ වෙලා තිබෙනවා. Foreign Employment Bureau එකට; ආණ්ඩුවට; රජයට ලැබෙන්න ඕනෑ එවැනි මුදල් තැන් තැන්වලින් ලැබිලාත් නැහැ. ඒ වාගේම, කම්කරුවන්ගේ සුබසාධනය වෙනුවෙන් කටයුතු කළ යුතු එම පාර්ශ්වය පසුගිය කාලයේ හරියාකාරයෙන් කටයුතු කරලා නැහැ කියන චෝදනාවත් තිබෙනවා. නමුත්, ඒ චෝදනාව විතරක් අපි ඉදිරිපත් කරන්නේ නැහැ. අපි අනිවාර්යයෙන්ම අපේ වැඩ පිළිවෙළ හරහා මේ වෙනුවෙන් කටයුතු කරනවා. විශේෂයෙන්ම අපගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේදී මේ ක්ෂේත්‍රයට අදාළ ඒ හිමි තැන අපි දෙනවා කියන ඒ පොරොන්දුව අපි දීලා තිබෙනවා. අපි ඒ අනුව කටයුතු කරන්න සූදානම්.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු කථානායකතුමනි, මේ කථා කරන මොහොතේත් අපේ රටේ ඉඳලා පිට රටට ගිහිල්ලා වැඩ කරන විශාල පිරිසක් ඉන්නවා. Sir, we must thank the British Delegation who are here and their Government for extending market access and duty free facilities to Sri Lanka. While India is getting into a Free Trade Agreement with the US, why could Sri Lanka also not get into a free trade agreement so that we would have more people working in this country rather than going overseas? The British Delegation was here a little while ago and they would have probably left, but they can hear what we are saying. So, we should thank them.

While we want to have greater market access and why can we not ensure that that type of benefits are also given for investments in Sri Lanka? When people go overseas for employment, it is our labour that goes overseas. Owing to British intervention, we will now be able to have more investors like Marks & Spencer and NEXT in Sri Lanka. So, could we ensure that we also provide these types of facilities and tax incentives? You must tell the IMF to go fly a kite because, now, the UK is giving us market access and we must also give them the necessary tax incentives so that they could invest in our country. So, taking that as a cue, please ensure that you intervene as Deputy Minister of Foreign Affairs and Foreign Employment and being in charge of the Foreign Employment Bureau and ensure that our workers get the deserved rights.

Also on the GSP, which is basically up for negotiation, ensure that we do not lose out. At the moment, we do not know what President Donald Trump is going to do.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, please shorten your Supplementary Question.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Okay, Sir. Since the British Delegation is here, they could see how accommodative you are as the Speaker and could go and tell their Speaker, "See the way the Sri Lankan Speaker is behaving". I am only assisting -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Usually, two minutes are allocated for a Supplementary Question. Otherwise, it would drag on.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I know, Sir. I hope a British delegation would be here every day so that it would be helpful for us.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, please shorten your Question.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, I appreciate it and will make it a point to finish asking the Question.

Sir, while we get investments, we do not know what Donald Trump is doing at the Indian end. If India gets a ten to fifteen per cent tariff from America, we would be subjected to a lot of problems. So, I would like you all to intervene at this moment. Now that the Hon. Prime Minister, the Hon. Vijitha Herath and you are here, Hon. Deputy Minister, I would ask you all to ensure that you have discussions with them. Make it zero-tax on our end right now. Do not waste time. Once they finish having negotiations, there is no point in talking with them. Our market access to America is worth US Dollars 3.1 billion and as for them, they are getting only US Dollars 300 million. Please ensure that we say that from tomorrow, the duty-free facility would be afforded to them. They wouldl not be coming into the market, but, at least, para-tariff would not be applied to them.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please shorten your question.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Yes, Hon. Speaker, I will certainly listen to you.

I am only pointing out the situation so that the Deputy Minister could reply. There are a couple of days more for us to negotiate. So, please ensure that you intervene and get this sorted out on behalf of us, Sri Lankans.

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
Hon. Speaker, I am very thankful to Hon. Member because he is very concerned about the welfare of our migrant workers. In that regard, as a Government, we feel that the welfare of the migrant workers should be enhanced even further. We are working on a consolidated effort, involving the foreign affairs part and the foreign employment part of the Ministry through the Sri Lanka Bureau of Foreign Employment. Initially, what we are doing is, we are looking forward to certain reforms after looking into certain committee reports. Based on that, we would make sure that every citizen who is working overseas would be protected.

මහර බන්ධනාගාර පරිශ්‍රයේ මුස්ලිම් දේවස්ථානය: විස්තර

மஹர சிறைச்சாலை வளவிலுள்ள பள்ளிவாசல்: விபரம்

MOSQUE AT MAHARA PRISON PREMISES: DETAILS

338/2024

7. ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අතීතයේ සිට මහර බන්ධනාගාර පරිශ්‍රයේ පැවති මුස්ලිම් දේවස්ථානය 2019 වර්ෂයෙන් පසුව ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින බව දන්නේද;

(ii) ඊට හේතු කවරේද;

(iii) එම දේවස්ථානය නැවත පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අවසරය සහ පහසුකම් ලබා දීමේ හැකියාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பண்டைய காலம் முதல் மஹர சிறைச்சாலை வளவில் காணப்பட்ட முஸ்லிம் பள்ளிவாசல் 2019ஆம் ஆண்டுக்குப் பின்னர் இயங்கும் நிலையில் இல்லை என்பதை அறிவாரா;

(ii) அதற்கான காரணங்கள் யாவை;

(iii) மேற்படி பள்ளிவாசலை மீண்டும் பேணிவரத் தேவையான அங்கீகாரம் மற்றும் வசதிகளைப் பெற்றுக்கொடுப்பதற்கான வாய்ப்பு உள்ளதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House -

(i) whether he is aware that the mosque which had existed in the Mahara Prison premises for a long time has not been functioning since 2019;

(ii) the reasons for that; and

(iii) whether it is possible to provide permission and facilities necessary to resume the functions of the mosque concerned?

(b) If not, why?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

(ii)
- මැලේ ජාතික ඉස්ලාම් භක්තික බන්ධනාගාර නිලධාරින් වෙනුවෙන් මුල් කාලීනව ආරම්භ කරන ලද මෙම දේවස්ථානය කාලය ගතවීමත් සමඟ සම්පූර්ණයෙන් පිටස්තර පුද්ගලයන් භාවිත කිරීමට පටන් ගෙන ඇති අතර, වර්තමානයේ ඉස්ලාම් භක්තික නිලධාරින් විසින් භාවිත කරනු ලබන්නේ මහර බන්ධනාගාරය ඇතුළත පරිශ්‍රයේ පිහිටුවා ඇති පල්ලිය වේ.

- බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අයිති භූමියක පවතින ගොඩනැඟිල්ලක් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අවසරයකින් තොරව අනීතික ලෙස ලියාපදිංචි කිරීම සිදු කර තිබීම.

- පල්ලියට ඇතුළු වන්නේ මහර බන්ධනාගාරයට ඇතුළු වන ප්‍රධාන දොරටුවට පිවිසෙන මාර්ගයෙන් හා වෙනත් අනවසර ස්ථානයකින් වන අතර, ප්‍රධාන දොරටුවට පිවිසෙන මාර්ගයෙන් ඇතුළු වූ පුද්ගලයෙක් බන්ධනාගාරයේ දකුණු පස ඇති තාප්පය දිගට සමාන්තරව ඇති මාර්ගය දිගේ මීටර් 300ක පමණ දුරක් ගොස් පල්ලිය පිහිටා ඇති භූමියට ප්‍රවිෂ්ට විය යුතු වේ. (දළ සැලැස්ම ඇමුණුම් අංක 1හි දක්වා ඇත.)

- එම මාර්ගය දිගේ ගමන් ගන්නා පිටස්තර පුද්ගලයන් -පල්ලියට යන මුවාවෙන් ගමන් ගන්නා අය- ජංගම දුරකථන, මත් ද්‍රව්‍ය හා වෙනත් තහනම් ද්‍රව්‍ය තාප්පයට ඉහළින් බන්ධනාගාරය තුළට විසිකිරීමට පවතින හැකියාව තුළ ආයතනයේ ආරක්ෂාවට තර්ජනයක් ඇති වීම. ඒ, පල්ලියට යන අය නොවෙයි, වෙනත් පුද්ගලයන් වෙන්න පුළුවන්.

- එමෙන්ම ඉස්ලාම් බැතිමතකු මියගිය විට එම දේහය පල්ලියට රැගෙන ඒම නිසාත්, විවාහ වන විට අදාළ පාර්ශ්ව පැමිණීම නිසාත් සිකුරාදා දිනවලදී විශාල පිරිසක් එක්රැස් වන ස්ථානයක් බවට පත්වීම නිසා එම තත්ත්වය බන්ධනාගාරයේ ආරක්ෂාවට තර්ජනයක් වීම.

- පල්ලිය ඇති ස්ථානයේ සිට ප්‍රධාන තාප්පයට ඇති දුර අඩි 50ක් පමණ වීම නිසා ආයතනයේ ආරක්ෂාවට බාධාවක් ඇති වීමට හැකියාවක් තිබීම.

- තනිකඩ නිලධාරින්ගේ නිවස්නය ද පල්ලියට සමාන්තරව ඉතාම ආසන්නව අඩි 10ක පමණ දුරකින් පිහිටා තිබීම.

- ජල බිල්පත් හා විදුලි බිල්පත් ගෙවනු ලබන්නේ මහර බන්ධනාගාරයේ ගිණුම් අංශය විසින් වීම.

- යථෝක්ත පල්ලිය මහර බන්ධනාගාරයට හා තනිකඩ නිල නිවාසයට ඉතා ආසන්නව පිහිටා ඇති බැවින් පල්ලිය පවරා දීම නිසා මහර බන්ධනාගාරයේ ආරක්ෂාවට බලවත් තර්ජනයක් වන බව පසක් කර එවකට බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අදාළ පල්ලියේ අයිතිය ලබා දිය නොහැකි බව 2013.02.04 දිනැති ලිපියෙන් පල්ලියේ පාලනාධිකාරිය වෙත දන්වා ඇත. (ඇමුණුම් අංක 2හි දක්වා ඇත.)

- ඒ අනුව, එවකට මහර බන්ධනාගාරයේ අධිකාරිවරයා විසින් පල්ලිය සහිත ඉඩම රජයට පවරා දෙන ලෙස දන්වා, අස්කිරීමේ දැන්වීමක් පල්ලියේ පාලනාධිකාරිය වෙත දන්වා යවා ඇතත්, පල්ලියේ පාලනාධිකාරිය ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරලා නැහැ. එය යවා තිබෙන්නේ 2013 මාර්තු මාසයේ. (ඇමුණුම් අංක 3හි දක්වා ඇත.)

- එකල රට තුළ පැවති වාතාවරණය අනුව පිටස්තර පුද්ගලයන් බන්ධනාගාර පරිශ්‍රය තුළ රැඳී සිටීම නිසා මහර බන්ධනාගාරයේ රැඳවියන්ගේ හා නිලධාරින්ගේ ජීවිතාරක්ෂාවට තර්ජනයක් විය හැකි බැවින්, එකල සිටි අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් බන්ධනාගාරයට අයත් මාර්ගවල පිටස්තර පුද්ගලයන්ට ගමන් කිරීමට අවසර ලබා නොදෙන ලෙස දන්වා 2019.04.25 දිනැති ලිපියෙන් නියෝගයක් නිකුත් කර ඇත. (ඇමුණුම් අංක 4හි දක්වා ඇත.)

- 2019.05.16 දාතමින් එවකට මහර බන්ධනාගාර අධිකාරි කේ.ඒ.එස්. කොඩිතුවක්කු මහතාගේ ලිපියෙන් දක්වා ඇති පරිදි මහර බන්ධනාගාරයේ සේවය කරනු ලබන මුස්ලිම් භක්තික නිලධාරින් හා සිරකරුවන් වෙනුවෙන් සකස් කර ඇති මෙකී මුස්ලිම් පල්ලියේ ආගමික කටයුතු සඳහා හඳුනා නොගත් විවිධ පිටස්තර පුද්ගල කණ්ඩායම්වලට බන්ධනාගාර පරිශ්‍රයට ඇතුළු වීමට ඉඩදී, ආයතනයේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවදානමක් දැරීමේ හැකියාවක් හෝ අවශ්‍යතාවක් නොමැති බැවින්, බන්ධනාගාර පරිශ්‍රයේ පිහිටි මුස්ලිම් පල්ලියට පිටස්තර පුද්ගලයන් පැමිණීම සම්පූර්ණයෙන් නවතා දැමීම පිණිස අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. (ඇමුණුම් අංක 5හි දක්වා ඇත.)

- මරණීය දණ්ඩනය නියම කරන ලද සිරකරුවන්, නම ගිය අපරාධකරුවන් - IRCs, පාතාල සාමාජිකයන්, මහා පරිමාණ මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හා විශේෂ අපරාධවලට සම්බන්ධ සිරකරුවන්/සැකකරුවන් 2,000කට අධික ප්‍රමාණයක් රඳවා සිටින මහර බන්ධනාගාරයේ සිරකරුවන්ගේ/ සැකකරුවන්ගේ ජීවිත ආරක්ෂාව හා රජයේ දේපළවල සුරක්ෂිතභාවය සලකා බැලීමේදී අවදානමක් දැරීමේ හැකියාවක් නොමැති අතර, බාහිර පාර්ශ්වයන් වෙත පල්ලිය විවෘත කරන ලෙස රජයේ විවිධ පාර්ශ්ව මඟින් දිගින් දිගටම ඉල්ලීම් කිරීම ද සිදු වුණා. නමුත් එයින් ආයතනයේ ආරක්ෂාවට මැනිය නොහැකි මට්ටමේ අන්තරාදායක තත්ත්වයක් ඇති බවට 2019.09.12 දාතමින් මහර බන්ධනාගාරයේ එවකට සිටි අධිකාරි විසින් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. (ඇමුණුම් අංක 6හි දක්වා ඇත.)

- අදාළ පල්ලිය පිහිටි පරිශ්‍රයට නැවත පිටස්තර පුද්ගලයන්ගේ පැමිණීම නිසා මහර

බන්ධනාගාරයේ ආරක්ෂාවට බලවත් තර්ජනයක් ඇති විය හැකි බැවින්, අදාළ පල්ලිය නැවත විවෘත නොකිරීම වඩාත් සුදුසු බවට 2020.07.08 දිනැති ලිපියෙන් අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත හා අධිකරණ අමාත්‍යාංශය වෙත දැනුම් දී තිබෙනවා, බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින්. (ඇමුණුම් අංක 7හි දක්වා ඇත.)

ඇමුණුම් 1, 2, 3, 4, 5, 6 සහ 7 **සභාගත*** කරමි.

(iii) එම ස්ථානයේ තිබෙන ඒ පරණ සිද්ධස්ථානය - පල්ලිය- විවෘත කළොත්, ඉහතින් කී බාධා ඉස්මතු වෙනවා. කෙසේ වෙතත්, ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍ය ගරු මුනීර් මුලාෆර් මැතිතුමා මේ වන විටත් එම ස්ථානය නිරීක්ෂණය කරලා, එම පල්ලියේ නියෝජිතයන් සමඟ සාකච්ඡා කළා. ඒ වාගේම දැන් අපි Prisons Department එක සමඟත් මේ සම්බන්ධව සාකච්ඡා කරමින් ඉන්නවා. Prisons Department එකට අයත් තවත් පර්චස් පහක පමණ ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා. ඒ අනුව ප්‍රවේශ වීමේ අපහසුතා නොමැති, ආරක්ෂාවට තර්ජනයක් නොවන ආකාරයේ බිම්කඩක් හඳුනාගෙන තිබෙනවා. මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා සමඟ සාච්ඡා කළ පාලනාධිකාරියට, ඒ පල්ලියේ නියෝජිතයන්ට අපි දැනුම් දීලා තිබෙනවා, මේ සම්බන්ධව නිල වශයෙන් අපෙන් ඉල්ලීමක් කරන්න කියලා. ඉන් පසු ඒ අලුත් ස්ථානය ඔවුන්ට ලබා දීමට ඇති හැකියාව සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරනවා. මොකද, ඒ ප්‍රදේශයේ පුද්ගලයන් කාලයක් තිස්සේ එතැනට ගිහිල්ලා තිබෙන නිසා.

නමුත්, ආරක්ෂාව නිසා පැරණි පල්ලියට යන්න අවස්ථාව දෙන්න බැහැ. දෙවැනි තත්ත්වය, ඉදිරියට සාකච්ඡා කරගෙන යනවා.

(ආ) අදාළ නොවේ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ආරක්ෂාව කියන කාරණාව මත, පරණ දේවස්ථානයට යෑමට ඉඩ ලබා දීමට හැකියාවක් නොමැති බව ඔබතුමන්ලා කියනවා. පර්චස් 5ක ඉඩම් ප්‍රමාණයක් ලබා දීමක් ගැනත් ඔබතුමා සඳහන් කළා. පර්චස් 5ක් ලබා දුන්නාම නැවත ප්‍රශ්නයක් ඇති වනවා. මොකද, එම පර්චස් පහේ පල්ලිය හැදුවාම සිකුරාදාට පල්ලියට එන වාහන නවත්වන්න වෙන්නේ පාරේ. එතකොට තවත් ප්‍රශ්නයක් නිර්මාණය වනවා. ඒ නිසා හැකියාවක් තිබෙනවාද, මේ ප්‍රශ්නය විසඳීමට රජයේ මැදිහත්වීමක් ලබා දෙන්න? ඒ අය ඉඩමක් මිලදී ගෙන ඒ අයම construction එක කරාවි, රජයෙන් ආධාර බලාපොරොත්තු නොවී. මොකද, ඒකට donorsලා ඉන්නවා, කැමැත්ත ප්‍රකාශ කළ අය ඉන්නවා. වැඩි ඉඩ ප්‍රමාණයක් ගත්තාම, වාහන parking එකකුත් දැම්මාම නැවත සිංහල-මුස්ලිම් අනවබෝධයක් ඇති නොවෙන්න පුළුවන්. ඒ නිසා රජයේ මැදිහත්වීමෙන් ඒක කරලා දෙන්න පුළුවන්ද? රජයේ වියදමින් නොවෙයි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමනි, මට මේ නිශ්චිත මොහොතේ කථා කරන්න පුළුවන්කම තිබෙන්නේ ඒ පර්චස් 5 ගැන විතරයි. මක්නිසාද යත්, එය අධිකරණ අමාත්‍යාංශයට අයත් භූමියක් නිසා. නමුත්, ඔබතුමා කියන්නා වූ ප්‍රශ්නය සම්බන්ධයෙන් අපට එතැන feasibility එක පොඩ්ඩක් බලන්න වෙනවා. මොකද, ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය කියන්නේම ජාතීන් අතර සහයෝගය ඇති කිරීම සම්බන්ධයෙන් වගකීමක් තිබෙන අමාත්‍යාංශයක්. ඒ වගකීමත් මගේ අමාත්‍යාංශයට පැවරී තිබෙනවා. ඒ නිසා අදාළ නිල ඉල්ලීම ලැබුණාට පසුව ඔවුන්ගේ අවශ්‍යතාව ඉෂ්ට වන ආකාරයට යම් කරුණක් වෙනුවෙන් මැදිහත් වෙන්න අපට පුළුවන්. මේ නිශ්චිත මොහොතේ ඒ මැදිහත්වීම කොහොම කරනවාද කියන්න අමාරුයි. නමුත්, මගේ අමාත්‍යාංශයේ වපසරියට අයත් දෙයක් නේ, ජාතික සහයෝගීතාව ඇති කිරීම. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඒකට අත ගහන්න පුළුවන් කියන එක තමයි මගේ උත්තරය.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දෙවැනි අතුරු ප්‍රශ්නයක් අහන්නේ නැහැ. ගරු ඇමතිතුමාගෙන් පොඩි ඉල්ලීමක් කරන්න තිබෙනවා. ගරු ඇමතිතුමනි, පසුගිය කාලයේ අත්දැකීම් අරගෙන බැලුවාම, ඉතා කුඩා ප්‍රදේශයක පල්ලියක් තිබුණාම සිකුරාදා දේව මෙහෙය තිබෙනකොට පිට අයත් එන නිසා වාහන නවත්වන්න ඉඩක් නැතිවනවා. ඕකෙන් තමයි ප්‍රශ්න ගොඩක් ආරම්භ වුණේ. අපි ඒක දැකලා තිබෙනවා. ඔබතුමාට මේ සඳහා නිශ්චිත උත්තරයක් දැන් දෙන්න බැරි බව මට තේරෙනවා. නමුත්, ප්‍රතිපත්තිමය එකඟතාවක් දෙන්න. මොකද, ඉඩම ගන්නත් donorsලා ඉන්නවා; දේවස්ථානය හදන්නත් donorsලා ඉන්නවා. රජයට අයිති ඉඩමක නේ, ඒ දේවස්ථානය තිබුණේ. ඒ නිසා මේ සම්බන්ධව රාජ්‍ය මැදිහත්වීම ලබා දෙන්න කියන ඉල්ලීම විතරයි මා කරන්නේ.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
අනිවාර්යයෙන්ම ඒ ගැන සලකා බලන්නම්. මොකද, අපි මනුෂ්‍යයන්ගේ ආගම ඇදහීමේ නිදහසට සම්පූර්ණයෙන්ම සහයෝගය දක්වන රජයක්. ඒ නිසා තිබෙන තත්ත්වය අනුව, කරන්න පුළුවන් උපරිම මැදිහත්වීම මේ සම්බන්ධව අපි කරනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Bimal Rathnayake?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, අද තුනෙන් දෙකක ඡන්දයක් ගන්නා පනත්

[ගරු බිමල් රත්නායක මහතා]

කෙටුම්පතකුත් සම්මත කරන්න තිබෙනවා කියන කාරණය. අපි පෙරවරු 11.00 දක්වා විතරයි වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා කාලය වෙන් කර තිබෙන්නේ. ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, කාලය කළමනාකරණය කරන්න කියලා. මොකද, අපේ කථිකයන්ට ගොඩක් කරුණු පැහැදිලි කරන්න තිබෙනවා. ඒ නිසා අතුරු ප්‍රශ්න සඳහාත්, පිළිතුරු ලබා දීම සඳහාත් නිසි පරිදි කාලය කළමනාකරණය කරන්න. වාචික පිළිතුරු අපේක්ෂා කරන තව ප්‍රශ්න තුනක් ඇසීමට නියමිතව තිබෙනවා.

උප පොලිස් පරීක්ෂක තනතුර: බඳවා ගැනීම
உப பொலிஸ் பரிசோதகர் பதவி: ஆட்சேர்ப்பு
POST OF SUB-INSPECTOR OF POLICE: RECRUITMENTS

443/2025

8. ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) උප පොලිස් පරීක්ෂක තනතුරට බඳවා ගැනීම සඳහා පසුගිය කාලයේදී සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබේද;

(ii) එසේ නම්, එම සම්මුඛ පරීක්ෂණවලින් සමත් වූ සංඛ්‍යාව කොපමණද;

(iii) උප පොලිස් පරීක්ෂක තනතුරට බඳවා ගනු ලබන සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට එම තනතුර සඳහා බඳවා ගැනීම නතර කර තිබේද;

(v) නොඑසේ නම්, උප පොලිස් පරීක්ෂක තනතුර සඳහා බඳවා ගනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உப பொலிஸ் பரிசோதகர் பதவிக்கு ஆட்சேர்ப்பதற்கு அண்மைக் காலத்தில் நேர்முகப் பரீட்சைகள் நடாத்தப்பட்டுள்ளனவா என்பதை யும்;

(ii) அவ்வாறாயின், மேற்படி நேர்முகப் பரீட்சைகளில் சித்தியடைந்தவர்களின் எண்ணி க்கை எத்தனை என்பதையும்;

(iii) உப பொலிஸ் பரிசோதகர் பதவிக்கு ஆட்சேர்க்கப்படும் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iv) இன்றளவில் மேற்படி பதவிக்கான ஆட்சேர்ப்பு நிறுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(v) இன்றேல், உப பொலிஸ் பரிசோதகர் பதவிக்கு ஆட்சேர்க்கப்படும் திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) whether interviews have been conducted recently for recruitment for the post of Sub-Inspector of Police;

(ii) if so, the number of candidates who have passed the aforementioned interviews;

(iii) the number of those that will be recruited for the post of Sub-Inspector of Police;

(iv) whether the recruitment process for the post concerned has been currently suspended; and

(v) if not, the date on which the recruitments will be made for the post of Sub-Inspector of Police?

(b) If not, why?

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) අයදුම්කරුවන් 2,650යි.

(iii) 100යි.

(iv) තාවකාලිකව නතර කර ඇත.

සියලුම අයදුම්කරුවන් ලබා ගත් ලකුණු අවරෝහණ ක්‍රමයට එකතු කර සකස් කරන ලද ප්‍රමුඛතා ලේඛනයට අනුව වැඩිම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් සම්බන්ධයෙන් පසුබිම් පරීක්ෂණ හා වෛද්‍ය පරීක්ෂණ සිදු කර සුදුසුකම් සහිත 100දෙනා තෝරා ගෙන ඇති අතර මේ පිළිබඳව අයදුම්කරුවන් කිහිපදෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන්, අනුමත බඳවා ගැනීම් පටිපාටියේ 7.2.4.5.2හි සටහන 03ට අනුව පත් කිරීමේ බලධාරියා වන පොලිස්පති විසින් කමිටුවක් පත් කිරීමට කටයුතු කර ඇත. සටහන 03 ඇමුණුම වශයෙන් **සභාගත*** කරමි.

(v) ඉහත දක්වන ලද කමිටුවේ නිර්දේශ ලද පසු කඩිනමින් බඳවා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු කරමි.

(ආ) පැන නොනඟී.

සභාමේසය මත තබන ලද ඇමුණුම:
** சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
** Annex tabled:*

සටහන 03 : අයදුම්කරුවෙකු/අයදුම්කාරියකගේ අයහපත් පසුබිම් වාර්තා මත ඔහු/ඇය බඳවා ගැනීම සඳහා සුදුසු/නුසුදුසු වන්නේද යන්න තීරණය කිරීම පත්කිරීම් බලධාරියා විසින් කළ හැකිය. එසේ වුවද, අයදුම්කරුවෙකු අයදුම්කාරියක විසින් බඳවා ගැනීම ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අභියාචන ඉදිරිපත් කරන අවස්ථාවක පත්කිරීම් බලධාරියා විසින් පත් කරන ලද කමිටුවක නිර්දේශය මත බඳවා ගැනීම, පත් කිරීම් බලධාරියාට තීරණය කළ හැකිය.

7.2.4.5.3. අයහපත් පසුබිම් වාර්තා නොමැති අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පමණක් වෛද්‍ය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

7.2.4.5.4. බඳවා ගැනීමේදී අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු/ඇය බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බවට බඳවා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් ඕනෑම අවස්ථාවකදී සේවයෙන් ඉවත් කරනු ලැබේ.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධව දැනට සමාජයේ වෙනම කතිකාවක් හා මහජන ආරක්ෂක අමාත්‍යතුමා වශයෙන් ඔබතුමා ගැන වැරැදි අවබෝධයක් තිබෙනවා. මොකද, මේ ගැසට් පත්‍රය නිකුත් කළේ 2024.03.28වැනි දා, යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වූයේ 2024.05.29වැනි දා, විභාගය පැවැත්වූයේ 2024.06.15වැනි දා, අවසන් සම්මුඛ පරීක්ෂණය පැවැත්වූයේ 2024.07.30වැනි දා, වෛද්‍ය පරීක්ෂණය පැවැත්වූයේ 2024.09.11වැනි දා, මත් ද්‍රව්‍ය පිළිබඳ පරීක්ෂණය පැවැත්වූයේ 2024.10.24වැනි දා, පත්වීම් ලබා දීම 2024.11.20වැනි දා වශයෙන් තමයි තිබුණේ. උප පොලිස් පරීක්ෂකවරුන් - SIs - බඳවා ගැනීමට අයදුම්කරුවන් 18,000ක් applications දාලා තිබුණා. එයින් 6,000ක් විභාගය සඳහා තෝරා ගත්තා. විභාගය සමත් කියලා 3,000ක් ඉදිරිපත් වුණා. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් හා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගෙන් යුත් කමිටුවක් පත් කරලා තමයි මේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වූයේ. මේ වෙනුවෙන් interviewsවලට ශ්‍රී ලංකා පොලීසිය විශාල මුදලක් වියදම් කරලා තිබෙනවා. මේ පත්වීම් දෙන්න තිබුණේ 2024 වර්ෂයේ නොවැම්බර් මාසයේ. ඒ වෙනකොට ඒ ළමයි ඇඳුම් අරගෙන සූදානම් වෙලා හිටියේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් හිටපු SI කෙනෙක් නේ. ඔබතුමා දන්නවා, training එකට යනකොට මොනවාද ගෙනියන්න ඕනෑ ඇඳුම් කියලා. ළමයි ඒ ඔක්කොම සූදානම් කරගෙන හිටියේ. ඒ ළමයි කරපු රක්ෂාවලිනුත් ඉවත් වෙලා තමයි, මේ තනතුර භාර ගන්න සූදානම් වෙලා ආවේ.

අනෙක් එක තමයි, 500ක් බඳවා ගන්නවා කියලා දැන් බඳවා ගන්නේ සියදෙනායි. හැබැයි, මේ වෙනකොට ඒ අය බඳවා ගෙන නැහැ. නමුත්, ඔබතුමා මේක අවලංගු කරලා, අලුත් ගැසට් පත්‍රයක් නිකුත් කරලා අලුත් විභාගයට යන්න කටයුතු කරනවා, ඒ නිසා එම විභාගයට තේරුණු ළමයින්ට නැවත ඉල්ලුම් කරන්නය කියලා තිබෙනවා. ඒ හැමෝටම දුරකථන ඇමතුමක් දීලා තිබෙනවා. මේක රජයට, රටට කරන ලොකු පාඩුවක්.

ඔබතුමා ජනාධිපතිතුමාගේ ළඟම නියෝජිතයා. හැබැයි, ජනාධිපතිතුමාගේ විශ්වාසවන්තම කෙනා මේ වාගේ දෙයක් කළොත්, ඒක ජනාධිපතිතුමාටත් හොඳ නැහැ; රටටත් හොඳ නැහැ.

ගරු සභානායකතුමනි, මම කියන මේ කාරණය අහගන්න. මේ රටේ දරුවෝ applications දමලා, එයින් 6,000ක් විභාගය සඳහා තෝරා ගෙන 3,000ක් විභාගය සමත් වුණා. Medical testවලට ගිහිල්ලා ඔක්කෝම කරලා ඉවර වුණාට පස්සේ මේ හේතුව නිසා ඒ සියදෙනාගේ බලාපොරොත්තු කඩ වෙනවා. ඔවුන්ගේ බලාපොරොත්තු කඩ කරන්න එපා, ඇමතිතුමා. ඇමතිතුමාට අලුතින් සියදෙනෙක් බඳවා ගන්න ඕනෑ නම්,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Chamara Sampath Dasanayake, make your Supplementary Question brief, please.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මටත් මේ ගැන කියන්න පොඩි අවස්ථාවක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම වැඩිය ප්‍රශ්න අහන්නේ නැහැ. එක අතුරු ප්‍රශ්නයයි මම අහන්නේ. ඊට වැඩිය අහන්නේ නැහැ. මේක අද රටේ ජනතාව කථා කරන ප්‍රශ්නයක්. මේ සියදෙනා බඳවා ගන්න තිබෙන ප්‍රශ්නය මොකක්ද? මේ පොලිස් දෙපාර්තමේන්තුව නොවෙයි ද ඒ වෙලාවේ තිබුණේ? මේ නියෝජ්‍ය පොලිස්පති නොවෙයිද ඒ වෙලාවේ හිටියේ? ඒ වෙලාවේ හිටියේ මේ මහජන ආරක්ෂක ඇමති නොවෙයිද? මේ සියදෙනා පිළිබඳ ප්‍රශ්නය මොකක්ද කියන එක තමයි මම අහන්නේ. ඒ නිසා ඔබතුමා මේ සියදෙනා බඳවා ගන්න. ඒ අයව බඳවාගෙන ඕනෑ නම් Cabinet Paper එකක් දාලා තව 500ක් බඳවා ගන්න. තව 400ක් සිටියදී තමයි මේ සියදෙනා බඳවා ගන්න කටයුතු කරලා තිබෙන්නේ. ඒ නිසා මේ සියදෙනාගේ ප්‍රශ්නය විසඳන්න. මොකද, අවුරුදු 70කට පස්සේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව විශ්වාස කරලා තමයි මේ ළමයි විභාගවලට පෙනී හිටියේ. දැන් මේ සියදෙනා බඳවා ගන්න. මේක අවලංගු කරන්න එපා. ඒ වාගේම නැවත විභාගයක් පවත්වන්න එපා. හැබැයි, එහෙම මේක අවලංගු කළොත් මම ඉස්සෙල්ලා කිව්වා වාගේ ඔබතුමාටත් ජම්පරය අඳින්න වෙයි. මොකද, මේවා රජයේ මුදල්. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. රජයේ මුදල් මේ interviewsවලට වියදම් කරලා තිබෙනවා. ඒක විශාල මුදලක්. ඔබතුමායි, වැඩබලන පොලිස්පතිතුමායි, interviews භාරව ඉන්න නියෝජ්‍ය පොලිස්පතියි කියන සියලුදෙනාටම මේවාට වග කියන්න වෙනවා. *[බාධා කිරීමක්]* පත්වීම් දෙන්න එන්න කියලා ඒවා දෙන්නේ නැති එක වැරැදියි නේ, පොලීසිය භාර ඇමතිතුමා.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මේ බඳවා ගැනීම් සම්බන්ධයෙන් පැමිණිලි රාශියක් ලැබිලා තිබුණා. මේ වෙනකොට ඒ සම්බන්ධව කමිටුවක් පත් කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු කාරණා බොහොමයක් වැරැදියි. ඒක අහෝසි කරලාය කියලා මම කිසිම කෙනෙකුට කියලා නැහැ. SIs බඳවා ගැනීමේ ගැසට් නිවේදනයක් දැනටත් නිකුත් වෙලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, මට පැහැදිලි කරන්න පොඩ්ඩක් ඉඩ දෙන්නකෝ. එතකොට ඒ විභාගයෙන් සියදෙනා බඳවා ගැනීම පිළිබඳව කමිටු වාර්තාව ලැබුණාට පස්සේ තීන්දුවක් ගන්නවා. ඒක අවලංගු කිරීමක් කරලා නැහැ. අලුතින් බඳවා ගැනීම සඳහා ගැසට් නිවේදන නිකුත් කරලා, ඒ සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වනවා. ඒක අමතරව සිදු වෙනවා. ඔබතුමා කිව්වා වාගේ ඒක අමතර කාරණයක්. යම් කෙනෙක් දුරකථන ඇමතුමක් දුන්නාම, ඔබ බඳවා ගන්නවාද, නැද්ද කියලා ඒ කමිටුවේ වාර්තාව එනකල් මට කියන්න බැහැ. ලැයිස්තු හදද්දි 2,650ක් තමයි විභාගයෙන් සමත් වෙලා තිබෙන්නේ. ඒ 2,650න් තමයි බඳවා ගන්න සියදෙනෙක් තෝරාගෙන තිබෙන්නේ. ඒ සම්බන්ධව ලැබුණු පැමිණිලි තමයි දැන් පොලිස්පතිවරයා විසින් කමිටුවකට යොමු කර තිබෙන්නේ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. මේක පසුගිය ආණ්ඩුව කාලයේ පවත්වපු සම්මුඛ පරීක්ෂණය. නමුත් ඒ වුණාට අපි,-

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ආණ්ඩු මාරු වුණා,-

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ඒක තමයි කියන්නේ. ආණ්ඩු මාරු වුණා කියලා අපි ඒ කටයුත්ත නතර කරලා නැහැ. *[බාධා කිරීමක්]* ආණ්ඩු මාරු වුණා කියලා ඒ කටයුත්ත නතර කරලා නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ පිළිබඳව කමිටු වාර්තාව ලැබුණාට පස්සේ ඔවුන් බඳවා ගැනීම සඳහා කඩිනමින් පියවර ගන්නවා.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එක අතුරු ප්‍රශ්නයයි නේ අහනවා කිව්වේ. *[බාධා කිරීම්]*

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු මන්ත්‍රීතුමනි, කමිටු වාර්තාව ලැබුණාට පස්සේ ඒ කට්ටිය බඳවා ගන්න කටයුතු කරනවා.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
බඳවා ගත්තේ නැත්නම් ඔබතුමා,-

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
නැහැ, නැහැ. *[බාධා කිරීමක්]* ඒක කමිටු වාර්තාව මත තීන්දු වෙන්නේ. *[බාධා කිරීම්]* ඒක ඔබතුමාට කියන්න බැහැ. ඒක කමිටු වාර්තාව අනුව තීන්දු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Now, could we move on to the next Question, please? The Hon. Kins Nelson. *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එක අතුරු ප්‍රශ්නයයි අහන්නේ කියලා තමයි පටන් ගත්තේ.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා,- [බාධා කිරීම්] අතුරු ප්‍රශ්න,- [බාධා කිරීම්]

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු මන්ත්‍රීතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න මට අවස්ථාව දීලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි,

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මම එක අතුරු ප්‍රශ්නයයි ඇහුවේ.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු මන්ත්‍රීතුමා මට අවස්ථාව දුන්නා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කරුණාකරලා මට ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chamara Sampath Dasanayake started asking his Supplementary Question by saying, "I am going to ask only one Supplementary Question."

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මට අතුරු ප්‍රශ්න දෙකක් අහන්න පුළුවන්. ඒ නිසා ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාට දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න අවස්ථාව ලබා දෙන්න.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මම අහන්නේ එතුමාගේ ප්‍රශ්නයට අදාළව අහන දෙවැනි අතුරු ප්‍රශ්නය.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. Hon. Ranjith Madduma Bandara, make your Supplementary Question brief.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, ගම්වල සිදු වන අපරාධ, හොරකම්, මිනී මැරුම් වළක්වන්න ආරක්ෂක කමිටු පිහිටෙව්වා කියලා. *[බාධා කිරීමක්]* මේ ආරක්ෂක කමිටු ඉතිහාසය පුරාම ස්වාධීනව තමයි පිහිටෙව්වේ. ඒ, ගමේ පන්සලේ හාමුදුරුවෝ, පල්ලියේ පූජකතුමා, ස්වාධීන සංවිධානවල කට්ටිය එකතු වෙලා. නමුත් දැන් පොලීසියට උපදෙස් දීලා තිබෙනවා, JVP; NPP සාමාජිකයෝ මේ ආරක්ෂක කමිටුවලට බඳවා ගන්න කියලා. මම හිතන විධියට, මේක පොලීසියේ තිබෙන ස්වාධීනත්වය,- *[බාධා කිරීමක්]* මේක ප්‍රසිද්ධ කරුණක්. ඕනෑම OIC කෙනෙකුගෙන් ඇහුවොත් ඒ ගැන කියයි. *[බාධා කිරීම්]* ඒගොල්ලන්ගේ ප්‍රධානත්වයෙන් ඒ කටයුත්ත කරන්න කියලා තිබෙනවා. ඒක සාමාන්‍ය දෙයක්. අපි අහන්නේ පොලීසියේ ස්වාධීනත්වයට තමුන්නාන්සේ,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, please make your Supplementary Question relevant to the original Question on the Order Paper.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
පොඩ්ඩක් මම කියන කාරණය අහගන්න. මේක පොලිසියේ ස්වාධීනත්වයට, රටේ ප්‍රජාතන්ත්‍රවාදයට ප්‍රශ්නයක්. මොකද, මේ ආණ්ඩුව පත් වුණු මේ කාල සීමාව ඇතුළත වෙඩි තැබීම් 68ක්, මිනී මැරුම් 37ක් සිද්ධ වෙලා තිබෙන බව අපි දන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නය විධියට මුල් ප්‍රශ්නයට අදාළ කාරණයක් අහන්න.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
රටේ ආරක්ෂාව නැහැ. ගරු ඇමතිතුමනි, ඊයේ පෙරේදා මගේ ගෙදරටත් කවුද දෙසැරයක් පැනලා ඔක්කොම අවුස්සලා ගිහිල්ලා. අපිටවත් ආරක්ෂාවක් නැහැ. අපි ඉල්ලන්නේ කරුණාකරලා මේ දේශපාලන ඇඟිලි ගැසීම් නවත්වන්න කියායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, please make your Supplementary Question relevant to the original Question.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
කරුණාකරලා තමුන්නාන්සේ මීට ඉස්සෙල්ලා තිබුණා වාගේ මේ කමිටු ස්වාධීනව පත් කරන්න අවස්ථාව දෙන්න. කවදාවත් ඉතිහාසයේ මේ වාගේ දේශපාලන ඇඟිලි ගැසීම්, ආරක්ෂක කමිටුවලට පත්වීම්,-

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහජන ආරක්ෂක කමිටු සකස් කිරීම සම්බන්ධයෙන් පොලිස්පතිවරයා විසින් චක්‍රලේඛයක් නිකුත් කරලා තිබෙනවා. ඒ චක්‍රලේඛය අනුව තමයි මහජන ආරක්ෂක කමිටු පත් කරන්නේ. මේවා කිසිසේත්ම දේශපාලනීකරණය කරලා නැහැ. එතුමා කිව්ව ඒ කථාව වැරැදියි. *[බාධා කිරීම්]* එතුමා කිව්ව ඒ කථාව වැරැදියි. ඒ චක්‍රලේඛය අනුව ඒවායේ තරුණ නියෝජනය සියයට 25කුත්, කාන්තා නියෝජනය සියයට 25කුත් තිබෙනවා. ග්‍රාම නිලධාරි තමයි කමිටුවේ ලේකම්වරිය හෝ ලේකම්වරයා වෙන්නේ.

ප්‍රජා පොලිස් සේවයේ නිලධාරියා තමයි එහි කැඳවුම්කරු කරන්නේ. ප්‍රදේශයේ කමිටු සඳහා අයදුම් කරන අයගෙන් ප්‍රදේශයේ පිළිගත් පුද්ගලයෙක් සභාපති හැටියට පත් කර ගන්නට පුළුවන්. මේවා කිසිසේත්ම දේශපාලනීකරණය කරලා නැහැ. ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අදාළව මම කියපු චක්‍රලේඛය අනුව තමයි මේ පත් කිරීම් කරන්නේ. මේ පිළිබඳව ඔබතුමා ඉදිරිපත් කරපු කාරණා මම ප්‍රතික්ෂේප කරනවා.

ගුවන් සේවා සපයන සමාගම්: ගෙවිය යුතු හිඟ මුදල්
விமான சேவைகளை வழங்கும் கம்பனிகள்: செலுத்தவேண்டிய நிலுவைத் தொகை
AIRLINES PROVIDING SERVICES: OUTSTANDING AMOUNTS

621/2025

9. ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවට ගුවන් සේවා සපයනු ලබන ගුවන් සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) මේ වනවිට එම ගුවන් සමාගම් විසින් සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමට සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට ගෙවීමට ඇති හිඟ ණය මුදල ඉහත එක් එක් ගුවන් සමාගම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම හිඟ ණය මුදල් අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைக்கு விமான சேவைகளை வழங்கும் விமானக் கம்பனிகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அத்தகைய கம்பனிகளின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) அந்த விமானக் கம்பனிகளால் இன்றளவில் வரையறுக்கப்பட்ட விமான நிலைய மற்றும் விமான சேவைகள் (ஸ்ரீலங்கா) கம்பனி மற்றும் இலங்கை சிவில் விமான சேவைகள் அதிகார சபைக்குச் செலுத்தவேண்டிய நிலுவைக் கடன் தொகை, மேற்படி விமானக் கம்பனி ஒவ்வொன்றுக்கும் இணங்க வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) அந்த நிலுவைக் கடன் தொகையை அறவிடுவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු කිංස් නෙල්සන් මහතා]

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Will he inform this House the -
 (i) number of airlines which provide aviation services to Sri Lanka;
 (ii) names of those airlines;
 (iii) current outstanding amounts of money owed by each of the airlines referred to above to the Airports and Aviation Services (Sri Lanka) Limited and to the Civil Aviation Authority of Sri Lanka separately; and
 (iv) steps to be taken to recover the said outstanding amounts?

(b) If not, why?

ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Janitha Ruwan Kodithuwakku - Deputy Minister of Ports and Civil Aviation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 2025.05.31 දින වන විට ශ්‍රී ලංකාවට ගුවන් සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය යටතේ ලියාපදිංචි ගුවන් සමාගම් සංඛ්‍යාව පහත පරිදි වේ.
 මගී/භාණ්ඩ මෙහෙයුම් - 28
 දේශීය ගුවන් සේවා - 06
 චාර්ටර් මෙහෙයුම් - 03

(ii)

මගී මෙහෙයුම්	චාර්ටර් මෙහෙයුම්	දේශීය ගුවන් සේවා
1. ඒරොෆ්ලොට් - රුසියා	1. අසූර් එයාර්	1. ෆිට්ස් එයාර්
2. එයාර් ඇරබියා	2. ඉරාන් එයාර් ටුවර්	2. සැෆ්රන් ඒවියේෂන් (පුද්ගලික) සමාගම
3. එයාර් ඇරබියා අබුඩාබි	3. රෙඩ් වින්ග්ස්	3. ලක්වින් ඒවියේෂන්
4. එයාර් ඒෂියා බර්හාඩ්		4. සෙනොක් ඒවියේෂන් (පුද්ගලික) සමාගම
5. එයාර් චයිනා		5. ඩීපී ඒවියේෂන් (පුද්ගලික) සමාගම
6. එයාර් ඉන්දියා		
7. එයාර් සීෂෙල්ස්		
8. කැතේ පැසිෆික් එයාර්වේස්		
9. චයිනා ඊස්ටර්න් එයාර්ලයින්ස්		
10. චොන්ග්කුවින්ග් එයාර්ලයින්ස්		
11. ඒඩල්වයිස් එයාර්		
12. එමිරේට්ස්		
13. එතිහාඩ් එයාර්වේස්		
14. ෆිට්ස් ඒවියේෂන්		
15. ෆ්ලයිඩුබායි		
16. ගල්ෆ් එයාර්		
17. ඉන්ඩිගෝ ගුවන් සේවය		
18. ජසීරා එයාර්වේස්		
19. ජේ එස් සී රෙඩ් වින්ග්ස්		
20. ජෙස්ටර් ඒසියා එයාර්වේස්		
21. මැලේසියා ගුවන් සේවය		
22. කටාර් එයාර්වේස්		
23. සලාම් එයාර්		
24. සිංගප්පූරු ගුවන් සේවය		
25. ශ්‍රීලංකන් ගුවන් සේවය		
26. තායි එයාර් ඒෂියා		
27. තුර්කි ගුවන් සේවය		
28. තායි එයාර්වේස්		

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නයේ ඉතිරි කොටස්වලට දීර්ඝ පිළිතුරු තිබෙන්නේ. එම නිසා පිළිතුරේ ඉතිරි කොටස මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුරේ ඉතිරි කොටස:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடையின் எஞ்சிய பகுதி:*
** Rest of the Answer tabled:*

(iii) එක් එක් ගුවන් සමාගම විසින් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙත ගෙවිය යුතු අපගමන බද්දේ 2025.05.31 පවතින බදු මුදල සහ එදිනට අදාළ වන පොලිය පහත පරිදි වේ.

	ගුවන් සමාගමේ නම	අපගමන බද්ද (රු.)	අදාලවන පොලිය (රු.)	මුළු මුදල (රු.)
1	ශ්‍රීලන්කන් ගුවන් සේවය	20,681,865,921.78	3,973,526,991.68	24,655,392,913.46
2	එයාර් ඒෂියා බර්හාඩ්	83,240,539.13	5,581,622.39	88,822,161.52
3	ඒරොෆ්ලොට් - රුසියා	381,958,485.00	126,788,670.47	508,747,155.47
4	එයාර් ඉන්දියා	-	57,587,313.10	57,587,313.10
5	තායි එයාර් ඒෂියා	208,342,227.17	13,475,984.88	221,818,212.05
6	ෆිට්ස් ඒවියේෂන්	1,740,699,318.44	386,037,402.62	2,126,736,721.06
එකතුව		**23,096,106,491.52**	**4,562,997,985.14**	**27,659,104,476.66**

	ගුවන් සමාගමේ නම	අපගමන බද්ද (ඇ.ඩො.)	අදාලවන පොලිය (ඇ.ඩො.)	මුළු රු. (ඇ.ඩො.)
1	ඒරොෆ්ලොට් - රුසියා *	1,283,520.00	149,796.21	1,433,316.21
2	රොසියා ගුවන් සේවය	50.00	86,699.11	86,749.11
එකතුව		**1,283,570.00**	**236,495.32**	**1,520,065.32**

*ඒරෝෆ්ලෙට් - රුසියා ගුවන් සමාගම විසින් අදාල බදු මුදල් මීට ඉහත රුපියල් වලින් ගෙවා ඇති අතර, ඉන් පසු ඇ.ඩො.වලින් ගෙවීම සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරියේ විශේෂ අනුමැතියක් ලබා ගෙන ඇත.

ගුවන් තොටුපළ සහ ගුවන් සේවා ශ්‍රී ලංකා (පුද්ගලික) සමාගම

ඉහත සඳහන් සමාගම් සඳහා ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සමාගම වෙත 2025.06.30 දිනට ගෙවිය යුතු එහෙත් මෙතෙක් ගෙවා නොමැති මුදල් එක් එක් ගුවන් සමාගම අනුව පහත පරිදි වේ.

i. ජාත්‍යන්තර ගුවන් සේවා

	ගුවන් සමාගමේ නම	හිඟ මුදල	
		ඇ.ඩො	රුපියල්
1	එයාර් අරාබියා අබුඩාබි එල්එල්සී	38	
2	එයාර් අරාබියා ගුවන් සේවය	211	-
3	එයාර් චීනය සීමාසහිත	3,444	54
4	එයාර් ග්ලෝබල් පුද්ගලික සමාගම සී/ඕ රෆා	-	675,059
5	එයාර් ඉන්දියා සමාගම	3,399	14,724
6	එයාර් සීෂෙල්ස් සමාගම	1,761	-
7	එයාර් ඒෂියා බර්හාඩ්	-	1,855
8	කැතේ පැසිෆික් ගුවන් සේවය සමාගම	828	112,517
9	චීන නැගෙනහිර ගුවන් සේවය සමාගම	33	-
10	ඩුබායි ගුවන් සේවය	14,074	43,855
11	එමිරේට්ස් ගුවන් සේවය	167,194	82,574
12	එතිහාඩ් ගුවන් සේවය	2,034	13,114
13	ෆිට්ස් ගුවන් සේවය (පුද්ගලික සමාගම)	140,546	7,061,454
14	ගල්ෆ් ගුවන් සේවය	6,848	-
15	ඉන්ටර්ග්ලෝබ් ගුවන් සේවය සමාගම(ඉන්ඩිගෝ)	52,744	33,307
16	ජසීරා ගුවන් සේවය කේ.එස්.සී.පී.	5,707	-
17	මැලේසියා ගුවන් සේවය බර්හාඩ්	8,862	21,397
18	කටාර් ගුවන් සේවය	4,978	26,331
19	සලාම් එයාර්	9,451	26,282
20	සවුදි අරාබි ගුවන් සේවා	1,141	21,863
21	සිංගප්පූරු ගුවන් සේවා සමාගම	18,451	1,320
22	ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගම	6,931,640	5,388,488
23	තායි ගුවන් සේවා සමාගම: රාජ්‍ය සමාගම: සමාගම,	6,156	576
24	තායිඒෂියා සමාගම	5,382	-
25	තුර්කි ගුවන් සේවා සමාගම	30,118	11,491
	ජාත්‍යන්තර ගුවන් සේවා සමාගම වෙතින් ගෙවිය යුතු මුළු ගාස්තු	**7,415,038**	**13,536,260**

	සාරාංශය		
	ශ්‍රී ලංකන් ගුවන් සේවය - 93%	6,931,640	5,388,488
	අනෙකුත් ගුවන් සේවා - 7%	483,398	8,147,772
	ජාත්‍යන්තර ගුවන් සේවා සමාගම් වලින් ලැබිය යුතු මුළු මුදල	**7,415,038**	**15,536,260**

ii. ජාත්‍යන්තර ගුවන් සේවා සඳහා හැසිරවීමේ නියෝජිතයන්

	ගුවන් සමාගමේ නම	හිඟ මුදල (ඇ.ඩො)
1	කෙයාර් ඒවියේෂන් (පුද්ගලික) සමාගම	345
2	සිලෝන් ඒවියේෂන් ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම	71
3	කොළඹ හැන්ඩ්ලින් (පුද්ගලික) සමාගම	-
4	ෆිට්ස් ට්‍රිප් සපෝර්ට් සර්විසස් (පුද්ගලික) සමාගම	14
5	සෙරන්ඩිබ් එයාර්වේස් ඇන්ඩ් එයාර්පෝර්ට් සර්විසස් (පුද්ගලික) සමාගම	-
	හැසිරවීමේ නියෝජිතයන්ගෙන් ලැබිය යුතු මුළු මුදල	430

iii. දේශීය ගුවන් සේවා

	ගුවන් සමාගමේ නම	හිඟ මුදල	
			රුපියල්
1	සැෆ්රන් ඒවියේෂන් (පුද්ගලික) සමාගම		7,845,682
2	සකුරායි ඒවියේෂන් (පුද්ගලික) සමාගම		487,940
3	ලක්වින් ඒවියේෂන් (පුද්ගලික) සමාගම		1,212,750
4	ඔපෙන්ස්කිස් ෆ්ලයිට් ට්‍රේනින් ප්‍රයිවට් ලිමිටඩ්		1,390,702
5	රෙඩ් බර්ඩ් ඒවියේෂන් (පුද්ගලික) සමාගම		2,495,411
6	සෙනොක් ඒවියේෂන් (පුද්ගලික) සමාගම		39,784
7	ඩේවිඩ් පීරිස් ඒවියේෂන් (පුද්ගලික) සමාගම		337,805
8	ආසියානු ගුවන් සේවා මධ්‍යස්ථානය (පුද්ගලික) සමාගම		5,164,011
9	දයා ඒවියේෂන් (පුද්ගලික) සමාගම		1,875,008
10	ෆ්ලයි සදර්න් (පුද්ගලික) සමාගම		7,351,757
	දේශීය ගුවන් සේවා සමාගම් වලින් ලැබිය යුතු මුළු මුදල		**28,200,851**

(iv) 1. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

- 2022 සිට, අපගමන බද්ද නොගෙවීම සම්බන්ධයෙන් සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) ගුවන් සමාගම් සමඟ අඛණ්ඩව පසු විපරම් කරමින් සිටී. මෙය විද්‍යුත් තැපැල, නිල ලිපි සහ රැස්වීම් හරහා සිදු කර ඇත.
- CAASL මෙම කාරණය රේඛීය අමාත්‍යාංශය හරහා මුදල් අමාත්‍යාංශයට නිරන්තරයෙන් දැනුම් දී ඇත.
- හිඟ මුදලින් කොටසක් අයකර ගැනීම සඳහා, පැහැර හරින ලද ගුවන් සමාගම් කිහිපයක් සඳහා පැවැති බැංකු ඇපකර මුදල් බවට පත් කර ඇත.
- අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, දින හතක් ඇතුළත හිඟ මුදල් පියවන ලෙස ඉල්ලා 2024 මැයි 20වන දින අදාළ ගුවන් සමාගම් වෙත අවසන් මතක් කිරීම් නිකුත් කරන ලදී.
- අපගමන බද්ද අය කර ගැනීමට අධිකාරිය විසින් පරිපාලනමය වශයෙන් ගත හැකි සියලුම ක්‍රියාමාර්ග ගත්තද අය විය යුතු මුදල අය කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධිකාරියට ඇති බලය නිශ්චය කර ගැනීමට සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය, ගරු නීතිපතිවරයාගෙන් උපදෙස් ලබා ගන්නා ලදී. සිවිල් ගුවන් සේවා අධිකාරි පනත අනුව ඒ සම්බන්ධයෙන් ප්‍රතිපාදන නොමැති බව ගරු නීතිපතිවරයා විසින් දන්වන ලදී. තවද, 2003 වර්ෂයේදී සංශෝධනය වන අවස්ථාවේ අදාළ ප්‍රතිපාදන ඉවත් කර ඇති බැවින් 2003 අංක 25 දරන මුදල් පනතෙහි ද ඒ සම්බන්ධයෙන් ප්‍රතිපාදන නොමැති බව වැඩිදුරටත් දන්වා ඇත.

  ඒ අනුව, සිවිල් ගුවන් සේවා අධිකාරිය, මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සමඟ නැවත මූල්‍ය පනතට එම ප්‍රතිපාදන ඇතුළත් කිරීමට කටයුතු කරගෙන යමින් පවතින අතර අමාත්‍ය මණ්ඩල සංදේශයක් කෙටුම්පත් කර ඇත.

2. ගුවන් තොටුපළ සහ ගුවන් සේවා ශ්‍රී ලංකා (පුද්ගලික) සමාගම

- සමාගමේ ණය ප්‍රතිපත්තියට අනුව, ගුවන් සමාගම් විසින් ලබා ගන්නා ලද සේවාවන් සඳහා ගෙවීම සහ වාහන නැවැත්වීම, ගුවන් පාලම් ගාස්තු, කුලී සහ උපයෝගිතා ආදිය සඳහා හිඟ මුදල් අයකර ගැනීමට සුරැකුම්පත් තිබේ. තවද, ගුවන් තොටුපළ සහ ගුවන් සේවා ශ්‍රී ලංකා (පුද්ගලික) සමාගම විසින් රජයට අයත් ආයතනය සලකා බලා ගත් ප්‍රතිපත්තිමය තීරණයට අනුව ශ්‍රීලන්කන් ගුවන් සේවයෙන් කිසිදු සුරැකුම්පතක් ලබාගෙන නොමැත. හිඟ මුදල් අයකර ගැනීම සඳහා පැහැර හරින ලද ගුවන් සමාගමට යාවත්කාලීන කරන ලද ගිණුම් ප්‍රකාශ සමඟ නිතිපතා මතක් කිරීම් යවා ඇත.
- ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා නියාමකයා වන සිවිල් ගුවන් සේවා අධිකාරිය සමඟ කාලානුරූපව වාර්තා සහ ලිපි හුවමාරු කර ඇති අතර, ඒ හරහා දිගු කාලීනව ලැබිය යුතු හිඟ මුදල් අයකර ගැනීමට මැදිහත් වන ලෙස ඉල්ලා සිටී.
- අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රධාන පැහැර හරින ලද ගුවන් සේවා හිඟ මුදල් කිහිපයක් නීති අංශයට යොමු කර ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, SriLankan Airlines එක embarkation fee එක විධියට සිවිල් ගුවන් සේවා අධිකාරියට රුපියල් බිලියන 22කට ආසන්න මුදලක් ගෙවිය යුතුව තිබෙනවා. එම මුදල SriLankan Airlines එක උපයාගන්නා මුදලක් නොවෙයි. ලංකාවට ගුවන් යානා එනකොට, එම ගුවන් යානාවල සිටින මඟීන් එම මුදල ගෙවනවා. එම මුදල මේ රජයට ලැබෙන මුදලක්. රුපියල් බිලියන 22කට ආසන්න මුදලක් SriLankan Airlines එක Civil Aviation Authority එකට ගෙවන්න තිබෙනවා. රජයට ලැබිය යුතු එම මුදල ලබා ගන්න ඔබතුමන්ලා ගනු ලබන ක්‍රියාමාර්ගය මොකක්ද?

ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு)
(The Hon. Janitha Ruwan Kodithuwakku)

ගරු මන්ත්‍රීතුමා, ගෙවිය යුතුව තිබෙන සම්පූර්ණ ගණන් ටික මම කියන්නම්. SriLankan Airlines එක විතරක් රුපියල් මිලියන 24,655ක් ගෙවන්න තිබෙනවා. ඒ කියන්නේ රුපියල් බිලියන 24ක්. එයාර් ඒෂියා බර්හාඩ් රුපියල් මිලියන 88ක්, ඒරොෆ්ලොට් රුසියා රුපියල් මිලියන 508ක්, එයාර් ඉන්දියා රුපියල් මිලියන 57ක්, තායි එයාර් ඒෂියා රුපියල් මිලියන 221ක්, ෆිට්ස් ඒවියේෂන් රුපියල් මිලියන 2,126ක්. Embarkation levy එක විධියට සම්පූර්ණ වශයෙන් රුපියල් මිලියන 27,659ක් අය විය යුතුව තිබෙනවා. ඒ වාගේම ඒරොෆ්ලොට් රුසියා -රුසියා ගුවන් සේවය- ඩොලර්වලින් මිලියන 1.5ක් ගෙවන්න තිබෙනවා. මෙම මුදල කාලයක් තිස්සේ එකතු වෙමින් ආපු මුදල් ප්‍රමාණයක්. සිවිල් ගුවන් සේවා අධිකාරිය විධියට අපි දිගින් දිගටම අවශ්‍ය ලිපි සහ ඊ-මේල් හරහා මේ බව දැනුම් දීලා තිබෙනවා. ඒ වාගේම යම් කිසි ප්‍රමාණයක් recover කර ගැනීම සඳහා ඔවුන්ගේ bank guarantees ටික liquidate කරලා තිබෙනවා. නමුත් අපට ප්‍රශ්නයක් විධියට තිබෙන්නේ, Civil Aviation Act එකේ මේ සඳහා නීත්‍යානුකූලව කටයුතු කිරීමට අවශ්‍ය පහසුකම් නොමැතිකමයි. එම ප්‍රතිපාදන

[ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා]

ලබා ගන්න අපි Fiscal Policy Department එකට කථා කරලා Finance Act එක අධ්‍යයනය කළා. අපට මේ සඳහා නීත්‍යනුකූලව කටයුතු කරන්න අවශ්‍ය පහසුකම් Finance Act එකේත් නැහැ. ඒ නිසා මෙතැනින් එහාට යෑම සඳහා නීත්‍යනුකූල කටයුතු ටික කරන්න අවශ්‍ය ඉඩ කඩ හදාගන්න අපි දැන් Cabinet Paper එකක් prepare කරලා තිබෙනවා.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

හිඟුරක්ගොඩ අභ්‍යන්තර ගුවන් තොටුපළ ජාත්‍යන්තර ගුවන් තොටුපළක් ලෙස නවීකරණය කරන්න යන වියදම විධියට ඇස්තමේන්තු කරලා තිබෙනවා රුපියල් බිලියන 17ක්. 2024 අය වැයෙන් රුපියල් බිලියන 2ක් වෙන් කරලා තිබෙනවා. ඒ අනුව මේ වන විට runway එකේ වැඩ ආරම්භ කරලා තිබෙනවා. මෙම ගුවන් තොටුපළ නවීකරණය කරන්න මෙවර අය වැයෙන් වෙන් කරන්න බලාපොරොත්තු වෙන්නේ රුපියල් බිලියන 2ක්ද කියලා මම දැන ගන්න කැමැතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඒ විධියට රුපියල් බිලියන දෙක ගණනේ වෙන් කරන්න ගියොත් එහි සම්පූර්ණ නවීකරණ කටයුතු කරන්න අවුරුදු 10ක් විතර ගතවෙනවා.

ඔබතුමන්ලාගේ රජය මෙවර අය වැයෙන් මේ සඳහා කොපමණ මුදලක් වෙන් කරන්න බලාපොරොත්තු වෙනවාද? මේකේ වැඩකටයුතු අවසන් කරන්නේ කවදාද කියා නිශ්චිත දිනයක් තිබෙනවාද, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, make your answer short, please.

ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு)
(The Hon. Janitha Ruwan Kodithuwakku)
හරියට feasibility study එකක් කරන්නේ නැතිව, business plan එකකුත් නැතිව, සැලසුම් රහිතව තමයි මේ airport එක හදන්න plan කරලා තිබෙන්නේ. නමුත් මේ airport runway එක යම් කිසි මට්ටමකට හදලා තිබෙන නිසා ඉතිරි ටික අවසන් කරන්න අවශ්‍ය මුදල තමයි අපි ඔය වෙන් කරලා තිබෙන්නේ. ඊළඟ අවුරුද්දේ මේ ගැන හරියට feasibility study එකක් කරලා, මේක අවශ්‍යද නැද්ද කියා ශක්‍යතාව බලා තමයි අපට එතැනින් එහාට වැඩකටයුතු කරන්න වෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Question No. 10 - 1017/2025 - (1), the Hon. Chithral Fernando. - *[Not in the Chamber.]*

Second Round. Question No. 3 - 196/2024 - (1), the Hon. Nalin Bandara Jayamaha.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට අදාළව ආයතන ගණනාවකින් තොරතුරු එකතු කරගන්න තිබෙනවා. ඒ නිසා එම

ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

දේශීය සීනි නිෂ්පාදනය සහ ආනයනය: විස්තර
உள்நாட்டு சீனி உற்பத்தி மற்றும் இறக்குமதி: விபரம்
LOCAL PRODUCTION AND IMPORT OF SUGAR: DETAILS

1017/2025

10. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Chithral Fernando, Attorney-at-Law)
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික සාමාන්‍ය සීනි අවශ්‍යතාව කොපමණද;

(ii) 2023, 2024 වර්ෂවලදී සහ 2025 වර්ෂයේ ආරම්භයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද සීනි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2025 අවසානය වනවිට ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කිරීමට සහ ශ්‍රී ලංකාවට ආනයනය කිරීමට අපේක්ෂා කරන සීනි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) දේශීයව නිෂ්පාදිත සීනි මත පනවා ඇති බදු වර්ග සහ බදු ප්‍රතිශත වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ පැල්වත්ත සහ සෙවනගල සීනි කර්මාන්තශාලා සීනි නිෂ්පාදනයෙන් මේ වනවිට අලාභ ලබන බව දන්නේද;

(iii) ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තය ආශ්‍රිතව නිර්මාණය වී ඇති සෘජු සහ වක්‍ර රැකියා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම රැකියා මේ වනවිට දැඩි අවදානමකට ලක් වී ඇති බව දන්නේද;

(v) ශ්‍රී ලංකාවේ සීනි නිෂ්පාදනය ඉහළ නැංවීමටත්, ආනයනය කරනු ලබන සීනි ප්‍රමාණය අඩු කර ගැනීමටත් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் தொழில்முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் வருடாந்த சராசரி சீனித் தேவை எவ்வளவு என்பதையும்;

(ii) 2023, 2024 ஆண்டுகளிலும் 2025ஆம் ஆண்டின் தொடக்கத்திலிருந்து இதுவரையும் இலங்கையில் உற்பத்தி செய்யப்பட்ட சீனியின் அளவு வெவ் வேறாக எவ்வளவு என்பதையும்;

(iii) 2025ஆம் ஆண்டு நிறைவில் இலங்கையில் உற்பத்தி செய்வதற்கும் இலங்கைக்கு இறக்குமதி செய்வதற்கும் எதிர்பார்க்கும் சீனியின் அளவு வெவ்வேறாக எவ்வளவு என்பதையும்,

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) உள்நாட்டில் உற்பத்தி செய்யப்படும் சீனிமீது விதிக்கப்பட்டுள்ள வரி வகைகள் மற்றும் வரி விகிதங்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

(ii) வரையறுக்கப்பட்ட லங்கா சீனி (தனியார்) நிறுவனத்தின் பெல்வத்த மற்றும் செவனகல சீனிக் கைத்தொழிற்சாலைகள் சீனி உற்பத்தியில் இன்றளவில் நட்டத்தில் இயங்குவதை அறிவாரா என்பதையும்;

(iii) இலங்கையில் சீனிக் கைத்தொழில் சார்ந்ததாக உருவாகியுள்ள நேரடி மற்றும் மறைமுகத் தொழில்வாய்ப்புகளின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) மேற்படி தொழில்கள் இன்றளவில் பாரிய இடர்நிலைக்கு உள்ளாகியுள்ளதை அறிவாரா என்பதையும்;

(v) இலங்கையில் சீனி உற்பத்தியை அதிகரிப்ப தற்கும் இறக்குமதி செய்யப்படும் சீனியின் அளவைக் குறைப்பதற்கும் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Entrepreneurship Development:

(a) Will he state the -

(a) average annual sugar demand in Sri Lanka;

(ii) quantity of sugar produced in Sri Lanka in the years 2023, 2024 and from the beginning of the year 2025 up to now, separately; and

(iii) quantity of sugar that is expected to be produced in Sri Lanka and to be imported into Sri Lanka by the end of 2025, separately?

(b) Will he also state -

(i) the types of taxes and the percentages of taxes imposed on locally produced sugar, separately;

(ii) whether he is aware that the Pelwatte and Sevanagala sugar factories of the Lanka Sugar Company (Pvt.) Limited are currently incurring losses from sugar production;

(iii) the number of direct and indirect jobs created in relation to the sugar industry in Sri Lanka, separately;

(iv) whether he is aware that the jobs referred to above are currently under severe risk; and

(v) the measures that will be taken to increase sugar production in Sri Lanka and to reduce the quantity of sugar imported to Sri Lanka?

(c) If not, why?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා සභාගත* කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) වාර්ෂික සාමාන්‍ය සීනි අවශ්‍යතාව මෙට්‍රික්ටොන් 650,000ක් පමණ වේ.

(උක් පර්යේෂණ ආයතනයේ දත්ත අනුව)

(ii)

සමාගම		වාර්ෂික නිෂ්පාදිතය (මෙට්‍රික්ටොන්)		
		2023	2024	2025.01.01 දින සිට 2025.06.30 දින දක්වා
ශ්‍රී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම	පැල්වත්ත කර්මාන්ත ශාලාව	28,076.65	27,790.85	8,779.30
	සෙවනගල කර්මාන්ත ශාලාව	13,784.00	11,930.00	3,139.56
ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම		14,581.00	26,382.00	5,225.00
ඇතිමලේ වැවිලි සමාගම		9,756.00	14,584.70	5,297.00
එකතුව		66,197.65	80,687.55	22,440.86

(iii)

සමාගම		2025 වර්ෂය තුළ නිෂ්පාදනය කිරීමට අපේක්ෂිත සීනි ප්‍රමාණය (මෙට්‍රික්ටොන්)
ශ්‍රී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම	පැල්වත්ත කර්මාන්ත ශාලාව	35,617.00
	සෙවනගල කර්මාන්ත ශාලාව	18,350.00
ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම		30,459.00
ඇතිමලේ වැවිලි සමාගම		19,701.00
එකතුව		104,127.00

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

2025 වර්ෂය තුළ ආනයනය කිරීමට අපේක්ෂිත සීනි ප්‍රමාණය - වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය මඟින් ලබා ගත් තොරතුරු අනුව 2025 වර්ෂය තුළ ආනයනය කිරීමට අපේක්ෂිත සීනි ප්‍රමාණය මෙට්‍රික්ටොන් 550,000ක්, 600,000ක් පමණ වේ. 2025 ජනවාරි සිට අප්‍රේල් මස දක්වා ආනයනය කර ඇති සීනි ප්‍රමාණය මෙට්‍රික්ටොන් 269,800කි.

(ආ) (i) එකතු කළ අගය මත බදු (VAT) - 18%

සමාජ ආරක්ෂක බද්ද (SSCL) - 2.5%

(ii) පැල්වත්ත සහ සෙවනගල සීනි කර්මාන්තශාලා සීනි නිෂ්පාදනයෙන් ලාභ නොලබන තත්ත්වයක පවතී.

(iii)

සමාගම		ඍජු රැකියා සංඛ්‍යාව	වක්‍ර රැකියා සංඛ්‍යාව
ලී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම	පැල්වත්ත කර්මාන්ත ශාලාව	3,856	250,000
	සෙවනගල කර්මාන්ත ශාලාව	1,297	100,000
ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම		1,265	60,000
ඇතිමලේ වැවිලි සමාගම		1,151	9,500
එකතුව		7,569	419,500

(iv) දේශීය සීනි කර්මාන්තය දැඩි මූල්‍ය ගැටලුවකට පත්ව ඇති බැවින් ඍජු හා වක්‍ර රැකියා පිළිබඳව ඉදිරියේදී ගැටලු සහගත තත්ත්වයන් ඇති වීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය කරමි.

(v) දුඹුරු සීනි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා පහත ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී.

- ඉහළ අස්වැන්නක් ලබා දෙන, නියඟයට ඔරොත්තු දෙන සහ පළිබෝධ හානි අවම උක් ප්‍රභේද හඳුන්වා දීම සිදු කිරීම.
- ගොවීන් අස්වනු නෙළීමේදී සිදුවන නාස්තිය අඩු කර ගැනීම හා ගුණාත්මක අස්වැන්නක් නෙළීම පිළිබඳ දැනුවත් කිරීම හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- උක් අස්වැන්න හා ගුණාත්මකභාවය වැඩි කරගැනීම සඳහා කාබනික පොහොර හඳුන්වා දීම.
- ගොවීන් උක් වගාව තුළ රඳවා ගැනීම සඳහා ගොවීන් දිරිගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- උක්වලින් සීනි උකහා ගැනීම වැඩිකර ගැනීම සඳහා නවීන තාක්ෂණයෙන් යුතු යන්ත්‍රෝපකරණ හඳුන්වා දීම.
- අස්වැන්නේ ගුණාත්මකභාවය වැඩි කරගැනීම සඳහා පොහොර නිර්දේශ හඳුන්වා දීම.

ඉහත ක්‍රියාමාර්ග අනුගමනය කොට දේශීය දුඹුරු සීනි නිෂ්පාදනය ඉහළ නැංවීම මඟින් ආනයනය කරනු ලබන සුදු සීනි ප්‍රමාණය අඩු කර ගැනීමේ හැකියාව පවතී.

(ඇ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Question under Standing Order No. 27(2), the Hon. Sajith Premadasa

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Leader of the House?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 35 යටතේ ඔබතුමාගෙන් සහ ගරු කථානායකතුමාගෙන් මම කරුණාවෙන් මෙම ඉල්ලීම කරනවා. ස්ථාවර නියෝග 35 අනුව හරිම පැහැදිලියි, ප්‍රශ්නවලට වෙන් කර තිබෙන්නේ පැයක කාලයක් බව. මම හිතන හැටියට අපට පැයක කාලයකදී මේ කටයුත්ත කළමනාකරණය කරගත හැකියි. ඒ නිසා කරුණාකර ඔබතුමා ගරු කථානායකතුමා සමඟ සාකච්ඡා කර, පිළිතුරුත්, ප්‍රශ්නත්, අතුරු ප්‍රශ්නත් හරියට කළමනාකරණය කර පැයකදී මේ කටයුතු අවසන් කරන්න කියන ඉල්ලීම කරනවා. නැතිනම් හැම වෙලාවේම නියමිත විවාදයට බාධා වෙනවා. ඒ විතරක් නොවෙයි, Committees පටන්ගන්නත් බැරි වෙනවා.

අනික් කාරණය මේකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් පිළිබඳව පාර්ලිමේන්තුවෙන් පත් කරන ලද පරීක්ෂණ කමිටුවේ වාර්තාව අද ඉදිරිපත් කළා, ඔහු වැරදිකරු කරලා. ඒ වාර්තාව ඉදිරිපත් කළාට, ඒ වාර්තාව ඉදිරිපත් කිරීමෙන් පසුව ක්‍රියාවලිය සිදු වන්නේ කෙසේද කියන එක සහ කථානායකතුමා ලෙස ඊළඟට යන්න තිබෙන පියවර මොකක්ද කියන එක පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනුත්, රටේ ජනතාවත් දැනගත යුතුයි කියා අපි හිතනවා. ඒ නිසා කරුණාකර අද දිනය ඇතුළතදී අද ඉදිරිපත් කරපු මේ වාර්තාවේ ඉදිරි ක්‍රියාවලිය කුමක්ද කියන එක ඔබතුමා හෝ ගරු කථානායකතුමා මේ සභාවට සහ රටට ඉදිරිපත් කරනවා නම් හොඳයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I shall discuss that matter with the Hon. Speaker.

Hon. Sajith Premadasa, you can now raise your Question under Standing Order No. 27(2).

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

අලි-මිනිස් ගැටුම අවම කිරීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම
யானை-மனித மோதலைக் குறைக்கும் தேசிய செயற்றிட்டத்தை நடைமுறைப்படுத்தல்
IMPLEMENTATION OF NATIONAL ACTION PLAN FOR THE MITIGATION OF HUMAN-ELEPHANT CONFLICT

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ අද මා මෙම ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ විශේෂයෙන්ම අපේ රටේ උද්ගත වී තිබෙන බරපතළම ප්‍රශ්නයක් වන වනඅලි-මිනිස් ගැටුම පිළිබඳවයි.

මෙරට අලි-මිනිස් ගැටුම්වල තීව්‍ර බව සහ වනඅලි සංරක්ෂණයේ පවතින ගැටලු තත්ත්වය පසුගිය වසර ගණනාවක් තිස්සේ අපට දැකගන්නට ලැබුණි. අලි-මිනිස් ගැටුම් හේතුවෙන් මිනිස් ජීවිත හානි, දේපළ හානි, වගා විනාශය සහ වනඅලින්ගේ, ඇතුන්ගේ මරණ පසුගිය දිනවල වැඩි වශයෙන් වාර්තා වුණා. නමුත්, මෙම ගැටුම් නිසා සිදු වන හානිකර තත්ත්වය වළක්වා ගැනීම සඳහා සුදුසු ස්ථිර වැඩ පිළිවෙළක් දියත් කිරීමට මෙතෙක් හැකියාවක් ලැබී නොමැති බව නිරීක්ෂණය වනවා. ඒ නිසා දීර්ඝ කාලයක් තිස්සේ පවතින මෙම ගැටලුව සම්බන්ධයෙන් වත්මන් රජයේ ක්‍රියා පිළිවෙළ පිළිබඳව තොරතුරු විමසීමේ අරමුණින් මා පහත සඳහන් ප්‍රශ්න යොමු කරනවා.

01. අප රටේ වනඅලින් ප්‍රමාණය පිළිබඳව මෑත කාලයේ සංගණන කොපමණ ප්‍රමාණයක් සිදු කර තිබේද? ඒවායේ දත්ත මෙම සභාවට ඉදිරිපත් කළ හැකිද? ඒ අනුව, මෙරට සමස්ත ඇතුන්ගේ ප්‍රතිශතය කොපමණද? ඒ කියන්නේ, වනයේ සිටින ඇතුන්.

02. වනඅලි-මිනිස් ගැටුම විසඳීම උදෙසා 2020දී නිර්මාණය කළ විසඳුම කුමක්ද? එය ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන තිබේද?

    විශේෂයෙන්ම මම අහන්න කැමැතියි, අලි-මිනිස් ගැටුම් අවම කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම - National Action Plan for the Mitigation of Human-Elephant Conflict - පිළිබඳව. මෙම වාර්තාව අප සතුවත් තිබෙනවා. හැබැයි, බොහෝ දෙනා පිළිගත් මෙම වාර්තාව තුළ අඩංගු ක්‍රියාදාමය ක්‍රියාත්මක කරන්නට මේ රජය තවම අපොහොසත් වෙලා තිබෙනවා. මම අහන්න කැමැතියි, 2020දී නිර්මාණය කළ මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන්නේ නැත්තේ ඇයි කියලා.

03. එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට ගන්නා වූ පියවර කුමන කාල රාමුවක් තුළදී සිදු කිරීමට බලාපොරොත්තු වන්නේද?

04. අලි-මිනිස් ගැටුම නිසා අහිමි වූ මිනිස් ජීවිත ප්‍රමාණය සහ වනඅලි ප්‍රමාණය පසුගිය වසර 5ක කාල වකවානුව තුළ කොපමණද?

05. මේ නිසා අහිමි වුණු මිනිස් ජීවිතවලට, දේපළ හානියට, වගා හානියට ලබා දෙන වන්දි ප්‍රමාණ කොපමණද? එම වන්දි ගණනය කිරීම සඳහා අනුගමනය කරනු ලබන නිර්ණායක කවරේද?

    ඇත්තවශයෙන්ම මිනිස් සම්පත, අලි-ඇතුන් සම්පත බරපතළ ලෙස හානියට ලක් වී තිබෙනවා, මේ ගැටුම නිසා. නමුත් ඒ වන්දි ලබා දීමේ ක්‍රමයේ කිසිම ක්‍රමික, ක්‍රමානුකූල, කාර්යක්ෂම වැඩ පිළිවෙළක් නැහැ. ඒ නිසා අපි විෂය භාර අමාත්‍යවරයාගෙන් අහන්න කැමැතියි, ඒ වන්දි ලබා දීමේ වැඩ පිළිවෙළ කුමක්ද කියන එකත්.

06. වනඅලි ඝාතනය වළක්වාලීමට පනවා ඇති නීති රීති කවරේද? එම ක්‍රියාවල නිරත වන අයට පමුණුවන දඬුවම් කවරේද?

07. සත්ව සුබසාධන පනත පිළිබඳව රජයේ ස්ථාවරය කුමක්ද?

08. වනඅලි-මිනිස් ගැටුම අවම කිරීම උදෙසා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන පශු වෛද්‍යවරුන් ප්‍රමුඛ කාර්ය මණ්ඩලය -භෞතික සම්පත් හා මානව සම්පත- වනජීවී කලාප මට්ටමින් කොපමණද? එය ප්‍රමාණවත් යැයි රජය සිතන්නේද?

    ඒ වාගේම මම ගරු ඇමතිතුමාගෙන් තවත් කාරණයක් අහන්න කැමැතියි. වනඅලි-මිනිස් ගැටුම අවම කරන්නටත්, තුවාල වුණු වනඅලි ඇතුළු සතුන්ට ප්‍රතිකාර කිරීමටත්, ජාත්‍යන්තරව ක්‍රියාත්මක වන Wildlife SOS වැනි වැඩ පිළිවෙළ සහ ක්‍රම ගණනාවක් තිබෙනවා. විශේෂයෙන්ම අම්බානි මැතිතුමාත් ඉන්දියාවේ එම වැඩසටහන ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ වාගේම තවත් රටවල් ගණනාවක නවීන ක්‍රම ක්‍රියාත්මක වෙනවා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, එතුමන්ලාගේත් ආධාර ලබා ගෙන අපේ රටේත් වනඅලි ඇතුළු අනෙකුත් සතුන්ට ප්‍රතිකාර කිරීමේ විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට ඔබතුමා කටයුතු කරනවාද කියලා.

ස්තුතියි.

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Minister?

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට ගරු ඇමතිතුමා පිළිතුර ලබා දීමට පෙර මට පොඩි වෙලාවක් දෙන්න.

විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා පසුගිය රැස්වීම් සතියේදී මගෙන් ප්‍රශ්නයක් ඇහුවා, ස්ථාවර නියෝග 27(2) යටතේ. ඊට අදාළ පිළිතුර මා සතුව තිබෙනවා. මට මේ පිළිතුර හෙට ලබා දෙන්න පුළුවන්. මොකද, දැන් මට Consultative Committee එකට යන්න තිබෙනවා. ඒ නිසා මම හෙට පිළිතුර ලබා දෙන්නම්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, කාලය කළමනාකරණය කර ගන්න ඕනෑ නිසා ඔබතුමා පිළිතුර හෙට ලබා දෙන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
බොහොම ස්තුතියි.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් ස්ථාවර නියෝග 27 (2) යටතේ අද දිනයේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. අපි මේ රටේ වනඅලි සම්බන්ධයෙන් අවසන් වතාවට සමීක්ෂණයක් කර තිබෙන්නේ 2024 අගෝස්තු 17, 18 සහ 19 යන දිනවල. එම සමීක්ෂණයට අදාළ විද්‍යාත්මක විශ්ලේෂණ තවම සිදු කරමින් පවතිනවා. ඒ නිසා එම සමීක්ෂණයට අදාළ දත්ත මේ මොහොතේ අපට ප්‍රකාශ කරන්න බැහැ. නමුත් ඉදිරියේදී අපි ඒවා ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙනවා. දැනට අප සතුව තිබෙන්නේ 2011 වර්ෂයේදී මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදු කළ සමීක්ෂණයක ප්‍රතිඵල.

    2011 වසරේ කළ එම සමීක්ෂණය අනුව අලි ඇතුන් අවම වශයෙන් 5,879ක් ජීවත් වෙලා තිබෙන බව වාර්තා වෙලා තිබෙනවා.

    ඊළඟට, එතුමා එම ප්‍රශ්නයෙන්ම අසා තිබෙනවා, ඒ අතර සිටින ඇතුන්ගේ ප්‍රමාණය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2011 වසරේ කරන ලද සමීක්ෂණයට අනුව ඇතුන් පිළිබඳව නිරීක්ෂණය කරලා තිබෙනවා. වැඩිහිටි ඇතුන් 1,042ක් ඉඳලා තිබෙනවා. වයස අවුරුදු 15ට වැඩි ඇතුන් තමයි වැඩිහිටි ඇතුන් කියන්නේ. ඒ අතරින් පිරිමි ඇතුන් 55ක් ඉඳලා තිබෙනවා. එය ප්‍රතිශතයක් ලෙස ගත්තොත් සියයට 5.28ක්. ඒ සමීක්ෂණයේදී තරුණ ඇතුන් -වයස අවුරුදු 10ට වැඩි- 453ක් නිරීක්ෂණය වෙලා තිබෙනවා. ඒ අතරින් 35 දෙනෙක් තරුණ පිරිමි ඇතුන් හැටියට නිරීක්ෂණය කරලා තිබෙනවා. ඒ කියන්නේ, සියයට 7.73ක්. පැටවුන් -ඒ කියන්නේ වයස අවුරුදු 5 දක්වා වූ සතුන්- 382ක් නිරීක්ෂණය වෙලා තිබෙනවා. ඒ අතරින් 32ක් තමයි දළ සහිත පැටවුන් -ඇතුන්- හැටියට සැලකිය හැක්කේ. එහි ප්‍රතිශතය සියයට 8.38ක් හැටියට වාර්තා වෙනවා.

02. වනඅලි-මිනිස් ගැටුම විසඳීම සඳහා 2020දී නිර්මාණය කළ විසඳුම ගැනයි ගරු විපක්ෂ නායකතුමා මේ යටතේ ඇසුවේ. ඒ කියන්නේ, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ -2020දී- ඉදිරිපත් කරපු වනඅලි - මිනිස් ගැටුම් අවම කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ගැන තමයි එතුමා අහන්නේ. ඊට කලින් රට පාලනය කරපු ආණ්ඩුව කාලයේ එතුමාත් වසර ගණනාවක් සිටියා. නමුත් එතුමාටම,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Minister, keep in mind the time constraints we have. Could you make your Reply brief or table that document?

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

Okay.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, table කරන්න document එකක් නැහැ. උත්තර දෙන්නේ කොහොමද? *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Whatever Reply he has in his hand to that Question.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

2020 වාර්තාව තමයි අපට ඉදිරිපත් කරන්න වෙන්නේ. 2015-2020 දක්වා පැවැති ආණ්ඩුවේ එතුමා ප්‍රබල ඇමතිවරයෙකු හැටියට හිටියා. නමුත් එතුමන්ලාට ඉදිරිපත් කර ගන්න බැරි වුණා වනඅලි-මිනිස් ගැටුම විසඳීම සඳහා සැලැස්මක්. ඒ නිසා එතුමාට පෙනී සිටින්න වෙලා තිබෙන්නේ ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ කාලයේ ඉදිරිපත් කරපු වැඩ පිළිවෙළක් වෙනුවෙන්. ඉතින්, ඒ වැඩ පිළිවෙළ කිසියම් දුරකට අපේ රටේ ක්‍රියාත්මක කරනවා, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවත්, ඒ වාගේම ඊට සම්බන්ධ වෙච්ච අදාළ අනෙකුත් ආයතනත් සම්බන්ධ වෙලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා අසා ඇති 02වන ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

ජනාධිපති ලේකම් කාර්යාලය විසින් පත් කළ කමිටුව ශ්‍රී ලංකාවේ අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලසුම් සකස් කර ඇති අතර, එම සැලැස්මේ කෙටි කාලීන, මධ්‍ය කාලීන, දිගු කාලීන ක්‍රියාකාරකම් හඳුනාගෙන ඇත. ඒ අනුව මේ වන විට ක්‍රියාත්මක කර ඇති හා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශය ඇමුණුම 01*හි දක්වා ඇත.

03. ඒ වැඩ පිළිවෙළ විධිමත්ව ක්‍රියාත්මක කරනවා නම්, සැලසුම්සහගතව ක්‍රියාත්මක කරනවා නම්, දළ වශයෙන් අවුරුදු 3කවත් කාලයක් ඒ සඳහා අවශ්‍ය කරනවා කියන අදහස තමයි අපට තිබෙන්නේ.

    ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ක්‍රියාකාරකම් සඳහා සම්බන්ධ කරගෙන තිබෙන ආයතන මොනවාද කියන ප්‍රශ්නය එතුමා නැගුවා.

    මෙම යෝජිත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු හඳුනාගෙන ඇති අතර, එම අමාත්‍යාංශ හා ආයතන පහත පරිදි වේ.

    a. පරිසර අමාත්‍යාංශය
    b. වාරිමාර්ග, කෘෂිකාර්මික, ජාතික පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
    c. රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
    d. ආරක්ෂක අමාත්‍යාංශය
    e. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
    f. වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව
    g. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
    h. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

i. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
j. පශු සම්පත් සංවර්ධන මණ්ඩලය
k. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
l. පොලිස් දෙපාර්තමේන්තුව
m. අලි - මිනිස් ගැටුම පවතින ප්‍රදේශවල දිස්ත්‍රික් ලේකම්වරු හා ප්‍රාදේශීය ලේකම්වරු
n. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

මෙම ආයතන මේ සඳහා ඒකාබද්ධව ක්‍රියාත්මක විය යුතු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ඇහුවේ 2020 සිට තොරතුරු.

04. 2020 අවුරුද්දේ අහිමි වූ මිනිස් ජීවිත සංඛ්‍යාව 112යි, වනඅලි 328යි. 2021 අවුරුද්දේ අහිමි වූ මිනිස් ජීවිත සංඛ්‍යාව 142යි, වනඅලි 375යි. 2022 අවුරුද්දේ අහිමි වූ මිනිස් ජීවිත සංඛ්‍යාව 146යි, වනඅලි සංඛ්‍යාව 439යි. 2023 අවුරුද්දේ අහිමි වූ මිනිස් ජීවිත සංඛ්‍යාව 184යි, වනඅලි සංඛ්‍යාව 488යි. 2024 අවුරුද්දේ අහිමි වූ මිනිස් ජීවිත සංඛ්‍යාව 155යි, වනඅලි සංඛ්‍යාව 388යි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024 අවුරුද්දේ සිට මේ දක්වා මිනිස් ජීවිත 73ක් අහිමි වෙලා තිබෙනවා. ඒ වාගේම වනඅලි 232දෙනෙක් අහිමි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වනඅලි-මිනිස් ගැටුම අපේ රටේ දිගු කාලයක් තිස්සේ සිද්ධ වෙමින් තිබෙනවා. මෙතුමා ප්‍රශ්න කළේ 2020 සිට මේ දක්වා තොරතුරු පිළිබඳව වුණත්, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න විශේෂ සංඛ්‍යාලේඛනයක් අපට තිබෙනවා. මීට කලින්, 2015 වසරේ දී වනඅලි මිය ගියේ 205ක් වාගේ සංඛ්‍යාවක්. නමුත්, ගරු විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා ආණ්ඩුවක ප්‍රබල ඇමතිවරයකු හැටියට හිටපු කාලය තමයි, අවුරුද්දකට මිය යන වනඅලි සංඛ්‍යාව 200 සිට 300 දක්වා වැඩි වූ කාල වකවානුව ලෙස සටහන් වුණේ. ඒ තමයි 2017 සිට 2018 කාලය. 2017දී 200 ගණන් ලෙස තිබුණු එය 2018දී 300 අබිබවා යන සංඛ්‍යාවක් බවට පත් වුණා. එවැනි සංඛ්‍යාලේඛන ප්‍රමාණයක් පිළිබඳව තමයි අපට වාර්තා වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ජන බලවේගය මේ රටේ පාලන බලයට තේරී පත් වුණේ, 2024 සැප්තැම්බර් මාසයේදීයි. 2023 වර්ෂයේ තමයි මෙතෙක් අපේ රටේ ඉතිහාසයේ වැඩිම අලි මරණ සංඛ්‍යාවක් - අලි මරණ 488ක්- සිදු වෙලා තිබෙන්නේ. නමුත් 2024 අවුරුද්දේ අලි මරණ සංඛ්‍යාව 388 දක්වා අඩුකර ගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. 2025 වසරේ අපි මේ ගණන සැලකිය යුතු තරමින් පහළට අරගෙන ආවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2023 වසරේ මාසයකට අලි 41දෙනෙක් මිය ගියා. 2024දී ඒ ගණන 31ක් දක්වා අඩු වුණා. 2025 වසරේ අපි මාසයකට මිය යන අලි සංඛ්‍යාව 20ත්, 25ත් අතර සංඛ්‍යාවක් දක්වා අඩු කරගෙන තිබුණා, මේ රජය ඒ සම්බන්ධයෙන් කර ගත්ත මැදිහත්වීම් ඇතුළේ. නමුත්, පසුගිය අවස්ථා දෙකකදී වනඅලි ඝාතනය කිරීම් සම්බන්ධ සිදුවීම් දෙකක් අපි නිරීක්ෂණය කළා. එකක් හැටියට, පසුගිය අය වැය සමයේ දී පරිසර අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පවතින දවස්වල වන අලින්ට වෙඩි තබා ඝාතනය කිරීමේ ප්‍රවණතාවක් තිබුණ බව අපි නිරීක්ෂණය කළා. ඒ වාගේම මේ වනවිටත් නැවත වනඅලි ඝාතන රැල්ලක් ඇති කරලා තිබෙනවා. ඒ නිසා වනඅලින්ට වෙඩි තැබීම සැලසුම්සහගත ක්‍රියාවක් ද කියන සැකය මතු වෙලා තිබෙනවා. වනඅලින්ගේ කකුල්වලට - දණහිසෙන් පහළ ස්ථානවලට - වෙඩි තබලා වනඅලි වේදනාවට පත් කරලා, දුක් විඳලා මිය යන තත්ත්වයට පත් කරලා තිබෙනවා. ඒ නිසා අපට පෙනෙනවා මේ තුළ කිසියම් සැලසුම්සහගත ක්‍රියාවලියක් තිබෙන බව.

ගරු විපක්ෂ නායකතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා, දේශපාලනය කරනවා නම් දේශපාලනය කරන්න කියලා. හැබැයි, ඒ සඳහා මේ අහිංසක සත්තු -වනඅලි- පටලවා ගන්න එපා. වනඅලි කියන්නේ අපේ රටේ සම්පතක්. විශේෂයෙන්ම චෝදනා නැඟෙනවා මේ වන අලි මරා දමන්නේ මේ රජයෙන් බෙදපු ආයුධවලින්, තුවක්කුවලින් කියලා.

නැහැ, එහෙම නොවෙයි. මේ රජය පත් වුණාට පස්සේ තවම එක තුවක්කුවක්වත් ගොවි ජනතාවට ලබා දීලා නැහැ. ඒ නිසා මේ වනඅලින්ට වෙඩි තබන්නේ මීට කලින් මේ රට පාලනය කළ පාලකයන් ලබා දීපු තුවක්කුවලින්. ඒ වැරැදි සංස්කෘතිය විසින් තමයි වනඅලි-මිනිස් ගැටුම උග්‍ර කරලා තිබෙන්නේ. ඒ නිසා අපි ගරු විපක්ෂයෙන් ඉල්ලනවා, දේශපාලනය කරනවා නම් අපි දේශපාලනය කරමු, ජයග්‍රහණය ලබා ගැනීම සඳහා වනජීවීන් උපයෝගි කරගන්න එපා කියලා. මොකද, අපට සාධාරණ සැකයක් තිබෙනවා, අපට තොරතුරු වාර්තා වෙලා තිබෙනවා, මේ සම්බන්ධයෙන් කිසියම් සංවිධානාත්මක ක්‍රියාවලියක් තිබෙනවා කියලා. ඒ නිසා අපි මේ වෙනකොට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා, මේ නීති විරෝධි අවි භාවිත කරමින් අපේ රටට සම්පතක් වෙච්ච, සංරක්ෂණය කළ යුතු අලි ඇතුන් ඝාතනය කිරීම සම්බන්ධයෙන් වහාම විධිමත් පරීක්ෂණයක් කරලා නීති විරෝධී ගිනි අවි සහ ඒ පිටුපස තිබෙන සංවිධානාත්මක ක්‍රියාවලියත් හෙළිදරව් කරන්න කියලා.

05. I. මිනිස් මරණයකදී රු.1,000,000.00යි.
II. පූර්ණ බෙලහීනතාවයට උපරිම රු.1,000,000.00 දක්වා.
III. අර්ධ බෙලහීනතාවකට උපරිම රු.150,000.00 දක්වා.
IV. දේපළ හානි උපරිම රු.200,000.00 දක්වා.

06. වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ 1993 අංක 49, 2009 අංක 22 පනත්වලින් සංශෝධිත එකී පනතේ II වන කොටසට අනුව, වනඅලි ඝාතනය වැළැක්වීම සඳහා ප්‍රතිපාදන සලස්වා ඇති අතර, එහි 12වැනි වගන්තිය ප්‍රකාරව ජාතික රක්ෂිත භූමියකින් හෝ යම් අභය භූමියකින් පිටත යම් ප්‍රදේශයක් තුළ ඇතෙකු දඩයම් කිරීම, වෙඩි තැබීම, මැරීම, තුවාල කිරීම හෝ ඝාතනය කිරීම තහනම් කරලා තිබෙනවා.

එකී පනතේ 22(අ) වන වගන්තිය ප්‍රකාරව තමා වෙත නිකුත් කරන ලද බලපත්‍රයට පටහැනිව ඇතෙකු දඩයම් කිරීම, වෙඩි තැබීම, මැරීම, ලුහුබැඳීම හෝ යම් ඇතෙකු මැරීම, තුවාල කිරීම හෝ අල්ලා ගැනීම සඳහා යම් විදුලි රැහැනක් භාවිත කරන හෝ යම් ඇතෙකුට හිංසා කිරීමට යම් ආකාරයක උපක්‍රමයක් භාවිත කිරීම නීති විරෝධි කරලා තිබෙනවා.

එවැනි වරදක් සිදුකරන සැකකරුවෙකු වරදකරු වීමේදී රුපියල් 150,000.00ට නොඅඩු හෝ රුපියල් ලක්ෂ 500,000.00ට නොවැඩි දඩයක් හෝ අවුරුදු දෙකකට නොඅඩු හෝ අවුරුදු පහකට නොවැඩි කාලයකට හෝ දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකම හෝ අයත් වෙනවා.

උක්ත පනතේ II කොටසේ ඡායා පිටපත් ඇමුණුම 02*හි දක්වා ඇත.

---

* පුස්තකාලයේ තබා ඇත.
* நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

07. මේ පනත පිළිබඳව අදාළ පාර්ශ්ව සමඟ සාකච්ඡා කර පවතින ගැටලු හඳුනා ගැනීමටත්, නව යෝජනා එක් කිරීමටත් වෙනම කමිටුවක් පත් කිරීමට අදහස් කරනවා. ඒ අනුව මෙම පනත සම්බන්ධයෙන් කටයුතු කිරීමට තීරණය කර තිබෙනවා.

08. අදාළ තොරතුරු ඇතුළත් ලේඛනය ඇමුණුම 03හි දක්වා ඇත.

ඇමුණුම් 01, 02 සහ 03 **සභාගත*** කරමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේ විශේෂයෙන් මෙම කාරණයත් කියන්න කරන්න ඕනෑ. පසුගිය කාලයේ අලින්ට ප්‍රතිකාර නොකිරීම සම්බන්ධයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටත්, එහි සේවය කරන පශු වෛද්‍යවරුන්ටත් විපක්ෂයෙන් ඉතාම අභූත චෝදනා, පදනම් විරහිත චෝදනා ඉදිරිපත් කළා. ඒවා හරිම සංවේදීයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා අපි හමුවුණා ඒ පශු වෛද්‍යවරුන්ව. ඒ චෝදනා සම්බන්ධයෙන් සහ ඔවුන් මුහුණපාන දුෂ්කරතා සම්බන්ධයෙන් ඔවුන් සමඟ අපි සාකච්ඡා කළා, ජූලි හත්වැනි දා. ඒ සාකච්ඡාවේදී ඔවුන් මුහුණපාන දුෂ්කරතා අපට ඉදිරිපත් කළා. ඉතාම සංවේදී තත්ත්වයක් තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි ගරු විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා, කරුණාකරලා වනඅලි ප්‍රශ්නය දේශපාලනය වෙනුවෙන් දඩමීමා කරගන්න එපා කියලා. වනඅලින්ට ප්‍රතිකාර කිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේම ඉන්නේ පශු වෛද්‍යවරු 12දෙනායි. මුළු ලංකාවටම ඉන්නේ පශු වෛද්‍යවරු 12දෙනායි. වෙනත් රටක වනඅලින්ට ප්‍රතිකාර කිරීම සඳහා ඉන්න පශු වෛද්‍ය කණ්ඩායමට පශු වෛද්‍යවරයෙක්, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Minister, could you please shorten your Answer? I think we have gone far beyond the allotted time.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ඉක්මනින් අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Leader of the House?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට සහ මේ සභාවට අපි ඇති තරම් මේක කියලා තිබෙනවා. පක්ෂ නායක රැස්වීමේදීත්, Parliamentary Business Committee එකේදීත් කියලා තිබෙනවා. ස්ථාවර නියෝග 27(2) යටතේ අවස්ථාව ලබා ගැනීම පක්ෂ නායකයන්ගේ අයිතියක්. හැබැයි ඒක තිබෙන්නේ imminent, පොදු වැදගත්කමක් ඇති කරුණු සම්බන්ධයෙන්. මේක පොදු වැදගත්කමක් තිබෙන කාරණයක් වෙන්න පුළුවන්. නමුත් ඒකට අතිවිශාල details ප්‍රමාණයක් ඉල්ලුවාට පස්සේ ඒ තොරතුරු ලබා දීමට ගරු ඇමතිවරුන්ට සිද්ධ වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා එක්කෝ ඔබතුමන්ලා මේ සඳහා කාලයක් වෙන් කරන්න. ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න ඉදිරිපත් කරන්න අවස්ථාව තිබෙන්නේ එක් දිනකට පක්ෂ නායකයන් දෙදෙනෙකුට නේ. එහෙම නම් ඒ දෙදෙනාටත් ඔබතුමන්ලා Adjournment Questionsවලට වෙන් කරලා තිබෙනවා වාගේ ප්‍රශ්නයකට විනාඩි 10ක්, නැත්නම් විනාඩි 15ක් වෙන් කරන්න. නැත්නම් මේක කරන්න බැහැ. දැන් මෙතුමා අහපු කාරණයේ ප්‍රශ්න 8ක් තිබෙනවා. ඒ ප්‍රශ්න 8 ඇතුළේ අතුරු ප්‍රශ්න 23ක් තිබෙනවා. එකතු කරලා බලන්න. මම මේ පිළිබඳව වාර්තාවක් Parliamentary Business Committee එකට ඉදිරිපත් කළා. මේ විධියට time management කරන්න බැහැ. ඒ වාගේම ඒක 27(2) කියන අවස්ථාව යොදා ගැනීම පිළිබඳත් ප්‍රශ්නයක්. ඒ නිසා මම හිතන විධියට අපි ඇමතිවරුන්ට උත්තරය සීමා කරන්න කියනවාට වඩා, ඊට කලින් මේ සඳහා ක්‍රමයක් හදන්න අවශ්‍යයි. මොකද, ඇමතිවරුන්ට වෙන්නේ අහලා තිබෙන ප්‍රශ්නවලට උත්තර දෙන්න නේ. පක්ෂ නායකයෙක් ප්‍රශ්නයක් ඇහුවාම උත්තර දෙන්න අවශ්‍යයි නේ. පැනලා යන්න බැහැ නේ. ඒ නිසා, මම හිතන විධියට ඉදිරියේදී මේ කටයුතු කළමනාකරණය කර ගත යුත්තේ කොහොමද කියන එක ගැන ඔබතුමන්ලා තමයි වග කියන්න ඕනෑ. ඇමතිවරුන්ට ඒක කළමනාකරණය කරන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I shall consult the Hon. Speaker to see whether we have to make a time limitation on this.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේක ඉතාම සංවේදී තත්ත්වයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මුළු රටටම පශු වෛද්‍යවරු ඉන්නේ 12දෙනායි. ඒ 12දෙනා ප්‍රතිකාර කරන්නේ අලින්ට විතරක් නොවෙයි. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් සංරක්ෂණය කරන සියලු වන ජීවීන්ට ප්‍රතිකාර කිරීම සඳහා ඉන්නේ ඒ 12දෙනා විතරයි.

වෙනත් රටවල පශු වෛද්‍යවරයකු සඳහා වෛද්‍ය සහායකයෙකු - assistant කෙනෙක් - ඉන්නවා. හෙදියකගේ මට්ටමේ වෛද්‍ය සහායකයකු ඉන්න ඕනෑ. ඒ වාගේම ඔහුට තාක්ෂණික ශිල්පියෙක් ඉන්න ඕනෑ. ඇතුන් හසුරුවා ගැනීම සඳහා ඇත්ගොව්වෙකු හෝ ඒ වෙනුවෙන් වෙන් වුණු වනජීවී නිලධාරියෙකු ඉන්න ඕනෑ. නමුත් අපේ රටේ සිටින වෛද්‍යවරුන් 12දෙනාට එහෙම හෙදියක් - nurse කෙනෙක්- assistant කෙනෙක් නැහැ, තාක්ෂණික ශිල්පියෙක් නැහැ. ඇත්ගොව්වෙකු

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

හෝ ඒ වෙනුවෙන් වෙන් වුණු වනජීවී නිලධාරියෙකු නැහැ. ඔවුන් තනියම ගිහින් කැලෑ වැදිලා ඉතාම අඩු පහසුකම් යටතේ තමයි අලි ඇතුන්ට ප්‍රතිකාර කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය ජූලි මාසයේ 10වෙනි දා වෙනකොට රට පුරා විසිරී සිටින මේ වෛද්‍යවරු 12දෙනාට වෙඩි තබන ලද ඇතුන් 9දෙනෙකුට ප්‍රතිකාර කරන්න සිදු වුණා. ජූලි 15වෙනි දා වෙනකොට, දින 5ක් ඇතුළත ඒ ගණන 13 දක්වා වැඩි වුණා. ඒ නිසා තමයි අපි කියන්නේ වනඅලින්ට වෙඩි තැබීම පිටුපස සංවිධානාත්මක කුමන්ත්‍රණයක් තිබෙනවා කියලා. වෙඩි තියන්නේ ගාත්‍රාවලට. වෙඩි තියන්නේ එකම ආකාරයකට. දණහිසෙන් පහළ කකුල්වලට වෙඩි තියනවා, දුක් විඳලා මැරෙන්න. ඒක පාවිච්චි කරගෙන YouTube videos කරන්න, ඒක පාවිච්චි කරගෙන පටු දේශපාලන වුවමනාවන් ඉටු කර ගන්න, ඒක පාවිච්චි කරගෙන ජනතාව සංවේදී කරලා ජනතාව කුපිත කිරීමේ වැඩ පිළිවෙළක්ද මේ තිබෙන්නේ කියන සාධාරණ සැකය මතු වෙලා තිබෙනවා.

මෙන්න මේ තත්ත්වය අවබෝධ කරගෙන, ඉතාම දුෂ්කර තත්ත්ව යටතේ වන ජීවීන් රැක ගන්න, සංරක්ෂණය කර ගත යුතු වන ජීවීන් රැක ගන්න වෙහෙසෙන ඒ පශු වෛද්‍යවරු ධෛර්යවත් කරනවා වෙනුවට විපක්ෂය කරන්නේ මොකක්ද ? ඔවුන් අධෛර්යට පත් වෙන විධියට තමයි කටයුතු කළේ. අපිත් එක්ක කළ සාකච්ඡාවේදී ඔවුන් ඒ දුක්ගැනවිල්ල අපට ඉදිරිපත් කළා. ඔවුන් ඉතාම සංවේදියි. ඔවුන් දිරි ගන්වනවා වෙනුවට ඔවුන් අධෛර්යට පත් වන විධියේ ක්‍රියාවලියක් විපක්ෂය සැලසුම් කරලා තිබෙනවා. ඒ නිසා, කරුණාකරලා අපේ රටේ සිටින අලි ඇතුන් දේශපාලනයට ගාවා ගන්න එපා කියලා ගරු විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයෙන් අපි ඉල්ලනවා.

ගරු විපක්ෂ නායකතුමනි, මේක ඉතාම සංවේදී ප්‍රශ්නයක්. රටට බලපාන ප්‍රශ්නයක්. රටේ ඩොලර්වලට බලපාන ප්‍රශ්නයක්. ඒ නිසා එවැනි කැත දේශපාලනයක යෙදෙන්න එපා කියලා අපි මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. මේ සභාවේ සිටින සමහර මන්ත්‍රීවරු මාධ්‍ය සාකච්ඡා තියලා මේ පිළිබඳව යම් යම් ප්‍රකාශ කළා. නමුත් වෙන කිසිදු රජයක් මැදිහත් නොවුණු තරමටම අපි ඒ හාතිය ඇතා රැක ගැනීම වෙනුවෙන් මැදිහත් වුණා. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය ඒකකය, ආරක්ෂක අංශ -ශ්‍රී ලංකා පොලීසිය- මහව ප්‍රාදේශීය සභාව, ඒ ප්‍රදේශවාසීන් පමණක් නොවෙයි, අපි ඉන්දියාවේ වන්තාරා ආයතනයෙන් පවා වෛද්‍යවරු රැගෙන ඇවිල්ලා තමයි එම ඇතාට ප්‍රතිකාර කළේ. ඒ තරම් මැදිහත් වීමක් අපි කළා. සමහර මන්ත්‍රීවරු මාධ්‍ය සාකච්ඡා තියලා කිව්වා, ඉන්දියාවේ වන්තාරාවලින් අපි වෛද්‍යවරු ගෙන්නුවේ ඒ ඇතා මරා දමන්න කියලා. ඒවා ජනතාව කුපිත කරවන විධියේ ප්‍රකාශ. අපි විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා, පටු දේශපාලන වුවමනාව වෙනුවෙන් මේ අලි ඇතුන් ප්‍රයෝජනයට ගන්න එපා, අලි ඇතුන් මරා දැමීම සඳහා එවැනි දිරිගැන්වීම් කරන්න එපා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හාතිය ඇතාට ප්‍රතිකාර කිරීම සඳහා මැදිහත් වෙච්ච පේරාදෙණිය පශු වෛද්‍ය පීඨයේ මහාචාර්ය අශෝක දංගොල්ල මහතා ඇතුළු වෛද්‍යවරු පිරිසට, විශේෂයෙන්ම ආරක්ෂක ලේකම් සම්පත් තුයියකොන්තා මැතිතුමා ඇතුළු ආරක්ෂක අංශයට, ශ්‍රී ලංකා පොලීසියට, මහව ප්‍රාදේශීය සභාවේ සභාපති සුමේද මැතිතුමා ඇතුළු එම ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලයට, ඒ වාගේම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට, එම ඇතාට ප්‍රතිකාර කිරීම වෙනුවෙන් මහන්සි වෙච්ච ප්‍රදේශවාසීන්ට සහ ඉන්දියාවේ වන්තාරා ආයතනයේ වෛද්‍යවරුන්ට ස්තුතිය පිරිනමන්න මම මෙය අවස්ථාවක් කරගන්නවා. එම වෛද්‍යවරු ඒ ඇතා ළඟට යන්න කලින් තමයි ඒ ඇතා මිය ගියේ. නමුත්, අපි ඉල්ලූ ගමන් ඔවුන් අපේ සේවය සඳහා පැමිණියා. ඒ නිසා අපි ඔවුන්ටත් අපගේ ස්තුතිය පිරිනමන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ අලි ඇතුන් සංරක්ෂණය කිරීම සඳහා වෙන කිසිදු රජයක් මැදිහත් වෙනවාටත් වඩා වැඩි මැදිහත්වීමක් මේ රජය කරලා තිබෙනවා. අලි මිනිස් ගැටුම විසඳීම සඳහා අවශ්‍ය සම්පත් හිඟයක් අපේ රටේ තිබෙනවා. ඒක තමයි ගරු විපක්ෂ නායකතුමා මතු කළේ. ඒ සම්පත් හිඟය පියවා ගන්න අපි මේ අවුරුද්දේ ජූනි 13වැනි දා අලි වැට සහායකයන් 3,551ක් බඳවා ගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි. පශු වෛද්‍යවරු බඳවා ගැනීම සඳහාත් විශේෂ සාකච්ඡාවක් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවාද දන්නේ නැහැ, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සම්බන්ධ වෙලා ඉන්නේ එක වෛද්‍යවරයායි. අනෙක් සියලු වෛද්‍යවරු ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය නියෝජනය කරමින් තමයි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කරන්නේ. බොහෝ කාලයකට කලින් තමයි මේවා නිවැරදි කරගත යුතුව තිබුණේ. මේ රට පාලනය කරපු ඒ පාලන කාල තුළ හිටපු ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන්ගේ වගකීමක්ව තිබුණා, මේවා නිවැරදි කරන එක. එහෙම නොකර, රජය අපහසුතාවට පත් කරන්න සැලසුම්සහගතව මේ ප්‍රශ්නය යොදා ගනිමින් තිබෙනවා. අන්න ඒ වාගේ ඉතාම නරක හැසිරීමක් තමයි මේ විපක්ෂයෙන් දක්වන්නේ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, please take your seat. Let the Hon. Minister finish his Reply first.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ඒ විතරක් නොවෙයි. අපේ රටේ ඉතා ඉක්මනින් වනජීවී රෝහලක් ගොඩනඟන්න අපි සැලසුම් කරලා තිබෙනවා. ඒ වාගේම ජංගම වෛද්‍ය ඒකකයක් ගොඩනැඟීම සඳහාත් අපි වැඩ කටයුතු පටන් ගෙන තිබෙනවා.

ඒ ජංගම වෛද්‍ය ඒකකය ගොඩනැඟීමට අවශ්‍ය ඇස්තමේන්තු අපි සකස් කරලා තිබෙනවා. රුපියල් මිලියන 40ක් පමණ ඒ සඳහා වැය වෙයි කියලා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී මා තවත් කාරණයක් මතු කරන්න ඕනෑ. අපි මේ වසර තුළදී මසකට සිදු වන වනඅලි මරණ ගණන අඩු කරගෙන තිබෙනවා. නමුත් අවස්ථා දෙකකදී සැක සහිත සංවිධානාත්මක ක්‍රියාවලියක් මඟින් වනඅලි ඝාතන රැලි දෙකක් හදලා තිබෙනවා. දැන් යන්නේ ඒ දෙවැනි රැල්ල. ඒ නිසා අපි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කරන්න කියලා.

ඒ වාගේම අපට තවත් සැකයක් මතුව තිබෙනවා. මොකද, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව තුළ සිටින ඇතැම් දේශපාලන සම්බන්ධතා පවතින වෘත්තීය සමිති නියෝජනය

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

කරන වනජීවී නිලධාරින් පසුගිය දිනවල වැඩ වර්ජනයක් සඳහා සූදානම් වුණා. මේ අලි මරණ සංඛ්‍යාවත් එක්ක සමපාත වෙලා තමයි ඒ සැලැස්ම ක්‍රියාත්මක කරන්න හැදුවේ. නමුත් අපි ඒ වෘත්තීය සමිතිත් එක්ක සාකච්ඡා කරලා කිසියම් මට්ටමකින් ඒ වර්ජනය ආපසු හරවාගත්තා. ඒ නිසා මම විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා, මෙවැනි කැත දේශපාලනයක යෙදෙන්න එපා කියලා. අලි-ඇතුන් කියන්නේ අපේ රටේ සම්පතක්. ඒ අලි-ඇතුන් ඔබේ පටු දේශපාලන වුවමනා සඳහා යොදාගන්න එපා කියන ඉල්ලීම අපි කරනවා, මේ රටේ ජනතාව වෙනුවෙන්.

ඒ වාගේම අලින්ට ආදරය කරන මේ රටේ සිටින සුවහසක් ජනතාවගෙනුත් අපි ඉල්ලීමක් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, මේ අලි ඝාතනය කරන්නේ ගොවීන් නොවෙයි කියලා. ගොවීන්, ඒ ප්‍රදේශවාසීන් තමයි අනතුරක් සිදුවූ වෙලාවේ ඒ හාතිය ඇතාට කන්න තමන්ගේ කිරිවදින ගොයම පවා ගෙනැල්ලා දුන්නේ. ඒ නිසා වෙඩි තියලා අලි ඝාතනය කරන්නේ ගොවීන් නොවෙයි. මේ සිද්ධි පිටුපස යම් කුමන්ත්‍රණයක් තිබෙනවා. එම නිසා අලි වෙනුවෙන් පෙනී සිටින, අලි සංරක්ෂණය සඳහා පෙනී සිටින, අලින්ට ආදරය කරන සුවහසක් ජනතාව වෙනුවෙන් මම ඉල්ලන්නේ මේ කුමන්ත්‍රණය හරියට තේරුම් ගන්න කියලායි.

දැන් බලයට පත් වෙලා තිබෙන්නේ ඉතිහාසයේ සිට පරිසරයට වැඩියෙන්ම ආදරය කළ, පරිසරය වෙනුවෙන් වැඩියෙන්ම මැදිහත් වෙන්න සූදානම් පාලනයක්, එවැනි වැඩ පිළිවෙළක් සහිත පාලනයක්. එම වැඩ පිළිවෙළ අඩාළ කරන්න හදන්නේ පරිසරය ආරක්ෂා කිරීම වෙනුවෙන් නොවෙයි, අලි-ඇතුන් ආරක්ෂා කිරීම වෙනුවෙන් නොවෙයි. අන්න ඒ පරිසරය ආරක්ෂා කරන වැඩ පිළිවෙළ, ඒ අලි-ඇතුන් සංරක්ෂණය කරන වැඩ පිළිවෙළ කඩාකප්පල් කිරීමේ උත්සාහයක් තමයි මේ තිබෙන්නේ.

අපේ රජය මාස 6ක් වාගේ කෙටි කාලයකදී පාරිසරික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරමින් වෙන කිසිදු රජයක් නොකරපු තරම් වැඩ ගණනාවක් කරලා තිබෙනවා. අපි පසුගිය ජුනි මාසයේ 05වැනි දාට යෙදුණු ජගත් පරිසර දිනයේදී අපේ රටේ වනාන්තර 5ක් රක්ෂිත බවට පත් කළා. ඉන් එකක් තමයි, නිල්ගල වනාන්තරය. අපේ රටේ දෙවැනි විශාලතම වනාන්තරය වන එය අපි රක්ෂිතයක් බවට පත් කළා. ඒ විතරක් නොවෙයි. ඊට පස්සේ පසුගිය ජූලි 05වැනි දා අපි "දලුලන්න ඉඩ දෙන්න" කියන වැඩ පිළිවෙළ අනුව වනාන්තර 18ක් රක්ෂිත බවට පත් කළා. ඒ, මොනරාගල දිස්ත්‍රික්කයේ වනාන්තර 10ක්, අම්පාර දිස්ත්‍රික්කයේ වනාන්තර 6ක් සහ මහනුවර දිස්ත්‍රික්කයේ වනාන්තර 2ක්. පෙර පැවති කිසිදු රජයකින් මෙහෙම කරලා නැහැ. ඔවුන් මීට කලින් ගෙන ගිය ඒ වැඩ පිළිවෙළ තමයි අපි දැන් මේ පරාජය කරන්න හදන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, we are highly constrained for time. Could you please make it short?

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි මේ රටේ ජනතාවගෙන් ඉල්ලා සිටිනවා, මේ කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළට හසුවෙන්න එපා කියලා. එම වැඩ පිළිවෙළ පරාජය කරන්නයි අපි උත්සාහ කරන්නේ. මේ රටේ පරිසරය රැක ගැනීම සඳහා මෙතෙක් බිහි වෙච්ච හොඳම වැඩ පිළිවෙළ සහිත, ඇත්ත වුවමනාව සහිත පාලනයක වැඩ පිළිවෙළ කඩාකප්පල් කරන්න තමයි මේ උත්සාහ කරන්නේ. ඒ නිසා ඒකට ඉඩ දෙන්න එපා කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition? I will give you one minute.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පැහැදිලිව ගරු ඇමතිතුමාට කියන්න කැමැතියි, මේ අලි සංරක්ෂණ වැඩසටහන ගෝඨාභය රාජපක්ෂගේ වැඩසටහනක් නොවෙයි, ආචාර්ය පෘථිවිරාජ් ප්‍රනාන්දු, සුමිත් පිලපිටිය, යූ.කේ.ජී.කේ. පද්මලාල් කියන ප්‍රවීණයෝ හදපු වැඩසටහනක් බව. මම ප්‍රශ්නයක් ඇහුවා, මේ වැඩසටහන ක්‍රියාත්මක නොකරන්නේ ඇයි කියලා.

ඒ වාගේම මම මේ කාරණයත් කියන්න කැමැතියි. වනජීවී ක්ෂේත්‍රයේ පශු වෛද්‍යතුමන්ලා ප්‍රමුඛ ඒ සියලුදෙනා අතිවිශිෂ්ට කාර්යභාරයක් කරනවා. අපි ඒවා විවේචනය කරලා නැහැ. ගරු ඇමතිතුමා සඳහන් කරපු වෛද්‍ය දංගොල්ල, වෛද්‍ය තාරක ඒ වාගේම හාතිය ඇතාට ප්‍රතිකාර කරපු වෛද්‍ය ඉසුරු ඇතුළු ඒ පශු වෛද්‍යවරුන්ට අපිත් ප්‍රශංසා කරලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ සම්බන්ධව වැරදි කරුණු කාරණා කියලා මේ සභාව නොමඟ යැවීමක් මෙතුමා කරලා තිබෙන්නේ. ඒක නිවැරැදි කරන්න ඕනෑ.

ඊළඟ කාරණාව මෙයයි. ගරු ඇමතිතුමා උත්තර දෙනකොට කිව්වා, පිරිමි ඇතුන් කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ කාරණය දන්නේ නැද්ද? ප්‍රධාන වශයෙන් ආසියාතික අලියා ඉන්නවා, අප්‍රිකානු අලියා ඉන්නවා. අප්‍රිකානු අලියාගේ තමයි පිරිමි, ගැහැනු සතුන් දෙදෙනාටම දළ තිබෙන්නේ. මේ රටේ ඉන්නේ ආසියාතික අලියා. පිරිමි ඇතුන් කියලා කියන්නේ නැහැ. මොකද, පිරිමි සතාට විතරයි දළ එන්නේ. ඒ තරම්ම දැනුමක් තිබෙනවා, පරිසර ඇමතිතුමාට! නිකම් ලියලා දෙන උත්තර කියවන්න එපා. විෂයය පිළිබඳව අවබෝධයක් ඇතුව කථා කරන්න. මම ප්‍රශ්නය ඇහුවේ ඇතුන් ගැන.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, shall we move on to the next Question under Standing Order No. 27(2)?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Give me a few seconds, Sir. This is very important.

ඉන්දියාවේ ඉන්නේ ආසියාතික වනඅලි. ඒ සතුන්ගෙන් සියයට 70කට, 80කට, 90කට දළ තිබෙනවා. අපේ රටේ ඒ ප්‍රතිශතය සියයට 6ක්, 7ක් වැනි ප්‍රමාණයක් වනවා. ගරු ඇමතිතුමනි, එම නිසා විශේෂයෙන්ම ඇතුන් සංරක්ෂණය කරන වැඩ පිළිවෙළකට ඔබතුමා යන්න. ඔබතුමා කියන්න එපා, අපි දේශපාලනය හේතුකොටගෙන මේ ප්‍රශ්නය ඇහුවා කියලා. මෙය දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි. මේක මේ රටේ පාරිසරික ප්‍රශ්නයක්, මේ රටේ සිටින වනජීවීන් පිළිබඳ ප්‍රශ්නයක්, සත්ව සහ වෘක්ෂලතා ක්ෂේත්‍රයේ සුරක්ෂිතභාවය පිළිබඳ ප්‍රශ්නයක්. එම නිසා ඔබතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා, ඔබතුමා මේක කණපිට හරවන්න එපා කියලා. අපිත් ඉන්නේ මේ රටේ වනසතුන් ආරක්ෂා කරන්නට. අපට ආරංචියි, මේ ජාතික වැඩසටහනට ආණ්ඩුවේ නම දාගන්න ඕනෑ නිසා පොඩ්ඩක් එහාට මෙහාට කරලා අලුත් වාර්තාවක් ඉදිරිපත් කරලා "ඒක අපේ වැඩසටහනක්" කියලා ක්‍රියාත්මක කරන්න හදනවා කියලා. මේ සංරක්ෂණ වැඩසටහන හැමෝම පිළිගන්නා වැඩසටහනක්. ඔබතුමා දන්නවාද, මේ වනඅලි-මිනිස් ගැටුමට හේතුව මොකක්ද කියලා?

මම අවසාන කාරණාව කියලා නතර කරනවා. මට විනාඩියක් දෙන්න. මේ රටේ වනඅලින්ගෙන් සියයට 30යි රක්ෂිත ප්‍රදේශවල ඉන්නේ. වනඅලින්ගෙන් සියයට 70ක් ඉන්නේ මිනිස්සු ජීවත්වන ප්‍රදේශ ආශ්‍රිතව. ඒ කාරණාව අවබෝධ කරගෙන මේ Action Plan එක හදලා තිබෙනවා. කරුණාකරලා මේ Action Plan එක ක්‍රියාත්මක කරන්න.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next Question under Standing Order No. 27(2) is to be raised by the Hon. Amirthanathan Adaikkalanathan.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Amirthanathan Adaikkalanathan is on his feet.

II

තලෙයිමන්නාරම-රාමේෂ්වරම් පාරු සේවාව නැවත ආරම්භ කිරීම

தலைமன்னார் - இராமேஸ்வரம் படகுச் சேவையை மீள ஆரம்பித்தல்

RESUMPTION OF THALAIMANNAR-RAMESWARAM FERRY SERVICE

ගරු අමීර්තනාදන් අඩෛක්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27(2)இன்கீழ் வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர் கௌரவ விஜித ஹேரத் அவர்களிடம் நான் பின்வரும் வினாவைக் கேட்கின்றேன்.

இலங்கைக்கும் இந்தியாவுக்கும் இடையிலான படகுச் சேவையை ஆரம்பித்தல் சம்பந்தமாக அதாவது, தலைமன்னார் - இராமேஸ்வரம் படகுச் சேவையை ஆரம்பித்தல் சம்பந்தமாக நீண்ட நாட்களாகப் பேசப்பட்டு வருகின்றது; பாராளு மன்றத்திலும் பேசப்பட்டது. அதனை முன்னெடுப்பதற்கு இந்தியா தயாராகவுள்ளதாக அறிகின்றோம். எனவே, இது சம்பந்தமாக என்ன முன்னேற்றம் ஏற்பட்டிருக்கின்றது என்பதை அறியத்தர முடியுமா?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister of Foreign Affairs, Foreign Employment and Tourism to reply.

ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ප්‍රශ්නය අදාළ වෙන්නේ විදේශ කටයුතු අමාත්‍යාංශයට නොවෙයි, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට. විෂය භාර නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister of Ports and Civil Aviation.

ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Janitha Ruwan Kodithuwakku - Deputy Minister of Ports and Civil Aviation)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

අපි ferry operation එක 2023 ඔක්තෝබර් 14වැනි දා පටන් ගත්තා. දැනටත් ferries දෙකක් එතැන දිගින් දිගටම operate වෙනවා. ඒ ජැටිය සම්බන්ධව ගැටලු කිහිපයක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා මතු කරපු ආකාරයට මේ සඳහා ඉන්දියාවත් උදවු කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. නමුත්, ඒ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, ඒ පිළිබඳ feasibility study එකක් හරියට කරලා තිබුණේ නැහැ. Ferry service එකෙන් සාමාන්‍යයෙන් මේ අවුරුද්දේ මේ වෙනකොටත් passengersලා 17,000ක් වාගේ පිරිසක් ගමන් කර තිබෙනවා. අපි voyages 153ක් operate කරලා තිබෙනවා. අපි දැනට මේ operation කරගෙන යනවා, ferries දෙකකින්. Sea එකේ condition එක මත, sea එක rough වෙන වෙලාවට තමයි ඒ ferry service එක පොඩ්ඩක් නතර වෙන්නේ. එහෙම නැති වෙලාවේ ඒ සේවය දිගටම ක්‍රියාත්මක වෙනවා. අඟහරුවාදා හැර අනික් දවස්වලදී දවසකට voyages දෙකක් යනවා.

ගරු අමීර්තනාදන් අඩෛක්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
கௌரவ பிரதி அமைச்சர் அவர்களே, தலைமன்னார் - இராமேஸ்வரம் ferry service சம்பந்தமாகத்தான் நான் கேட்டிருந்தேன்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, could you clarify the Hon. Member's point please? - *[Interruption.]* Okay, then let us move on to the next item.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, what is your point of Order? I will give you 30 seconds.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I would like to bring your kind attention to Standing Order No. 33(2). Please read that, Sir. It states, I quote:

> "The Speaker may limit the time allowed for raising of supplementary questions and answers thereto."

සභානායකතුමාට තිබෙන බලය අනුව කියලා එතුමාට නැඟිටලා කියන්න පුළුවන් නම්, "ඔබතුමා කට වහගෙන ඉන්න, මේ මන්ත්‍රීතුමා කථා කරලා ඉවර වෙනකල්" කියලා, එහෙම නම් මේක පාර්ලිමේන්තුව නොවෙයි.

කරුණාකරලා මේක consider කරන්න. අපට ලබා දෙන්නේ තත්පර 10ක, 15ක විතර කාලයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I have noted your point.

Next, Ministerial Statement by the Minister of Energy, the Hon. Kumara Jayakody, in reply to the Question under the Standing Order No. 27(2) raised by the Hon. Sajith Premadasa.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I have noted your point. Thank you.

The Hon. Minister of Energy.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Sajith Premadasa?.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මමයි ඒ ප්‍රශ්නය ඇහුවේ. අද කාල වේලාව ගතවෙලා තිබෙන නිසා මම ගරු ඇමතිතුමාට යෝජනා කරනවා, වෙනත් දිනයක ඒ ප්‍රශ්නයට පිළිතුරු ලබා දුන්නාට කමක් නැහැ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. That is a good decision.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Can I have a minute, Sir?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, not more than that.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Thank you, Sir.

Sir, I would like to raise a concern. The Hon. Amirthanathan Adaikkalanathan raised about the Mannar -Rameswaram ferry service. Like the Hon. Addaikkalanathan very correctly said, the Government of India is also happy to provide the necessary assistance. So, if the Ministry could expedite this process, we also could help you in restarting that ferry service because the distance from Mannar to Rameswaram is shorter, whereas the Hon. Deputy Minister was talking about the ferry service to Karaikal in India from KKS. The distance of that ferry service is too long and is not practically viable compared to the Talaimannar-Rameswaram ferry service since the train service is also there now. So, the Leader of the DTNA raised that Question about the Thalaimannar-Rameswaram ferry service. That is an urgent requirement to uplift the economy of the North. Therefore, we would like your Government to expedite that ferry service so that both the people of the Northern Province and the entire support system built around the Northern Province could benefit from it. Thank you, Sir.

ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு)
(The Hon. Janitha Ruwan Kodithuwakku)
Hon. Deputy Speaker, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Deputy Minister, do you have anything else to say?

ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு)
(The Hon. Janitha Ruwan Kodithuwakku)

Sir, but the Question states the ferry service between India and Sri Lanka. I think that is why we were misled.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay.

Next, Question of Privilege to be raised by the Hon. Dilip Wedaarachchi.

වරප්‍රසාද: 2025.07.06 දින කොළඹ කොටුව පොලීසිය විසින් කළ චෝදනාව
சிறப்புரிமை: 2025.07.06ஆம் திகதியன்று கொழும்பு கோட்டை பொலிஸாரால் முன்வைக்கப்பட்ட குற்றச்சாட்டு
PRIVILEGE: ALLEGATION MADE BY COLOMBO FORT POLICE ON 06.07.2025

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉදිරිපත් කරන වරප්‍රසාද ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025.07.06වැනි දා ඕස්ට්‍රේලියාවේ අධ්‍යාපනය ලබන මගේ පුතා කටුනායක ගුවන් තොටුපොළින් රැගෙන ඒමට මමත්, මගේ බිරිඳත්, රියැදුරාත් කටුනායක ගුවන් තොටුපොළට ගියා. කටුනායක ගුවන් තොටුපොළින් පුතා රැගෙන එද්දී මගේ රියැදුරාට තංගල්ලට යන්න අවශ්‍ය නිසා මම කොටුව බස් නැවතුම් පොළට ගිහිල්ලා ඔහු බස් එකට නැග්ගුවා. ඉන්පසුව මගේ බිරිඳයි, දරුවායි වාහනයේ දමාගෙන මම ඒ වාහනය පදවාගෙන එද්දී කොටුව පොලීසියේ පොලිස් නිලධාරින් මගේ වාහනය නැවැත්තුවා. එතකොට වේලාව රාත්‍රී 11.00ට විතර ඇති. ඒ වෙලාවේ පොලිස් නිලධාරින් මගේ වාහනය නවත්වලා ඇහුවා, "ඔබ බීලා නේද?" කියලා. මම කිව්වා, "මම අරක්කු බීලා නැහැ. මම උදේ 9.00ට තංගල්ලේ ඉඳලා ආවේ. රාත්‍රී 11.00ට මේ යන්නේ කටුනායක ගුවන් තොටුපොළින් මගේ පුතා අරගෙන. මගේ නෝනා චිකුන්ගුන්යා උණ හැදිලා වාහනයේ පිටුපස ඉන්නේ. පුතා ගන්න ඕනෑ නිසායි ඇය මමත් එක්ක මේ ගමන ආවේ. ඒ නිසා මම අරක්කු බීලා නැහැ. මගේ පාර්ලිමේන්තු හැඳුනුම්පත තිබෙනවා. මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. මගේ රියැදුරා මම කොටුව bus stand එකෙන් බස් එකකට නැග්ගුවා. ඕනෑ නම් මම ඔහු ගෙන්වන්නම්" කියලා. එතකොට ඔවුන් කිව්වා, "නැහැ, නැහැ, ඔයා අරක්කු බීලා" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, could you read out the Question of Privilege you have submitted, please?

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න. ඒ වරප්‍රසාද ප්‍රශ්නය තමයි මම මේ කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කරුණාකර වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

ඒක තමයි මම මේ කියවන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොලීසියෙන් මගේ වාහනය නවත්වලා, මම අරක්කු බීලා ඉන්නේ කියලා මාව පොලීසියට ගෙනියන්න ඕනෑ කිව්වා. ඒ වෙලාවේ මාව වාහනයෙන් බස්සලා, මගේ වාහනයේ යතුර ඉල්ලාගෙන වාහනය පොලීසියට අරගෙන ගියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා භාරදීලා තිබෙන වරප්‍රසාද ප්‍රශ්නය කියවන්න, please.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

මාව පොලීසියට අරගෙන ගිහිල්ලා එහි ගොඩනැඟිල්ලක 3වැනි මහලේ කාමරයකට එක්කගෙන ගිහිල්ලා මට බැලුම් බෝලයක් දුන්නා, පුම්බන්න කියලා. මගේ පුතාත් එක්කයි මම එතැනට ගියේ. මගේ බිරිඳ වාහනයේ තනියම ඉන්දවලා තමයි මම ගියේ. මගේ පුතාත් එක්ක උඩ තට්ටුවට අරගෙන ගිහිල්ලා මට බැලුම් බෝලයක් පුම්බන්න දීලා පරීක්ෂා කළා. නමුත්, මම වැරදිකරුවෙක් වුණේ නැහැ. මගේ ඒ පරීක්ෂණය negative. මම එදා දවසේම අරක්කු බීලා නැහැ. අපි කන බොන මිනිස්සු තමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත්, මම එදා දවසේ බීලා නැහැ. මම අරක්කු බීලා කියලා පැය භාගයක් මාව අපහසුතාවට පත් කළා. අරක්කු බිව්වා නම් මම වාහනය පදවන්නේත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නය කියවන්න, please.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒක තමයි කියවන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මට හම්බ වුණු වරප්‍රසාද ප්‍රශ්නයේ ඔබතුමා කියන ඔය දේවල් නැහැ.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක මගේ ගෞරවයට අපකීර්තියක් කරන්න, මගේ ගෞරවයට හානි කරන්න හිතාමතා කරපු වැඩ පිළිවෙළක්. මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. මගේ පාර්ලිමේන්තු identity card එක ඔවුන්ට ලබා දුන්නා. පාර්ලිමේන්තු identity card එක ලබා දීලාත් ඔවුන් මා ගණන්

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

ගත්තේ නැහැ. මම මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දෙසිය විසිපස්දෙනායි ඉන්නේ. කෝටි දෙකහමාරක පමණ ජනතාවකගේ නියෝජිතයෝ අපි. එම නිසා අපේ ගෞරවය ආරක්ෂා කරන්න ඕනෑ. මෙවැනි දේවල් මීට පෙර සිදු වුණේ නැහැ. ආත්ම ගරුත්වය නැති වන විධියට අපි වැඩ කටයුතු කරලා නැහැ. රටේ මිනිස්සු අපට ආදරය කරනවා. මම හත් වතාවක් පාර්ලිමේන්තුවට පත් වෙලා ආවේ මහජනතාවගේ ගෞරවය අපට තිබෙන නිසායි. අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 224දෙනාට ගරු කථානායකතුමා වග කියන්න ඕනෑ. මට මතකයි, වි.ජ.මු. ලොකුබණ්ඩාර මැතිතුමා ඒ කාලයේ කථානායකතුමා විධියට සිටියදී, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, could you read out what you have submitted and if you have finished with it, let me know.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මට විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එතුමා කථානායකතුමා විධියට ඉන්නකොට මම වාහනයෙන් පාර්ලිමේන්තුවට එද්දී පාරේ ඉර කැපුවා කියලා පොලීසියෙන් මගේ ලයිසන් එක ගත්තා. මම ඒ සම්බන්ධයෙන් පැමිණිලි කළා. ගරු වි.ජ.මු. ලොකුබණ්ඩාර කථානායකතුමා පොලීසියේ කොට්ඨාස භාර නියෝජ්‍ය පොලිස්පතිතුමාත්, පොලීසියේ OIC මහත්මයාත්, traffic police මහත්මයාත් පාර්ලිමේන්තුවට ගෙන්වලා අවවාද කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරුත්වය ආරක්ෂා වන විධියට ඒ ආකාරයෙන් වැඩකටයුතු කරන්න කියලා මම ගරු කථානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ගරු කථානායකතුමාට වගකීමක් තිබෙනවා අප වෙනුවෙන්. ගරු කථානායකතුමා අපේ ආත්ම ගරුත්වය ආරක්ෂා කර දෙන්න ඕනෑ. අපි මහජන නියෝජිතයෝ. මම ඒ අවස්ථාවේ බීලා හිටියේ නැහැ. බීලා හිටියා නම් ප්‍රශ්නයක් නැහැ. අපි කන බොන මිනිස්සු, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මගේ බිරිඳ උණ හැදිලා තමයි ඒ වෙලාවේ වාහනයේ හිටියේ. රට ඉඳලා ආපු මගේ පුතාත් වාහනයේ හිටියා. අපි තුන්දෙනා පොලීසියට අරගෙන ගියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු කථානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ කොට්ඨාසය භාර නියෝජ්‍ය පොලිස්පතිතුමායි, OIC මහත්මයායි, අපියි වහාම පාර්ලිමේන්තුවට කැඳවලා, මේ ගැන විමසලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දෙසිය විසිපස්දෙනාගේ ගෞරවය ආරක්ෂා කරන්න කියලා ඒ අයට උපදෙස් දෙන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I shall bring that matter to the notice of the Hon. Speaker. Thank you.

ගරු දිලිප් වෙදආරච්-චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මේ විධියට වැඩ කරගෙන ගිහිල්ලා හරියන්නේ නැහැ නේ. අපි ගෙවල් දොරවල් හදන මේසන් බාස්ලා වාගේ මිනිස්සු නොවෙයි නේ. අපි වැදගත් පවුල්වල මිනිස්සු හැටියටයි පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගෙන් මම බැගෑපත්ව ඉල්ලීමක් කරනවා, අපේ ගෞරවය ආරක්ෂා කරලා ඕනෑ දේශපාලනයක් කරන්න කියලා. අපි ආත්ම ගරුත්වය රැකගෙන ඉන්න මිනිස්සු. අපි කාලා බීලා නම් වාහන පදවන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය මම ගරු කථානායකතුමාට යොමු කරන්නම්.

The next Question of Privilege is to be raised by the Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law.

වරප්‍රසාද: 2025.07.17 දින කෝප් කමිටුවේදී කරන ලද චෝදනාව
சிறப்புரிமை: 2025.07.17ஆம் திகதி 'கோப்' குழுவில் முன்வைக்கப்பட்ட குற்றச்சாட்டு
PRIVILEGE: ALLEGATION MADE AT COPE HELD ON 17.07. 2025

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025.07.17 දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඉදිරියේ, රජයට අයිති හන්තාන වත්තෙන් අක්කර 43ක ඉඩමක් දේශපාලන බලපෑම් යොදාගෙන නීති විරෝධී ලෙස මාගේ නමට පවරා ඇති බවට ජාතික ජන බලවේගයේ මන්ත්‍රීන් කිහිපදෙනෙක් සහ නිලධාරීන් සාකච්ඡා කර ප්‍රකාශයට පත් කරන ලදී. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී ප්‍රකාශයට පත් වූ එම අසත්‍ය සහ අපහාසාත්මක ප්‍රකාශය උපයෝගී කරගෙන මාධ්‍ය සහ සමාජ මාධ්‍ය හරහා මේ ඉඩමේ අයිතිය පිළිබඳව මාගේ කීර්ති නාමයට හානි වන ආකාරයට පුවත් සංසරණය විය.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඉදිරියේ සාකච්ඡාවට භාජන වූ ඒ හන්තාන ඉඩමේ අයිතියක් කිසිදු දිනක මට නොතිබුණි. ඒ වාගේම රජයට අයිති කිසිදු ඉඩමක් මාගේ නමට මෙතෙක් පවරාගෙන නොමැත.

1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ උපලේඛනයේ, "අ" කොටසේ 8වන වගන්තියට අනුව මන්ත්‍රීවරයකු වශයෙන් යම් මන්ත්‍රීවරයකුගේ ක්‍රියා කලාපය ගැන යම් අපහාසාත්මක ප්‍රකාශයක් පළ කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පමණක්ම දඬුවම් කළ හැකි වරදකි. ඒ වාගේම එහි "අ" කොටසේ 4වන වගන්තිය අනුව පාර්ලිමේන්තුව හෝ යම් කාරක සභාවක් රැස්වීමේ අදහසින් පාර්ලිමේන්තුව වෙත හෝ යම් කාරක සභාවක් වෙත ව්‍යාජ, අසත්‍ය හේතු ඉදිරිපත් කිරීමත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පමණක්ම දඬුවම් කළ හැකි වරදකි. ඒ වාගේම එහි උපලේඛනයේ "ආ" කොටසේ 4වන වගන්තියට අනුව පාර්ලිමේන්තුව තුළ දී හෝ කාරක සභා තුළ දී මන්ත්‍රීවරයකුට නින්දා කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය හෝ පාර්ලිමේන්තුව විසින් දඬුවම් කළ හැකි වරදකි.

එමෙන්ම, 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ උපලේඛනයේ 14වන වගන්තියේ "අ" කොටස

ප්‍රකාරව යම් තැනැත්තකු කාරක සභාවක් ඉදිරියේ යම් පරීක්ෂණයක් පවත්වාගෙන යන අතරතුර යම් ප්‍රශ්නයකට ඕනෑකමින් අසත්‍ය පිළිතුරක් දෙන්නේ නම් දණ්ඩ නීති සංග්‍රහයේ 190වන වගන්තිය යටතේ වරදකට ඔහු වරදකරු විය යුතුය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කිසිම අයිතියක් නැති හන්තාන ඉඩමක් මම දේශපාලන බලපෑම් යොදාගෙන අයිති කරගෙන ඇති බවට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව තුළ කරන ලද ප්‍රකාශය අසත්‍ය ප්‍රකාශයක් වන අතර එය මට කරන අපහාසයක් මෙන්ම නින්දාවකි. මේ අසත්‍ය, අපහාසාත්මක සහ නින්දිත ප්‍රකාශය මඟින් මාගේ කීර්ති නාමයට විශාල හානියක් වූ අතර, උක්ත සඳහන් වගන්ති කඩ කිරීමෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක වන මාගේ වරප්‍රසාද කඩවී ඇත. එම නිසා මාගේ වරප්‍රසාද කඩවීම පිළිබඳ ප්‍රශ්නය ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලෙස මම ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මන්ත්‍රීවරුන්ගෙන් වැඩි පිරිසක් ජනතා ඡන්දයෙන් තේරී පත් වූ අය. එලෙස තේරී පත් වූ මන්ත්‍රීවරියක වන මට මේ කරන අපහාසාත්මක සහ නින්දිත ප්‍රකාශ මට ඡන්දය ලබා දුන් මහනුවර දිස්ත්‍රික්කයේ සියලුදෙනාට කරන අපහාසයක් සහ නින්දාවක් හැටියට තමයි මම සලකන්නේ. ඉතින්, මේ පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස මම ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I shall bring it to the notice of the Hon. Speaker for necessary action.

Thank you.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
Sir, on behalf of the Leader of the House of Parliament, I move,

> "That notwithstanding the provisions of Standing Order No. 8 of Parliament, the hours of sitting of Parliament on this day shall be 9.30 a.m. to 12.30 p.m. and 1.00 p.m. to 6.00 p.m. At 5.00 p.m., Standing Order No. 8(5) of Parliament shall operate. At 6.00 p.m., Mr. Speaker shall adjourn Parliament."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත
காணி அபிவிருத்தி (திருத்தம்) சட்டமூலம்
LAND DEVELOPMENT (AMENDMENT) BILL

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

> "(464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6) இன்படி கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Agriculture, Livestock, Land and Irrigation for report.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Notice of Motions and Orders of the Day.

Item Nos. 1 to 3 to be moved by the Hon. (Dr.) Anil Jayantha. You have 18 minutes.

සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත් කෙටුම්පත
வேலையாட்களின் வரவுசெலவுத்திட்ட நிவாரணப்படி (திருத்தம்) சட்டமூலம்
BUDGETARY RELIEF ALLOWANCE OF WORKERS (AMENDMENT) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[12.08 p.m.]

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)
Hon. Deputy Speaker, I move,

"That the Bill be now read a Second time".

In addition to that, Sir, I also move Item No. 2, the Budgetary Relief Allowance of Workers (Amendment) Bill, and Item No. 3, the National Minimum Wage of Workers (Amendment) Bill.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත, 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත සහ 2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත යන පනත් තුනේ සංශෝධන තමයි අද විවාදයට ගැනෙන්නේ. 2025 වර්ෂයේ අය වැයෙන් අපි රාජ්‍ය අංශයේ වැටුප් වැඩි කිරීමක් කළා. ඒක සියයට 60-80 අතර ප්‍රමාණයක විශාල වැටුප් වැඩි කිරීමක්. ඒ වාගේම වැටුප් වර්ධක සියයට 80ක ප්‍රමාණයකින් වැඩි කිරීමට පසුගිය අය වැයෙන් යෝජනා කළා. ඒ සඳහා රුපියල් බිලියන 325ක ප්‍රතිපාදනයක් වෙන් කළා. එය අදියර තුනක් යටතේ ගෙවන පරිදි යෝජනා කළා.

අපි දන්නවා, ලංකාව ඇතුළේ ජාතික නිෂ්පාදනයට දායක වන, නිෂ්පාදන ක්‍රියාවලියට එකතු වෙන, විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ ශ්‍රමය සැලකිය යුතු ප්‍රමාණයක් තිබෙන බව. ඒ පෞද්ගලික අංශයේ වැටුප් වැඩිවීම්, දීමනා සහ යම් යම් දේවල් පෞද්ගලික අංශයේ කැමැත්ත පරිදි කරනවා වුණත්, රාජ්‍ය අංශයේ වැටුප් වැඩිවීමට සාපේක්ෂව පෞද්ගලික අංශයේත් වැටුප් වැඩි වීමක් කළ යුතුයි කියන ස්ථාවරයේ ඉඳගෙන අපි සාකච්ඡා පැවැත්වූවා, විශේෂයෙන්ම වෘත්තීය සමිති, සේවා යෝජකයන්, ඒකට සම්බන්ධ රාජ්‍ය ආයතන එකතු කරගෙන එක මේසයක් මතදී. මේ මොහොතේදී මේ වැටුප් වැඩි කිරීම සිද්ධ කරන්න ඔවුන්ට දායක වෙන්න පුළුවන් කොහොමද කියලා අපි සාකච්ඡා කළා. මේ රට වට්ටලා තිබිච්ච තැනින් ඉදිරියට අරගෙන යනකොට රට උද්ධමනයකට මුහුණ දීලා තිබුණා. ඒ, සියයට 70ක විතර උද්ධමනයක්. එහි ප්‍රතිඵලයක් විධියට සේවකයන්ගේ වේතනයත් පහළ ගිහිල්ලා තිබුණා. අපේ ආණ්ඩුව බලයට පත් වෙනකොට අවුරුදු එකහමාරකට වැඩි කාලයක් කැඳවලා තිබිච්ච නැති ජාතික කම්කරු උපදේශක සභාව අපි කැඳෙව්වා. ඒක කැඳවලා අපි පළමුකොටම ඒ වැටුප් සංශෝධනය පිළිබඳව සාකච්ඡා කළා.

අපි මේ වෙනකොට ජාතික කම්කරු උපදේශක සභාව අවස්ථා හතරකදී කැඳවලා තිබෙනවා. රාජ්‍ය අංශයට විශාල වැටුප් වැඩිවීමක් වෙන නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෞද්ගලික අංශයටත් ඒ වැටුප් වැඩි වීම දෙන්න කියලා අපි සාකච්ඡා කළා. දැනට මේ වැටුප් සම්බන්ධයෙන්, සේවකයන්ගේ අවම වේතනය සම්බන්ධයෙන් තිබෙන පනත තමයි, 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත. ඒකට අනුව සේවකයෙකුගේ අවම වැටුප රුපියල් 17,500යි. ඒ නිසා අපට අවශ්‍ය කළා, දැනෙන වැටුප් වැඩි කිරීමක් කරන්න. අපි රුපියල් 30,000ක මට්ටමට ඒක ගෙන ඒමට සාකච්ඡා කළා. නමුත්, සේවායෝජකයන්ගේ පැත්තෙන් ඉල්ලීමක් කළා, එකවර රුපියල් 30,000 වැඩි කරන්න එපා කියලා. අද තිබෙන උද්ධමනයත්, ආර්ථික තත්ත්වයත් සැලකිල්ලට භාජන කරලා, රුපියල් 30,000 වැඩි නොවන බව අපි සඳහන් කළත්, රුපියල් 30,000 එකවර වැඩි කරන්න බැහැ කියලා අදියර දෙකකින් වැඩි කරන්න වෘත්තීය සමිති එක්ක එකඟ වුණා. ඒ අනුව, රුපියල් 27,000ක් 2025 අප්‍රේල් 01වැනි දා සිට බලපැවැත්වෙන පරිදිත්, රුපියල් 30,000 දක්වා එය තවත් රුපියල් 3,000කින් 2026 ජනවාරි 01වැනි දා සිට බලපැවැත්වෙන පරිදිත් වැඩි කරන්න එකඟ වෙලා, 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත සංශෝධනයට එකඟ වුණා.

ඒත් එක්කම මීට කලින් සේවකයන්ගේ වැටුප් වැඩිවීම් පිළිබඳ අත්දැකීම් බැලුවාම, මූලික වැටුප්, එහෙම නැත්නම් අවම වැටුප් ඉහළට ඔසවනවාට වඩා යම් යම් දීමනා ලබා දීම හරහා ඒ සේවකයන්ට ආර්ථික වශයෙන් මුහුණ දීමට සිදු වුණු තත්ත්වය සඳහන් කර තිබුණා. ඒ අනුව මේකත් එක්ක ඇඳෙන අණ පනත් දෙකක් තිබුණා. ඒ කියන්නේ, 2005 අංක 36 සහ 2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත්. ඒ අනුව රුපියල් 3,500ක දීමනා එකතු කරලා තිබුණා. ජාතික කම්කරු උපදේශක සභාවේ ඉල්ලීම සහ එකඟතාව වුණේ, රුපියල් 30,000 දක්වා මූලික වැටුප වැඩි කරලා, ඒ වැටුපට මේ එකතු වෙලා තිබෙන දීමනා වන රුපියල් 3,500ත් අන්තර්ගත වන විධියට අරගෙන අර දීමනා අයින් කරන්නයි. ඒ සියලු පාර්ශ්වවල එකඟතාව මත තමයි මේ පනත් දෙක අපි සංශෝධනයට ලක් කළේ. අපි ඒ සඳහා අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබාගෙන, ඒ අදාළ ගැසට් නිවේදනය නිකුත් කළා. ඒක පාර්ලිමේන්තු න්‍යාය පුස්තකයට ඇතුළත් කරලා, පාර්ලිමේන්තුවට මේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කළාම, මේ පනත් කෙටුම්පත් තුනෙන් දෙකක්, ඒ කියන්නේ, අය වැය සහන දීමනා පනත් කෙටුම්පත් දෙක උසාවියේ -අධිකරණයේ- අභියෝගයට ලක් කළා. ඒ පනත් කෙටුම්පත් දෙකෙන් කිව්වේ සහන අයින් කරනවා කියන එක නොවෙයි, ඒ සහන අන්තර්ගත කරනවා, ප්‍රධාන මූලික වැටුපට. හැබැයි, ඒ සඳහා මේ පනත් කෙටුම්පත් තුනම එකවර අරගෙන කියවිය යුතු වනවා. නමුත්, උසාවියේ අභියෝගයට ලක් කළේ එයින් පනත් කෙටුම්පත් දෙකක් පමණයි. මේ සහන දීමනා මූලික වැටුපට අන්තර්ග්‍රහණය කළාම කාට හරි අර්ථකථනය කරන්න පුළුවන් මේ වනකල් සේවකයන් ලබාගෙන තිබුණු අයවැය සහන දීමනා රුපියල් 3,500කින් අඩු වනවා කියලා. එම නිසා ඒ කොටස විතරක් උසාවියේ අභියෝගයට ලක් කළා. විශේෂයෙන්ම එය අභියෝගයට ලක් කළේ ජාතික කම්කරු උපදේශක සභාවේ නියෝජනයට සම්බන්ධ වෙන්නේ නැති වෘත්තීය සමිති දෙකක්. නමුත්, සේවකයන්ගේ පැත්තෙන් ඔවුන්ට තිබුණා, අවශ්‍ය නම් සමස්තය අධ්‍යයනය කරලා මේ කටයුත්ත දෙස බලන්න.

ඒ පනත් කෙටුම්පත් දෙක නිරපේක්ෂව අරගෙන බැලුවොත්, සේවකයන්ට මේ වනකල් ලැබුණු රුපියල් 3,500ක දීමනාව අහිමි වෙනවා. හැබැයි, ඒ දීමනාව අහිමි වීම ගැට ගැහිලා තිබුණේ මූලික වැටුප -අවම වේතනය- වැඩි කිරීමත් එක්ක. ඒ නිසා තමයි උසාවිය නියෝගයක් නිකුත් කරන්නේ, පළමුකොට මූලික, නැත්නම් අවම වැටුප වර්ධනය කරන එක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා ඒක සම්මත කරගෙන, දෙවනුව මේ අයවැය සහන දීමනා පනත් ටික සංශෝධනය කර ගැනීමට. ඒක එක ක්‍රමයක්. එහෙම නැත්නම්, අයවැය සහන දීමනා පනත් කෙටුම්පත් අයින් වන නිසා එය වෙනමම තුනෙන් දෙකක බහුතරයකින් සම්මත කර ගත යුතුයි කියන නියෝගය. අවම වැටුප වැඩි කර ගැනීම සම්මත කරලා, ඉන් පසුව අයවැය සහන දීමනා සම්මත කර ගන්න ගියොත් තවත් ප්‍රමාද වන නිසා තමයි, මේ පනත් තුනම අද එකවර ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේකට හේතුවක් තිබෙනවා. දැනටමත් මේ වැටුප් ගෙවීම ප්‍රමාදයි. වැටුප් ගෙවීම ප්‍රමාදයි. 2025 අප්‍රේල් 01වැනි දා ඉඳලායි මේ වැටුප් වැඩිවීම ගෙවන්න නියම වෙලා තිබුණේ. නමුත් ඒක ප්‍රමාදයි.

තවදුරටත් කල් නොයවා ඒක ඉක්මන් කරන එක සේවකයන්ගේ පැත්තෙනුත්, හාම්පුතුන්ගේ පැත්තෙනුත් වැදගත් වනවා, මුදල් ගෙවීමේදී ඔවුන්ගේ මුදල් ප්‍රවාහ හසුරුවා ගැනීමට.

සමහර සේවායෝජකයන් - හාම්පුතුන් - මේ නඩු තීන්දුව එන්න කලින් -ඔවුන් දන්නවා, ජාතික කම්කරු සභාවේදී මේ තත්ත්වයට එකඟ වුණා කියලා- අදාළ වැටුප් ගෙවීම සිද්ධ කරගෙන ගියා. ඒ අනුව මේ සංශෝධනයෙන් සිදු වෙන්නේ මොකක්ද, පෞද්ගලික අංශයේ වැටුප් වැඩි වෙන්නේ මොන විධියටද කියලා සංඛ්‍යා දත්ත කිහිපයක් ඉදිරිපත් කළොත්, 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනතට අනුව 2016දී එය රුපියල් 10,000ක් බවට තමයි නිශ්චය කර තිබුණේ.

ඊට පස්සේ 2021දී කරන ලද සංශෝධනය අනුව එය රුපියල් 12,500 දක්වා වැඩි කරලා තිබුණා. ඊටත් පස්සේ 2024 සැප්තැම්බර් සිට ක්‍රියාත්මක වන පරිදි 2024 අංක 48 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනතින් එය රුපියල් 17,500 දක්වා වැඩි කරලා තිබුණා. ඒ ආදි වශයෙන් එය රුපියල් 2,500කිනුත්, රුපියල් 5,000කිනුත් වැඩි කරලා තිබුණා. ඒ පනත් සංශෝධන තුළම ජාතික අවම මාසික වේතනය සමඟ ජාතික අවම දෛනික වේතනයත් අන්තර්ගත කර තිබෙනවා. ඒ අනුව, 2016 ජාතික අවම දෛනික වේතනය රුපියල් 400ක්ව තිබුණා. 2021දී එය රුපියල් 500 දක්වා වැඩි වෙලා තිබුණා. 2024දී එය රුපියල් 700 දක්වා වැඩි වෙලා තිබුණා. අපේ ආණ්ඩුව යටතේ කරන ලද මේ සංශෝධනයෙන් ජාතික අවම මාසික වේතනය රුපියල් 30,000 දක්වා වැඩි කළාම, සේවකයන්ගේ ජාතික අවම දෛනික වේතනය රුපියල් 1,200 දක්වා වැඩි වෙනවා. 2025 අප්‍රේල් 01වැනි දා සිට 2025 දෙසැම්බර් 31වැනි දා දක්වා ජාතික අවම දෛනික වේතනය රුපියල් 1,080ක් දක්වා වැඩි වෙනවා. රුපියල් 17,500ක්ව තිබුණු ජාතික අවම මාසික වේතනය රුපියල් 30,000 දක්වා රුපියල් 12,500කින් වැඩි කිරීම තමයි මේ සංශෝධනය මඟින් සිදු කරනු ලබන්නේ. එය සැලකිල්ලට භාජන කළ යුතු වෙනවා.

අපි කවුරුත් දන්නවා, සේවකයන්ගේ ශ්‍රම දායකත්වය සැලකීමේදී අවම මූලික වැටුප - minimum wage එක - රුපියල් 30,000 කියන එකත් අද පවතින උද්ධමනකාරී තත්ත්වයන්ට අනුව ප්‍රමාණවත් නොවන බව. සාමාන්‍ය පවුලකට ජීවත් වෙන්න, සාමාන්‍ය ජීවන තත්ත්වයක් ගෙනියන්න එය රුපියල් ලක්ෂයක වාගේ ඉහළ ප්‍රමාණයක් වෙන්න ඕනෑ. නමුත්, අපි හෙමින් ඉදිරියට යන්නේ. ආර්ථිකය ස්ථාවර කරලා, ආයෝජන කැඳවලා, රටේ නිෂ්පාදනය වැඩි කිරීමෙන් තමයි වැටුප් වැඩි කිරීම සිදු කර ගත යුතු වන්නේ. එහෙම නැතුව පනත් සංශෝධනයකින් විතරක් එය වැඩි කර ගන්න බැහැ. අන්න ඒ එකඟතාව මත මේ පාර්ශ්ව තුන එකට කැඳවලා, ඉදිරියේදී නිෂ්පාදන වැඩි කර ගන්න, ආයෝජන වැඩි කර ගන්න වැඩ කරන ගමන්ම, ඒ සඳහා යම් උත්තේජනයක් ලබා දීමට තමයි සේවකයන්ට මේ වැටුප් වැඩි කිරීම සිදු කරන්නේ. ආයෝජන කැඳවීමේදී වැටුප් වැඩි කිරීම සිද්ධ කරන ගමන්ම, තවත් නීති-රීති ගණනාවක් සංශෝධනය කර ගන්න අපට සිද්ධ වෙනවා. අපට හුරු වෙලා තිබුණේ වැටුපක් වැඩි කර ගන්නා එක, වෙනත් වරප්‍රසාදයක් ලබා ගන්නා එක හාම්පුතා -සේවායෝජකයා - එක්ක ගැටිලා ලබා ගන්නා පරිසරයක්. අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා, අපේ ආණ්ඩුව යටතේ ඒ පරිසරය වෙනස් කරමින් කටයුතු කරන්න. ඒ අනුව සේවායෝජකයන්, සේවකයන්, ආණ්ඩුවේ ආයතන විතරක් නොවෙයි, මේ හා සම්බන්ධව ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක වන ජාත්‍යන්තර කම්කරු සංවිධානය වැනි ආයතන ශ්‍රමය සම්බන්ධයෙන් ඉදිරිපත් කරලා තිබෙන ජාත්‍යන්තර ප්‍රමිතීන් සම්බන්ධයෙන් ඒ ආයතන සමඟ අපි මේ වෙනකොට අඛණ්ඩව සාකච්ඡා පවත්වමින් යනවා. ඒ අනුව අපට අවශ්‍ය කරනවා, යම් ආකාරයක යහපත් නිෂ්පාදන සම්බන්ධතාවක් ලංකාව ඇතුළේ ස්ථාපිත කර ගන්න. මෙන්න මේ කියන නිෂ්පාදන සම්බන්ධතාව ස්ථාපිත කර ගත්තොත් තමයි, ආයෝජන ප්‍රමුඛ කරගෙන රටේ නිෂ්පාදනය වැඩි කර ගන්න පුළුවන් වන්නේ. මේ නිෂ්පාදන සම්බන්ධතාව වැඩි කර ගන්න නම්, මේ එකඟතාව මත සේවකයන්ගේ ප්‍රතිලාභ යම් ප්‍රමාණයකට වැඩි කර ගන්න පුළුවන් වෙනවා. මේ සඳහන් කරලා තිබෙන්නේ අවම සීමාවයි. අපි උත්සාහ කරනවා, රටේ නිෂ්පාදනය හා ආයෝජන වැඩි කරලා මේ මට්ටම් තව තවත් ඉදිරියට ගෙනියන්න. ඒ අනුව අපි දේශීය ආයෝජකයන්, විදේශීය ආයෝජකයන් රට තුළට කැඳවා ගැනීමේ ව්‍යාපෘතියක, වැඩසටහනක තමයි දැන් ඉන්නේ. අපට පළමුවැනි මාස හය, හත, අට ඇතුළත සිද්ධ වුණා අස්ථාවරව, බිඳ වැටිලා, එක තැන පල් වෙමින්, හිර වෙමින් තිබුණු ආර්ථිකය නැවත නඟා සිටුවීම සඳහා අවශ්‍ය කරන ආර්ථික ස්ථායීකරණ වැඩ කටයුත්ත කරන්න. ඒ ස්ථායීකරණ වැඩසටහන අපි නිසි පරිදි කරලා තිබෙනවා. නමුත්, ආර්ථික ස්ථායීකරණයෙන් ඒ සියලු ප්‍රශ්න විසඳෙන්නේ නැහැ. ආයෝජන කැඳවමින් මෙය ඉදිරියට ගෙනියන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය කරන වැඩ පිළිවෙළ, වටපිටාව, ආණ්ඩුවේ මැදිහත්වීම වේගයෙන් අඛණ්ඩව සිද්ධ වෙනවා. එහි එක ප්‍රගතියක් විධියට අපට පුළුවන්කම ලැබුණා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ කරගෙන යන වැඩසටහන ඇතුළේ මේ ස්ථායීකරණය ඉදිරියට අරගෙන යන්න.

ඒ අනුව මේ වනකොට සමාලෝචන හතරක් අවසන් වෙලා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් අපට පස්වන වාරිකය නිදහස් කරලා තිබෙනවා. ඒත් එක්කම පස්වැනි සමාලෝචනය ආරම්භ කිරීමේ මූලික සාකච්ඡාවක් පසුගිය සඳුදා ආරම්භ වුණා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිත පිරිසක් ඇවිල්ලා ඒ පිළිබඳව සාකච්ඡා කළා. මේ වෙනකොට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් අපට ඉදිරිපත් කරපු quantitative performance criteriaවලට අමතරව, ඔවුන් විශේෂ ඇගයීමකට ලක් කළා යහපත් ආණ්ඩුකරණය කියන කාරණය. මොකද, ආයෝජකයන්ගේ විශ්වාසය වර්ධනය කර ගන්න වැදගත් වන දෙයක් තමයි යහපත් ආණ්ඩුකරණය - good governance - කියන එක.

ඒ නිසා අපි Governance Diagnostic Assessment එක සම්බන්ධයෙන් මැදිහත් වෙලා ඒ කටයුත්ත වේගයෙන් කරගෙන යනවා. මොකද, අපට අවශ්‍යයි වංචාවක්, දූෂණයක් නැති දේශපාලන යන්ත්‍රණයක් විතරක් නොව, වංචාව දූෂණය නැති ව්‍යාපාරික ආර්ථික යන්ත්‍රණයකුත්, වංචාව දූෂණය නැති, හැම කෙනාටම එක මට්ටමින් වැඩකටයුතු කරන්න පුළුවන් හිතවත් ආයෝජන පරිසරයකුත් නිර්මාණය කරගන්න. ඒ නිසා ආයෝජකයන්ගේ විශ්වාසය ගොඩනැඟෙන වැඩ කටයුතු අපි මේ මොහොතේ කරමින් සිටිනවා. ඒ වැඩ කටයුතුවලට අනුව ඉදිරියේදී විදේශීය ආයෝජන, දේශීය ආයෝජන පැමිණීමට නියමිතයි. පසුගිය ජනවාරි මාසයෙන් පස්සේත් ආයෝජන මණ්ඩලය - BoI එක - හරහා අපට විදේශීය ආයෝජන සැලකිය යුතු මට්ටමෙන් ලැබිලා තිබෙනවා. මේ වනකොට තවත් විශාල ඉදිරි ව්‍යාපෘති ගණනාවක් පිළිබඳවත් සාකච්ඡා කරමින් තිබෙනවා. අපට අවශ්‍ය කරනවා, මේ මට්ටම ඉදිරියට අරගෙන යන්න.

එතැනදී අපට එන අභියෝග අතර ජාත්‍යන්තර වශයෙන් අපට පාලනය කරන්න බැරි අභියෝගත් තිබෙනවා. නමුත් අපි ඒවාටත් සාර්ථකව මුහුණ දෙමින් සිටිනවා. ඒ අනුව දැනට පැන නැඟී තිබෙන එක් අභියෝගයක් තමයි ඇමෙරිකා එක්සත් ජනපදයේ තීරු බදු සම්බන්ධ ප්‍රශ්නය. අපි ඒ පිළිබඳ සාකච්ඡාත් අඛණ්ඩව ඉදිරියට ගෙන යනවා. අපේ රටට සියයට 44ක් ලෙස පනවපු එම බද්ද දැන් සියයට 30 දක්වා අඩු කරගෙන තිබෙනවා. එය තවත් අඩු කරමින් රට ඉදිරියට ගෙන යෑමේ ව්‍යායාමයක් තිබෙනවා. නමුත් අපට රට ඇතුළේ තිබෙන අභියෝගය තමයි, ආණ්ඩුව

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

කෙරෙහි විශ්වාසය තහවුරු වෙලා ආයෝජකයන් ඉදිරියට එන අතරතුර අපත් සමඟ එකට එකතු වෙලා ඒ විශ්වාසය ගොඩ නඟනවා වෙනුවට විපක්ෂය දේශපාලනික චුවමනාවන් හෝ වෙනත් කාරණා මත එය තව තවත් පසුපසට ඇදීමේ උත්සාහයයක් දැරීම. එවැනි උත්සාහයන් අපට පෙනෙනවා. මේ පනත් කෙටුම්පත් පිළිබඳ දෙවන වර කියවීමට අදාළ විවාදයේදී මම මෙය අවස්ථාවක් කර ගන්නවා, සැලකිල්ලට භාජන කළ යුතු විශේෂ කාරණයක් ගැන කියන්න. මේ පනත් කෙටුම්පත් විවාදයට ඉදිරිපත් කරන ගමන්ම අප සියලුදෙනාගේ එකඟත්වය, සාමූහික මැදිහත් වීම, කැප කිරීම අවශ්‍යයි මේ වැඩේ ඉදිරියට කරගෙන යන්න.

අද සම්මත කරනු ලබන මේ පනත් කෙටුම්පත් තුනට අදාළව මතු කර තිබෙන වැදගත්ම කාරණය වන්නේ, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමයි. මූලික එකඟතාවක් මත සාමූහිකව සිද්ධ කරන ලද මේ කියන වැටුප් වැඩි වීමෙන් සේවකයන් ලබන උත්තේජනය මත ඉදිරියේදී මේ රටේ ආයෝජනය වැඩි කරන්නත්, යහපත් ව්‍යාපාරික සහ නිෂ්පාදන සම්බන්ධතාවක් ගොඩ නඟන්නත් නිශ්චිත අඩිතාලම දැමීමේ හැකියාවත් ලැබේවි කියලා මම හිතනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. Jagath Vithana. You have seven minutes.

[අ.භා. 12.24]

ගරු ජගත් විතාන මහතා
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම සංශෝධන පනත් කෙටුම්පත් පිළිබඳ විවාදයේදී අදහස් දක්වකොට මා වතු ක්ෂේත්‍රය පිළිබඳව යමක් කිව යුතුයි. වතු ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රායෝගික දැනුමක් තිබෙන පුද්ගලයෙකු විධියට මට කියන්න තිබෙන්නේ, පසු ගිය අය වැය යෝජනාවේ සඳහන්ව තිබෙන එකී සහන ලබා දෙන එක ඉතාම හොඳ බවයි. නමුත් මට තිබෙනවා, කියන්න කාරණා වගයක්. පසුගිය පාලන සමයේ රසායනික පොහොර තහනම් කිරීම නිසා වතු ක්ෂේත්‍රය කඩා ගෙන වැටුණා. ඊට පස්සේ අපි බොහොම අමාරුවෙන් මේ ක්ෂේත්‍රය ගොඩ ගන්න හදන කොට -මමත් වතු සමාගමක අයිතිකාරයෙක්- අප දැකපු දේ තමයි වැවිලිකරුවන්ට අදාළව සියයට 10ක්ව තිබුණු ආදායම් බද්ද සියයට 30 දක්වා වැඩි කරලා තිබීම. මේ ආණ්ඩුවෙන් නොවෙයි රනිල් වික්‍රමසිංහගේ ආණ්ඩුවෙන් ඒක කළේ. ඒක කළාට පස්සේ ගරු ඇමතිතුමනි, අපේ නියෝජ්‍ය කථානායකතුමනි, වතු ක්ෂේත්‍රය පාඩු ලබමින් දිගින් දිගටම ක්‍රියාත්මක වෙනවා. දැන් අප දෙගොල්ලන් අතර ප්‍රශ්නයක් තිබෙනවා. මේ විධියට දිගින් දිගටම පාඩු ලබන්න ගත්තොත් මේ රටේ වැවිලි ආර්ථිකය කඩා වැටෙනවා. ඒ නිසා මේකට දෙන්න තිබෙන හොඳම විසඳුම දිය යුතුයි. මම දන්නවා, රජයට ආදායම ලැබිය යුතු බව. නමුත් ඔබතුමන්ලා අපට පොහොර ටිකවත් VAT එක නැතිව ලබා දෙනවා නම්, එහෙම නැත්නම් රජයෙන් සහනාධාර මුදලක් ලබා දෙනවා නම් හොඳයි. මේ වනකොට තේ කර්මාන්තශාලා 237ක් වැහිලා. ඒත් එක්කම මතු වෙලා තිබෙන අනික් ප්‍රශ්නය මේකයි. මගේ දිස්ත්‍රික්කයේ ආසනවල ඇන්තුරියම් හිටවපු ගෙවල්වල මිදුලේ තේ හිටුවලා තිබෙනවා. ඉතින් ඒ අයගේ අදායම් මාර්ගය නැති වීගෙන යනවා, ගරු ඇමතිතුමනි. ඒ නිසා මේ ගැන අවධානය යොමු කරන්න.

ඊට පස්සේ මට තවත් කාරණයකට යන්න වෙනවා. මම ලොකු පීඩනයකින් ඉන්නේ; ලොකු කම්පනයකින් ඉන්නේ. මම මේ ළඟදී, පාවිච්චි කරපු වාහනයක් ගත්තා. සිකුරාදා හවස මගේ පුතා ඒ වාහනය පදවාගෙන යනකොට පොලීසියෙන් ඇවිල්ලා අත්අඩංගුවට ගත්තා. ඒක මුළු රටටම පෙනෙන්න ඇති. ඒක හරිම අසාධාරණ අත්අඩංගුවට ගැනීමක්. මම ඒ වාහනයෙන් 10 පාරක් විතර පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා. අඩු තරමේ මට දුරකථන ඇමතුමක් දුන්නා නම්, 'මන්ත්‍රීතුමා, වාහනයේ මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා' කියලා, මම ගිහිල්ලා එය බාර දෙනවා. බාර දීලා ඉවර වෙලා මට පුළුවන් නිදහසට කරුණු කියන්න. හිටපු ප්‍රබල ඇමතිවරයෙකුගෙන් - වර්තමාන මන්ත්‍රීවරයෙකුගෙන් - මම ඒ වාහනය ගත්තේ. මම ඒ මන්ත්‍රීතුමාට telephone call එකක් දුන්නා, මට මෙහෙම අසාධාරණයක් වුණා කියලා. එතකොට එතුමා කිව්වා, "ඔව්, මම දන්නවා. මේ වෙච්ච දේ පිළිබඳව මම දන්නේ නැහැ" කියලා. එතුමාගේ දුවගේ නමින් තිබුණු වාහනය මගේ පුතාගේ නමින් Motor Traffic Department එකේ register වෙලා මගේ පුතාට අයිතිවාසිකම ලැබුණා. අද මගේ පුතා ඇප නැතුව හිරබත් කනවා. මම ඊයේ පුතා බලන්න ගිහිල්ලා ආවේ. විශේෂ වරප්‍රසාද පුතා ප්‍රතික්ෂේප කරනවා. කෑම ටික පිටින් ගන්නේ නැහැ. මම හරිම වේදනාවෙන් ජීවත් වෙන්නේ. මා ඇතුළට ගන්න කියලා මම කිව්වා. මම නේ, වාහනයේ අයිතිකරු. මගේ නමින් තිබෙන සමාගමට තමයි අයිති. සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයා මම නිසා මාව අත්අඩංගුවට ගන්න කියලා කිව්වා. නමුත්, මා ගත්තේ නැහැ. මගේ ඉස්සරහදීම මගේ පුතාට මාංචු දාලා සියලු කටයුතු සිද්ධ කරලා ඉවරයි. දැන් දවස් 14කට ඔහුව බන්ධනාගාරගත කරලා තිබෙනවා. පෙර අයිතිකරු ඉදිරිපත් වුණොත් විතරයි ඇප ලැබෙන්නේ. බන්ධනාගාරගත වෙලා සිටින මගේ පුතා ගැන මටත් හිතට අමාරුයි. දැන් බන්ධනාගාරගත වෙන්න යෝජිත හිටපු ඇමතිවරයාගේ, නැත්නම් ඒ අදාළ මන්ත්‍රීවරයාගේ හිතටත් අමාරුයි කියලා මම දන්නවා.

එම වාහනයට වාද්දුවේ HNB එකෙන් කල්බදු පහසුකමක් අරගෙන තිබුණා. ඉඩමක් ගන්න ගියත් එම ඉඩමට බැංකුවෙන් ණය මුදලක් අරගෙන තිබුණොත් ගනුදෙනුකරුට දැඩි විශ්වාසයක් තිබෙනවා, බැංකුවෙන් ණය මුදලක් දීලා තිබෙනවා, එම නිසා ඉතාම පිරිසිදු ඉඩමක් කියලා. ඒ වාගේම තමයි මටත් හිතුණේ. HNB එකෙන් දුන්නු ණය පහසුකම නිසා මට හිතුණා මේ වාහනය අතිපිරිසිදු වාහනයක් කියලා. මම වාහනය අරගෙන ගිහිල්ලා Motor Traffic Department එකට papers ටික භාර දුන්නාම, මගේ සමාගමේ නමට ලියාපදිංචි කරලා දවස් 4ක් ඇතුළත වාහනයේ පොත මට ලබා දුන්නා. ඊට වඩා මොකක්ද බලන්න තිබෙන්නේ?

එම නිසා මට කියන්න තිබෙන්නේ මෙච්චරයි. මම එම වාහනය විතරක් තිබෙන මිනිහෙක් වුණා නම්, ඒ කියන්නේ එක වාහනයක් විතරක් තිබෙන මිනිහෙක් වුණා නම්, මේ වෙනකොට සිය දිවි නසාගෙන. දැන් මගේ පුතා අත්අඩංගුවේ ඉන්නේ. පුතාට පොඩි ළමයි දෙන්නෙක් ඉන්නවා. ඒ දරුවන්ගේ වයස අවුරුදු 2යි, අවුරුදු 3යි. ඒ ළමයි මගෙන් තාත්තා ඉල්ලනවා. මට ඒ දරුවන්ට තාත්තා දෙන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Jagath Vithana, this is a matter pending before court. Therefore, I think it would be better not to refer to it.

ගරු ජගත් විතාන මහතා
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උසාවියේ තිබෙන කරුණු ගැන මම කථා කරන්න යන්නේ නැහැ. මම කථා කරන්නේ සාධාරණත්වය ගැන විතරයි. ඒ සාධාරණත්වය මට ලැබෙන්නේ නැහැ කියලා මම දන්නවා. ඒත්, මේ අසාධාරණය ජනතාවට වෙන්න දෙන්න එපා. මට මේක ඉවසාගන්න පුළුවන්. මට වාහනය නැති වෙන්න පුළුවන්, මට මුදල් නැති වෙන්න පුළුවන්. ඒත් මේ ජීවිතය මට නැති වුණොත්? මට හිරේ ඉන්නත් පුළුවන්. නමුත්, මේ අසාධාරණය රජයේ සේවකයෙකුට, දුප්පත් මිනිහෙකුට, නැත්නම් දරාගන්න බැරි මිනිහෙකුට වුණොත් මොකද වෙන්නේ කියලායි මම මේ අහන්නේ. ඒ නිසා කරුණාකරලා අවම බලය පාවිච්චි කරන්න කියලා උපදෙස් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. උසාවියේ තිබෙන කාරණයක් ගැන මම මත ප්‍රකාශ කරන්නේ නැහැ. ගරු අධිකරණයටත් කරන්න දෙයක් නැහැ. මම මේ අදහස් ටික ප්‍රකාශ කළේ මට වෙන කියන්න තැනක් නැති නිසයි. ජනතාවගේ අදහස් මම මේ කියන්නේ. පුතාට ඇප දීලා එළියට ගත්තාට පස්සේ මට මීට වඩා දේවල් කියන්න පුළුවන්. එම නිසා මේ වගේ දේවල් කරන්න එපා. ගරු ඇමතිතුමනි, මම වතු ක්ෂේත්‍රය ගැනත් කථා කරන්නම්. මේ දෙපාර්ශ්වයම කඩා වැටෙන තැනට ගෙනියන්න දෙන්න එපා. අපි දෙගොල්ලෝ අතර සාමූහිකත්වයක් පවතින්නේ කොච්චර කාලයක ඉඳලාද?

මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. මාධ්‍ය ප්‍රකාශකතුමා කියනවා මම දැක්කා, අපි දෙන්නට දෙන්නා පිට කහගන්නවා කියලා. ඒ කියන්නේ, රෝහිත අබේගුණවර්ධනයි, ජගත් විතානයි දැනුවත්ව තමයි මේ ඔක්කෝම කෙරෙන්නේ කියලා තමයි කිව්වේ. එවැනි ප්‍රකාශයක් කරනකොට අපි අපේ සහෝදරත්වය, අපේ සහෝදරකම ගැන හිතන්න අවශ්‍යයි. මේ ඉන්නේ පාර්ලිමේන්තුවේ සිටින 225දෙනාගෙන් එක්කෙනෙක් නේද කියලා හිතන්න තරමට කාරුණික වෙන්න කියලා මම ඔබතුමාගෙන් සහ මේ සභාවෙන් ඉල්ලා සිටිනවා. මෙහෙම වෙන්න බැහැ. අපි ඔක්කෝම එක අම්මාගේ ළමයි. අපි සහෝදරත්වයෙන් පාර්ලිමේන්තුවේ ඉන්නේ. අපි වාද විවාද කරනවා. අපි වාද විවාද කරන්නේ සද්භාවයෙන්. එහෙම නැතුව ගහගන්න වාද විවාද කරනවා නොවෙයි නේ. උසාවියේ තිබෙන කටයුත්තක් පිළිබඳව අර විධියට කියලා, දෙදෙනාම චූදිතයෝ කියලා, දෙදෙනාම දඬුවම් ලැබිය යුතුයි කියන තරමට මාධ්‍ය ප්‍රකාශයක් කරන තරමට, මේක දුරට ගිහින් තිබෙ නවා.

හරි අමාරුවෙන් තමයි කළුතර දිස්ත්‍රික්කයෙන් අපේ මන්ත්‍රීවරු දෙන්නෙක් මෙතැනට පත්වෙලා ආවේ. ඒ දෙන්නාගෙන් එක්කෙනෙක් මම. අපේ මිනිස්සු, අපි වටා සිටින මිනිස්සු නොයෙක් කථා කියනවා. මම හිතනවා, එහෙම දෙයක් වෙන එකක් නැහැ කියලා.

මතුගම ප්‍රාදේශීය සභාවේ බලය පිහිටුවීමේදී මම ඉතාම වගකීමෙන් කටයුතු කළා. මෙය මට ඒකට ලැබුණු පදක්කමක්ද, gold medal එකක්ද මේක කියලා මම දන්නේ නැහැ. හැබැයි, මම දිනපු ප්‍රාදේශීය සභා දෙකම ආණ්ඩුවට දුන්නා. මම මේ අවස්ථාවේ ඒ කාරණයත් සිහිපත් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order,please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු විජිත හේරත් ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා.1.00]

ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජාතික ජන බලවේගයේ අපි භාර ගත්තේ ආර්ථික වශයෙන් බංකොලොත් වෙලා තිබුණු රටක්. ආර්ථික වශයෙන් බංකොලොත් වෙලා තිබුණු රටක් භාර ගෙන කෙටි කාලයක් තුළ අපේ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර අපි ප්‍රතිව්‍යුහගතකරණය කළා. ඒ වාගේම ද්විපාර්ශ්විකව ලබා ගත් ණය ප්‍රතිව්‍යුහගතකරණ කටයුතුත් දැන් අවසන් වෙමින් පවතිනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ එම ක්‍රියාවලියත් එක්ක අපි බලයට එන්න කලින් පැවැති පසුගිය ආණ්ඩුව කටයුතු කරමින් තිබුණා. අපි බලයට පැමිණියාට පසුව එම සාකච්ඡා දිගටම පවත්වා ගෙන යමින් ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමත්, අපේ ආර්ථිකයේ ඉලක්ක සම්පූර්ණ කර ගැනීම දක්වා වුණු ගමනත් අපි ඉතා සාර්ථකව යමින් තිබෙනවා.

අද දවස වනවිට අපේ රටට සංචාරකයින්ගේ පැමිණීම විශාල වශයෙන් වැඩි වෙලා තිබෙනවා. සංචාරකයින්ගේ පැමිණීමත් එක්ක අපේ අපේක්ෂිත ආදායම් ඉලක්ක අපට සම්පූර්ණ කර ගන්න පුළුවන්. ඒ වාගේම විදේශගත ශ්‍රී ලාංකිකයන් සාමාන්‍යයෙන් දළ වශයෙන් මාසයකට ඩොලර් මිලියන 650ක විතර මුදලක් ලංකාවට එවනවා. එම ආදායමත් දවසින් දවස වැඩිවෙමින් පවතිනවා. ඒ නිසා විදේශ ප්‍රේෂණ, සංචාරකයන් හරහා ලැබෙන විදේශ විනිමය අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න ප්‍රධාන වශයෙන් පිටිවහලක් වෙලා තිබෙනවා. ඒ වාගේම පසුගිය කාර්තු 2දීම අපේ අපනයන ආදායම වැඩි කරගන්න අපි සමත් වෙලා තිබෙනවා. එසේ අපනයන ආදායම වැඩි කර ගැනීමත් එක්ක අපේ රටේ නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් වෙන්න පටන් ගෙන තිබෙනවා. එම කටයුතු ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම අපේ රටේ ඇති වුණු ආර්ථික ස්ථායීතාවත්, දේශපාලන ස්ථාවරත්වයත් නිසා විදේශ ආයෝජකයන්ගේ පැමිණීම වර්ධනය වෙලා තිබෙනවා. ගිය අවුරුද්දේ පළමු මාස 7 ඇතුළත ඩොලර් මිලියන 250ක වාගේ විදේශ ආයෝජන ලැබී තිබුණා. අද වනවිට -මේ කෙටි කාලය තුළ- ඩොලර් මිලියන 507ක විදේශ ආයෝජන ලබා ගන්න අපි සමත් වෙලා තිබෙනවා. ඒ ප්‍රමාණය හරියටම දෙගුණයකින් වැඩි වෙලා තිබෙනවා.

මෙහෙම බැලුවාම අපි ආර්ථික වශයෙන් හොඳ, ශක්තිමත් ගමනක් යනවා. බංකොලොත් වුණු ආර්ථිකයක් අපි භාර ගත්තත්, අපේ පළමු අය වැයේදීම මේ රටේ වැඩ කරන ජනතාව ලබන

[ගරු විජිත හේරත් මහතා]

වැටුප් සහ දීමනා වැඩි කරන්න අපි සමත් වුණා. අපි සියලුම රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කළා. එය රාජ්‍ය සේවකයන් කිසිසේත්ම බලාපොරොත්තු වුණු දෙයක් නොවෙයි. අපි බංකොලොත් වුණු රටක් භාර ගෙන ඔවුන්ගේ වැටුප් වැඩි කරයි කියලා හීනෙකින්වත් ඒ අය හිතුවේ නැහැ. නමුත් මේ කෙටි කාලය තුළ රජයක් විධියට අපි මේ රටේ සියලුම රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම් කළා. රාජ්‍ය සේවකයන්ගේ විතරක් නොවෙයි, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කරන්නත් අපි තීන්දු කළා. වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කරන්නත් අපි තීන්දු කළා. මේක ඉතා අමාරු වැඩක්. බංකොලොත් වුණු රටක් භාරගෙන කෙටි කාලයක් තුළ රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කරන්න, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කරන්න, වතු සේවකයන්ගේ වැටුප් වැඩි කරන්න ඒ ගත් තීරණය අමාරු එකක්. නමුත් අපි ඒක කළා.

එහි පළමුවැනි කාරණාව රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම. ඒ අනුව ඉතාම ඉහළ ප්‍රතිශතයකින් සියලුම රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම් කළා. ඒ අනුව දැන් ඒ රාජ්‍ය සේවකයන්ට වැටුප් වැඩිවීමට සමානුපාතිකව ලැබිය යුතු වැටුප් තල ක්‍රමානුකූලව ලැබෙමින් පවතිනවා.

පෞද්ගලික අංශයේ අයට ලබා දිය යුතු වැටුප අපි පාර්ලිමේන්තුවේ නීතියක් මඟින් සම්මත කළ යුතු වෙනවා. අන්න ඒ නීතිය තමයි අද අපි මේ සම්මත කරන්නේ. මේකට යම් ප්‍රමාදයක් ඇති වුණා. ඒ ප්‍රමාදය ඇති වෙන්න හේතු වුණේ මේ පනත් කෙටුම්පතට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට ගිය නිසා. ඒ උසාවි ක්‍රියාවලියත් එක්ක යම් ප්‍රමාදයක් ඇති වුණා. නමුත් අද එය පනතක් විධියට අපි මේ පාර්ලිමේන්තුවේදී සම්මත කරනවා. මේ වැටුප් වැඩිවීමත් සිදු විය යුත්තේ පසුගිය අප්‍රේල් මාසයේ 01 වැනි දා ඉඳලා. හරියටම ගත්තොත් පෞද්ගලික අංශයේ අයගේ අවම මාසික වේතනය තිබුණේ රුපියල් 17,500යි. ඒකට එකතු කරලා තිබුණා, අවස්ථා දෙකකදී මේ පාර්ලිමේන්තුවෙන් අනුමත කරන ලද අයවැය සහන දීමනා දෙකක්. පළමුව රුපියල් 1,000ක දීමනාවක්; දෙවනුව රුපියල් 2,500ක දීමනාවක්; එකතුව රුපියල් 3,500යි. ඒ අනුව ගත්තොත්, රුපියල් 17,500ට රුපියල් 3,500 එකතු වුණාම රුපියල් 21,000යි. නමුත් අපි අයවැය සහන දීමනා කියන එක එහෙමම තිබියදී, රුපියල් 6,000ක් අලුතෙන් ඒ වැටුපට එකතු කළා. රුපියල් 6,000කින් වැටුප් වැඩි කළා. එතකොට අප්‍රේල් මාසයේ 01 වෙනිදා ඉඳලා පෞද්ගලික අංශයේ සියලු සේවකයන්ගේ මූලික වැටුප රුපියල් 27,000ක් බවට පත් වෙනවා.

ඇත්තටම මේ අයවැය සහන දීමනා කියලා වැටුපට අමතර එකතු කිරීමක් කරන්න සිද්ධ වුණේ, මේ පනතට අනුව පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කරපු නැති නිසා; වැඩි කරන්න පසුගිය පාලකයන් තීන්දු ගත්තේ නැති නිසා. ඒ නිසා තමයි පෞද්ගලික අංශයේ සේවකයන්ගෙන් ආ දැඩි ඉල්ලීම මත අවස්ථා දෙකකදී, රුපියල් 1,000ක් සහ රුපියල් 2,500ක් විධියට අයවැය සහන දීමනා කියන එකක් එල්ලන්න සිද්ධ වුණේ. නමුත් ඇත්තටම විය යුත්තේ කුමක්ද? රජයේ සේවකයන්ටත් මූලික වැටුප කියලා එකක් තිබෙනවා. පෞද්ගලික අංශයේ සේවකයන්ටත් මූලික වැටුපක් ලෙස මෙය එකතු විය යුතුයි. අයවැය සහන දීමනා කියලා විටින් විට දීමනා එකතු කළ යුතු නැහැ. ඉතින් අද බොහොම පැහැදිලියි, අපි ගත්ත තීරණය අනුව මෙතෙක් කල් අයවැය සහන දීමනා කියලා විවිධ අවස්ථාවලදී දෙන ඒ දීමනා වෙනුවට ඒ සියල්ල පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූලික වැටුපට එකතු කරලා අවම වැටුප රුපියල් 27,000ක් කරලා තිබෙනවා. මේ රුපියල් 27,000 කියන්නේ දවස් 25ක වැටුප. දෛනික දීමනාව කලින් තිබුණේ රුපියල් 700යි. ඒක අපි රුපියල් 380කින් වැඩි කරලා එය රුපියල් 1,080ක් වෙනවා.

2025 වර්ෂය පුරාවට අප්‍රේල් මාසයේ 01වෙනිදා ඉඳලා මේ රටේ පෞද්ගලික අංශයේ වැඩ කරන සියලු සේවකයන්ට මේ වැටුප අනිවාර්යයෙන් ලැබිය යුතුයි. බොහෝ පෞද්ගලික ආයතන අප්‍රේල් මාසයේ 01වෙනිදායින් පසුව මේ වැඩි කරපු වැටුප දුන්නා. නමුත් ගොඩක් ආයතන දීලා නැහැ. ඒ දීපු නැති ආයතනවලට අද මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ, පසුගිය අප්‍රේල් මාසයේ 01 වෙනිදා ඉඳලා arrears එකත් එක්ක ඒ වැටුප ඒ සේවකයන්ට ලබා දිය යුතු වෙනවා. මොකද, ඉතා පැහැදිලිව අපි අයවැය සම්මත කළා. ඒ අයවැය සම්මත කිරීමත් එක්ක එතැනින් එහාට ක්‍රියාත්මක විය යුතුයි. ඒ නිසා පනත් කෙටුම්පත සම්මත වෙන්න පෙර ඒ ගත වුණු මාස තුන සඳහාත් ඒ වැටුප හිමි විය යුතුයි. මේ රටේ පෞද්ගලික අංශයේ සේවකයන් විවිධ ආයතනවල වැඩ කරනවා. ඒ සියලු දෙනාටම මේ වැටුප හිමි විය යුතුයි. යම්කිසි ආයතනයක් මේ වැටුප් ගෙවලා නැත්නම් හිඟ මුදල් එක්ක අනිවාර්යයෙන් එය ලබා දිය යුතු වෙනවා. සේවකයන්ට ඒ අයිතිය තිබෙනවා. ඒ නිසා සේවකයන්ට තමන්ගේ ආයතනයෙන් මේ වැටුප ලබා ගත හැකියි - ලබා දිය යුතුයි.

ඒ වාගේම තමයි එම අයවැය යෝජනාවේම අපි ඉතා පැහැදිලිව සඳහන් කළා, 2025 වර්ෂය සඳහා පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූලික වැටුප රුපියල් 27,000ට වැඩි වෙනකොට 2026 ඉඳලා ඒ කියන්නේ ලබන අවුරුද්දේ ජනවාරි 01වෙනිදා ඉඳලා තවත් රුපියල් 3,000කින් අපි වැටුප් වැඩි කරන බව. එතකොට පෞද්ගලික අංශයේ සියලු සේවකයන්ගේ අවම වැටුප ලබන අවුරුද්දේ ජනවාරි 01වෙනිදා ඉඳලා රුපියල් 30,000ක් වෙනවා. එතකොට EPF එක, ETF එක ඒ මූලික වැටුප මත ගණන් හැදිය යුතුයි. ඇත්තටම පෞද්ගලික අංශයේ සේවකයන්ට ලැබෙන්නේ සේවක අර්ථසාධක අරමුදල. ඉතින් ඒ නිසා සේවක අර්ථසාධක අරමුදල එකවර ලබා ගන්නකොට ඒ ලැබෙන සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රමාණයත් වැඩි වෙනවා. මොකද, මේ වැටුප් වැඩිවීමත් එක්ක - basic salary එක වැඩිවීමත් එක්ක - සේවක අර්ථසාධක අරමුදලේ තමන්ට හිමි දායක මුදලත් අනිවාර්යයෙන් වැඩි වෙනවා. ඒ නිසා සේවකයන්ට ඒ මඟිනුත් විශාල සහනයක් ලැබෙනවා.

ඒ වාගේම දෛනික වැටුප රුපියල් 1,080ක් විධියට මේ අවුරුද්දේ ක්‍රියාත්මක වෙන එක ලබන වසරේ ජනවාරි 01වෙනිදා ඉඳලා තව රුපියල් 120කින් වැඩි වුණාම, දවසේ අවම පඩිය රුපියල් 1,200ක් වෙනවා. දවස් 25ක් වැඩ කළාම රුපියල් 30,000 බවට පත් වෙන්නේ එහෙමයි. පොදුවේ ගත්තොත්, පසුගිය අප්‍රේල් මාසයේ 01වෙනිදා ඉඳලා ජනවාරි 01වෙනිදා වෙනකොට රුපියල් 17,500 ක් වෙච්ච පෞද්ගලික අංශයේ සියලු සේවකයන්ගේ අවම වැටුප රුපියල් 37,000ක් බවට පත් වෙනවා. ඒක විශාල වැටුප් වැඩිවීමක්. මොකද, ඒ මූලික වැටුප මත තමයි EPF එක ගණන් හැදෙන්නේ. එතකොට EPF අරමුදලත් ඇත්තටම දෙගුණයකින්ම වැඩි වෙනවා. ඉතින්, මේක සුවිශාල වැටුප් වැඩිවීමක්. මේ රටේ පෞද්ගලික අංශයේ සියලුම සේවකයන්ට මේ සහනය ලබා දෙන්න, ඒ අයිතිය ලබා දෙන්න නව රජයට හැකියාව ලැබුණා. නව රජය කෙරෙහි තැබූ ඒ විශ්වාසය අපි ඉතා පැහැදිලිව තහවුරු කර තිබෙනවා.

ඒ වාගේම වතු කම්කරුවන්ගේ වැටුප දැනට අපි නියම කර තිබෙන්නේ රුපියල් 1,700ක් කියලා. අපි දන්නවා, ඒක තව වැඩි විය යුතු බව. ඒක අනිවාර්යයෙන්ම වැඩි කරන්න ඕනෑය කියන ස්ථාවරයේ අපි ඉන්නවා. එය කළ යුත්තේ මේ පනත් කෙටුම්පත

මගින් නොවෙයි. දැනට ක්‍රියාත්මක වන සාප්පු හා කාර්යාල සේවක පනත වාගේ තවත් අණ පනත් තිබෙනවා, නීති තිබෙනවා. ඒ නීති පිළිබඳව ඒ වතු හාම්පුතුන් එක්ක සාකච්ඡා කරලා, ඒ වාගේම කම්කරු අමාත්‍යාංශයේ tripartite committee එක තුළ එකඟතාවකට ඇවිල්ලා වතු කම්කරුවන්ගේ වැටුප තවත් වැඩි කළ යුතුව තිබෙනවා. අපි ඒ ස්ථාවරයේ ඉන්නවා. නමුත්, රුපියල් 1,700ට දැනටමත් වතු හිමිකරුවන් එකඟ වෙලා තිබෙනවා. බොහෝ වතු හිමිකරුවන් ඒ තීන්දුව ගත් දවසේ ඉඳලා ඒ වැටුප ගෙවන්න පටන්ගත්තා. නමුත් අපි පිළිගන්නවා, වතු සේවකයන්ට ලබා දෙන මේ රුපියල් 1,700ක මුදල තව වැඩි කළ යුතු බව. මොකද, ඒ රුපියල් 1,700 ගණන් හැදෙන්නේත් ක්‍රම දෙකකට, රුපියල් 1,350 සහ 350 වශයෙන්. එහිදී යම් යම් නිර්ණායක තිබෙනවා. මාසිකව වැඩ කළ යුතු දින ගණනක්, ඒ වාගේම එම සේවය පිළිබඳවත් යම් නිර්ණායක තිබෙනවා. ඒවා මත තමයි ඒ රුපියල් 1,700 ලැබෙන්නේ. කෙසේ වෙතත්, වතු කම්කරුවන්ටත් දැනට ක්‍රියාත්මක වෙන්නේ දෛනික වැටුප කියන එක. වඩාත් කාලෝචිතයි, මාසික වේතනයක් දක්වා මේක වෙනස් කරන්න පුළුවන් නම්. ඉදිරියේදී අපි බලාපොරොත්තු වෙනවා, පෞද්ගලික අංශයේ සේවකයන්ට මාසික වේතනයක් ලෙස වැටුප ලබා දෙන ආකාරයටම වතු ක්ෂේත්‍රයේ නියුතු සියලුදෙනාටත් මාසික වේතනය කියන තැනට ඔවුන්ගේ වැටුප ගෙනයන්න. ඒක තමයි වඩාත් සුදුසු දේ. නැත්නම් එහි වෙනසක් තිබෙනවා.

රජයක් විධියට අපි ඉතා පැහැදිලි ස්ථාවරයක ඉන්නවා, මේ රටේ වැඩ කරන ජනතාවට ලැබිය යුතු අයිතිවාසිකම් ලබා දෙන්න. ඒ පිළිබඳව දැනටමත් අපි තීන්දු-තීරණ අරගෙන ඒ අයිතිවාසිකම් ලබා දීලාත් තිබෙනවා. අද මේ පනතින් සිද්ධ වෙන්නෙත් මේ රටේ විවිධ ක්ෂේත්‍රවල නියුතු සියලුම පෞද්ගලික අංශයේ සේවකයන්ට තමන්ගේ වැටුප් වැඩිවීම නෛතිකව ලබා ගැනීම. පසුගිය කාලය තුළ මේ අවම වැටුප ඔවුන්ට ලැබුණේ නැත්නම් මේ පනත තුළින් එය ලබා ගැනීමේ අයිතිය ලැබෙනවා. ඒ නිසා මෙය මේ රටේ පෞද්ගලික අංශයේ සේවයේ නියුතු සියලුදෙනාම ලැබූ විශාල ජයග්‍රහණයක් කියන එකත් සඳහන් කරමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු පත්මනාදන් සත්‍යලිංගම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.12]

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
நன்றி, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! இன்றையதினம் சமர்ப்பிக்கப்பட்டிருக்கின்ற வேலையாட் களின் வரவுசெலவுத்திட்ட நிவாரணப்படி (திருத்தம்) சட்ட மூலம், வேலையாளர்களின் வரவுசெலவுத்திட்ட நிவாரணப்படி (திருத்தம்) சட்டமூலம், வேலையாளர்களின் தேசிய குறைந்தபட்ச வேதனம் (திருத்தம்) சட்டமூலம் என்பவற்றை நிறைவேற்றுவதன் ஊடாக இந்த நாட்டில் வாழுகின்ற ஊழியம் செய்பவர்களுக்கு குறிப்பாக, குறைந்த வருமானம் பெறுகின்ற தொழிலாளர்களுக்கு 6,000 ரூபாய் நிவாரணம் அல்லது சம்பள அதிகரிப்பு கிடைக்கும். நாங்கள் இந்தச் சம்பள அதிகரிப்பை வரவேற்கின்றோம்; பாராட்டுகின்றோம். கௌரவ அமைச்சர் அவர்கள் இங்கு குறிப்பிட்டதுபோன்று, Eவேலையாட் களுக்குரிய வரவு செலவுத்திட்ட நிவாரணப்படியை அவர்களுடைய அடிப்படைச் சம்பளத்தோடு சேர்த்தால் EPF, ETF உட்பட பல விடயங்களில் அவர்கள் நன்மை அடைவார்கள். தற்பொழுது, 27,000 ரூபாயைப் பெறுபவர்கள் 2026.01.01ஆம் திகதியிலிருந்து 30,000 ரூபாயைப் பெற இருக்கிறார்கள். 30,000 ரூபாய் என்பது கிட்டத்தட்ட 100 அமெரிக்க டொலர்களாகும். இது மிகவும் குறைந்த சம்பள மாகவே இருக்கின்றது. ஆனாலும், உங்களுடைய முயற்சிக்கு என்னுடைய பாராட்டுக்கள்! வங்குரோத்து அடைந்த நாட்டைப் பொறுப்பேற்றுள்ள இந்த அரசாங்கம், இச்சம்பள அதிகரிப்பைச் செய்தது நல்ல விடயம்!

இந்த நாடு வங்குரோத்து அடைவதற்குக் காரணமாக இருந்தவர்கள் மக்கள் அல்லர்; முன்னர் இருந்த அரசாங்கங்கள்! எமது நாடு வங்குரோத்து நிலையிலிருந்து மீள வேண்டுமாக இருந்தால், நாங்கள் எமது நாட்டுக்கு investors - முதலீட்டாளர் களைக் கொண்டுவர வேண்டும். எமது நாட்டுக்கு முதலீடுகள் வந்தாலும்கூட, போக்குவரத்து என்பது மிகவும் முக்கியமானது. இந்திய அரசாங்கத்தால் 65 மில்லியன் டொலர் grantஆக இலங்கை அரசாங்கத்துக்குக் கொடுப்பதற்குரிய ஏற்பாடுகள் நடைபெற்று இருக்கின்றன. ஆனால், 2017ஆம் ஆண்டிலிருந்து அது இழுத்தடிக்கப்படுகின்றது. நான் இது பற்றி கடந்த பாராளுமன்ற அமர்விலும் கூறியிருந்தேன். குறிப்பாக, காங்கேசன்துறை துறைமுகத்தை அபிவிருத்தி செய்வதன்மூலம் வடக்கு மாகாணம் மாத்திரமல்ல, முழு நாடும் அபிவிருத்தி அடையும். அந்த வகையில், நாட்டின் வருமானத்தை அதிகரிப்பதற்குரிய, பொருளாதாரத்தை மேம்படுத்துவதற்குரிய வாய்ப்புக் கிடைக்கும். இவ்வாறு தானாக வரும் வாய்ப்பை நாங்கள் நழுவவிட்டுக்கொண்டு இருக்கின்றோம் என்பதை இந்தச் சந்தர்ப்பத்தில் தெரிவித்துக் கொள்கின்றேன்.

அடுத்து, எங்களுடைய வவுனியா பிரதேசத்திலுள்ள முக்கியமானதொரு பிரச்சினை தொடர்பாக நான் இந்தச் சபையின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். வவுனியா மாவட்டத்தில் இருக்கின்ற நான்கு பிரதேச செயலாளர் பிரிவுகளில் ஒன்றான வவுனியா வடக்குப் பிரதேச செயலாளர் பிரிவிலுள்ள வெடிவைத்தகல் கிராம சேவையாளர் பிரிவில் இருந்த மக்களுக்கும், பிற மாவட்டங்களில் இருந்து கொண்டுவந்து குடியேற்றப்பட்ட பெரும்பான்மையின மக்களுக்கும் இடையில் ஏற்பட்ட பிரச்சினை காரணமாக 1983ஆம் ஆண்டு அங்கிருந்து இடம்பெயர்ந்தார்கள். அப்போது படுகொலைகள்கூட நடந்தன. யுத்தம் முடிந்த பிற்பாடு, 2019ஆம் ஆண்டு அவர்கள் தங்களது சொந்தக் காணிகளுக்குப் போவதற்கு முயற்சித்தார்கள். அந்த வகையில், திரிவைத்த குளத்தை அண்டிய பகுதியிலுள்ள 150 ஏக்கர் வயல் பிரதேசத்தைத் துப்புரவுசெய்து, அங்கு மீண்டும் தங்களது தொழிலைச் செய்ய முற்பட்டவேளை வனவளத் துறையினர் அவர்களுக்கு எதிராக நீதிமன்றத்தில் வழக்குத் தாக்கல் செய்தார்கள். ஐந்து வருடங்களுக்குப் பின்னர், அதாவது 2024ஆம் ஆண்டு எந்தவிதமான ஆதாரமும் இல்லாத வழக்கு எனக்கூறி, அந்த வழக்கு தள்ளுபடி செய்யப்பட்டது. அந்தக் காலப் பகுதியில் அங்கிருக்கின்ற விவசாயிகளுக்கு அந்த வயல் நிலங்களுக்குச் செல்லக்கூடாது என்ற கட்டளை இடப் பட்டிருந்தது. வயல்வெளிக்குச் செல்லாமல் இருந்த அந்தக் குறிப்பிட்ட காலத்தில், மகாவலி அதிகாரசபையால் கொண்டு வந்து குடியேற்றப்பட்ட அயல்கிராம மக்களுக்கு எந்தவோர் அனுமதியும் பெறாமல் குத்தகை அடிப்படையில் அந்த வயற் காணிகள் வழங்கப்பட்டு இருக்கின்றன. அது மாத்திரமன்றி, சட்டத்துக்குப் புறம்பான வகையில் அந்தக் காணிகளை 'அந்தரவெவ கமக்கார அமைப்பு' என்ற பெயரிலும் பதிவுசெய்து இருக்கிறார்கள். இதற்கு அங்கிருக்கின்ற அரச உத்தியோகத்தர்களும் உடந்தையாக இருந்திருக்கிறார்கள்.

இப்போது அங்கிருக்கின்ற பிரச்சினை என்னவென்றால், அங்கு குடியேற்றப்பட்ட மக்களால் கடந்த ஒரு மாத காலமாக 400 - 500 ஏக்கர் அடர்ந்த காட்டுப் பகுதி துப்புரவு

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

செய்யப்பட்டு இருப்பதுதான். இது பற்றி தங்களுக்குத் தெரியாதென பொலிஸாரும் வனவளத் திணைக்களத்தினரும் சொல்கிறார்கள். சாதாரண ஒரு விவசாயி வேலியைத் திருத்துவதற்கு ஒரு தடியை வெட்டினால்கூட, அவரைக் கைதுசெய்கின்ற பொலிஸாரும் வனவளத் திணைக்களத் தினரும் கிட்டத்தட்ட 400 ஏக்கர் நிலத்தைப் பாரிய இயந்திரங்களைக் கொண்டு துப்புரவு செய்வது தங்களுக்குத் தெரியாது என்று சொல்கின்றார்கள். இந்த நிகழ்ச்சிநிரலுக்குப் பின்னால் அரசாங்கம் அல்லது வேறொரு சக்தி இருப்பதாகவே நாங்கள் கருதுகின்றோம். தொடர்ந்துவந்த அரசாங்கங்கள் செய்த அதே பிழையை, மேலாதிக்க சிந்தனையை -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
தயவுசெய்து, ஒரு நிமிடம் தாருங்கள்!

கடந்த அரசாங்கங்கள் செய்த இனப் பரம்பலை மாற்றுகின்ற அதே செயற்பாட்டை இந்த அரசாங்கமும் செய்கின்றதோ என்ற சந்தேகம் எங்களுக்கும் மக்களுக்கும் இருக்கின்றது. இந்த நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்ப வேண்டுமெனப் பேசுகின்ற நாங்கள், இடம் பெயர்ந்த மக்கள் தங்களுடைய சொந்தக் காணிகளில் விவசாயம் செய்வதற்கு நடவடிக்கை எடுப்பதன் ஊடாக இன்னும் விரைவாகப் பொருளாதாரத்தைக் கட்டியெழுப்பு வதற்குச் சந்தர்ப்பம் கிடைக்கும். எனவே, நான் சொன்ன இந்தக் காணிப் பிரச்சினை தொடர்பில் அரசாங்கம் உடனடி யாகத் தலையிட வேண்டுமெனக் கேட்டு, இச்சந்தர்ப்பத்துக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.19]

ගරු සුනිල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ආර්ථික වශයෙන් කඩාගෙන වැටුණු මේ රට ගොඩනඟන්න වෙහෙසෙන, කැප වන, දහඩිය හෙළන ඒ වටිනා ජනතාව වෙනුවෙන් අද දවසේ අපේ හඬ අවදි කරන්න ලැබීම අපි සතුටක්කොට සලකන්න ඕනෑ. අද අපි කථා කරන්නේ මේ රටට රුපියල් උපයන්න, ඩොලර් ගෙනෙන්න තමන්ගේ වෙහෙස මහන්සිය කැප කරන මිනිස්සු ගැනයි.

අද අපි කථා කරනවා, සේවකයන්ගේ ජාතික අවම වැටුපක් ගැන. මේකට දීර්ඝ ඉතිහාසයක් ජාත්‍යන්තර වශයෙන් තිබෙනවා. ජාත්‍යන්තර කම්කරු සංවිධානය 1928දී තමයි මේ අවම වැටුප නියම කිරීම සම්බන්ධව යන්ත්‍රණයක් සැකසීම සඳහා ජාත්‍යන්තර සම්මුතියක් හඳුන්වා දුන්නේ. රටක් විධියට ශ්‍රී ලංකාවත් 1971 ජූනි 9වැනි දා මේ සම්මුතියට අත්සන් තබා තිබෙනවා. නමුත්, අපි අවම ජාතික වේතනය සම්බන්ධයෙන් පනතක් ගෙනෙන්නේ 2016දීයි. එදින හෝ එවැනි පනතක් ගෙනාපු එක ගැන අපි සන්තෝෂ වෙන්න ඕනෑ. 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනතෙන් මාසික වැටුප රුපියල් 10,000ක් විධියට තීරණය වෙනකොට, දෛනික වැටුප රුපියල් 400ක් විධියට නියම කෙරුණා. ඒ වැටුප 2021 අංක 16 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනතෙන් නැවත වතාවක් වෙනස් කළා. ඒ, අවම වේතනය මාසිකව රුපියල් 12,500ක් හා දෛනිකව රුපියල් 500ක් විධියටයි. ඒක 2024 අංක 48 දරන ජාතික අවම වේතනය (සංශෝධන) පනතෙන් රුපියල් 17,500ක් විධියට මාසික වැටුපත්, රුපියල් 700ක් විධියට දෛනික වැටුපත් වෙනස් කළා.

IMF එක කියනවා, නිශ්චිත වැඩ කරන කාලයක් තුළ යම් සේවකයෙක් නිෂ්පාදනය කළ භාණ්ඩ ප්‍රමාණය මත, එහෙම නැත්නම් වැඩ කරන පැය ගණන මත, එහෙමත් නැත්නම් ඉටු කළ වැඩ හෝ සේවා සඳහා සේවකයාට ලබා දිය යුතු අවම මුදල, "අවම වේතනය" විධියට තීරණය කරන්න සලකා බලන සාධකය තමයි, ඒ වනවිට ඒ රටේ පවත්නා ආර්ථික හා සමාජයීය තත්ත්වයන් සලකා බලමින් ඒ සේවකයාගේ පවුලේ අවශ්‍යතා සපුරා ගැනීමට ප්‍රමාණවත් වන පරිදි නිශ්චය කරලා එය නීතිගත කළ යුතුයි කියන එක. ඒක තමයි ජාත්‍යන්තර වශයෙන් මේ සම්බන්ධව පිළිගත් තත්ත්වය, පිළිගත් සම්මුතිය. අන්න, ඒ අනුව යමින් තමයි අපි 2025 වර්ෂය වනවිට පැවති ආර්ථික අර්බුද හමුවේ අපේ සේවකයාට ලැබෙන වැටුප ජීවත්වීම සඳහා ප්‍රමාණවත් නොවන නිසා රාජ්‍ය අංශයට සියයට 60 සිට සියයට 80 දක්වා වැටුප් වර්ධකයක් ලබා දෙනකොට, පෞද්ගලික අංශයටත් සැලකිය යුතු, යම් ප්‍රමාණයෙන් හෝ සතුටු වෙන්න පුළුවන් වේතනයක් අවම වශයෙන් ලබා දීම කෙරෙහි සැලකිල්ලට භාජන වුණේ.

ඒ අනුව තමයි අපි මේ අවුරුද්දේ අප්‍රේල් මාසයේ 01වැනි දා ඉඳලා රුපියල් 17,500ට පැවතුණු අවම මාසික වේතනය රුපියල් 27,000කටත්, 2026.01.01වැනි දා ඉඳලා එය රුපියල් 30,000කටත් ඉහළ නංවන්න කටයුතු කර තිබෙන්නේ. අපේ සලකා බැලීම අනුව 2025.04.01වැනි දිනට අවම දෛනික වැටුප රුපියල් 1,080ක් බවට පත් වුණා. ඒ වාගේම 2026.01.01වැනි දින සිට අවම දෛනික වැටුප රුපියල් 1,200ක් බවටත් පත් වෙනවා. මේ වැටුප් වැඩිවීම ඔවුන්ගේ අතට ලැබෙන මුදලට අමතරව වෙනත් ආකාරයෙනුත් බලපානවා. අපේ ඇමතිතුමා කලින් මතක් කළා, සේවක අර්ථසාධක අරමුදලට ලැබෙන දායකත්වය සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ලැබෙන දායකත්වය පිළිබඳව. ඒකත් ඔවුන්ගේ සේවයේ සුරක්ෂිතභාවයට එකතු වෙන මුදලක්. ඒ විතරක් නොවෙයි, ඔවුන් අතිකාල වැඩ කරනවා; නිවාඩු දිනවල වැඩ කරනවා. ඒ වාගේම ප්‍රසාද දීමනා ලැබෙනවා. අතිකාල පැයකට ලැබෙන මුදලට, නිවාඩු දිනයක වැඩ කරනවාට ලැබෙන මුදලට, ප්‍රසාද දීමනාවලට මේ වැටුප් වැඩිවීම බලපානවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, කම්කරුවන් වෙනුවෙන් හඬ අවදි කරපු අපට මේ රුපියල් 30,000 පිළිබඳව ඇත්තටම සතුටු වෙන්න පුළුවන්කමක් නැහැ. නමුත් පවතින ආර්ථික අර්බුදය හමුවේ අපට ඊට වඩා තැනකට යන්න පුළුවන්කමකුත් නැහැ. නමුත් අපි තව අවුරුදු තුනක්, හතරක් ගත වනකොට බලාපොරොත්තු වෙනවා, මේ රටේ නිෂ්පාදන ක්ෂේත්‍රය, කෘෂිකර්මය වාගේම සේවා ක්ෂේත්‍රය දියුණු කරලා ආර්ථිකය ශක්තිමත් කරන්න. ඉන්පසුව රට වෙනුවෙන් කැප වෙලා වැඩ කරන -ඒක ගොවිපළේ වෙන්න පුළුවන්; කර්මාන්තශාලාවේ වෙන්න පුළුවන්; සේවා ස්ථානයක වෙන්න පුළුවන්- ජනතාවට නියම වටිනාකමක් ලබා දෙමින් සතුටින්

ළමයින්ට උගන්වන්න, ලෙඩට දුකට බෙහෙත් ගන්න, කාලා ඇඳලා ඉන්න, හොඳ ගෙයක් හදා ගන්න වාගේම ජීවිතය පවත්වාගෙන යන්න පුළුවන් විධියේ හොඳ වැටුපක් ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි ඒ වෙනුවෙන් හොඳ ආරම්භයක් අරගෙන තිබෙනවා, අපේ පළමුවැනි අය වැයෙන්ම. අපි ඉදිරියේදී ඉදිරිපත් කරන අය වැය ලේඛනවලින් රටේ සියලු සේවකයින්ට සතුටින් ඉන්න පුළුවන්, හොඳින් ජීවිතය ගොඩනඟා ගන්න පුළුවන් පසුබිමක් ඇති කරන්න අනිවාර්යයෙන් කටයුතු කරන බව මේ ගරු සභාවට පවසමින්, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියටත් ස්තුතිය පළ කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.27]

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද අපි කථා කරන්නේ සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත් කෙටුම්පත් සහ සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධවයි. වැටුප් ගැන කථා කරන මේ අවස්ථාවේදී අපේ පොලීසිය භාර ඇමතිතුමා මේ ගරු සභාවේ සිටින නිසා මම මේ කාරණය කියන්න කැමතියි. ඉලංගකෝන් පොලිස්පතිතුමා සිටියදී සියයට 40ට තිබුණු පොලිස් නිලධාරින්ගේ allowance එක පසුගිය කාලයේ සිදුවූ වැටුප් වැඩි කිරීමේදී සියයට 22ට අඩු වෙලා තිබෙනවා. හැබැයි, එහෙන් මෙහෙන් එල්ලලා තිබුණු ඒවා ඔක්කොම එකතු කළාම ඒක balance වෙලා තිබෙනවා.

මම දැන් ඔබතුමාට මගේ ළඟ තිබෙන මේ paysheet එක ලැබෙන්න සලස්වනවා. හැබැයි, ඔබතුමා අය වැය විවාදය අවස්ථාවේ කරපු කථාවේදී සඳහන් කළ දේවල් සිදු වෙලා නැහැ. නමුත්, ඔබතුමා පසුගිය කාලයේ පොලීසියේ වැටුප් වැඩි කරන්න ඕනෑ කියලා ඉල්ලීමක් කරලා තිබෙනවා මාධ්‍ය තුළින් මම දැක්කා. ඒක නිසා පොලීසියේ වැටුප් වැඩි කරන්න. මොකද, ඔයගොල්ලන්ට අන්තිමට පොලීසිය තමයි ඉතුරු වෙන්නේ. ඒ හින්දා පොලීසියේ වැටුප් ටික වැඩි කරගන්න එක හොඳයි. මම මේ ලේඛනය ඔබතුමාට එවනවා.

ඊළඟ කාරණය මෙකයි. අපේ අනිල් ජයන්ත ඇමතිතුමා කිව්වා, "අපි භාර ගන්නකොට රට කඩාගෙන වැටිලා තිබුණේ" කියලා. රට කඩාගෙන වැටුණා. රට කඩාගෙන වැටුණේ 2021 - 2022දී.

2023 - 2024දී ආයේ නැඟිට්ටා. 2021 - 2022දී තමයි තෙල් නැති වුණේ, ගෑස් නැති වුණේ, පොහොර නැති වුණේ; ඔක්කෝම නැති වුණේ. හැබැයි 2023දී ආයේ අපි පටන් ගත්තා. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාව ජනාධිපති කරවලා අපි පටන් ගත්ත එක බාර දෙනකොට ඩොලර් බිලියන 6කුත් එක්ක තමයි බාර දුන්නේ. රට වැටිලා තිබුණේ නැහැ, වැටිලා යම්තම් නැඟිටපු රටක් තමයි ඔයගොල්ලන් ගත්තේ. ඒක අනුර කුමාර ජනාධිපතිතුමා සැප්තැම්බර් 23 දිවුරුම් දීපු දවසේත් කිව්වා. යම්තාක් දුරකට ගෙනියන්න පුළුවන් රටක් එතුමාට හම්බ වෙලා තිබෙනවා කියන එක එතුමාගේ දිවුරුම් දීමේ කථාවේදීත් කිව්වා. ඒක නැහැ කියන්න එපා. අනිල් ජයන්ත ඇමතිතුමා දැන් කියනවා වැටිලා තිබුණු රටක් කියලා. වැටිලා තමයි රට කොහොමත් තිබෙන්නේ, දැනුත් වැටිලා තමයි තිබෙන්නේ. දැන් කියලා සියල්ල ලැබිලා නැහැ ජනතාවට. හැම දෙයක්ම ගෙනැල්ලා, වස්තුව ලැබිලා නැහැ දැන්, දැනුත් වැටිලා තිබෙන්නේ.

අනෙක් එක, පරිසර ඇමතිතුමා කියනවා අලි මැරෙන එකටත් විපක්ෂය වග කියන්න ඕනෑලු. අපි අලියාව තල්ලු කරගෙන ගිහිල්ලා කෝච්චියට දැම්මා වාගේ තමයි පරිසර ඇමතිතුමා කියන්නේ, අලින්ටත් වග කියන්න ඕනෑලු විපක්ෂය. මාර කථා නේ මේවා. අපි පාන්දර එන මඩකලපුව කෝච්චියට අලියා තල්ලු කරගෙන ගියාද? නැහැ. ඒකටත් විපක්ෂය වග කියන්න ඕනෑලු. අනෙක් අතට කියනවා, අපි කකුලෙන් අදිනවාලු. අපි කකුලෙන් අදින්නේ නැහැ. අපි නොවෙයි කකුලෙන් අදින්නේ ඩොනල්ඩ් ට්‍රම්ප්. අපි කකුලෙන් ඇද්දේ නැහැ. අපි කිව්වාද, විපක්ෂයේ කවුරු හරි ගිහිල්ලා කිව්වාද ඩොනල්ඩ් ට්‍රම්ප්ට සියයට 44ක බද්දක් ගහන්න කියලා? අපි ඩොනල්ඩ් ට්‍රම්ප්ව අඳුනනවාද? මේ විපක්ෂයේ ඉන්න කවුරුවත් ඩොනල්ඩ් ට්‍රම්ප් එක්ක ආදරය කරලා නැහැ, මම දන්නා විධියට. සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා හිතවත්ද මම දන්නේ නැහැ ඩොනල්ඩ් ට්‍රම්ප් එක්ක. ඩොනල්ඩ් ට්‍රම්ප් එක්ක එහෙම හිතවතෙක් නැහැ. ඒ බදු අපට විතරක් නොවෙයි, ඔක්කොම රටවලට ගහලා තිබෙන්නේ, හැම රටටම කෙළලා තිබෙන්නේ. ඔයගොල්ලන්ටත් සියයට 30ක් ගහලා තිබෙනවා. ඩොනල්ඩ් ට්‍රම්ප් කකුලෙන් ඇද්දාට අපට කරන්න දෙයක් නැහැ. විපක්ෂයේ කවුරුත් ඩොනල්ඩ් ට්‍රම්ප් එක්ක හිතවත් නැහැ. අපි කකුලෙන් ඇද්දේ නැහැනේ. බදු ගහන්න අපි කැමැතිද එහෙම? මොකක්ද, හේතුව?

අද අවම වැටුප ගැන කථා කරනවා. මේ ගහපු බද්ද, tax එක වැඩි වුණොත් garment factoriesවල ලක්ෂ ගාණකට රැකියා නැති වෙනවා. විශේෂයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ - ගම්පහ ඇමතිතුමා සභාවේ ඉන්නවා - garment factoriesවල සේවය කරන ලක්ෂ ගාණකට ගෙදර යන්න වෙනවා. හැබැයි ගම්පහ මිනිස්සු නොවෙයි වැඩ කරන්නේ අපේ පැත්තේ මිනිස්සු. අනුරාධපුරය, පොළොන්නරුව, බදුල්ල, මොනරාගල වාගේ දුෂ්කර ප්‍රදේශවල මිනිස්සු තමයි වැඩ කරන්නේ. ඒ නිසා ඒක ඔයගොල්ලන් කර ගන්න; ඒක ඔයගොල්ලන්ගේ හැකියාව.

අනිල් ජයන්ත ඇමතිතුමා කථා කරන්නේ හරියට IMF වැඩසටහන එතුමා ගෙනාවා වාගේ. IMF වැඩසටහන එතුමා ගෙනාවේ නැහැ. අපි වාරික දෙක තුනක් අරගෙන තමයි ඔයගොල්ලන්ට ඉතුරු ටික කරගෙන යන්න දුන්නේ. කමක් නැහැ, ඒක කරගෙන යනවා. හැබැයි සමහර ඇමතිවරු කිව්වා, ඒ කාලයේ වේදිකාවල අපේ පළාතේ ඇමති කිව්වා සුද්දාට ඕනෑ විධියට නොවෙයි අපට ඕනෑ විධියට සුද්දා සල්ලි දෙන්නේ කියලා. දැන් කෝ? සුද්දාට ඕනෑ විධියට තමයි, IMF එකට ඕනෑ විධියට තමයි වැඩේ යන්නේ, අපට ඕනෑ විධියට වැඩේ යන්නේ නැහැ. අපට ඕනෑ විධියට වැඩේ යනවා නම් අද විදුලි බිල වැඩි වෙන්නේ නැහැ. අපට ඕනෑ විධියට යන්නේ නැහැ. IMF එකට ඕනෑ විධියට තමයි තවමත් රට යන්නේ. හැබැයි කිව්වේ කොහොමද? කිව්වේ එහෙමයි. නමුත් කියපු විධියට කරන්නේ නැහැ.

සමහර ඇමතිවරු ආණ්ඩුවත් එක්ක තරහයිද කියලා මම දන්නේ නැහැ. මේ ආණ්ඩුවේම ඇමතිවරු. ඊයේ අනුරාධපුරයේ කෘෂිකර්ම ඇමතිතුමා කියනවා -නුවරින් ඡන්දය ඉල්ලුවාට අනුරාධපුරයේ මනුස්සයෙක්- අපි වවලා අපි කන්න කියලා නීතියක් නැහැලු, මේ ශ්‍රී ලංකාවේ එහෙම නීතියක් නැහැලු, අපට ඕනෑ නම් අපි හාල් ගේනවාලු. සාමාන්‍යයෙන් රටේ මොන ප්‍රශ්නය තිබුණත් කෘෂිකර්ම ඇමති කෙනෙක් එහෙම කියන එක වටින්නේ නැහැ රාජ්‍ය ඇමතිතුමනි? එහෙම වටිනවාද කියන්නකෝ? Mediaවලට ඇවිල්ලා කියනවා, අපි වවලා අපි කනවා කියලා

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

අපේ ප්‍රතිපත්තියක් නැහැලු, අපිට ඕනෑ වුණොත් හාල් ගේනවාලු. මොන ප්‍රශ්නය තිබුණත්, ගොවිතැනින් ජීවත් වුණු, ගොවි පළාතක ඉපදුණු මිනිහෙක් කියන වචනයක්ද කියන්නකෝ ඒක? එහෙම කියන්න හොඳ නැහැ. මේ පාර්ලිමේන්තුවේ කොච්චර ඉන්නවාද ගොවිතැන් කරන ප්‍රදේශවලින් ආව මන්ත්‍රීවරු? ඒ අය ඒ පළාතේ මිනිස්සුන්ට මුහුණ දෙන්න එපායැ. ඒ පළාතේ ජනතාවගේ ඡන්දය දීලා පත් කරලා එව්වේ. මේ ඇමතිවරුන්ට පිස්සුද දන්නේ නැහැ, මේ ආණ්ඩුවත් එක්ක තරහද දන්නේ නැහැ. එක ඇමති කෙනෙක් කියනවා ගව ශුක්‍රාණු ගේනවාලු!

ඊළඟට තව කාරණාවක් කියනවා. පුළුවන් නම් කඩන්න කියන්නකෝ පොළොන්නරුව රෙස්ට් හවුස් එක. පොළොන්නරුව රෙස්ට් හවුස් එකට අවුරුදු 70ක් විතර ඇති. කෙළින්ම තිබෙන්නේ වැවේ - වැව අයිනේ; වැවේ වතුර වදිනවා. රජයට අයත් පොළොන්නරුව රෙස්ට් හවුස් එක වැව අයිනේ තිබෙන්නේ, වැවේ වතුර ඇවිල්ලා රෙස්ට් හවුස් එකට වදිනවා. පුළුවන් නම් පොළොන්නරුව රෙස්ට් හවුස් එක කඩන්න කියන්නකෝ. ඊළඟට ආණ්ඩුකාර නිල නිවස. අනුරාධපුරයේ ඒ ඉන්න ආණ්ඩුකාරවරයා අපේ විපක්ෂයේ කාගේ හරි කෙනෙක්ද? අනුරාධපුරයේ ආණ්ඩුකාර නිල නිවස කඩන්න කියන්නකෝ. කඩන්න කියන්න. නුවර වැව හෝටලය කඩන්න කියන්නකෝ. රජයේ ඒවා කඩන්න කලින් පෞද්ගලික අයගේ ඒවා කඩලා පෙන්වන්න කියන්න ඇමතිතුමාට. පෞද්ගලික අයගේ ඒවා කඩලා රජයේ ඒවා කඩන්න කියන්න. රජයේ කියන්නේ කාගෙත් නේ. රජයේ කිව්වාම ආණ්ඩුවේ විතරක් නොවෙයි, මේ රටේ මිනිස්සුන්ගේ සල්ලි නේ. ඒවාට අනුමැතිය දීපු අයත් ඉන්නවා නේ. ඔය අනුරාධපුර ආණ්ඩුකාර නිල නිවසයි, මහ ඇමති නිල නිවසයි හැදුවේ ඇමතිවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ, මහ ඇමතිගේ වුවමනාවලට විතරක් නොවෙයි. ප්‍රධාන ලේකම්, ගණකාධිකාරී, ඉංජිනේරුවන්, පළාත් ඉංජිනේරුවන් ඇතුළු ඒවාට ඇස්තමේන්තු හදපු, ඒවා - estimates - අනුමත කරපු රජයේ නිලධාරින් කී දෙනෙක් ඉන්නවාද? එහෙම නම් ඒ හැම කෙනාම අත්අඩංගුවට ගන්න වෙනවා. ඒගොල්ලන් ඔක්කෝගෙන්ම වන්දි ගන්න වෙනවා. එහෙම නැතුව පොදු දේපළ පනත යටතේ ඒවා නිකම් කඩන්න බැහැ. කැඩුවොත් මාස තුනහමාරකට වඩා තපින්න වෙනවා ඇප ගන්න. ඇමතිකම් පවර්ස් පෙන්වලා මේ සැරේ ලොකුකමට කියයි. කඩලා පෙන්වන්න කියන්නකෝ, ඇමතිතුමාට. ඊළඟ ආණ්ඩුවක් ආවාම ඇමතිතුමාට තමයි තපින්න වෙන්නේ. මේවා කියන්න නම් ලේසියි. හැබැයි, කරලා පෙන්වන්න ඕනෑ.

ඔබතුමන්ලාට මතකද, සුනාමි කාලයේ කිව්වා, මීටර් 100ක් ඇතුළත තිබෙන ඒවා සියල්ල කඩනවා කියලා. සුනාමිය ආවාට පස්සේ අපේ ආණ්ඩුව, -අපි කියන්නේ අපේ ආණ්ඩුව කාලයේ. එහෙම නැතුව ඔයගොල්ලන්ගේ ආණ්ඩුවක් ද සුනාමිය ආපු වෙලාවේ තිබුණේ? අපේ ආණ්ඩුවක් තිබුණේ- මීටර් 100ක් ඇතුළත සිටින සියලුදෙනා ඉවත් කරනවා කිව්වා. හැබැයි, එක්කෙනෙක්වත් ඉවත් කළාද? සුනාමියට හසු වුණු එක හෝටලයක් අයින් කළාද? දැන් ඊට වඩා හොඳට ඒවා හදලා තිබෙනවා. එහෙම කරන්න බැහැ. ප්‍රායෝගික වෙන්නේ නැහැ. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මහ පොළොවේ පැළ වෙන්නේ නැහැ, තීන්දු. පොළොන්නරුව රෙස්ට් හවුස් එක ගත්තොත්, පරාක්‍රම සමුද්‍රයේ වතුර ටික "රොක් රොක්" ගාලා ඇවිල්ලා කෙළින්ම වදින්නේ රෙස්ට් හවුස් එකට. මේවා ගැන බලන්න. මේවා ගැන හොයන්න. කට තිබෙන පළියට ඇමතිවරුන්ට දොඩවන්න බැහැ. කට තියෙන පළියට කියවන්නත් බැහැ. *[බාධා කිරීමක්]* ඇමතිතුමා මට වාඩි වෙන්න කියන්න එපා. වාඩි වෙන්න නොවෙයි, මේවා අහගන්න. මේවා ඇත්ත. මේවා කියන්න ඕනෑ දේවල්. මේවා කිව්වා කියලා තරහා වෙන්න එපා. හවසට ගිහිල්ලා ලස්සන සූට් එකක් ගහලා කණ්ණාඩි දෙකක් දාලා මයික් එක ඉස්සරහ දේවල් කිව්වාට මොනවා ගහලා ගිහිල්ලා කියනවාද කියලා මම දන්නේ නැහැ. ඒ නිසා හරි දේ කරන්න කියලා ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නිලූෂා ලක්මාලි ගමගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.37]

ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலூஷா லக்மாலி கமகே)
(The Hon. (Mrs.) Nilusha Lakmali Gamage, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 2005 අංක 36 දරන පනත සංශෝධනය සඳහා වන සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත් කෙටුම්පත, 2016 අංක 04 දරන පනත සංශෝධනය සඳහා වන සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන) පනත් කෙටුම්පත සහ 2016 අංක 03 දරන පනත සංශෝධනය සඳහා වන සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදයේදී අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම ගැන ඇත්තටම මම සතුටු වෙනවා. සාමාන්‍යයෙන් වැඩ කරන ජනතාව වෙනුවෙන් පෙනී සිටින සහ සැම අවස්ථාවකදීම ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් හඬ නගන පක්ෂයක් වන ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරියක් විධියට මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඇත්තටම මම කෘතඥතාව පුද කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් 1928 දී තමයි අවම වැටුප නියම කිරීමේ යන්ත්‍රණය බිහි කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය හඳුන්වා දුන්නේ. මේ සම්මුතියට 1971 ජුනි 09වැනිදා ශ්‍රී ලංකාවත් අත්සන් තැබුවා. ඒ අනුව නිශ්චිත වැඩ කරන කාල පරිච්ඡේදයක් තුළ සේවකයෙකු නිෂ්පාදනය කළ භාණ්ඩ ප්‍රමාණය මත හෝ වැඩ කළ පැය ගණන මත හෝ ඉටු කළ වැඩ හෝ සැපයූ සේවා සඳහා වන එම සේවකයාට ගෙවිය යුතු අවම මුදල ලෙස සේවකයෙකුගේ අවම වැටුප ජාතික කම්කරු සංවිධානය විසින් අර්ථ දක්වා තිබෙනවා. ශ්‍රී ලංකාවේ මේ පිළිබඳව තිබෙන නීති සලකා බැලීමේදී කර්මාන්ත සහ සේවා අංශයන්ගේ රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන්ගේ අවම වැටුප සහතික කිරීමේ අරමුණෙන් සම්පාදනය කරන ලද පනත් තුනක් දක්නට තිබෙනවා, 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත, 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත, 2016 අංක 4 දරන සේවකයන්ගේ අය වැය සහන දීමනාව පනත වශයෙන්.

ජාත්‍යන්තර කම්කරු සංවිධානයට අනුව අවම වැටුප සාමූහික හෝ පෞද්ගලික ගිවිසුමක් මඟින් අඩු කරන්න බැහැ. ඒ වාගේම, රටේ ආර්ථික හා සමාජයීය තත්ත්ව සැලකිල්ලට ගනිමින් සේවකයාගේ සහ ඔහුගේ පවුලේ අවම අවශ්‍යතා සපුරා ගැනීමට ප්‍රමාණවත් වන පරිදි නිශ්චය කොට නීතියෙන් සහතික කළ යුතු බව දක්වා තිබෙනවා. ඒ අනුව සාමූහික හෝ පෞද්ගලික ගිවිසුමක් මඟින් වේතනය අඩු කිරීමට තිබෙන නොහැකියාව මඟින් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වේතනයේ ස්ථාවරභාවය, ආරක්ෂාව ඔවුන්ට ලබා දෙනවා.

2024 සැප්තැම්බර් මස සිට ජාතික මාසික අවම වේතනය ලෙස රුපියල් 17,500ක් සමඟ 2005 අංක 36 සහ 2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත් මඟින් ගෙවිය

යුතු රුපියල් 3,500ක අය වැය සහන දීමනාව ඇතුළුව රුපියල් 21,000ක අවම වේතනයක් පෞද්ගලික අංශයේ සේවා යෝජකයන් විසින් සේවකයන්ට ගෙවීමට කටයුතු කරලා තිබෙනවා.

ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විසින් 2025 අය වැය යෝජනා මඟින් රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කළා. ඒ හා සමානව, ඊට සමගාමීව පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම සඳහා ආණ්ඩුව විසින් පහත යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව 2025.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රුපියල් 17,500 සිට රුපියල් 27,000 දක්වා රුපියල් 9,500කින් සේවකයන්ගේ ජාතික අවම මාසික වේතනය ඉහළ නැංවීමටත්, 2025.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවකයන්ගේ ජාතික අවම දෛනික වේතනය රුපියල් 700 සිට රුපියල් 1,080 දක්වා රුපියල් 380කින් ඉහළ නැංවීමටත්, ඒ වාගේම එහි දෙවන අදියර ලෙස 2026.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවකයන්ගේ ජාතික අවම මාසික වේතනය රුපියල් 27,000 සිට රුපියල් 30,000 දක්වා රුපියල් 3,000කින් ඉහළ නැංවීමටත්, සේවකයන්ගේ ජාතික අවම දෛනික වේතනය රුපියල් 1,080 සිට රුපියල් 1,200 දක්වා රුපියල් 120කින් ඉහළ නැංවීමටත් තීරණය වෙලා තිබෙනවා. මේ වෙනස්කම් සිදු කිරීම සඳහා මෙම සංශෝධන පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. එසේම මෙම සියලු සංශෝධන නීතියේ ප්‍රතිපාදන ප්‍රකාරවම සේවකයාගේ වේතනවල හෝ වැටුපෙහි අනිවාර්ය සහ මූලික කොටසක් විය යුතු බවත් මෙහි සඳහන් වෙලා තිබෙනවා. ඒ වාගේම, සේවක අර්ථසාධක අරමුදලට, සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට සහ විශ්‍රාම වැටුපට ගෙවනු ලබන දායක මුදලට එය අදාළ කරගනු ලබනවා. ඇත්තටම මෙම සියලු සංශෝධන සැලකිල්ලට ගැනීමේදී, පෞද්ගලික අංශයේ කර්මාන්ත සහ සේවා අංශවල රැකියාවල නියුතු සේවකයන් විශ්වාසයකින් යුතුව පෞද්ගලික අංශයේ සේවය සඳහා නියුක්ත කිරීමටත්, පෞද්ගලික අංශයේ නව රැකියා සඳහා පුද්ගලයන් ආකර්ෂණය කර ගැනීමටත් මෙම සංශෝධන හේතුවක් වන බව පැහැදිලි වනවා.

අලුතින් රැකියා සඳහා යොමු වන දූ පුතුන්ට අපි කියන්න කැමැතියි, රජයේ රැකියා වාගේම පෞද්ගලික අංශයේ රැකියා සඳහාත් අවධානය යොමු කරන්න මේක හොඳම අවස්ථාවක් වෙනවා කියලා. ඒ වාගේම, රැකියා පෝලිමේ රැඳී නොසිට විවෘත වන විවිධ රැකියා ක්ෂේත්‍ර පිළිබඳව අවධානය යොමු කරන්නත් මෙය හොඳ ප්‍රවේශයක් වෙනවා. උපාධියක් තියාගෙන දරුවෝ ගෙදර ඉන්නවා, ගුරු පත්වීමක්, එහෙම නැත්නම් රජයේ රැකියාවක් බලාපොරොත්තුවෙන්. නමුත් ඇත්තටම වර්තමානයේ පෞද්ගලික අංශයේ විවිධ රැකියා අවස්ථා විවෘත වෙනවා. ඒවා ගැන අවධානය යොමු කළොත් තමන්ගේ හැකියාව අනුව බොහෝ රැකියා අවස්ථා ගණනක් පෞද්ගලික අංශයේ සේවා ක්ෂේත්‍රය තුළ සොයාගත හැකියි. දැනට අපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා, අපේ අමාත්‍යාංශ හරහා විවිධ නිපුණතා වැඩසටහන් සහ දරුවන් වෙනත් රැකියා අවස්ථා සඳහා යොමු කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවා. මා හිතන්නේ, දරුවන් පෞද්ගලික අංශය වෙත නැඹුරු වුණොත් වැඩි රැකියා අවස්ථා ප්‍රමාණයකට ඉඩ කඩ ලැබෙනවා කියලායි. ඒ වාගේම, දැනට රැකියා නොමැතිව පෝලිමේ ඉන්න ප්‍රමාණය අඩුවීමටත් ඒක හේතුවක් වේවි. ඒ නිසා අපට ලැබුණු මේ අවස්ථාව නව ආයෝජකයන් මෙරටට ගෙන්වා ගැනීමට වාගේම දරුවන් තමන්ගේ උපාධිය මතම නොරැඳී ඒ උපාධියෙන් අපේක්ෂා කරන රැකියාවම බලාපොරොත්තු වන්නේ නැතුව විවිධ රැකියා ක්ෂේත්‍රවලට යොමු කිරීමටත් අවස්ථාවක් කරගෙන අපේ ආර්ථිකයට වැඩි දායකත්වයක් ලබා දෙන්නත්, සේවයක් ලබා දෙන්නත් මෙය හොඳ අවස්ථාවක් කරගන්න කියලා මම යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමියනි.

ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலூஷா லக்மாலி கமகே)
(The Hon. (Mrs.) Nilusha Lakmali Gamage, Attorney-at-Law)
ජාතික ජන බලවේගය රජය විධියට පෞද්ගලික අංශය පිළිබඳවත් අපි වැඩි අවධානයක් යොමු කරන බවත්, ඒ ලබා දීලා තිබෙන පොරොන්දුව ක්‍රියාත්මක කරන බවත් ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.44]

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, සුවිශේෂ පනත් කෙටුම්පත් කිහිපයක් විවාදයට ගැනෙන අද මේ වෙලාවේ අදහස් දක්වන්න අවස්ථාවක් ලැබීම ගැන සතුටු වෙනවා. මම හිතන හැටියට මේක මේ රටේ ජනතාව, විශේෂයෙන්ම වැඩ කරන ජනතාව බලාගෙන ඉන්නා මොහොතක්. මොකද, මේ පනත් සංශෝධනය වීම් හරහා ඔවුන්ට යම්කිසි අයිතියක් ලැබෙන නිසා. මේ පනත් කෙටුම්පත් ගෙන ඒම පිළිබඳව අපි ආණ්ඩුවට ස්තුතිය පුද කරනවා, රටේ ජනතාවට මේ අවශ්‍යතාව තිබෙන නිසා. නමුත් මේ ලබා දීලා තිබෙන සහන ජනතාවට ප්‍රමාණවත් ද කියන ගැටලුව තිබෙනවා.

අපි දැක්කා, ආණ්ඩු පක්ෂයේ සමහර මන්ත්‍රීවරු කථා කරන කොට කිව්වා, මේක ප්‍රමාණවත් වෙන්නේ නැහැ කියලා. එතුමන්ලාට ඒක දැනිලා තිබෙන එක ගැන අපි සතුටු වෙනවා. පසුගිය රජයන් තුළ සිදු වෙච්ච වැරැදි, පසුගිය රජයන් තුළ සිදු වෙච්ච අඩුපාඩු, පසුගිය රජයන්වල අමාත්‍යවරුන්ගෙන් වෙච්ච අඩු පාඩුකම් නිසා ජනතාවට සහන දෙන්න වත්මන් ආණ්ඩුවට තිබෙන අපහසුතාව කියලා, ඒක හුවාදක්වන්න උත්සාහ කරනවා නම්, ඒක සමාජයට කරන බොරුවක්. ඒකට හේතුව මේකයි. වත්මන් ජනාධිපතිවරයාගේ ඉඳලා මේ ඉන්න බොහෝ ඇමතිවරු, මන්ත්‍රීවරු මැතිවරණවලදී ජනතාව හමුවේ කථා කළේ අපේ රටේ ජනතාවට දෙන සහන ගැන. ඒ සහන දෙන්න පසුගිය ආණ්ඩු කටයුතු නොකරපු ආකාරය ගැන ගණන් මිම් ඇතිව, ගණන් හදලා, ඉලක්කම් එක්ක පෙන්නුවා.

අර දමිළ මන්ත්‍රීතුමියක් බදුල්ලෙන් ආවා. ඒ තමයි අම්බිකා මන්ත්‍රීතුමිය. එතුමිය අඬලා කිව්වේ, දමිළ ජනතාවට වෙලා තිබෙන දේ. අපි ආපු ගමන් කම්කරුවන්ට රුපියල් දෙදාහක් දෙනවා කිව්වා. පෞද්ගලික අංශයේ වැටුප් වැඩි වීම ගැන අපි වෙනම කථා කරමු. අද දමිළ ජනතාවට මොකක්ද වෙන්නේ? වතු කම්කරු ජනතාවට මොකක්ද වෙන්නේ? මේ රටේ අහිංසක, මේ රටට ජාතික ධනය ඉපැයීම වෙනුවෙන් මහා විශාල මෙහෙයක් කරන ඒ කණ්ඩායමට රුපියල් දෙදාහක් තියා රුපියල් පනහකින්වත් වැටුප වැඩි කරන්න මේ ආණ්ඩුව කථා කරන්නේ නැහැ. මේ වෙලාවේ අපි ඒ කාරණය අවධානයට ලක් කරනවා. ආණ්ඩුව එදා කියපු දේවල් වලංගු නැද්ද, එහෙම නැත්නම් ඒවා එදා කිව්වේ හුදු

[ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා]

දේශපාලන බලය ලබා ගැනීමේ අරමුණින්ම පමණක්මද? ඒ නිසා අඩුම ගණනේ සමාජය ඉස්සරහට ඇවිල්ලා සමාව ඉල්ලන්න, "අපි ඒ කියපුවා කරන්න අමාරුයි. අපි කරන්න පුළුවන් දේ තමයි කරන්නේ" කියලා. ඒ මන්ත්‍රීතුමිය ඒ මුල් දවස්වල දැක්කාට පස්සේ පාර්ලිමේන්තුවේ දකින්නත් නැහැ. මේ රටේ ජනතාව රවට්ටලා බලය ලබාගෙන, ඒ බලය රඳවා ගන්න බැහැ කියන එක ඉතිහාසයේ එක් එක් වකවානුවල ඔප්පු වෙලා තිබෙනවා.

අද තමුන්නාන්සේලා තිබෙන තත්ත්වය වෙන පැත්තකට හරවනවා. පසු ගිය ආණ්ඩුවල වැරැදි කියලා, පසුගිය ආණ්ඩුවලට චෝදනා කරලා අත පිහගන්න කාලයක් තිබුණා. ඒ, මුල් මාස තුන හතර තුළ. දැන් තමුන්නාන්සේලා බලය අරගෙන අවුරුද්දකට ආසන්නයි. දැන් සත්‍යයත් එක්ක ගමන් කරන්න ඕනෑ. මේ රටේ වැඩ කරන අහිංසක ජනතාවගේ වැටුප රුපියල් 21,000කට නැත්නම් රුපියල් 27,000කට යන එක තුළ යම් ප්‍රමාණයක වාසිදායක තත්ත්වයක් තිබෙනවා. මේ රටේ ආර්ථික කඩා වැටීමත් එක්ක, විශේෂයෙන්ම ව්‍යවසායකයන්ට තිබෙන ප්‍රශ්නත් බලන්න ඕනෑ. ව්‍යවසායකයනුත් ව්‍යාපාර අත්හැරලා පාඩු විඳින තැනට වැටිලා තිබෙනවා. හැබැයි, රැකියාවක් කරන සාමාන්‍ය ජනතාවට ලැබෙන ඒ වැටුපෙන් ජීවිකාව ගෙන යන්න පුළුවන්කමක් නැහැ. මේ කාරණා දෙක ගළපන්න පුළුවන් මට්ටමක් ගැන හිතලා ආණ්ඩුව මේ තීන්දු තීරණ ගන්නවාද කියලා අපට සැකයි. ඒකට හේතු සාධක තිබෙනවා. මොකද, ලුණු සංස්ථාව පවත්වා ගෙන යන්න බැරිකොට මේ වාගේ ලොකු දේවල් කරන්න පුළුවන් වෙයිද කියන සැකයක් අපට තිබෙනවා. ඒ නිසා අපි ආණ්ඩුවට යෝජනා කරනවා, අඩුම තරමින් මේ රටේ ජනතාවට පොරොන්දු වෙච්ච දේවල් ඉටු කරන්න බැහැ කියන කාරණාව සමාජගත කරලා, ඉතිරි ජනතාවාදී යෝජනා, තමන්ගේ මට්ටමින් කරන්න පුළුවන් යෝජනා ඉස්සරහට ගෙනෙන්න කියලා. දැන් කාලය හරි. රාජ්‍ය සේවකයා බලාගෙන ඉන්නවා, රාජ්‍ය සේවකයාට එදා වෙච්ච පොරොන්දු ඉටු වෙනවාද කියලා. තරුණ පරම්පරාව, විශේෂයෙන් උපාධිධාරීන්ට රැකියා ලබා දීම ගැන පුදුමාකාර විධියේ පොරොන්දු දුන්නේ. අද ඒ තරුණ පරම්පරාව උපාධිය අරගෙන ගෙදරට වෙලා බලාගෙන ඉන්නවා, කෝ, මේ ජනාධිපති අනුර කුමාර දිසානායක මහත්මයා දීපු පොරොන්දු ටික මේ මහ පොළොවේ යථාර්ථයක් වෙන්නේ කවදද කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ආණ්ඩුව මේ ගෙවමින් ඉන්නේ මේ රටේ ජනතාව විශාල බලාපොරොත්තු තියාගෙන ඉන්න කාලයක්. මොකද, පසුගිය රජයන්ට චෝදනා කරලා, පසුගිය රජයන් ප්‍රතික්ෂේප කරලා, මේ රටේ බොහොමයක් දේශපාලන බලවේග එකතු වෙලා - මේ ආණ්ඩුව ජනතා විමුක්ති පෙරමුණේම මන්ත්‍රීවරු 159 දෙනෙකුගෙන් හැදුණේ නැහැ- හැදිච්ච පාලනයකින් බලාපොරොත්තු වන අරමුණ තමයි, මේ රට මෙතෙක් කල් පාලනය කරපු අයගෙන් වෙච්ච වැරැදි නිවැරැදි කරගෙන, ඒ සඳහා අවශ්‍ය විකල්ප යෝජනා මේ ආණ්ඩුවෙන් ගේන්න ඕනෑය කියන එක. හැබැයි, අද ඒ විකල්ප ද ගේන්නේ? අද ගේන අලුත් යෝජනා ඔක්කෝම පසුගිය ආණ්ඩු හරහා වෙච්ච දේවල් නේ. ඇමතිවරුන්ගෙන් බලාපොරොත්තු වුණා මේ රටේ සාධාරණයක්. මේ රටේ අහිංසක මිනිසුන්ගේ බදු මුදල්වලට සාධාරණයක් කරයි කියලා ඔවුන්ගෙන් බලාපොරොත්තු වුණා.

ඒ වාගේම, පසුගිය කාලයේ හිටපු ඇමතිවරු කරපු ඒ කාඩ, තුච්ඡ වැඩ වත්මන් ඇමතිවරුන්ගෙන් සිදු නොවෙයි කියලා බලාපොරොත්තු වුණා. නැහැ, ඒක වෙනවා. අපි මාධ්‍යවල යන එක සිදුවීමක් දැක්කා. ඒක වැරදි නම් නිවැරදි කරන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු විධියටත් ඉන්ධන දීමනාව ගන්නවා, ඇමතිවරයා විධියටත් ඉන්ධන දීමනාව ගන්නවා. ඒ ගැන ඇහුවාට පස්සේ කියනවා, ඉස්සෙල්ලා කට්ටියත් ගත්තා කියලා. ඉස්සෙල්ලා කට්ටිය කරපු දේ කරන්න නම් දෙවියනේ මේ රටේ මිනිස්සු බෙල්ල තියලා මාලිමාවේ ආණ්ඩුවක් හදන්නේ නැහැ නේ. එහෙම නම් පසුගිය ආණ්ඩුත්, මේ ආණ්ඩුවත් දෙකම එකයි නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, දැන් තනිකරම පීල්ල වැරදි පැත්තට පැනලා තිබෙන්නේ. පුළුවන් නම් ආපහු හරවලා නිවැරදි පීල්ලකට දා ගන්න. මේ රටේ මිනිස්සු, උගත් තරුණ පරම්පරාව බලාපොරොත්තු වුණේ ඒක. දූෂණයට එරෙහිව මේ යන ගමන තුළ දූෂණය නතර කරන්න ආපු කණ්ඩායමට අද ඇතුළේ දූෂණය නතර කර ගන්න බැරි වෙලා තිබෙනවා. මේ රටේ දේශපාලනඥයන් මුදලට විකිණෙන යුගය අවසන් කරන්නට ආපු මාලිමාවේ ආණ්ඩුව, අද පළාත් පාලන මැතිවරණයෙන් තේරී පත් වුණු මන්ත්‍රීවරු සල්ලිවලට ගත්ත විධිය, මන්ත්‍රීවරු බිලී බා ගත්ත විධිය මේ රටේ ජනතාව දන්නවා. ඒ නිසා තමයි එදා මේ අයත් එක්ක හිටපු උගත් පරම්පරාව, මේ රටට ආදරය කරන මිනිස්සු, මේ රට නිවැරදි මඟකට ගෙනියන්න මාලිමාවට පුළුවන් කියලා හිතපු මිනිස්සු අද පැත්තකට වෙලා ඉන්නේ. ඒ නිසා අපි හිතනවා, තව අවුරුද්දක් යනකොට මේ ආණ්ඩුවට සහ අපි සියලුදෙනාට නරක අත්දැකීම්වලට මුහුණ දෙන්න වෙනවා කියලා. මොකද, අපට ණය ගෙවන්න තිබෙනවා. මේ බයිලා මොනවා ගැහුවත් තව අවුරුද්දකින් ණය ගෙවන්න පටන් ගන්න වෙනවා. අන්න ඒකට මොකක්ද අපට තිබෙන සැලසුම්? අන්න ඒ වෙනුවෙන් මොකක්ද අපි අරගෙන තිබෙන පියවර? අද අපි මේ කරන්නේ එදා වේල වෙනුවෙන් මොකක් හරි මාතෘකාවක් හදාගෙන කාලය ගෙවන එක විතරයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ නිසා මේ පාර්ලිමේන්තුව උගතුන්ගෙන් බුද්ධිමතුන්ගෙන් පිරිණු, ප්‍රායෝගිකව කටයුතු කරන්න පුළුවන් කණ්ඩායමක් කියන එක ඔප්පු කරන්න ඕනෑ. එහෙම නැතිව, පසුගිය කාලයේ වෙච්ච වැරදිත් එක්ක අද කටයුතු ගළපන්න ගිහිල්ලා සමාවක් කරගන්න පුළුවන්කමක්, මේ යන ගමන නිවැරදි කරන්න පුළුවන්කමක් වත්මන් ආණ්ඩුවට නැහැ කියලා අපි විශ්වාස කරනවා.

අද මේ යෝජනාවලිය හරහා අපේ රටේ පෞද්ගලික අංශයේ සේවකයන්ට යම්කිසි වටිනාකමක් එකතු වෙනවා. අපි විපක්ෂය විධියටත්, මේ රටේ අහිංසක මිනිස්සු නියෝජනය කරන පාර්ශ්වයක් විධියටත් ඒ ගැන සතුටු වෙනවා. අපි මේ ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. තමන්ගේ මේ ජනවරම සැබෑවට තේරුම් අරගෙන, ඒක හරියට කියවාගෙන, ඒ ජනවරම තුළින් ජනතාව බලාපොරොත්තු වෙච්ච දේ ඉටු කිරීමට අවශ්‍ය කටයුතු කරන්න. මේ විධියට මන්ත්‍රීවරු දඩයම් කරලා, මන්ත්‍රීවරු හිර කරලා මේ ප්‍රශ්නයට උත්තර හොයන්න පුළුවන් නම් හොඳයි. වරදක් කර තිබෙනවා නම් දඬුවම් කරන එක හොඳයි. ඒක කරන්න, ඒක වෙන්න ඕනෑ. හැබැයි, ඒක එක කොටසක් විතරයි. ඒක ආණ්ඩුවේ එකම යැපුම් මාර්ගය කර ගන්න එපා. ඒ කටයුතු ඒ අදාළ අමාත්‍යවරයා හා පිරිස කරගෙන යන්න. මුළු ආණ්ඩුවේම කාර්යභාරය ඒක කියලා හිතලා වැඩ කරනකොට මේ රටේ ආර්ථිකය හදන්න කෙනෙක් නැති වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය දැන් අවසානයි.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම අවසන් කරනවා.

අපේ රටේ ආර්ථිකය හදන්නේ නැතිව අපට ගොඩයෑමක් නැහැ. ඒ නිසා අපි ආණ්ඩුවට කරනවා, මේ බොරු සුපින් දේවල් නැතිව, රටේ ජනතාවට එදා අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා ඇතුළු ඔබතුමන්ලා, ඔබතුමියලා සියලුදෙනා පොරොන්දු වෙච්ච විධියට ජනතා යුතුකම් ඉටු කරන්න ඉස්සරහට අඩියක් තියන්න කියලා. ආණ්ඩුවට ඒ කාරණය මතක් කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.53]

ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම හිතන විධියට මේ දවස්වල විපක්ෂයේ මන්ත්‍රීවරු තරම් අපට ආදරේ වෙන කවුරුවත් නැහැ වාගේ. චාමර සම්පත් මන්ත්‍රීතුමා, හේෂා විතානගේ මන්ත්‍රීතුමා සෑහෙන්න උපදෙස් ප්‍රමාණයක් මේ ආණ්ඩුවට, අපට දුන්නා හැදෙන්න ඕනෑ විධිය කියලා. මම ඒ ගැන වෙනම කියන්නම්.

කෙසේ වෙතත්, අද මේ රටේ පෞද්ගලික අංශයේ වැඩ කරන ජනතාවට ඓතිහාසික දිනයක්. ඒ අන් කිසිවක් නිසා නොවෙයි, අපේ රටේ ඉතිහාසයේ පෞද්ගලික අංශයට වැඩි වූ විශාලතම වැටුප් වැඩිවීම තමයි මේ ලැබෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. පෞද්ගලික අංශයේ රුපියල් 17,500ක basic salary එක ලබන අවුරුද්දේ ජනවාරි වනකොට රුපියල් 30,000 දක්වා වැඩි වනවා. මේ රටේ ඉතිහාසයේ පළමු වතාවට ඒක වෙන්නේ. මේ එහා පැත්තේ ඉන්නේ පසුගිය කාලයේ ආණ්ඩු කරපු මහත්වරු. එතුමන්ලා අද හරියට කථා කරන්නේ, පසුගිය කාලයේ අපි ආණ්ඩු කළා වාගේයි. ඒ මහත්වරු කරපු කෙරුවාව මේ රටේ ජනතාව දන්නවා. පළමු වතාවට රාජ්‍ය සේවකයාට වැඩිම වැටුප් වැඩි වීම ලබා දුන්නා ඉතාම කෙටි කාලයක් ඇතුළේ වර්තමාන ආණ්ඩුව. ඊළඟට, අද පනත් කෙටුම්පත සම්මත වනවා පෞද්ගලික අංශයේ වැටුපට අදාළව. මේ පනත් කෙටුම්පත අද නොවෙයි ගෙනෙන්න තිබුණේ. ඒ ගැනත් වචනයක් කියන්න ඕනෑ.

මේ පනත් කෙටුම්පත ගෙනෙන්න තිබුණේ මීට කලින්. හැබැයි, අඩුම ගණනේ මේ රටේ ජාතික කම්කරු උපදේශක සභාවවත් නියෝජනය නොකරන වෘත්තීය සමිතියක් යැයි කියා ගන්නා අය මේකට මැදිහත් වුණා. නමට නම්, පෙරට යනවා කියලා තමයි කියන්නේ. හැබැයි, කරන්නේම පසුගාමී වැඩ. නම පෙරටුගාමී. හැබැයි, කරන්නේ පසුගාමී වැඩ. ඒ අය ගියා උසාවි; මේක කල් දැම්මා. ඇත්තටම සමහරු කියනවා, මේ වැටුපට දැන් arrears දෙන්න ටිකක් අමාරුයි. මොකද, මේ ප්‍රශ්නය නිසා මාස දෙකක් විතර මේ කටයුත්ත කල් ගියා. මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන එක කල් ගියා. කෙසේ වෙතත්, අද අපි හිතනවා අද දිනය මේ රටේ වැඩ කරන ජනතාවට ඓතිහාසික දිනයක් කියලා. මොකද, රුපියල් 17,500 ඉඳලා රුපියල් 30,000 දක්වා පෞද්ගලික අංශයේ වැටුප වැඩි වනවා.

හිටපු කට්ටිය මොනවාද කළේ? දැන් අපට කියනවා, මේක මදි ලු. ඔව්, ඇත්ත. අපි කියන්නේ නැහැ, දැන් රාජ්‍ය සේවකයන්ට සියයට 60ත්, 80ත් අතර වැටුප් වැඩි වෙලා සියල්ල පහළ වෙලා කියලා. හැබැයි, මේ කඩා වට්ටපු රට, කාලා වනසපු රට තමයි අපි භාර අරගෙන මාස හතක් ඇතුළේ කෙළින් කරගෙන යන්නේ. ඇද වට්ටලා තිබුණු රටක් තමයි යන්තම් කෙළින් කරගෙන, ආර්ථිකය ස්ථාවර කරගෙන අපි ඉදිරියට යමින් තිබෙන්නේ. ඒ නිසා අපි ඉතා පැහැදිලිව කියන්න ඕනෑ, මේ රටේ පෞද්ගලික අංශයට ඉතාම හොඳ -මේ මොහොතේ අපට දෙන්න පුළුවන්- වැටුප් වැඩි වීමක් ලබා දීලා තිබෙනවා. ඒක හොඳම එක නොවෙයි. අපි දන්නවා, තවත් ඉදිරියට යා යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පසුගිය කාලය තිස්සේ ආණ්ඩු කරපු මහත්වරු අපි කම්කරු අමාත්‍යාංශයේ වැඩ භාර ගන්නකොට අවුරුදු එකහමාරකින් NLAC එක කැඳවලා තිබුණේ නැහැ; ජාතික කම්කරු උපදේශක සභාව ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ඇමතිවරු කැඳවලා තිබුණේ නැහැ, අවුරුදු එකහමාරකින්. අපි තමයි ගිහිල්ලා ජනවාරි මාසයේ 15වන දා, පළමු වතාවට ජාතික කම්කරු උපදේශක සභාව කැඳෙව්වේ. මොකක්ද ජාතික කම්කරු උපදේශක සභාව කියන්නේ? ඒක තමයි හාම්පුතුන්, වෘත්තීය සමිති, ආණ්ඩුව කියන ඒ ත්‍රෛපාර්ශ්වය එකතු වෙලා මේ රටේ වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් ගැන, ඒ වාගේම ඔවුන් මුහුණ දෙන ගැටලු සහ හාම්පුතුන් මුහුණ දෙන ගැටලු සාකච්ඡා කරන ආයතනය. ඒක කැඳවලා තිබුණේ නැහැ. අපි මේ වනකොට හතර වතාවක් ඒක කැඳෙව්වා. අපි හතර වතාවක් NLAC එක කැඳවලා තිබෙනවා. අපි ඒ තුළ සාකච්ඡා කරමින් ඔවුන්ට වඩාත් හොඳ වැඩ කරන පරිසරයක් ගොඩනහන්න ඕනෑ කරන මැදිහත් වීම සිදු කරමින් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි.මම දැක්කා දැන් එහා පැත්තේ ඉඳගෙන වතු කම්කරුවෝ ගැන සෑහෙන්න කිඹුල් කඳුළු හෙළනවා. කවුද ඒ? පසුගිය ආණ්ඩු කරපු මහත්වරු. ඔබතුමන්ලා දන්නේ නැත්නම් ඉගෙන ගන්න. මගේ phone එකේ තිබෙනවා, ඒ ගැසට් එකේ soft copy එක. අවශ්‍ය නම් ඒ soft copy එක සභාගත කරන්න පුළුවන්කම තිබෙනවා. 2024.09.10වන දා තමයි සාමූහික ගිවිසුම් අත්සන් කරන්නේ. විපක්ෂය පැත්තේ ඉන්න උදවිය දන්නවා වතු කම්කරුවන්ගේ වැටුප වැඩි කරන්න, ඒ වැඩ කරන ජනතාවගේ වැටුප් වැඩි කරන්න නිකම් ම බැහැ කියලා. සාමූහික ගිවිසුම් ඇතුළේ තමයි ඒ වැටුප් වැඩි කරන්නේ. ඔය පැත්තේ ඉන්න වෘත්තීය සමිති නායකයන් ඇතුළු ඔබතුමන්ලා ගිවිසුම් ගහලා වතුවල වැඩ කරන ජනතාවගේ වැටුප අවුරුදු තුනකට සැරයක් වැඩි කරන්න සාමූහික ගිවිසුම් තුළින් එකඟ වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 2027.09.10 දා තමයි ඒ සාමූහික ගිවිසුම අවසන් වෙන්නේ. ඒත් අපි ඉදිරියේදී උත්සාහ කරනවා හාම්පුතුන් සමඟ, වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කරලා වතු ජනතාවට තවත් ඉහළ වැටුප් වැඩිවීමක් ලබා දෙන්න.

මා දැක්කා, මන්ත්‍රීවරු දෙදෙනෙකුගේ අත්සනින් කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කරන සංශෝධන කියලා සංශෝධනයක් දාලා තිබෙනවා, "අවම දෛනික වැටුප රුපියල් 1,600ක් විය යුතුයි" කියලා. නමුත්, මේ පනත් ඇතුළේ ඒක කරන්න බැහැ. ඒකත් රැවටිල්ලක් නේ. ඉතිහාසය පුරා මේගොල්ලෝ කළේ රටේ ජනතාව රවට්ටන එක. අදත් ඒකට උත්සාහ කරනවා. ඒක තමයි ඇත්ත තත්ත්වය. හැබැයි, වතු කම්කරු ජනතාවට පෙන්වන්න ඕනෑකම තිබෙනවා, "අපි ඔයගොල්ලෝ වෙනුවෙන් පෙනී හිටියා. අපි වතු ජනතාවගේ වැටුප් වැඩි කිරීම වෙනුවෙන් පාර්ලිමේන්තුවේ හඬ නැගුවා" කියලා. ඒකට තමයි මේ සංශෝධන ගෙනැල්ලා අද උත්සාහ කරමින් තිබෙන්නේ. මා දැක්කා, අපේ ගරු අනිල් ජයන්ත ඇමතිතුමා, "ඒ අයගේ දෛනික වැටුප අදටත් මෙහෙමයි" කියද්දී, ඒ අය සද්දේ දානවා ඒක වැරදියි කියලා.

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
Madam, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
ගිවිසුමක් අත්සන් කරලා ඒක කළේ නැහැ කියලා ඔබතුමා කිව්වා. නමුත් ජනාධිපතිතුමා 1,700ක් කියලා කිව්වේ දැනගෙන නොවෙයිද?

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ඒක කිව්වා නේද?

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
1,700ක් කියලා ඊයේ පෙරේදා කිව්වේ, එතකොට ජනාධිපතිතුමා ඒක දන්නේ නැද්ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඒක point of Order එකක් නොවෙයි නේ. ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
වාඩි වෙන්න, වාඩි වෙන්න. එතැන point of Order එකක් නැහැ.

අපි ඔබතුමන්ලාට කියන්න ඕනෑ, අපි ආණ්ඩුව ගත්තේ මාස 60කට මිසක්, මාස 7කට, 8කට නොවෙයි කියන එක. අපි අද මේ රටේ ජනතාවට දීපු සියලු පොරොන්දු එකින් එක ඉටු කරමින් ඉදිරියට යමින් සිටිනවා. ඒ නිසා මේ අය අද කලබල වෙලා ඉන්නවා. ඉතින්, බොහොම ස්තූතියි. මේගොල්ලන් නයි මුගටි වාගේ කට්ටිය. අපි දැක්කා, කොළඹ මහ නගර සභාවේ බලය පිහිටුවන්න කලින් මේගොල්ලන් ඔක්කෝම එකතු වෙලා මාධ්‍ය සාකච්ඡා තිබ්බා; නාමල්, සජිත්, දයාසිරි ඒ කට්ටියම එකතු වෙලා මාධ්‍ය සාකච්ඡා තිබ්බා, කොළඹ මහ නගර සභාවේ බලය පිහිටුවීමට. මේගොල්ලන් එදා හිටියේ කොහොමද? අද කොහොමද? ඊට පස්සේ මම දැක්කා, මේ අය නැතුව අවිස්සාවේල්ල නගර සභාවේ බලය ඒගොල්ලන් පිහිටුවා ගත්තා කියලා, මේ ඉස්සරහ පේළියේ ඉන්න තවත් සමහරු ගිහිල්ලා, - නම් කියන්න බැහැ නේ. නම කිව්වාම නැගිටිනවා නේ, point of Order එකක් කියලා. නේද මන්ත්‍රීතුමා? එදා මේ ඔක්කෝම ගිහිල්ලා එකට එකතු වෙලා මාධ්‍ය සාකච්ඡා තිබ්බා. කල්පනා කරලා බලන්න. *[බාධා කිරීමක්]* හරි, හරි, ඕක -

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ඔබතුමාට Point of Order එකක් ගන්න මම මොනවත් කිව්වේ නැහැ, වාඩි වෙන්න. *[බාධා කිරීමක්]* වාඩි වෙන්නකෝ. ඊළඟ අවස්ථාවේ කියන්න. *[බාධා කිරීමක්]* ඊළඟ අවස්ථාවේ කියන්න. වාඩි වෙන්න. *[බාධා කිරීමක්]* අනේ, වාඩි වෙන්න. ඊළඟ අවස්ථාවේ කියන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා, ඔබතුමාට ඊළඟට අවස්ථාව ලැබෙනවා, ඉන්න.

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
Madam, I rise to a point of Order.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
හා, එතුමාට අවස්ථාව දෙන්නකෝ. මටත් තිබෙනවා දෙයක් බලා ගන්න. එතුමාට අවස්ථාව දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ point of Order එක මොකක්ද කියන්න.

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
අපි යාළු වෙච්ච එකක් ගැන දැන් ඔබතුමා කථා කළා නේ. හැබැයි ඉතින් අපි එක්ක සංවිධානාත්මක අපරාධකරුවෝ නැහැ. ඉතින්, ඔබතුමාත් මමත් තරහා වුණාම තමයි මේ පැත්තත් එක්ක යාළු වුණේ. අපි දෙන්නා නේ යාළුවෝ.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
හරි, හරි. නාමල් මන්ත්‍රීතුමා, ඒ ගැන මගෙන් අහගන්න එපා, ලුණු ඇඹුල් ඇතුව. ජූලම්පිටියේ අමරේ කවුද? තාජුඩීන් මැරුවේ කවුද? *[බාධා කිරීමක්]* තාජුඩීන් මැරුවේ කවුද? *[බාධා කිරීමක්]* ඒ කවුද? ඔබතුමන්ලා සංවිධානාත්මක අපරාධකරුවෝ හුරතල් කරලා, ගේ අස්සේ දමාගෙන හුරතල් කරලා, මැදමුලනේ තියාගෙන හුරතල් කරලා, අරලියගහ මන්දිරයේ තියාගෙන හුරතල් කරලා මේ රට මේ තැනට ඇද වැට්ටුවා. සුදු වෑන්වලින් ඇවිල්ලා මේ රටේ ජනතාව පැහැරගෙන ගියා. ඒ කවුද? ඒ සංවිධානාත්මක අපරාධකරුවෝ නොවෙයිද? අද අනුර දිසානායක සහෝදරයාට ඇති තරම් අපහාස කරනවා. ඇති තරම් අපහාස කරනවා. ගෝඨාභයට, මහින්දට, නාමල්ට එදා අපහාස කළා නම් ඉතුරු වෙන්නේ නැහැ; කැලිත් නැහැ. අළු වෙනවා, අළු දූවිලි වෙනවා. නැගිටලා මගෙන් අහගන්න එපා. ඒ නිසා වාඩි වෙලා ඉන්න. බොරු points of Order දාලා ඉතිහාසයේ කෙරුවාව අහගන්න එපා. මේගොල්ලන්ගේ කෙරුවාවල් නිසා තමයි අද මේ රට මෙතැනට වැටිලා තිබෙන්නේ. අද එකින් එක එළියට එනවා. හේෂා විතානගේ මන්ත්‍රීතුමා කිව්වා, මම දැක්කා -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මට තව විනාඩි දෙක තුනක් දෙන්න. අපේ මන්ත්‍රීවරුන්ගේ වෙලාව වෙනස් කර ගන්නම්. අපේ මන්ත්‍රීවරුන්ගේ වෙලාවෙන් අඩු කරලා අපි ඒක හදා ගන්නම්.

දැන් මේ දඩයම් කරනවා. *[බාධා කිරීමක්]* දඩයක්කරුවෝ? කවුද, දඩයක්කරුවෝ? ඒගොල්ලන් තමයි දඩයක්කරුවෝ. අපි කිසිවෙක් දඩයම් කළේ නැහැ. 2010 ජනාධිපතිවරණය ඉවර වෙලා ඔබතුමාගේ තාත්තා සරත් ෆොන්සේකා දඩයම් කරපු විධිය මගෙන් අහගන්න එපා. මොන නඩුද, මොන නීතිද? මොන උසාවියේද නඩුව ඇහුවේ? මහින්ද රාජපක්ෂ, ඔබතුමාගේ තාත්තා, 2010 ජනාධිපතිවරණය ඉවර වෙලා සතියක් යන්න කලින් සරත් ෆොන්සේකා කුදලාගෙන ගිහිල්ලා හිරේට දැම්මා. සරත් ෆොන්සේකාට ජම්පර් ඇන්දුවා. හැබැයි කථා කරන්නේ යුද විරුවෝ ගැන, යුද්ධය අවසන් කරපු එක ගැන. යුද විරුවෝ ගැන කථා කරනවා. සරත් ෆොන්සේකා කුදලාගෙන ගිහිල්ලා ජම්පරය ඇන්දුවා. ඒ නිසා, ඔබතුමන්ලා කරපු කෙරුවාවල් මේ රට දන්නවා. පාර්ලිමේන්තුවේ සුදු ඇඳගෙන සුදනෝ වෙන්න හැදුවාට සුදනෝ වෙන්න බැහැ. දූදනා දූදනාමයි. කවියක් තිබෙනවා, "කරන කලට පව් මිහිරිය බෝ සේ - විඳින කලට දුක් ගිනි වෙයි බෝ සේ" කියලා. ඒක තමයි අද විපක්ෂයට වෙලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ඉතින් කලබල වෙනවා. සංස්කෘතික අරමුදලේ වෙච්ච වංචා ගැන හොයන්න කමිටු දමනකොට කලබල වෙනවා. ඒ ගැන අහන්න දෙයක් නැහැ. අර පැත්තේ මන්ත්‍රී කෙනෙක් ඉන්නවා, මම දවස් ගණනකින් දැක්කේ නැහැ. කළුතර පැත්තේ "රත්තරන්"ද කවුද මම දවස් ගණනකින් දැක්කේ නැහැ. ඉතින්, දැන් කලබල වෙනවා. පාර්ලිමේන්තුවට දුවගෙන එනවා, මොනවා හරි ටිකක් කියනවා, ආපහු එළියට දුවනවා. එළියට දුවලා පැනලා යනවා. ඒ තරමට දැන් කලබල වෙලා තිබෙන්නේ.

දැන් දඩයම් කිරීම් නැත. හැබැයි, රටේ ජනතාවට දුන් පොරොන්දු එකින් එක, එකින් එක ඉටු කරමින් ජාතික ජන බලවේගය ආණ්ඩුව ඉතා නිරවුල්ව, නිවැරදිව ඉදිරියට යමින් තිබෙනවා. ඒ නිසා තමයි මේ අය කලබල වෙලා තිබෙන්නේ. අපට මෙච්චර වරදිනවා නම් ඔබතුමන්ලා සතුටු වෙන්න එපායැ. අපට වරදිනවා නම් සතුටු වෙන්න එපායැ. ඊළඟ ජනාධිපතිවරණයේ ඔටුන්න,- කවුද, ජනාධිපති අපේක්ෂකයා? ඔබතුමාද, එහා පැත්තේ ඉන්න සජිත් මහත්මයාද? එහෙම නැත්නම් දයාසිරි මහත්මයාද?

අපි මේ රටේ ජනතාවට පොරොන්දු ලබා දුන්නා. දැන් ඒ පොරොන්දු ඉටු කරමින් යනවා. පෞද්ගලික අංශයේ වැඩ කරන ජනතාවට ඉතිහාසයේ වැඩිම වැටුප් වැඩිවීම ලබා දෙන්න අපි කටයුතු කර තිබෙනවා. නමුත්, ඒ කිසිවක් ප්‍රමාණවත් නැහැ. රාජ්‍ය සේවයේ තව ප්‍රශ්න ගොඩක් තිබෙනවා, පෞද්ගලික අංශයේත් තව ප්‍රශ්න ගොඩක් තිබෙනවා, වතු වැඩ කරන ජනතාවට, කම්කරු ජනතාවට ප්‍රශ්න ගොඩක් තිබෙනවා. ඒ සියලු ප්‍රශ්න අපි එකින් එක විසඳා ගත යුතුයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ සියලු ප්‍රශ්න මෙගොල්ලන් හදපු ඒවා, -ඇති කරපු ඒවා- වර්ධනය කරපු ඒවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ නිසා මම මේ මොහොතේ අපේ රටේ සියලු වෘත්තීය සමිතිවලින් එක ඉල්ලීමක් කරනවා. ඔව්, ඔබට ප්‍රශ්න තිබෙනවා. හෙද සේවයේ, තැපැල් සේවයේ, දුම්රිය සේවයේ, ගුරු සේවයේ, විදුහල්පති සේවයේ හැමෝටම ප්‍රශ්න තිබෙනවා. අපි ඒවා හොඳින් දන්නවා. අපි වෘත්තීය සමිති නායකයෝ. ඒ ප්‍රශ්නත් එක්ක අපි එදා පොර බැදුවා, අදත් පොර බදනවා. ඒවා විසඳා ගැනීම වෙනුවෙන් කරන්න පුළුවන් සියලු මැදිහත්වීම් අපි කරමින් ඉන්නවා. ඒකට ඔබ මේ ආණ්ඩුවට කල් ලබා දිය යුතුව තිබෙනවා, මේ ආණ්ඩුවට අවස්ථාව ලබා දිය යුතුව තිබෙනවා.

මේ වැටුප් වැඩි කිරීමට කටයුතු කළා වාගේම අනෙකුත් ප්‍රශ්නත් එකින් එක, එකින් එක විසඳන්න ඕනෑ කරන සැලසුම් අපි හදමින් තිබෙනවා. රාජ්‍ය අංශයේ සියලු වැටුප් විෂමතා ඉවත් කරන්න අපි රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරමින් තිබෙනවා, ඉතාම හොඳ වැටුප් කොමිසමක් පත් කරන්න. අපි අධ්‍යාපන සභාවක් පිහිටුවීමට දැනටම කටයුතු කර තිබෙනවා. ඒ අධ්‍යාපන සභාව පිහිටුවීම පිළිබඳ අනුකාරක සභාව පසුගිය 8වැනි දා ආරම්භ කළා. මේ 25වැනි දා දෙවෙනි වතාවට අපි රැස් වෙනවා. ඒ අධ්‍යාපන සභාව හරහා අධ්‍යාපන ක්ෂේත්‍රයේ තිබෙන සියලු සේවාවල -ගුරු සේවය, විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපනඥ සේවය, අධ්‍යාපන පරිපාලන සේවය සහ ගුරු උපදේශක සේවය- ගැටලු විසඳන්නත්, ඒ සේවා වෘත්තික සේවා බවට පත් කරන්නත්, වෘත්තික සභාවක් හදන්නත් අපි කටයුතු කරමින් ඉන්නවා. මේ රටේ වැඩ කරන ජනතාවට විතරක් නොවෙයි, මුළු රටටම දුන් පොරොන්දු එකින් එක ඉටු කරමින් අපි ඉදිරියට යමින් තිබෙනවා.

අනවසර ඉදි කිරීම් ගැන කියනවා මම දැක්කා. අතැන, මෙතැන තිබෙනවා කියලා කියනවා. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය ඉතා පැහැදිලිව එම ප්‍රතිපත්තිය කිව්වා. ඒ මොකක්ද? දැනට වැව් 48ක් තෝරාගෙන තිබෙනවා, ඒ වැව් ආශ්‍රිතව ඉදිකර ඇති සියලු අනවසර ඉදිකිරීම් ඉවත් කරන්න. ඒකෙන් පළමු වැව් 22හි රක්ෂිත මායිම් සලකුණු කිරීමේ කටයුතු සිදු කරමින් යනවා. දැන් කියනවා, අතැන තිබෙනවා, මෙතැන තිබෙනවා ලු. මම දන්නේ නැහැ, මේ පාර්ලිමේන්තුවට මේ මහත්වරු මොකට එච්චාද කියලා. පැහැදිලිව අපි ඒ ප්‍රතිපත්ති කියලා තිබෙනවා. දැනට තේරාගෙන තිබෙන වැව් 22ට අයත් අනවසර ඉදිකිරීම් ඉවත් කරනවා. ඒක තමයි ස්ථාවරය. ඒක තමයි ප්‍රතිපත්තිය. එහෙම නැතිව තමුන්නාන්සේලා වාගේ වළං කඩේට පැනපු ගොන්නු වාගේ තැනින් තැනට ඔහේ ඇනගෙන යන්නේ නැහැ. විධිමත් විධියට, පිළිවෙළකට ඒ සියල්ල සිදු කරමින් තිබෙනවා. අධිකරණ පද්ධතිය හරහා විධිමත් විධියට, පිළිවෙළකට ඒ සියල්ල සිදු කරමින් තිබෙනවා.

වැඩි දවස් නැහැ, වැරදි කරපු හැමෝම ළඟට එනවා. ඒ නිසා කලබල නොවී ඉන්න. අධි චෝදනා ගොනු වෙලා තිබෙනවා. ඉතින්, කලබල වෙන එක ගැන අහන්න දෙයක් නැහැ. ඒ නිසා කලබල වෙනවා, උන්හිටි තැන් අමතක වෙනවා, කියන්නේ මොනවාද කියලා අමතක වෙනවා, කරන්නේ මොනවාද කියලා අමතක වෙනවා, ඉතිහාසයේ කරපු දේවල් අමතක වෙනවා, ඉතිහාසයේ කරපු දේවල් අමතක කරලා දැන් සුදනෝ වාගේ කථා කරනවා.

මේ රටේ පෞද්ගලික අංශයට අද ඓතිහාසික දවසක් කියලා අපි හිතනවා. ඉතිහාසයේ වැඩිම වැටුප් වැඩි කිරීම කරන්න අපි කටයුතු කළා. ඒ වාගේම ඉදිරියේදී අනෙකුත් ක්ෂේත්‍රවල තිබෙන ගැටලුත් අපි විසඳනවා. අවසාන වශයෙන් මම මේ රටේ සියලු පෞද්ගලික ආයතනවලින් ඉල්ලීමක් කරනවා, අප්‍රේල් 01වැනි දා සිට මේ වැටුප් වැඩි වීම ලබා දෙන්න කියලා. සමහර දේශපාලන කුඩුකේඩුකම් නිසා, බියගම ප්‍රදේශයේ සමහර කර්මාන්තශාලා ඉදිරිපිට notices දාලා තිබුණා මා දැක්කා, "තවම පනත් කෙටුම්පත සම්මත වුණේ නැහැ, නීතිය නැහැ, ඒ නිසා නීතිය ආවාම අපි මේක දෙන්නම්" කියලා. කම්කරු අමාත්‍යාංශයෙන් විවිධ විමසීම් කරද්දී අපි කිව්වා, "අප්‍රේල් සිට වැටුප් වැඩි වීම ලබා දෙන්න, අපි මේ පනත් කෙටුම්පත අනිවාර්යයෙන්ම සම්මත කරලා දෙනවා, එතෙක් ලබා දෙන්න" කියලා. අද අපි සියලු ආයතනවලින් ඉල්ලනවා, අප්‍රේල් 01වැනි දා සිට මේ වැඩි කරපු වැටුප arrears එක්ක ලබා දෙන්න කටයුතු කරන්න කියලා. එම ඉල්ලීමත් කරමින්, මට වෙලාව ලබා දීම වෙනුවෙන් මූලාසනාරූඪ ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.08]

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ නියෝජ්‍ය ඇමතිතුමා අවුරුදු 15ක් තිස්සේ කරපු කථාව ඒ විධියටම කිව්වා. දැන් ඔබතුමාද ආණ්ඩුවේ ඉන්නේ, අපිද ආණ්ඩුවේ ඉන්නේ? මෙතුමන්ලා එදා කියපු බොරු ටික අද ඒ විධියටම බලයට ඇවිල්ලාත් කියනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

දැන් පසුගිය කාලයේ - *[බාධා කිරීමක්]* ඔව්, ඔව්, ඔබතුමන්ලාගේ ආණ්ඩු කෙරුවාව අපි දැක්කා. දැන් කිව්වා නේ ලෑස්ති වෙලා ඉන්න කියලා. ඔබතුමන්ලාත් ලෑස්ති වෙලා ඉන්නකෝ යන තැන් ටික පෙන්වන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, දැන් පඩි වැඩි කරනවා නේ. ඒකේ ප්‍රශ්නයක් නැහැ, ඒක හොඳයි. ඒක වැඩි වෙන්න ඕනෑ. හැබැයි ඔබතුමන්ලා මොකක්ද කරන්නේ? පඩිය වැඩි කරනවා, ඒ වැඩි කරන පඩියට අසීමිතව බදු ගහනවා, ආයෙත් ඒක ආණ්ඩුවට ගන්නවා. දැන් මේ පඩි වැඩි කරන එකේ බලපෑම සේවකයාට ලැබෙනවාද, නැද්ද? නැහැ. මොකද, මේ බදු ප්‍රතිපත්තියත් එක්ක ඒ වැඩි කරන පඩියෙන් බහුතරයක් ආයෙත් ආණ්ඩුව ඉල්ලා ගන්නවා. හැබැයි, මැතිවරණ කාලයේ දීපු පොරොන්දු ඉෂ්ට කර ගන්න බැරි වෙනකොට මෙතැනට ඇවිල්ලා,- දැන් නම් කිව්වේ මාස 60ක් යනවා කියලා. එදා නම් කිව්වේ එක පැන් පහරින් ගේම් එක ගහනවා කියලා. හැබැයි, එක පැන් පහරින් ගේම් එක ගහන එක එහෙම ලේසි නැහැ කියලා දැන් තමයි කට්ටියට තේරෙන්නේ. එහෙම නේද ඇමතිතුමනි? හැබැයි, ඉතින් ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ බලන්න. අද සෑම රාජ්‍ය ආයතනයකම දේශපාලන පළිගැනීමක් තිබෙනවා. අද වෘත්තීය සමිති මර්දනය කරනවා. අද ඔබතුමන්ලා කියන්නේ වෘත්තීය සමිති කියන්නේ මහ කරදරයක් කියලා. මේ අපි නොවෙයි එහෙම කියන්නේ. හැබැයි, මේ රටේ වෘත්තීය සමිති ව්‍යාපාරය මෙහෙයවූයේ ඔබතුමන්ලා. දැන් අධ්‍යාපනය ගැන කථා කෙරුවා. ඉස්කෝලේ යන්නේ නැතුව වෘත්තීය සමිති කටයුතු කළේ. ඉස්කෝලේ දරුවන්ට උගන්වන්නේ නැතුව ඔබතුමන්ලා වෘත්තීය සමිතිවල කටයුතු කළේ, අවුරුදු 20ක ඉඳන් වෘත්තීය සමිති ව්‍යාපාරය ආරක්ෂා කරන්න. නේද? හැබැයි, අද කරන්නේ මොකක්ද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද වෙනකොට සමස්ත වෘත්තීය සමිති ව්‍යාපාරයම අතහැරලා දාලා, සේවකයන් හිතුමතේට transfer කරවලා, දේශපාලන පළිගැනීම්වලට ලක් කරලා, තමන්ගේ අණසකට ලක් වුණේ නැත්නම්, යට වුණේ නැත්නම් ඒ අයත් transfer කරලා දාලා, රාජ්‍ය සේවය සක්‍රිය කරන්න කියලා කියනවා. හැබැයි, රාජ්‍ය සේවය අකාර්යක්ෂම වුණාම මොකක්ද කරන්නේ? ඒකට තමන්ගේ දේශපාලන මැදිහත්වීම ගැන කථා කරන්නේ නැහැ. හැබැයි, අනෙක් පැත්තෙන් ආණ්ඩුව මොකක්ද කරන්නේ? තමන්ගේ දේශපාලන මැදිහත්වීම ගැන කථා නොකරන ආණ්ඩුව, රාජ්‍ය සේවකයාට චෝදනා කරනවා.

පසුගිය ආණ්ඩුව කාලයේ SIලා බඳවා ගන්න විභාගයක් පැවැත්වූවා. මම දැක්කා, ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමාත් ඒ ගැන කථා කරලා තිබුණා. සියයක් බඳවා ගන්න interviews පවත්වන්න තිබෙනවා. දැන් මොකක්ද කරන්නේ? ඒ අය තමන්ගේ පක්ෂයේ නොවෙයි නේ. එහෙම තමයි හිතන්නේ. ඔබතුමන්ලා හිතන්නේ හැම දෙයක්ම දේශපාලන වශයෙන් මෙහෙයවපු කාරණා කියලා. ඒ නිසා මොකක්ද කරන්නේ? ඒ හැම එකක්ම නවත්වලා තමන්ට ඕනෑ විධියට ගන්නවා. ඒ නිසා අපි ආණ්ඩුවට කියන්නේ, ඔබ ඔබේ දේශපාලනය කරන්න. හැබැයි, මේ රාජ්‍ය යන්ත්‍රණය විනාශ කරන්න එපා. සේවකයන්ට හොඳ මානසිකත්වයකින් වැඩ කරන්න අවස්ථාවක් දෙන්න.

පෞද්ගලික අංශයේත් එහෙමයි. දැන් කම්කරුවන්ගේ අයිතිය ගැන කථා කරනවා. වැසුණු කර්මාන්තශාලාවල වැඩ කරපු අයට රැකියා හොයලා දෙනවා කිව්වා. දැන් කීදෙනෙකුට හොයලා දුන්නාද? වහපු ඒවා පැත්තක තියලා, මේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ විවෘත කරපු කර්මාන්තශාලාවක් ගැන කියන්න. එහෙම එකක් නැහැ. මේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ කර්මාන්තශාලා වැහෙනවා. ඒ වැහෙන කර්මාන්තශාලාවල සේවකයන්ට සාධාරණයක් ඉෂ්ට කරන්න ආණ්ඩුව මැදිහත් වෙන්නේ නැහැ. ඇයි ඒ? පොඩි මනුස්සයාගේ ආණ්ඩුව අද හාම්පුතාගේ ආණ්ඩුව බවට පත් වෙලා තිබෙනවා. අද හාම්පුතාලාගෙන් අහලා තමයි තීන්දු ගන්නේ. අද කෝටිපති ව්‍යාපාරිකයාගෙන් අහලා තමයි තීන්දු තීරණ ගන්නේ. එහෙම නැතුව පොඩි මනුස්සයාගෙන්, ගොවියාගෙන්, ධීවරයාගෙන්, කම්කරුවාගෙන් ඒවා අහන්නේ නැහැ.

සංචාරක ව්‍යාපාරය ගැනත් කථා කළා. අනවසර ඉදි කිරීම් කඩනවා කියලා මහ ලොකුවට කියනවා. කඩන එක ලේසියි. හදන එක නේ අමාරු. ඒවා ඒ මිනිස්සු අවුරුදු ගණනාවක් තිස්සේ යම් ආදායමක් උත්පාදනය කර ගත්ත තැන්. ඒවාට නීතිමය ගැටලුවක් තිබෙනවා නම් ඒ ගැන සාකච්ඡා කරන්න. ඒ ගැන සාකච්ඡා කරලා ඒකට සාධාරණයක් ඉෂ්ට කරන්න. අපි කියන්නේ නැහැ, ඒ අයට බලහත්කාරයෙන් ඉන්න දෙන්න කියලා. අපි කියන්නේ නැහැ, ඒ අයට නීතිවිරෝධීව ඉන්න දෙන්න කියලා. හැබැයි, යම් වැඩ පිළිවෙළකට අනුව ඒක ක්‍රියාත්මක කරන්න. වැලිගමින් පටන් ගත්තාම අද වෙනකොට තංගල්ල උනාකුරුව දක්වාත්, මෙහේ ගෝල් ෆේස් එකේ, කිඹුලාවල කියන මේ හැම තැනින්ම යම් ආදායමක් උත්පාදනය කරපු පිරිසක් ඉන්නේ. ඒ නිසා ඔබතුමන්ලා හිතා ගෙන ඉන්නවා නම්, මහා තරු පහේ හෝටල් අයිතිකරුවන් එක්ක සාකච්ඡා කරලා, ගමේ ඉන්න මනුස්සයාගේ ආර්ථිකය ගැන, සංචාරක ව්‍යාපාරය ගැන තීන්දු තීරණ ගන්න පුළුවන් කියලා, ඒක සාර්ථක වෙන්නේ නැහැ. මේ රටේ සංචාරක ව්‍යාපාරය ගොඩනැඟුණු ක්‍රමයක් තිබෙනවා. ඒ වාගේම, ඒ මිනිස්සු ජීවත් වෙන්නේ ඒකෙන්. අද පෞද්ගලික අංශයේ සේවකයන්ගේ පඩි වැඩි කරන්න පනත් කෙටුම්පතක් ගෙන එනවා. හැබැයි, අනෙක් පැත්තෙන් ආණ්ඩුවට බරක් වෙන්නේ නැතුව, ස්වෝත්සාහයෙන්, බොහොම අමාරුවෙන් කීයක් හරි හොයා ගන්න මනුස්සයාගේ බඩට ආණ්ඩුව ගහලා දමනවා. මොකක්ද, ඒකට දෙන උත්තරය? ඒ කලින් හිටපු දේශපාලන පක්ෂවලින් පදිංචිකරපු අය කියනවා. නැහැ, ඒ අය කලිනුත් අපි එක්ක දේශපාලනය කරපු අය නොවෙයි. ඒ තැන්වල හැම පක්ෂයේම අය ඉන්නවා. හැබැයි, අද බහුතරයක් ඉන්නේ ඔබතුමන්ලාට ඡන්දය දීපු අය. ඒ වාගේම කලින් ආණ්ඩු තිබෙන විටත් ඔබතුමන්ලා එක්ක වැඩ කරපු අය ඒ තැන්වල ඉන්නවා. හැබැයි, ඒ අයට ඔබතුමන්ලා කරන්නේ මොකද? ඒ අය එක දවසින් ඒ තැන්වලින් එළියට ඇදලා දමනවා. ඒ අයගේ ආදායම් මාර්ගය සම්පූර්ණයෙන් වහලා දමනවා. හැබැයි, තමුන්නාන්සේලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා පෞද්ගලික අංශයේ පඩි වැඩි කරන්න කථා කරනවා.

යෞවන සමාජ ව්‍යාපාරය දිහා බලන්න. ඉතිහාසයේ පළමුවැනි වතාවට වෙන දා නොතිබුණු දේශපාලනීකරණයක් යෞවන සමාජ ව්‍යාපාරයට ගේනවා. තරුණ සේවා සභාවෙන් යම් දේශපාලන කාරණයක් කරන්න ඕනෑ නම් ඒකට ක්‍රමයක් සොයා ගන්න. හැබැයි, යෞවන සමාජ ව්‍යාපාරයේ යෞවන සමාජ පිහිටුවන තැන ඉඳන් තමන්ගේ දේශපාලන අණසකට යෞවන සමාජ ටික ගන්න උත්සාහ කරනවා. ඕක තමයි ගතානුගතික පාරම්පරික මානසිකත්වය. ඔය මානසිකත්වයට ගිහිල්ලා මේ රටේ ඔබතුමන්ලා අපේක්ෂා කරන වෙනස කරන්න කවදාවත් හම්බ වෙන්නේ නැහැ. අලි කෝච්චියේ හැප්පෙනකොට, ඒකටත් කියන්නේ විපක්ෂයේ කුමන්ත්‍රණයක් කියලා. විපක්ෂයෙන් අලියා උස්සන් ගිහිල්ලා එතැනින් තිබ්බාද?

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඒ වාගේ තමයි කියන්නේ.

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
අන්තිමට අලි-මිනිස් ගැටුමටත් පළි විපක්ෂය. අලියා කෝච්චියේ හැප්පුනත් විපක්ෂය පළි. හැබැයි, ආණ්ඩුව උත්තර දෙනකොට මොකක්ද කියන්නේ? ආණ්ඩුවට ඒකට දෙන්න උත්තරයක් නැහැ. ආණ්ඩුවට වැඩ පිළිවෙළක් නැති වෙනකොට, උත්තරයක් නැති වෙනකොට ආණ්ඩුව මොකක්ද කරන්නේ? විපක්ෂයට චෝදනා කරලා තමන්ගේ සුපුරුදු දේශපාලන පළි ගැනීම් කරන්න ක්‍රියාත්මක වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න. මට තව එක කාරණයක් කියන්න තිබෙනවා. ඒ, වැලිගම වෙඩි තැබීම ගැන. දැන් ඔබතුමන්ලා කිව්වා, සංවිධානාත්මක අපරාධ සිද්ධ වෙන්නේ පාතාල කණ්ඩායම් අතර තිබෙන ප්‍රශ්නයක් හින්දා කියලා. වැලිගම ඔබතුමන්ලාගේම -ජේවීපී එකේ- මන්ත්‍රීවරයෙකුගේ ගෙදරට වෙඩි තිබ්බා. ඒ මන්ත්‍රීවරයාත් සංවිධානාත්මක අපරාධකරුවෙක්ද කියන ප්‍රශ්නය දැන් අපට අහන්න වෙනවා. තවත් මන්ත්‍රීවරු වාහනයකින් ඇවිල්ලා උස්සන් ගියා කියනවා. ගමේ අය නම් කියන්නේ ඒක රජයේ වාහනයක් කියලා. රජයේ වාහනයකින් ඇවිල්ලා අරන් ගියා කියලායි කියන්නේ. මම දන්නේ නැහැ, ඒ පරීක්ෂණ කටයුතුවල තත්ත්වය මොකක්ද කියලා. ඔබතුමන්ලා ඒකත් පරීක්ෂා කරන්න. අනෙක් ඒවා නම් මහ ලොකුවට පරීක්ෂණ කරනවා. වැලිගම සිද්ධිය සම්බන්ධයෙන් කිසිම චුවමනාවක් නැති ගානට ඉතාම මන්දගාමීව තමයි පරීක්ෂණ කටයුතු කරන්නේ. අන්තිමට, මාලිමාවේම මන්ත්‍රීවරයෙකුගේ ගෙදරට ඇවිල්ලා වෙඩි තියලා ගියා.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
පොලීසියත් සිටියදී!

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
පොලීසියත් සිටියදීත් තමන්ගේ මන්ත්‍රීවරයෙකු ආරක්ෂා කරගන්න බැරි ආණ්ඩුවකට සාමාන්‍ය පුරවැසියාගේ ආරක්ෂාව ගැන මොකක්ද කථා කරන්න තිබෙන්නේ? රටේ සාමාන්‍ය පුරවැසියා ආරක්ෂා කරන්නේ කොහොමද, තමන්ගේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාගේ ගෙදර පොලිස් ආරක්ෂාව තිබෙද්දීත් වෙඩි තියලා යනවා නම්, තමන්ගේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් දෙදෙනෙක් සුඛෝපභෝගී වාහනයකින් ඇවිල්ලා උස්සාගෙන යනවා නම්? ඊයේ සීදූවේදීත් තවත් වෙඩි තැබීමක් වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

ඒ, ඔබේම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුගේ තාත්තා කෙනෙකුට. ඒ මන්ත්‍රීවරයාගේ තාත්තාත් සංවිධානාත්මක අපරාධකරුවෙක්ද? ඔබතුමන්ලා කියන්නේ සංවිධානාත්මක අපරාධකරුවෝ දෙපිරිසක් ගහගන්නවා, ඒ දෙපිරිස වෙඩි තියාගන්නවා කියලා නේ. හැබැයි, දැන් මාලිමාවේ මන්ත්‍රීවරුන්ගේ ගෙවල්වලටත් වෙඩි තියනවා නේ. එතකොට ඒ මාලිමාවේ මන්ත්‍රීවරුත් සංවිධානාත්මක අපරාධකරුවන්ට සම්බන්ධ අයද? ඔබතුමන්ලාට පරණ තැටියම play කරගෙන ඉන්න පුළුවන්. තිබෙන පරණ චෝදනා ටික ඒ විධියටම මේ පාර්ලිමේන්තුව ඇතුළේත් ගේන්න පුළුවන්. හැබැයි, මේ වැඩ පිළිවෙළ තුළින් රටේ ජනතාවට සාධාරණයක් වෙනවාද, නැද්ද කියලා ඔබතුමන්ලාම කල්පනා කරලා බලන්න. ඔබතුමන්ලා එදා පොඩි මනුස්සයා වෙනුවෙන් පෙනී හිටපු දේශපාලන පක්ෂයක්. අපි ඒක පිළිගන්නවා. හැබැයි, අද නම් ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති සියයට 100ක් සම්පූර්ණයෙන්ම තීන්දු කරන්නේ මේ රටේ ව්‍යාපාර පෙළැන්තියත් එක්ක වාඩිවෙලා.

මට කාලය ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.17]

ගරු සංජීව රණසිංහ මහතා
(மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ)
(The Hon. Sanjeewa Ranasingha)
මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

මේ රටේ වැඩ කරන ජනතාව වසර ගණනාවක් තිස්සේ බලාපොරොත්තු වූ ඒ වැටුප් වැඩි වීම නීත්‍යනුකූල බවට පත් කරන්න, එයට නිසි සාධාරණත්වය ඉටු කරන්න අද අපට හැකි වනවා. ඒ සඳහා 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනතත්, ඒ වාගේ 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනතත්, 2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනතත් සංශෝධනය කිරීමට අදාළ පනත් කෙටුම්පත් සම්බන්ධව අද දින කරනු ලබන විවාදයේදී බොහෝ කථිකයන්ගෙන් කරුණු කාරණා බොහෝ ප්‍රමාණයක් ඉදිරිපත් වුණා.

අපි අරමුණු කරපු "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ඒ සංකල්පය යථාර්ථයක් බවට පත් කිරීම සඳහා වන ගැඹුරු සමාජ, ආර්ථික, දේශපාලන පරිවර්තනයක ඉතා නිශ්චිත සන්ධිස්ථානයක් ලෙස තමයි මේ වැටුප් වැඩි කිරීම, මේ සංශෝධන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් වන අපි දකින්නේ.

අපට පෙනෙනවා, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප 2016දී තිබුණේ කොහොමද, 2021දී තිබුණේ කොහොමද, ඒ වාගේම 2025 වර්ෂයට අප ඉදිරිපත් කළ රජයේ අය වැය යෝජනා ඇතුළේ එම වැටුප් පරිවර්තනය කොහොමද වුණේ කියන එක. ඒ වාගේම ලංකා ඉතිහාසයේ පළමු වතාවට වැඩිම වැටුප් පරිවර්තනයකට ලක් වුණු, ඒ විෂමතා අහෝසි කිරීමේ මූලාරම්භය සනිටුහන් කරපු රාජ්‍ය සේවකයන් මේ මොහොතේදීත් ලංකාව තුළ ජීවත් වෙනවා. ඒ පිළිබඳව රාජ්‍ය සේවකයා තුළ තිබෙන්නේ

[ගරු සංජීව රණසිංහ මහතා]

ඉතාම ප්‍රසාදයක්. හැබැයි, මොකද මේ වෙන්නේ? වසර 76ක් වාගේ ඉතා දිගු කාලයක් රාජ්‍ය සේවකයා ප්‍රමුඛ වැඩ කරන ජනතාවගේ ඒ ඉල්ලීම්වලට, වෘත්තීය සමිතිවලට ඇහුම්කන් නොදී, වෙඩි තියලා, ඔළු පළලා, හිරිහැර කරලා, ඒ අයිතිවාසිකම් ලබා දෙන්න මැදිහත් නොවුණු අය අද විපක්ෂයේ ඉඳගෙන රාජ්‍ය සේවකයා පිළිබඳව මහත් දයානුකම්පාවෙන් කථා කරනවා. ඔවුන්ට ඉහි කරනවා, ඔබ අමාරුවේ වැටෙයි, ඔබ බියට පත් විය යුතු රජයක් තිබෙන්නේ කියලා. එසේ රාජ්‍ය සේවකයා බිය වැද්දීමේ ක්‍රියාවලියක තමයි අද විපක්ෂය නිරත වී සිටින්නේ. අපට පෙනෙනවා, ඉතාම ආදරයෙන් රාජ්‍ය සේවකයින්ට අයුතු ලෙස බලපෑම් කරමින්, ඒ රාජ්‍ය සේවකයාගේ අවස්ථා තමන්ගේ දේශපාලන අරමුණු වෙනුවෙන් පාවිච්චි කරන්න ඔවුන්ගේ රැකියාව පිළිබඳ අවිනිශ්චිතභාවයක් නිර්මාණය කරපු විපක්ෂයේ කණ්ඩායම් අද ඒ වෙනුවෙන් උත්සාහ කරමින් ඉන්නවාය කියලා. රාජ්‍ය සේවකයාත්, පෞද්ගලික අංශයේ සේවකයාත් තමන්ගේ ජීවිත යථාර්ථය තුළ යම් පියවරක් අත්පත් කර ගනිමින් ඉදිද්දී ඔවුන් බිය වැද්දීම සඳහා තමයි අද මේ විවාදය ඔවුන් පාවිච්චි කරමින් ඉන්නේ. ඒ නිසා අපි විපක්ෂයට කියන්න ඕනෑ, ඒ පැත්තෙන් අපට ලැබුණේ වට්ටපු රටක් බව. ඔව්, අපට ලැබුණේ වට්ටපු රටක්. ඒ වට්ටපු රට ගොඩගන්නට පැති ගණනාවක් තිබෙනවා. අපි කියනවා, ජාතික ජන බලවේගයේ අපේ ආණ්ඩුව ඒ සඳහා ප්‍රවේශය ලබාගෙන තිබෙනවාය කියලා.

අපේ ආර්ථිකය දියුණු වෙන්න නම් රටේ ජනතාව සතුටින් ඉන්න ඕනෑ. ඔවුන් තෘප්තිමත් ජනතාවක් බවට පත් වෙන්න ඕනෑ. ඒ සඳහා තමයි පළමු අය වැය යෝජනාව තුළින්ම රාජ්‍ය සේවකයන්ගේ වැටුප් විෂමතා අහෝසි කිරීම සඳහා මේ ධනාත්මක පියවර අපි අරගෙන තිබෙන්නේ. ඒ වාගේම, මේ රටේ පෞද්ගලික සේවකයා වගකීමක් නැති; වගකීම් විරහිත; අයිතිකාරයෙක් නැති තැනට පත් කර තිබුණා. හැබැයි, අපේ රජය මැදිහත් වෙලා ඒ හාම්පුතුන්, වෘත්තීය සමිති සමඟ කරපු සාකච්ඡා තුළ ධනාත්මක ලෙස ගන්න පුළුවන් උපරිම ඵල නෙළා ගැනීම සඳහා කටයුතු කරපු යෝජනාවලියක් විධියට තමයි මේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වැටුප් වැඩිවීම අපි දකින්නේ. ඒක පැත්තකින් තියලා තව පැත්තකින් ඔවුන් සතුටු වෙනවා, ඇමෙරිකාවේ ඩොනල්ඩ් ට්‍රම්ප් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව. ඒ ක්‍රියාමාර්ග ඇතුළේ මේ රටේ garment factories වැහිලා, ඒවායේ සේවකයින් එළියට වැටිලා, රැකියා අස්ථාවරත්වයක් නිර්මාණය වෙලා, ඔවුන්ගේ පවුල් තුළ අර්බුද ගොඩනැගිලා, ඒක රජයට එරෙහිව ගොඩනැගෙන බලවේගයක් බවට ගොඩනගන්න පුළුවන්ද කියලා ඔවුන් කල්පනා කරමින් ඉන්නවා. අපි විපක්ෂයට කියනවා, ඒ පිළිබඳව ඔබට හිතන්න දෙයක් අපි ඉතුරු කරන්නේ නැහැ කියලා. අපි හොඳම මැදිහත් වීම කරමින්, රාජ්‍ය යන්ත්‍රණය හරහා රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් සාකච්ඡා පවත්වමින් අදාළ මැදිහත් වීම් කරනවා. ඇමෙරිකාව විතරක් නොවෙයි, තව අපට ගොඩනහා ගන්න පුළුවන් විවිධ සම්බන්ධතා තුළ නව රැකියා අවස්ථා නිර්මාණය කරන්න වාගේම අපේ නිෂ්පාදන විදෙස් රටවලට යවන්න පුළුවන් වෙළෙඳ පොළවල් පිළිබඳවත් අපි සොයා ගනිමින් ඉන්නවා. ඒ පිළිබඳව යෝජනා ඉදිරිපත් වෙමින් තිබෙනවා.

ඊළඟට, IMF යෝජනා පිළිබඳව ඔවුන් කථා බහ කරනවා. හැබැයි, IMF සරණ යන්න සිද්ධ වුණේ මේ රට කඩා වට්ටලා, බංකොලොත්භාවයට පත් කළ නිසායි. මේක අයුතු දේශපාලන සංස්කෘතිය ඇතුළේ වරදාන, වරප්‍රසාද භුක්ති විඳිමින්, තමන්ගේ ජීවිත විතරක් ජීවිත කියලා කල්පනා කරපු පාලකයින් හිටපු රටක්; තමන් විතරක් ජීවත් වෙන්න ඕනෑ කියලා කල්පනා කරපු රටක්; තමන්ගේ දරුවන්ගේ ජීවිත විතරක් ජීවිත කියලා කල්පනා කරපු රටක්; තමන්ගේ දරු පවුල විතරක් සතුටින්, යෙහෙන් වැජඹෙන්න ඕනෑ කියලා කල්පනා කරපු රටක්; එහෙම දේශපාලකයෝ හිටපු රටක්. ඒ දේශපාලන සංස්කෘතිය අපි පරිවර්තනයට ලක් කරලා තිබෙනවා. පළමුවන වතාවට මේ රටේ ජනතාව අතර බිම් මට්ටමේ දේශපාලන සංස්කෘතියක් අපි නිර්මාණය කර තිබෙනවා. මේ රටේ ආර්ථික ප්‍රතිසංස්කරණ, සමාජ ප්‍රතිසංස්කරණ කරන්න කලින් දේශපාලන සංස්කෘතිය තුළ ඒ මහා පරිවර්තනය සිදු කිරීමේ කාර්යභාරය වෙනුවෙන් අත තියලා තිබෙන්නේ ජාතික ජන බලවේගයේ අපයි. ලංකා ඉතිහාසය තුළ මේ රටේ ජනතාවට මෙතෙක් දකින්නට නොලැබුණු, ඔබට ඇසුරු කරන්නට නොලැබුණු, මේ මහ පොළොවේ යථාර්ථයක් විධියට ඔබ නොදුටු ඒ දේශපාලනඥයා අපි මේ මහ පොළොවේ නිර්මාණය කළා. ඒ නිසා අපි විශ්වාස කරනවා, පසුගාමී, බල ලෝභයට, වරප්‍රසාදවලට යට වුණු ඒ සාම්ප්‍රදායික දේශපාලන සංස්කෘතිය අතුගා දමන්න අපට පුළුවන්කම ලැබුණාය කියලා. නැවත වතාවක් එය මේ මහ පොළොවේ යථාර්ථයක් බවට පත් නොවන බවත්, එසේ නොවීමට කළ හැකි උපරිමය අපි කරන බවත් සපථ කරමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට මේ වෙලාව ලබා දුන්නාට ඔබතුමියට ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මනෝ ගනේසන් මැතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.24]

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

අද උදේ මේ සභාවේදී අපේ අනුර කුමාර දිසානායක සහෝදරයාගේ අමාත්‍යාංශය වෙනුවෙන් නියෝජ්‍ය අමාත්‍ය, අනිල් ජයන්ත මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව පිළිබඳව මා සතුටු වෙනවා. ප්‍රශ්නයක් නැහැ, හොඳයි. කාට හෝ හොඳ දෙයක් වෙනවා නම් හොඳයි. මම මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ, මම අහගෙන හිටපු දෙයක්. දැන් මෙතැනින් නැඟිටලා ගියා මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. රාජ්‍ය සේවකයන් පිළිබඳව, පෞද්ගලික අංශයේ සේවකයන් පිළිබඳව ඔබතුමන්ලා උනන්දු වෙලා තිබෙනවා. ඒක හොඳයි. නමුත් එක පැත්තකින් දීලා අනෙක් පැත්තෙන් බදු ගහලා නැවත ගන්නවා කියලාත් දැන් කියැවුණා. ඒකත් අවධානයට යොමු කර ගන්න ඕනෑ.

ඒ වාගේම ධීවර ජනතාවටත්, කම්කරු ජනතාවටත්, ගොවි ජනතාවටත් ඔබතුමන්ලා සහනාධාර දෙනවා. ඒකත් හරියාකාරව වෙනවාද කියලා දන්නේ නැහැ. ඒ ගැන විවිධ චෝදනා තිබෙනවා. කෙසේ වුණත්, මම මේ සභාවේ අවධානය පිණිස කියන්න කැමැතියි, කම්කරු ජනතාව කියනකොට, ප්‍රධාන කම්කරු ජනතාව තමයි රටේ වතු කම්කරු ජනතාව කියන කාරණය. එම ජනතාව සම්පූර්ණයෙන්ම අත හැරලා තිබෙන්නේ, ආණ්ඩුව. හැම දාම අනුකම්පාව, අනුකම්පාව විතරයි. හැම දාම ඒ අය ගැන කථා කරනවා. කථාව නම් වැඩියි. ඕනෑ තරම් කථාව තිබෙනවා. නමුත් වැඩක් වෙන්නේ නැහැ. ශත පහක වැඩක් වෙලා නැහැ. මේ සභාවේ අය වැය ඉදිරිපත් කරන අවස්ථාවේදී ජනාධිපතිතුමා ඇවිල්ලා 1,700ක් කියලා ගණනක් කියලා ගියා. කෝ, ඒ ගණන? ඒ අයට ඒ ගණන ලැබිලා නැහැ; ප්‍රායෝගිකව ලැබිලා නැහැ.

සමහර වතු සමාගම් ඒක දෙන්නම් කියනවා. නමුත් දෙන්නේ නැහැ. දුන්නත්, දවසේ පඩිය නේ දෙන්නේ ඒගොල්ලන්ට. ඒ අයට දවස් 10ක්, 15ක් වැඩ දෙනවා. ඊට වඩා වැඩ දෙන්නේ නැහැ. නමුත් ඊට පසුව casual වැඩ කරවා ගන්නවා. ඒ විධියට රවටනවා. ඒ නිසා මේ සම්බන්ධව ආණ්ඩුව වැඩියෙන් අවධානය යොමු කරන්න ඕනෑ බව මම කියන්න කැමැතියි.

අනෙක් කාරණය මේකයි. දැන් මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා මේ සභාවට ඇවිල්ලා සිටිනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා points of Order ඉල්ලන්නේ නැහැ නේ. ඔබතුමා Collective Agreement එක ගැන කිව්වා. නමුත් තේරුම් ගන්න, මමත්, අපේ රාධක්‍රිෂ්ණන් මැතිතුමාත් නියෝජනය කරන්නේ Tamil Progressive Alliance - TPA - එක. අපි Wages Board එක ගැන කථා කරන්නේ නැහැ. අපි ඒක විශ්වාස කරන්නේ නැහැ. ඒකේ ඔබතුමන්ලා ඉන්නවා, LJEWU ඉන්නවා, CWC ඉන්නවා. අපි නැහැ. ඒගොල්ලන් විශ්වාස කරන්නේ නැහැ. හැබැයි, ඔයගොල්ලන් පඩියක් දෙනවා නම් ඒවා කඩාකප්පල් කරන්නේත් නැහැ, අපි උදවු කරනවා. නමුත් අපි කියන්නේ මේ සම්පූර්ණ ක්‍රමය වෙනස් වෙන්න ඕනෑ කියලායි. වතුවල තිබෙන ක්‍රමය වෙනස් වෙන්න ඕනෑ. System change එක ගෙනෙන්න ඕනෑ එතැනට. එහෙම කරලා කම්කරු ජනතාවත් කොටස්කාර ජනතාවක් කරන්න. අලුත් business plan එකක් හදලා කටයුතු කරන්න. ඕනෑ නම් ඔයගොල්ලන් අපට ඒ ගැන කථා කරන්න. අපි ඒ ගැන කියා දෙන්නම්. අපි සාකච්ඡා කරමු. Plan එකක් හදලා ඒ ජනතාවගේ ආදායම් මාර්ගය වැඩි කරන්න. හැම දාම මෙහෙමයි. රුපියල් 1,000ක් ඉල්ලුවොත් ඒක ලැබෙන්න අවුරුදු 5ක් යනවා. රුපියල් 2,000ක් ඉල්ලුවොත් ඒක ලැබෙන්න අවුරුදු 10ක් යනවා. එතකොට ඒ පඩියේ වටිනාකම අඩු වෙනවා. ඒ නිසා මෙහෙම පඩි ලබා දීමෙන් කවදාවත් ඒ ජනතාව ගොඩගන්න බැහැ. දැනගන්න, the most marginalized, the poorest and the underprivileged segment of the society, අපේ ජනතාව තමයි. ඒක තේරුම් ගන්න. ඒගොල්ලන් වෙනුවෙන් හොඳ දෙයක් කරන්න ඕනෑ නම් කරන්න. නමුත් හැම දාම මෙතැනට ඇවිල්ලා ඒ අයට බොරු කියන්න එපා, අනුකම්පා කරන්න එපා, කඳුළු වක්කරන්න එපා, මෙහෙම කරනවා, මෙහෙම කරනවා කියලා බොරු කියන්න එපා.

ඔයගොල්ලන්ගේ JVP වෘත්තිය සමිතිය Wages Board එකට කියා තිබෙන ගණන මොකක්ද? 2,200ක්. ඒක ලැබෙනවාද? නැහැ නේ. ඒක අමතක වෙලා නේ ඔයගොල්ලන්ට. අපි සාධාරණ වෙමුකෝ. අපි රණ්ඩු කරන්නේ නැහැ. සාධාරණ වෙමුකෝ. ඔයගොල්ලන් 2,200 ගණනක් කිව්වා. දැන් 2,200ක් තියා 2,000ක්වත් නැහැ නේ. ඉතින් මොකද වෙන්නේ? ඔයගොල්ලන් වෙන වෙන ආණ්ඩුවලට බැන්නා. අපි නම් පඩි ගැන කියන්න යන්නේ නැහැ. අපි කියන්නේ කම්කරු ජනතාව නොවෙයි, ඒගොල්ලන් කොටස්කාර ජනතාව කරන්න, වතු ක්ෂේත්‍රයේ. වතු ක්ෂේත්‍රයේ system change එකක් කරන්න, ක්‍රමයේ වෙනසක් කරන්න කියලායි අපි කියන්නේ. එහෙම නැත්නම් මේ industry එක හදාගන්න බැහැ. හැම දාම ඔයගොල්ලන් හිතාගෙන ඉන්නවා, හාම්පුතුන්ට, කොම්පැනිකාරයන්ට කථා කරලා වෙනසක් කරන්න. නමුත් කවදාවත් ඒකට එකඟ වෙන්නේ නැහැ, ඒගොල්ලන්. හරි දේ කරන්නේම නැහැ, ඒගොල්ලන්. ඒවාට රැවටෙන්න එපා කියලා මම අවධාරණය කරන්න කැමැතියි.

අනෙක් කාරණය මේකයි. මම බැලුවා, මේ වෙලාවේ ගරු සභාවේ අපේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා නැහැ. එම ක්ෂේත්‍රය තුළත් ලොකු අපරාධයක් වෙනවා. ඒ ගැනත් කියන්න ඕනෑ. මොකද, ජාතික තරුණ සේවා සභාවේ ක්‍රමය වෙනස් කරලා තිබෙනවා. ආ, තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය එරංග ගුණසේකර මැතිතුමා ඉන්නවා නේද? සමාවෙන්න, මට මේ ඇමතිවරුන්ගේ මුහුණු මතක තිබුණාට නම අමතක වෙනවා, ලාල්කාන්ත ඇමතිතුමාට වාගේ. මටත් එහෙම නම අමතක වෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මෙතැන ඉන්න එක හොඳයි. ඔබතුමන්ලා පරණ ක්‍රමය වෙනස් කරලා එක සංගමයක් ලියාපදිංචි කිරීමට ග්‍රාම නිලධාරි කොට්ඨාසවලට circular එකක් යවා තිබෙනවා. ඒක වෙනස් කරගන්න. කාරණාව මොකක්ද දන්නවාද? රට වටේම ග්‍රාම නිලධාරි වසම් 14,000ක් විතර තිබෙනවා. නමුත් වතුකරය දිහා බලන්න. වෙන තැනක 2,000ක පමණ ජනගහනයක් ඉන්නකොට, වතුකරය තුළ 20,000ක, 30,000ක පමණ ජනගහනයක් ඉන්න තැන් තිබෙනවා. නුවරඑළියේ 30,000ක් ඉන්නවා. එතකොට සභා සාධාරණ වෙන්න එපා යැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමා, බලන්නකෝ, ඒක? වැරදියි නේ, එතැනදී. ජනගහනය 2,000ට එක සමිතියක් නම්, ජනගහනය 20,000ට එක සමිතියක් කියන එක වැරදියි නේ. මොකද, ඒ සමිති හරහා තමයි ක්‍රීඩා භාණ්ඩ ලබා ගන්නේ. සංස්කෘතික භාණ්ඩ ලබා ගන්නේ. ජාතික උළෙලවලට යන්නේ. නේද? එතකොට ඒක වැරදියි නේ. සමහර තැන්වල නැහැ නේ. මගේ මේ කොළඹත් එහෙම තමයි. මට්ටක්කුලියේ එක ග්‍රාම නිලධාරි කොට්ඨාසයකට ජනගහනය 29,777ක් ඉන්නවා. ඒ කියන්නේ, ග්‍රාම නිලධාරි වසමක සිටිය යුතු ජනගහනය වැඩි කරනවා, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ වැඩ. ඒක ලෙහෙසි කරන්න බැහැ නේ. දැන් තිබෙන තත්ත්වය යටතේ කරුණාකරලා ග්‍රාම නිලධාරි වසමකට එක සමිතිය කියලා කියන්නේ නැතුව කරුණාකලා ඒක ජනගහනය අනුව බලලා කියන්න. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමා මගේ කථාවෙන් පසුව උත්තර දෙන්න. උත්තර දෙන්න උත්සාහ කරපු එක හොඳයි.

ඉතින් එහෙම කරලා දෙන්න. එතකොටයි සාධාරණ වෙන්නේ. නේද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එරංග ගුණසේකර නියෝජ්‍ය අමාත්‍යතුමා.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මගේ වේලාව,-

ගරු එරංග ගුණසේකර මහතා (තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எரங்க குணசேகர - இளைஞர் விவகாரங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Youth Affairs)
මම විනාඩියයි ගන්නේ.

ගරු මන්ත්‍රීතුමා, එතැන නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. අපි දැන් කියන්නේ Youth Club කියන ආකෘතිය ඇතුළේ ලංකාවේ තිබෙන සෑම ග්‍රාම නිලධාරි වසමකම Youth Clubs හදන්න කියලා. ඔබතුමා කියන එක හරි. මොකද, මීට පෙර Youth Clubs හදලා තිබුණා. ඒවා ඔබතුමාත් දන්නවා ඇති, ජාතික තරුණ සේවා සභාවට වාර්තා ආවාට ගොඩක් ඒවා පේපර් ක්ලබ්ස්; ඒවා හරියටම Youth Clubs නොවෙයි. ඒක නිසා අපි මූලිකව නිර්දේශ දීලා තිබෙනවා, ග්‍රාම නිලධාරි වසම පදනම් කරගෙන හදන්න කියලා. ඔබතුමා කියනවා වාගේ කොහොමත් අපේ සමහර ග්‍රාම නිලධාරි වසම්වල හූ විෂමතා තිබෙනවා සහ වෙන වෙන තත්ත්වයන් තිබෙනවා. ඒ මත ඒගොල්ලන්ට ඒ අදාළ නිර්දේශ තරුණ සේවා නිලධාරියා හරහා එව්වාට පස්සේ ජාතික තරුණ සේවා සභාවෙන් අනුමත කරනවා, ඒ තිබෙන භූමියට ගැළපෙන

[ගරු එරංග ගුණසේකර මහතා]

විධියට එකක්ද හදන්න ඕනෑ, දෙකක්ද හදන්න ඕනෑ කියලා. ඒකත් ඒ චක්‍රලේඛයේම තිබෙනවා. නමුත් ඔබතුමා තවත් මේ පිළිබඳ අවධාරණය කරනවා නම්, අපි තව මැදිහත් වෙන්නම්. නමුත් මූලික චක්‍රලේඛයේ ඒ විස්තර ටික තිබෙනවා.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

නැහැ, ප්‍රශ්නයක් නැහැ. ඔබතුමාගේ උත්තරය ගැන සතුටු වෙනවා. කෙසේ වෙතත්, ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඒක ගැන බලන්න. වතුකරයේ ඉස්සර තිබුණේ එක වත්තකට සමිතියක්. සමිති හදන්නේ නැත්නම් කමක් නැහැ. Letterhead එකට විතරක් සමිතියක් හැදුවා නම් කමක් නැහැ. ඒක දන්නවා. මට තේරෙනවා. මම ඒවා දන්නවා. නමුත් දැන් අවස්ථාව දෙන්න. කවුරුහරි වැරැද්දක් කරනවා කියලා අවස්ථාව දෙන්නේ නැතුව ඉන්න බැහැ නේ. ඔබතුමා නිකම් ඉන්න එක වැරදියි නේ. ඒ නිසා කරුණාකරලා ඔයගොල්ලන් එක වත්තකට දෙන්න. අනික් එක, ජනගහනය විතරක් නොවෙයි, භූමිය බලන්න; not only at the demography, but look at the geography also. වතුවල ගිහිල්ලා එන්න බැහැ. ජනගහනය පමණක් නොවෙයි, භූමිය - geography - ගැනත් බලන්න ඕනෑ. මොකද, ලොකු තැන් නේ තිබෙන්නේ. ඒ නිසා එක වත්තකට එක සමිතියක අයිතිය දෙන්න. සමිතියක් හදන්න දෙන්න. හදලා ඔයගොල්ලන්ගේ ජනතා විමුක්ති පෙරමුණේ තරුණ සමිතිය විධියට කර ගන්න උත්සාහ කරනවා. මම ඒක දන්නවා. ප්‍රශ්නයක් නැහැ, කරන්න. තරු ලාංඡනය ඇති කරනවා කියලා මට වාර්තා වුණා. මම ඒ ගැන කලබල වෙන්නේ නැහැ. ඔයගොල්ලන් කරන්න, ප්‍රශ්නයක් නැහැ. දේශපාලන අධ්‍යාපනය ලබා දෙන්න, ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ කටයුත්තත් කරන්න. ඒගොල්ලන්ට අවස්ථාව දෙන්න. කොහොම හරි, ඡන්දවලින් නේ තීරණය කරන්නේ. ඒක ප්‍රශ්නයක් නැහැ. ඒගොල්ලන්ට අවස්ථාව දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

හරි, විනාඩියක් තිබෙනවා නේ.

දැන් මේ කාරණය බලන්න, මේ ජනතාව අත්හැරලා තිබෙන්නේ. විශේෂයෙන්ම වතුකරයේ සිටින ජනතාව, ඒ කම්කරු ජනතාව. ඒගොල්ලන්ගේ පුරවැසිභාවය පිළිබඳ දැන් ප්‍රශ්නයක් නැහැ. නමුත් ඒ පුරවැසිභාවය සම්පූර්ණ වෙලා නැහැ. ඔබතුමන්ලා උත්සාහ කරලා ඒක සම්පූර්ණ කරන්න ඕනෑ. ඒක සම්පූර්ණ කරන්න. අපි ශ්‍රී ලංකාව කියන රාමුවෙන් පිට යන්න බලන අය නොවෙයි, අපි ශ්‍රී ලංකා රාමුව තුළට වැඩියෙන් ඇතුළු වෙන්නයි බලන්නේ. මේ අය ඇතුළු කර ගන්න. අත්හැරලා යන්න එපා. ඒගොල්ලන් හුදෙකලා වෙලා ඉන්නේ. උඩ ප්‍රදේශවල ඉන්නේ. එහෙම නේද, උඩ ප්‍රදේශවල ඉන්නේ. Geography-wise, ඒගොල්ලන් වෙන තැන්වල ඉන්නේ. ඒ නිසා ඒ අයවත් ඇතුළු කර ගන්න. ඒ අයට අවස්ථාව දෙන්න. මේක ඒගොල්ලන්ගේ අවස්ථාවක්. තරුණයන් අතරේ ඒ අවස්ථාව තිබෙනවා. වතුකරයේ සිට කඳුකරයේ සිටින තරුණ ප්‍රජාව කිහිප දෙනෙක් මට කථා කරලා කිව්වා. ඒ නිසා තමයි මම මේ කාරණය ඔබතුමාගේ අවධානයට ගේන්නේ. ඔබතුමා සභාවේ ඉන්න එක හොඳයි. ඒ නිසා කරුණාකරලා ඒ අවස්ථාව දෙන්න. මොකද, ජාතික තරුණ සේවා සභාව නේ. ජනතා විමුක්ති පෙරමුණේ තරුණ සේවා සභාව නොවෙයි නේ. ජනතා විමුක්ති පෙරමුණේ තරුණ සමිතිය වෙනම කර ගන්න. ඒක වෙනම කර ගන්න. නමුත් මේකට ඒගොල්ලන්ට අවස්ථාව දෙන්න. ඒ අවස්ථාව දීලා ඒක කර ගන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.33]

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று இந்தப் பாராளுமன்றத்தில் இரண்டாம் மதிப்பீட்டுக்காகச் சமர்ப்பிக்கப்பட்டுள்ள வேலையாளர்களின் தேசிய குறைந்தபட்ச வேதனம் (திருத்தம்) சட்டமூலமானது மிகவும் முக்கியமானது. இன்று தனியார்துறையில் வேலைசெய்யும் தொழிலாளர்கள் பாரிய பிரச்சினைகளுக்கு முகங்கொடுத்துக் கொண்டு இருப்பதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. தொழிலாளர்களின் நலன்புரி சார்ந்த பிரச்சினைகள், அவர்களின் வேதனம் சார்ந்த பிரச்சினைகள், அவர்களின் குடியிருப்பு சார்ந்த பிரச்சினைகள், அவர்களுக்குச் சுத்தமான குடிநீரைப் பெற்றுக் கொடுப்பதிலுள்ள பிரச்சினைகள் எனப் பல்வேறு பிரச்சினைகள் மேலெழுந்திருக்கின்ற இத்தருவாயில் இந்தச் சபையில் இந்தச் சட்டமூலம் சமர்ப்பிக்கப்பட்டு இருப்பது மிகவும் வரவேற்கத்தக்கது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்தச் சபையில் தோட்டத் தொழிலாளர்களின் வேதனம் சம்பந்தமாகப் பலர் கூச்சலிட்டார்கள். தோட்டத் தொழிலாளர்களின் சம்பளத்தைக் கூட்டுவதற்கு ஏதுவான நடவடிக்கைகளை கட்டாயம் எடுக்க வேண்டுமென தேசிய மக்கள் சக்தியும் அதனோடு இணைந்த தொழிற்சங்கங்களும் தொடர்ச்சியாகக் குரலெழுப்பி வருகின்றன. கடந்த காலங்களில் இந்த நாட்டை ஆண்டி செய்தவர்கள் 449 பெருந்தோட்டங்களை 22 பல்தேசியக் கம்பனிகளுக்குத் தாரைவார்த்ததன் விளைவாக இன்று 30 ஆண்டுகளுக்குப் பின்னர் பெருந்தோட்டத்துறை பாரிய சவால்களுக்கு முகங்கொடுத்து வருகின்றது. அத்துறையில் வேலைசெய்கின்ற தோட்டத் தொழிலாளர்களின் அடிப்படை வேதனம் சம்பந்தமான விடயம் இலங்கையில் மட்டுமல்லாது, உலக அரங்கிலும் இன்று பேசுபொருளாக மாறியிருக்கின்றது. ஒரு காலத்தில் தோட்டத் தொழிலாளர்களின் சம்பளம் தொடர்பான விடயம் தோட்டங்களுக்குள்ளும் வெள்ளையர்களின் ஆட்சிக்குள்ளும் முடக்கப்பட்டு இருந்தது. அதன்பிறகு, அது சம்பள நிர்ணய சபைக்குக் கொண்டு செல்லப்பட்டது. சாதாரண ஒரு தொழிலாளியின் சம்பளத்தைவிட அவர்களின் சம்பளம் குறைவாகவே இருந்தது.

அரசாங்கம் பெருந்தோட்டங்களைத் தனியாருக்குத் தாரைவார்த்த பிறகு, கூட்டு உடன்படிக்கை ஊடாகத் தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வு தொடர்பான விடயம் முன்னெடுக்கப்படுமெனக் கூறப்பட்டது. இந்தச் சபையில் எனக்கு முன்னர் உரையாற்றிய கௌரவ மனோ

கணேசன் அவர்கள், தோட்டத் தொழிலாளர்களுக்குச் சம்பள உயர்வு வழங்குவதற்குப் பதிலாக அவர்களை இந்த நாட்டின் நிலவுடைமையாளர்களாக அல்லது தோட்டங்களுக்கு உரிமைகோரக்கூடிய பாட்டாளி வர்க்கத்தினராக மாற்ற வேண்டுமெனக் கூறினார். அதற்கான அடித்தளத்தை தேசிய மக்கள் சக்தியினராகிய நாங்கள் இட்டிருக்கின்றோம்.

இன்று பெருந்தோட்டங்கள் பல்தேசியக் கம்பனிகளுக்குச் சொந்தமாக இருக்கின்றன என்பது நம் அனைவருக்கும் தெரியும்! 2047ஆம் ஆண்டுவரை அவற்றை வழிநடத்து வதற்கான அதிகாரத்தை பல்தேசியக் கம்பனிகளுக்குச் சட்டத்தினூடாகப் பெற்றுக்கொடுத்தது அவர் கடந்த காலத்தில் பிரதிநிதித்துவம் செய்த அணியே ஆகும். அந்தப் பெருந்தோட்டங்களை உடனடியாக அரசாங்கம் கையகப்படுத்தி, அவற்றைத் தோட்டத் தொழிலாளர்களுக்குப் பகிர்ந்தளித்து, அவர்களை நிலவுடைமையாளர்களாக மாற்றுவதற்கு ஏதுவான நடவடிக்கைகளை எடுப்பதில் சிக்கல் இருக்கின்றது. எனினும், எதிர்வரும் காலங்களில் தோட்டத் தொழிலாளர்களை நிலவுடைமையாளர்களாக மாற்றுவதற்கு ஏற்புடைய வேலைத்திட்டங்களை எமது அரசாங்கம் முன்னெடுத்து வருகின்றது. கூட்டு உடன்படிக்கையில் அநீதி இடம்பெறுவதாகக் கூறி, அதற்கு எதிராகப் பிரேரணை கொண்டுவரப்பட்டு, இன்று தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வு தொடர்பான விடயம் சம்பள நிர்ணய சபையிடம் கொடுக்கப்பட்டு இருக்கின்றது.

கடந்த காலங்களில் தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வு விடயம் பேசப்பட்டபொழுது, தேசிய மக்கள் சக்தியினராகிய நாங்களும் எங்களுடைய தொழிற்சங்கமும் அதில் முக்கிய வகிபாகத்தை வகித்தோம். தோட்டத் தொழிலாளர்களுக்கு 2,000 ரூபாய் நாட் சம்பளத்தை வழங்குமாறும் அதற்கு ஏற்புடைய நடவடிக்கைகளை எடுக்குமாறும் நாங்கள் அழுத்தம் திருத்தமாகக் கூறினோம். அந்த வகையில், எங்களுடைய அரசாங்கம் தோட்டத் தொழிலாளர்களின் குறைந்தபட்ச நாளாந்த வேதனம் 1,700 ரூபாயென வரையறுத்திருக்கின்ற அதேவேளை, அவர்களுக்கு 2,000 ரூபாய் நாட் சம்பளத்தைப் பெற்றுக்கொடுப்பதற்கு ஏதுவான பேச்சுவார்த்தைகளிலும் ஈடுபட்டு வருகின்றது. தோட்டத் தொழிலாளர்களுக்குப் போதுமான சம்பள உயர்வை வழங்குவதற்கு எங்களுடைய அரசாங்கம் தயாராகிக்கொண்டு இருக்கின்றது. அதேநேரம், கடந்த ஆட்சியில் வங்குரோத்து அடைந்த தேசமாக மாற்றப்பட்ட இந்த நாட்டை மீட்டெடுக்க வேண்டிய, பொருளாதார ரீதியாகப் பின்தள்ளப்பட்டு இருக்கின்ற இந்தத் தேசத்தைக் கட்டியெழுப்பவேண்டிய, இந்த நாட்டிலுள்ள அனைத்து மக்களுக்குமான உரிமைகளையும் சலுகைகளையும் பெற்றுக்கொடுக்க வேண்டிய தேவையும் எமது அரசாங்கத்துக்கு உள்ளது. மேலும், தோட்டத் தொழிலாளர்களின் நாட் சம்பளத்தை 2,000 ரூபாயாக உயர்த்துவதற்கான பேச்சுவார்த்தைகளும் தற்பொழுது முன்னெடுக்கப்பட்டு வருகின்றன.

தற்போது முன்மொழியப்பட்டு இருக்கின்ற 1,700 ரூபாய் நாட் சம்பளம் தொடர்பான பேச்சுவார்த்தை முடிந்தவுடன், தோட்டத் தொழிலாளர்களுக்கு உயர்ந்தபட்ச நாளாந்த வேதனமாக 2,000 ரூபாயைப் பெற்றுக்கொடுப்பதற்கு எங்களுடைய தேசிய மக்கள் சக்தி அரசாங்கம் தயாராக இருக்கின்றது என்பதை கடந்த காலங்களில் தோட்டத் தொழிலாளர்களை அடிமைகளாகப் பயன்படுத்தி அரசியல் இலாபம் தேடிய மலையகத்தின் பிற்போக்கு அரசியல் தலைவர்களுக்கு தெளிவாகக் கூறிக்கொள்கின்றோம். இறுதியாக, மலையக மக்களின் குறிப்பாக தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வை முழுமையாகப் பெற்றுக்கொடுப்பதற்கு எங்களுடைய அரசாங்கம் தயாராக இருக்கின்றது என்பதைக் கூறிக்கொண்டு என்னுடைய உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி. வணக்கம்!

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.40]

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் அரசாங்கம் தனியார்துறை ஊழியர்களின் சம்பள அதிகரிப்புச் சம்பந்தமான ஒரு சட்டமூலத்தைக் கொண்டுவந்து இருக்கின்றது. வேலையாளர்களின் குறைந்தபட்ச வேதனமானது, 21,000 ரூபாயிலிருந்து 27,000 ரூபாயாக அதிகரிக்கப்பட்டு, எதிர்வரும் சனவரி மாதத்துக்குப் பிறகு 30,000 ரூபாயாக அதிகரிப்பதற்குரிய நடவடிக்கை எடுக்கப்பட்டு இருப்பதாகச் சொல்லப்படுகின்றது. இதை நாங்கள் வரவேற்கின்றோம்; அதில் எந்தவிதமான ஆட்சேபனையும் கிடையாது.

கௌரவ கிட்ணன் செல்வராஜ் அவர்கள் இங்கு பேசியது எனக்கு மிகவும் சந்தோசமாக இருக்கின்றது. தோட்டத் தொழிலாளர்களுக்கு 1,700 ரூபாய் நாட் சம்பளம் கொடுக்கப்பட வேண்டுமென கடந்த காலத்தில் சனாதிபதியாக இருந்த ரணில் விக்கிரமசிங்ஹ அவர்களும் சொல்லியிருந்தார். அதேபோல, மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்களும் சொல்லியிருக்கிறார். சம்பள நிர்ணய சபையில் 1,350 ரூபாய் அடிப்படைச் சம்பளமும் 350 ரூபாய் கொடுப்பனவும் என்று சொல்லும்பொழுது, 2,000 ரூபாய் கொடுத்தால் மட்டுமே ஏற்றுக்கொள்ள முடியும் என்ற அடிப்படையில் கௌரவ கிட்ணன் செல்வராஜ் அவர்கள் அங்கிருந்து வெளியேறியதை நான் இந்த நேரத்தில் ஞாபகப்படுத்த விரும்புகின்றேன். தோட்டத் தொழிலாளர் களுக்கு 2,000 ரூபாய் நாட்சம்பளம் கொடுக்கப்பட வேண்டும் என்பது JVPஇன் நிலைப்பாடாக இருந்தது. ஏன் அதை இன்று நடைமுறைப்படுத்த முடியாமல் இருக்கிறது? இன்று உங்களுடைய அரசாங்கம் சார்பில் 159 பாராளுமன்ற உறுப்பினர்கள் இருக்கிறார்கள். அப்படியென்றால், நீங்களும் கம்பனிக்காரர்களுக்குப் பயப்படுகின்றீர்களா? அல்லது கம்பனிக்காரர்கள் உங்களுக்கு ஒத்துழைக்கவில்லையா? அல்லது தோட்டத் தொழிலாளர்களுக்கு வழங்கிய வாக்குறுதியை நிறைவேற்ற முடியாமல் தடுமாறுகின்றீர்களா? இதற்கான பதிலை நீங்கள் சொல்ல வேண்டும்.

இன்று தோட்டத்தொழிலாளர்கள்தான் குறைந்த சம்பளம் பெறுகின்றவர்களாக இருக்கின்றார்கள். இன்று அவர்களுக்கு 1,300 ரூபாய் நாட் சம்பளம் வழங்கப்படுவது உங்களுக்குத் தெரியும்! எனினும், 20 கிலோகிராம் கொழுந்து பறித்தால் மட்டுமே அவர்களுக்கு 1,300 ரூபாய் கொடுக்கப்படுகின்றது. 20 கிலோகிராமுக்குக் குறைவாக அதாவது 10 அல்லது 12 கிலோகிராம் கொழுந்து பறித்தால் அவர்களுக்கு அரைவாசி சம்பளம்தான் கொடுக்கப்படுகின்றது. அப்படிப் பார்த்தால், அவர்களுடைய வேதனம் சாதாரண தனியார்துறை ஊழியர்களின் வேதனத்தைவிடக் குறைவாகும். எனவே,

[ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා]

தோட்டத் தொழிலாளர்களின் வேதனத்தை அதிகரிப்பதற்கு மாண்புமிகு சனாதிபதியும் அரசாங்கமும் நடவடிக்கை எடுக்க வேண்டுமென அன்பாகக் கேட்டுக் கொள்கின்றேன். அது தொடர்பான பிரேரணை ஒன்றையும் நாங்கள் கொண்டுவர இருக்கின்றோம். அதற்கு நீங்கள் எல்லோரும் ஒத்துழைப்புத் தர வேண்டுமென இந்த நேரத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, இலங்கையில் இருக்கின்ற இளைஞர் கழகங்கள் பற்றி சொல்ல வேண்டும். இது பற்றி கௌரவ மனோ கணேசன் அவர்கள் சிங்களத்தில் பேசினார். நான் இது பற்றி தமிழில் பேச விரும்புகின்றேன். ஒரு கிராம சேவகர் பிரிவுக்கு ஓர் இளைஞர் அமைப்பு என்று சொல்லப்படுகின்றது. எங்களுடைய பகுதியில் ஒரு கிராம சேவகர் பிரிவில் கிட்டத்தட்ட ஐந்து தோட்டங்கள் இருக்கின்றன. ஐந்து தோட்டங்களுக்கு ஓர் இளைஞர் அமைப்பை உருவாக்கினால் அங்குள்ள இளைஞர்களின் வளர்ச்சி எப்படி இருக்கும்? நீங்கள் இப்போது இளைஞர்கள் பற்றி பேசுகின்றீர்கள்; மாற்றத்தைக் கொண்டுவர வேண்டுமென விரும்புகின்றீர்கள். எனவே, நீங்கள் இதை மாற்றியமைக்க வேண்டும் என்பது எங்களுடைய கருத்தாக இருக்கின்றது. இந்த இளைஞர் அமைப்புகளுக்கு அந்தந்தப் பிரதேசத்திலுள்ள உள்ளூராட்சி மன்றப் பிரதிநிதிகள் தலைமைதாங்க வேண்டுமெனவும் சொல்லப்படுகின்றது. இளைஞர்கள் சார்ந்த இந்த விஷயத்தில் அரசியல் தலையீடு இல்லாமல் இருந்தால்தான் நல்லதென நான் நினைக்கின்றேன். அரசியல் தலையீட்டைத் தவிர்த்து, ஒவ்வொரு பகுதிக்கும் ஒவ்வோர் இளைஞர் அமைப்பை அல்லது ஒவ்வொரு விளையாட்டுக் கழகத்தை உருவாக்கி, அங்குள்ள இளைஞர்களின் வாழ்க்கையில் மறுமலர்ச்சியை ஏற்படுத்துவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும் என்பது என்னுடைய கருத்தாக இருக்கின்றது.

இன்று தோட்டங்களில் பல்வேறு பிரச்சினைகள் இருக்கின்றன. கௌரவ அமைச்சர் கே.வீ. சமந்த வித்யாரத்ன அவர்கள் இந்திய அரசாங்கத்தின் உதவியோடு அங்கு பல வீட்டுத்திட்டங்களை அமைப்பதற்கான நடவடிக்கைகளை எடுத்துவருவதாகச் சொல்லப்படுகின்றது. அவர் அதனைச் செய்தால் எனக்கு மிகவும் சந்தோஷம்! ஏனெனில், கடந்த காலங்களில் இது சம்பந்தமான வேலைகள் மிகவும் தாமதமாகவே - slowஆகவே - இடம்பெற்றன. இப்பொழுது அவர் அதைச் செய்வதையிட்டு நாங்கள் சந்தோஷப்படுகின்றோம்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
මම විනාඩි දෙකෙන් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

தோட்ட வைத்தியசாலைகளை அரசாங்கம் பொறுப்பேற்க வேண்டும் என்பது கடந்த காலங்களில் கொள்கையளவில் ஏற்றுக்கொள்ளப்பட்டது. அதன் அடிப்படையில், 19 தோட்ட வைத்தியசாலைகளை அரசாங்கம் பொறுப்பேற்குமெனவும் சொல்லப்பட்டது. இவ்வாறு 19 தோட்ட வைத்தியசாலைகள் அரசாங்கத்தால் பொறுப்பேற்கப்படுமென உறுதியளிக்கப் பட்டாலும், அதை நடைமுறைப்படுத்துவதில் சிக்கல்கள் இருக்கின்றன. தற்பொழுது, இங்கு சம்பந்தப்பட்ட அமைச்சர் அவர்கள் இல்லாவிட்டாலும், நான் இந்த விஷயத்தை இங்கு சொல்லிவைக்க விரும்புகின்றேன். தோட்டங்களில் இருக்கின்ற வைத்தியசாலைகளை அரசாங்கம் பொறுப் பேற்பதன் மூலம் நகரங்களிலுள்ள வைத்தியசாலைகளில் நிலவும் இடப்பற்றாக்குறை குறையும் என்பது என்னுடைய கருத்தாகும். கொட்டகலையில் திம்புல தோட்ட வைத்தியசாலை அமைந்துள்ள பகுதியில் 10,000க்கும் மேற்பட்ட மக்கள் வசிக்கின்றார்கள். அதற்குப் பக்கத்திலுள்ள கொட்டகலை ஆஸ்பத்திரியில் ஒரு நாளைக்கு 40,000 - 50,000 நோயாளர்கள் சிகிச்சை பெற்றுச் செல்கின்ற நிலைமை காணப்படுகின்றது. இந்த வைத்தியசாலைகளை அரசாங்கம் பொறுப்பேற்றால், பக்கத்தில் இருக்கின்ற மாவட்ட வைத்தியசாலைகளுக்குச் செல்லும் நோயாளர்களின் எண்ணிக்கை குறையும். இன்று சுகாதாரம் சார்ந்த பிரச்சினைகளுக்கு வைத்தியசாலைக்குச் செல்லவேண்டிய சூழ்நிலை இருக்கின்றது. எனவே, அரசாங்கம் தோட்ட வைத்தியசாலைகளைப் பொறுப்பேற்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

கடந்த காலங்களில் கூட்டு ஒப்பந்தம்மூலம் இந்த நாட்டிலுள்ள தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வு இல்லாது ஒழிக்கப்பட்டது. தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வு விஷயத்தில் அரசாங்கம் தலையிட்டு, அவர்களுக்கு 1,700 ரூபாய் நாட் சம்பளத்தை அல்லது கௌரவ கிட்ணன் செல்வராஜ் அவர்கள் சொன்னதுபோல 2,000 ரூபாய் நாட்சம்பளத்தைப் பெற்றுக்கொடுத்தால் நாங்கள் சந்தோஷப் படுவோம். எனவே, அதைச் செய்வதற்கான நடவடிக்கைகளை இந்த NPP அரசாங்கம் எடுக்க வேண்டுமெனக் கூறி, என்னுடைய பேச்சை நிறைவுசெய்கின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ක්‍රිෂ්ණන් කලෙයිචෙල්වි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.46]

ගරු ක්‍රිෂ්ණන් කලෙයිචෙල්වි මෙනෙවිය
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று எமது அரசாங்கத்தால் சமர்ப்பிக்கப்பட்டிருக்கும் 2005ஆம் ஆண்டின் 36ஆம் இலக்க, வேலையாட்களின் வரவுசெலவுத் திட்ட நிவாரணப்படி சட்டத்தைத் திருத்துவதற்கான சட்டமூலம் மற்றும் 2016ஆம் ஆண்டின் 3ஆம் இலக்க, வேலையாளர்களின் தேசிய குறைந்தபட்ச வேதனச் சட்டத்தைத் திருத்துவதற்கான சட்டமூலம் என்பன விவாதத்திற்கு எடுத்துக் கொள்ளப்பட்டிருப்பது வரவேற்கத் தக்கதொன்றாகும். ஏன் நாம் அப்படிக் கூறுகிறோம் என்றால், சென்ற அரசாங்கங்களால் தனியார்துறைத் தொழிலாளர்களின் வேதனம் தொடர்பாக எந்தவிதமான கலந்துரையாடலும் மேற்கொள்ளப்படவில்லை என்பதனாலாகும். தேசிய மக்கள் சக்தி அரசாங்கமானது, தனது முதலாவது வரவு செலவுத் திட்டத்திலேயே அரச ஊழியர்களின் ஊதியத்தை அதிகரித்தது போல், தனியார்துறை ஊழியர்களின் சம்பள அதிகரிப்பையும் அவர்களின் வரவு செலவுதிட்ட நிவாரணக் கொடுப்பனவையும் பெற்றுக்கொடுக்கும். இந்தச் சட்டமூலங்கள், உண்மை

யிலேயே இந்த நாட்டில் வாழும் தனியார்துறையில் தொழில்புரியும் அனைத்து ஊழியர்களுக்கும் அவர்களது எதிர்காலப் பரம்பரையினருக்கும் ஒரு வரப்பிரசாதமாகும்.

இந்தச் சட்டமூலங்களை நிறைவேற்றுவதனூடாக, தனியார்துறையில் தொழில்புரியும் சகலரும் குறிப்பாக, ஆடைத்துறையில், கடைகளில் மற்றும் வீட்டுப் பணியாளர்களாக வேலை செய்யும் அனைவரும் குறைந்தபட்ச நாட் சம்பளமாக 1,700/- ரூபாயைப் பெற்றுக்கொள்வார்கள். அவர்களின் எதிர்கால வாழ்வு தொடர்பாக சிந்தித்த ஓர் அரசாங்கம் என்றால் அது தேசிய மக்கள் சக்தி அரசாங்கமாகும். அது மாத்திரமல்ல, சென்ற அரசாங்கங்கள் அரச ஊழியர்களின் சம்பளத்திலும் சரி, தனியார்துறை ஊழியர்களின் சம்பளத்திலும் சரி, அவர்களின் வாழ்க்கைச் செலவையொட்டி வழங்கப்பட்ட சம்பள அதிகரிப்பை அடிப்படைச் சம்பளத்தில் சேர்க்கவில்லை.

இன்று எதிர்க்கட்சியில் இருக்கின்ற பெரும்பாலானவர்கள் எமது அரசாங்கம் ஆட்சிக்கு வருவதற்கு முன்பு இந்த நாட்டினை ஆட்சி செய்துவந்த ஒவ்வோர் ஆட்சியின்போதும் உறுப்பினர்களாகவும் அமைச்சர்களாகவும் இருந்தவர்கள்தான். உண்மையிலேயே மிகவும் கவலையான விடயம் என்னவென்றால், வேளையாட்கள் விடயத்தில் அவர்களால் அன்று எதுவும் செய்ய முடியாமற்போனதுதான். மேலும், வங்குரோத்து நிலையை அடைந்த நாட்டினையே அவர்கள் எமது அரசாங்கத்தின் கையில் கொடுத்தார்கள். தொழிலாளர்கள் மாத்திரமன்றி, மாணவர்கள், பெண்கள் உட்பட இந்த நாட்டில் வாழும் சகல துறையினரையும் மக்களாகவே யோசித்து தீர்மானங்களை எடுக்கும் ஓர் அரசாங்கமே தேசிய மக்கள் சக்தி அரசாங்கமாகும். அந்த வகையில், தனியார்துறை ஊழியர்களுக்கான கொடுப்பன வைப் பெற்றுக்கொடுப்பதற்கு 'வேலையாளர்களின் தேசிய குறைந்தபட்ச வேதனம் (திருத்தம்)' என்ற இந்தச் சட்டமூலத்தை நாம் சமர்ப்பித்துள்ளோம்.

அடுத்து, நான் பிரதிநிதித்துவம் செய்கின்ற மலையகம் தொடர்பாக சில விடயங்களைக் கூறுவதற்கு விரும்புகின்றேன். எதிர்க்கட்சியில் இருக்கின்ற ஒருசில உறுப்பினர்கள் எமது சக பாராளுமன்ற உறுப்பினரான கௌரவ அம்பிகா அவர்கள் கூறிய விடயத்தை மையப்படுத்தி சில விடயங்களைக் கூறினார்கள். நான் அவர்களுக்கு மிகவும் தெளிவாக ஒரு விடயத்தைக் கூறுகின்றேன். மலையக மக்கள் தொடர்பாக சரியான சிந்தனையோடு செயற்பட்டுக் கொண்டிருப்பது தேசிய மக்கள் சக்தி அரசாங்கம்தான். மாண்புமிகு சனாதிபதி அவர்கள், கௌரவ பெருந்தோட்ட அமைச்சர் அவர்கள், கௌரவ நீதி அமைச்சர் அவர்கள், கௌரவ தொழில் அமைச்சர் அவர்கள் உட்பட அனைவரும் மலையகத் தோட்டத் தொழிலாளர்களின் வாழ்க்கைச் செலவுக்கு ஏற்றவாறு அவர்களின் நாட் சம்பளத்தை உயர்த்துவதற்கான சகல கலந்துரையாடல்களையும் மேற்கொண்டிருக்கின்றார்கள்.

ஆரம்பத்தில் கூட்டு உடன்படிக்கையின் மூலமாக நிர்ணயிக்கப்பட்டு வந்த மலையக தோட்டத் தொழிலாளர்களின் சம்பளமானது அதற்கடுத்த படியாக சம்பள நிர்ணய சபையினூடாக நிர்ணயிக்கப்படுகின்றது என்பது எதிர்கட்சியிலிருந்து பேசுகின்ற ஒவ்வொருவருக்கும் தெரிந்த விடயமாகும். பெருந்தோட்டக் கம்பனிகளுடன் கதைத்துத்தான் அவர்களது சம்பளம் தொடர்பாக தீர்மானிக்க வேண்டிய தேவையுள்ளது. மாண்புமிகு சனாதிபதி அவர்களும் சம்பந்தப்பட்ட அமைச்சர்களும் குறித்த விடயம் தொடர்பில் கம்பனிகளுடன் கலந்துரையாடலைச் செய்து கொண்டிருக்கின்றார்கள். எதிர்கால வரவுசெலவுத் திட்டத்தில் வரவேற்கத்தக்க, சந்தோஷமான ஒரு விடயத்தை தோட்டத் தொழிலாளர்களுக்குப் பெற்றுக்கொடுப்பதற்கு நாங்கள் காத்திருக்கின்றோம்.

அது மாத்திரமல்ல, இன்றுவரை பெருந்தோட்டத் தொழிலாளர்களுக்கென்று சொந்தமான நிலம் இல்லை; சொந்தமான வீடு இல்லை; சொந்தமான ஒரு முகவரி இல்லை. சொல்வதற்கு மிகவும் சந்தோசமாக இருக்கின்றது. அது என்னவென்றால், தோட்டத் தொழிலாளர்களுக்கு நிரந்தரமான வீட்டையும், 10 பேர்ச் காணியையும் கொடுத்து நிரந்தர முகவரியைப் பெற்றுக்கொடுப்பதற்கென எதிர்வரும் 03ஆம் திகதியை நாங்கள் குறிப்பிட்டிருந்தோம். என்றாலும், அதில் கொஞ்சம் தாமதம் ஏற்பட்டுள்ளது. இந்த நாட்டிலுள்ள சகல மக்களினதும் வாழ்வை ஒளிமயமானதாக்குவதே தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் எதிர்பார்ப்பும் கொள்கையுமாகும். மலையக மக்கள் சம்பந்தமாகப் பேசும் ஒவ்வொருவரும் இதனை ஞாபகத்தில் வைத்துக்கொண்டால் நல்லது என்று கூறிக்கொண்டு விடை பெறுகின்றேன். நன்றி. வணக்கம்!

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.54]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත් කෙටුම්පත, සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන) පනත් කෙටුම්පත සහ සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත කියන පනත් කෙටුම්පත් තුන ගැන විවාද කරන මේ අවස්ථාවේ ඒ ගැන කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද මේ විවාදය හරහා අපි බොහෝදෙනෙකුට පුළුවන්කම ලැබුණා, තමන්ගේ ස්වෝත්සාහයෙන්, රටට බරක් නැතිව, බොහොම අමාරුවෙන් ජීවිතය ගැටගහ ගැනීම සඳහා විශාල අරගළයක නිරත වෙමින් සේවය කරන, කිසිම හඬක් නැති පිරිසක් වෙනුවෙනුත් කථා කිරීමට.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පෞද්ගලික අංශය කියන්නේ රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දෙන පිරිසක් සිටින අංශයක්. විධිමත් ලෙස පෞද්ගලික අංශයේ රැකියා කරන පිරිසට අමතරව අපේ රටේ ඉන්නවා ලක්ෂ සංඛ්‍යාත පිරිසක් ගොවි ජනතාව හැටියට. ඒ වාගේම ධීවර ප්‍රජාවක් ඉන්නවා. ඒ වාගේම ඇඟලුම් ක්ෂේත්‍රයේ රැකියා කරන ලක්ෂ සංඛ්‍යාත පිරිසක් රට පුරා ඉන්නවා. මේ සභාවේ බොහෝදෙනෙක් කථා කළා වාගේ අපේ රටට විදේශ විනිමය ගෙන දෙන වතු කම්කරු පිරිසත් අපට මේ වාගේ වේලාවක කිසිසේත්ම අමතක කරලා කථා කරන්න පුළුවන්කමක් නැහැ. පෞද්ගලික අංශයේ විධිමත් රැකියා කරන විශාල පිරිසකට යම් වැටුපක් ලැබෙනවා. ඒක හැම දාම අඩු වැඩි වශයෙන් ඔවුන්ට ලැබුණු දෙයක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, නමුත් පෞද්ගලික අංශයේ ඉන්නවා අවිධිමත් රැකියා කරන විශාල පිරිසක්. අපේ රට පුරාම එවැනි සේවාවල නිරත විශාල පිරිසක් ඉන්නවා. විශේෂයෙන් කඩ සාප්පුවල සේවය කරන අය, ගෙවල්වල වැඩ කරන අය, සනීපාරක්ෂක සේවාවල -

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

cleaning servicesවල - කටයුතු කරන අය, පෞද්ගලික ආරක්ෂක සේවාවල කටයුතු කරන අය වාගේම මැන්පවර් සේවකයන් බොහෝ පිරිසක්ද මේ අය අතර සිටිනවා. මේ අයට නිසි වැටුපක් ලැබෙන්නේ නැහැ. නමුත් ඔවුන්ගෙන් විශාල සේවයක් රටට සිද්ධ වෙනවා. විශේෂයෙන්ම ඒ පිරිස රටට බරක් නැතිව, ස්වෝත්සාහයෙන් ජීවත් වීමට වෙර දරන පිරිසක්. ඒ වාගේම ඒ අයගෙන් කොපමණ ප්‍රමාණයක් රටේ ශ්‍රම බලකායට අයත් වෙනවාද කියලා නිශ්චිත තොරතුරක් ඇත්තේත් නැහැ. මම හිතන හැටියට, කිසිම විධියකින් නිවැරදි දත්ත ලබා ගන්න පුළුවන්කමක් නැහැ, ඒ අවිධිමත් සේවාවල නිරත වන පිරිස කොච්චරද කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි දන්නවා වර්තමාන රජය පෞද්ගලික අංශයේ සේවකයන්ට දැනට ගෙවනු ලබන ජාතික මාසික අවම වේතනය සංශෝධනය කරන්න තීරණය කරපු බව. විපක්ෂයේ වුණත් අපි ඒ ගැන සතුටු වෙනවා. මොකද, කොයි විධියෙන් හරි මිනිස්සුන්ගේ වැටුප් වැඩි වෙනවා නම් ඒක සතුටු විය හැකි කාරණයක් නිසා.

ආණ්ඩුව හදන්නේ 2005 සහ 2016 වසරවල අය වැය සහන දීමනාවක් හැටියට දීපු 3,500ක මුදල මූලික වැටුපට එකතු කරලා මෙතෙක් පෞද්ගලික අංශයට දීපු අය වැය සහන දීමනාව අහෝසි කරන්න බව මේ පළමුවෙනි පනත් කෙටුම්පත් දෙක දිහා බලපුවාම අපට පේන්න තිබෙනවා. ඒක හොඳයි. මූලික වැටුපට ඒක එකතු කරන එක හොඳයි. නමුත් අපි දකිනවා මේ පනත් කෙටුම්පත් දෙක අද සම්මත වුණාට පස්සේ මින් ඉදිරියට අය වැය සහන දීමනා ලැබෙනකොට, පෞද්ගලික අංශයේ සේවකයන්ට ඒ ලැබෙන සහන දීමනා අහිමිවීමේ අවදානමක් තිබෙන බව. ඊට පස්සේ අය වැය සහන දීමනා වැඩි වුණාට ඒක පෞද්ගලික අංශයේ අයට වැඩි වෙන්නේ නැහැ. ඒක රාජ්‍ය අංශයේ අයට සහ අනෙක් අයට ලැබෙන්න පුළුවන්. නමුත් මේ අයට මූලික වැටුප වැඩි වුණොත් විතරයි ඒ වැඩිවීම සිද්ධ වෙන්නේ. ඒ නිසා මේ හරහා වැටුප් විෂමතාවක් ඇතිවීමටත් ඉඩකඩ තිබෙනවා.

මේ වෙනකොට වැටුපෙන් ජීවත් වෙන සියලු සේවකයන් තමන්ගේ දරු පවුල් ජීවත් කරවන්න ලොකු අරගලයක නිරත වෙනවා. ඉතාම අපහසුවෙන් තමයි මිනිස්සු අද ජීවත් වෙන්නේ. ඔබතුමන්ලාගේ රජය බලයට ආවේ දුප්පතාගේ හිතවතා වාගේ කටයුතු කරනවාය කියන බලාපොරොත්තුවක් දීලා. නමුත්, මේ වෙනකොට දුප්පත් ජනතාවත්, වැඩ කරන ජනතාවත්, වතුකරයේ ජනතාවත් කියන හැමෝම කබලෙන් ළිපට ඇද දැමූ ආණ්ඩුවක් විධියට තමයි අපිට මේ ආණ්ඩුව දකින්න සිදු වෙලා තිබෙන්නේ. එක මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේ, එක පැත්තකින් සොච්චමක් වැඩි කරනවා. අනෙක් පැත්තෙන් බදුවලින්, ජීවන බරින් ඒ මිනිස්සුන්ගෙන් ඒක උදුරා ගන්නවා. වැඩි වෙන පඩියට වඩා වැඩියි දිනපතා වැඩි කරන බද්ද. ඒ නිසා මිනිස්සු බොහොම අමාරුවෙන් ජීවත් වෙන්නේ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව බලයට එනකොට දීපු පොරොන්දු ගැන බැලුවොත්, පෞද්ගලික අංශයට වෙන්න පුළුවන්, රාජ්‍ය අංශයට වෙන්න පුළුවන් සමස්ත ජනතාවටම එකම විධියට බලපාන දේවල් තිබෙනවා. අපි අද කඩේකට ගිහිල්ලා බඩුවක් ගන්නකොට, හාල් ගන්නකොට, පොල් ගන්නකොට, ඉන්ධන ගන්නකොට, විදුලි බිල ගෙවනකොට පෞද්ගලික අංශයේ සේවකයාටයි, කම්කරුවාටයි, ධනපතියාටයි කියලා වෙනසක් නැහැ. ඔක්කොම එක විධියට තමයි ගෙවන්න ඕනෑ. අපට මතකයි, ඉන්ධන මිල ගැන කියපු හැටි. අද උදේ ප්‍රශ්න අහන වෙලාවේ ඒ පිළිබඳ ප්‍රශ්නයකුත් ඇහුවා. ඉන්ධන මිල වැඩි වෙලා තිබෙන්නේ කොමිස් ගහන නිසායි කිව්වා. අසීමිත බද්දක් තිබෙනවා කියලා කිව්වා. වරායට එනකොට පෙට්‍රල් ලීටරයක මිල මෙච්චරයි, තමුන්නාන්සේලා මිලදී ගන්නකොට ලීටරයක මිල මෙච්චරයි කියලා ගණන් හදලා පෙන්නුවා. ඒවා අඩු කරන්න ජන වරමක් අරගෙන තමයි තමුන්නාන්සේලා බලයට ආවේ.

ඒ වාගේම විදුලි බිල ගැන කිව්වේ කොහොමද? විදුලි බිල අඩු කරන හැටි ගණන් හදලා පෙන්නුවා. රුපියල් 9,000ක විදුලි බිලක් නම්, රුපියල් 6,000යි. රුපියල් 6,000ක විදුලි බිලක් නම්, රුපියල් 3,000යි කියලා විදුලි බිල අඩු කරන හැටි ගණන් එක්කම කිව්වා. ඒ කිව්වේ වෙන කවුරුවත් නොවෙයි, වර්තමාන මුදල් ඇමතිවරයා -ජනාධිපතිතුමා- තමයි එහෙම ප්‍රකාශ කළේ. මේවා අද හැම ජන කොටසකටම බලපානවා. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවලට VAT ගහලා තිබෙන එක ගැන කිව්වා. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවලට VAT ගහලා තිබෙන එක සම්පූර්ණයෙන් බින්දුවට බස්සනවා කිව්වා. ඖෂධවල VAT එක බින්දුවට බස්සනවා කිව්වා. පාසල් දරුවන්ගේ පොත්පත් සහ පාසල් උපකරණවල VAT එක බින්දුවට බස්සනවා කිව්වා. නමුත්, අද වෙනකොට ඒවා සම්පූර්ණයෙන් අමතක කරලා තිබෙනවා. බදු පිට බදු පනවන හැටි තමයි අද අපිට දකින්න තිබෙන්නේ. ඒ නිසා වැඩ කරන ජනතාවත්, කම්කරු ජනතාවත්, අනෙක් සියලු ජනතාවත් අද අපේක්ෂා භංගත්වයට පත්වෙලා සිටිනවා. මේ ආණ්ඩුව කටයුතු කරමින් සිටින්නේ එහෙමයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අවසාන වශයෙන්, අද ජාතික ආරක්ෂාව පිළිබඳ තිබෙන බරපතළ අර්බුදය ගැනත් මම කියන්න කැමතියි. දැන් හැම දාම සිදු වෙන සිදුවීම් තිබෙනවා. වෙඩි තැබීමක් ගැන අහන්න නොලැබෙන දවසක් නැහැ. මිනිස්සු අද පුරුදු වෙලා තිබෙනවා, අද කොහේද වෙඩි තියලා තිබෙන්නේ කියලා අහන්න. අද කොහේද ඝාතනයක් වෙලා තිබෙන්නේ, අද කොහේද වෙඩි තැබීමක් වෙලා තිබෙන්නේ කියන එක අහන්න මිනිස්සු පුරුදු වෙලා තිබෙනවා. අද ඒක දෛනික කටයුත්තක් බවට පත් වෙලා තිබෙනවා. නමුත්, මේ ආණ්ඩුව බලයට ආවේ කොහොමද? ඒවා නතර කරන හැටි, පෝය දෙකෙන් ඒවා නතර කරන හැටි කියමින්, ඒවා නිකම් simple වැඩ කියලා පෙන්වලා මහජනතාව අන්දලා තමයි බලය ගත්තේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, වැඩ කරන ජනතාවට වාගේම විශ්‍රාමිකයන්ටත් නොයෙකුත් පොරොන්දු දුන්නා. අද විශ්‍රාමිකයන් බොහෝ ප්‍රශ්නවලට මැදිහත් වෙලා තිබෙනවා. ඔවුන්ගේ වැටුප් විෂමතා තිබෙනවා. ඔවුන්ට දෙනවා කිව්ව ඒවා ලැබිලා නැහැ. අද විශ්‍රාමිකයන් තමන්ගේ විශ්‍රාම වැටුපෙන් තමයි බෙහෙත් ටික ගන්නේ, ආහාර ටික ගන්නේ. බෙහෙත් ටික ගත්තොත්, ආහාර ටික ගන්න බැරි වෙනවා. ආහාර ටික ගත්තොත්, බෙහෙත් ටික ගන්න බැරි වෙනවා. මේ දෙකම නැති වුණොත් ජීවත් වෙන්න බැරි වෙනවා. ඒ නිසා මේ කාරණා කෙරෙහි විශේෂයෙන්ම බලන්න කියලා මම ඉල්ලා සිටින්න කැමතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, රටේ ශ්‍රම බලකායෙන් විශාල පංගුවක් නියෝජනය කරන පෞද්ගලික අංශය අවම වැටුපක් ලබන අවිධිමත් අංශයේ රැකියාවල නියුතු පිරිසක්. මේ අය කාලයක සිට වෘත්තීය ජීවිතය තුළ අසාධාරණයන්ට ලක් වූ පිරිසක්. ඔවුන්ට විධිමත් වැටුප් ක්‍රමයක් නැහැ. ඔවුන්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක් ගැන ප්‍රශ්නයක් තිබෙනවා. රැකියාවේ අයිතිවාසිකම් සහ වරප්‍රසාද අහිමි වෙච්ච පිරිසක්, ඒ අය. ඒ වාගේම ඒ පිරිස වෘත්තිය තුළ ආරක්ෂණය අහිමි වූ පිරිසක්. ඒ නිසා පෞද්ගලික අංශයේ අවිධිමත් සේවාවන්වල නියුතු පිරිස ගැන, ඔවුන්ගේ සුරක්ෂිතතාව පිළිබඳව ආණ්ඩුවට විශාල වගකීමක් තිබෙනවා කියන එකත් අමතක කරන්න එපා කියලා මම මතක් කරන්න කැමැතියි.

තමුන්නාන්සේලා වතු කම්කරුවන්ට රුපියල් 1,700ක දෛනික වැටුපක් දෙන්න පොරොන්දු වුණා. තව පෝය දෙකක් යනකොට මේ ආණ්ඩුව පත් වෙලා අවුරුද්දකටත් ළං වෙනවා. නමුත් තවමත් ඒ පොරොන්දුව ඉෂ්ට කරන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා වැඩ කරන ජනතාව ගැන, කම්කරු ජනතාව ගැන, පෞද්ගලික අංශයේ සේවකයන් ගැනත් වැඩි වැඩියෙන් බලන්න කියන ඉල්ලීම කරමින්, මට කාලය ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු ඔෂානි උමංගා මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அரவிந்த செனரத் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. ARAVINDA SENARATH took the Chair.

[අ.භා. 3.04]

ගරු ඔෂානි උමංගා මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට තමයි ආණ්ඩුවක් විසින් අය වැයක් ඉදිරිපත් කළ මොහොතේ රාජ්‍ය අංශයේ වැටුප් වැඩිවීමට සමගාමීව පෞද්ගලික අංශයේ වැටුප් වැඩිවීමක් සිදු කළේ. වෘත්තීය සමිති, හාම්පුතුන් සහ ආණ්ඩුව එකඟතාවකින් සහ අවබෝධයකින් යුතුව තමයි පෞද්ගලික අංශයේ වැටුප් වැඩිකිරීම සිදු කළේ. පෞද්ගලික අංශයේ වැටුප් වැඩිකිරීම ආණ්ඩුවකට කළ හැකි දෙයක් නොවෙයි. බොහෝ අවස්ථාවල පැවතුණු ආණ්ඩු රාජ්‍ය සේවයේ වැටුප් වැඩි කිරීමත් සමඟම පෞද්ගලික අංශයෙන් ඉල්ලීමක් කරනවා, වැටුප් වැඩි කරන්න කියලා. මීට කලින් තිබුණු ආණ්ඩුවලට මේක කරන්න පුළුවන් දෙයක් වුණේ නැහැ. මොකද, මේක අනුමත කර ගන්න පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් අවශ්‍යයි. තුනෙන් දෙකක බලයක් තිබුණු ආණ්ඩු පවා මේ සඳහා උත්සාහයක් දැරුවේ නැහැ. ගොඩක් වෙලාවට ඔවුන්ට ඉල්ලීමක් කරන්න විතරයි පුළුවන් වුණේ. මාලිමා ආණ්ඩුව කියන්නේම කම්කරු පන්තිය නියෝජනය කරන දේශපාලන ව්‍යාපාරයක්. ඒ නිසා කම්කරුවාගේ ජීවිතය සම්බන්ධයෙන් රාජ්‍ය මැදිහත්වීම කම්කරු ප්‍රජාව ආරක්ෂා කිරීමක් විධියට තමයි අපි දකින්නේ. මෙවැනි වැටුප් ව්‍යුහයක් සකස් කිරීම මාලිමාවේ ආණ්ඩුවකට හැර වෙනත් කාටවත් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. අපි වැටිලා තිබෙන රටක්. මේ රට ක්‍රමානුකූලව පොහොසත් රටක් බවට පත් කරන්න තමයි මේ රටේ බහුතරයක් පුරවැසියන් අපට බලය දුන්නේ. ජනාධිපති කෙනෙක්, බහුතර බලයක් සහිත ආණ්ඩුවක් වාගේම පළාත් පාලන ආයතන බොහොමයක බලය අපට ලබා දුන්නේ ඒ සඳහායි. අපි සියලුම ක්‍රියාමාර්ග ගනු ලබන්නේ අපේ ජාතික දැක්ම ඉටු කිරීම වෙනුවෙනුයි. විශේෂයෙන් ලංකාවේ නිෂ්පාදන හා සේවා ආර්ථිකයේ විශාල පංගුවක් නියෝජනය කරන්නේ පෞද්ගලික අංශයයි. ඒකේ මහා පරිමාණ, මධ්‍ය පරිමාණ හා සුළු පරිමාණ ඇතුළත්ව විශාල ප්‍රමාණයක් නියෝජනය වෙනවා.

ඒ වාගේම, මූලික වැටුප වැඩිවීම මේ රටේ ආර්ථිකයේ ස්ථාවරත්වයට එක හේතුවක් වෙනවා කියලායි අපි දකින්නේ. මෙය ලංකාවේ නිෂ්පාදන හා සේවා ආර්ථිකයට ලැබුණු හොඳ අවස්ථාවක්. ව්‍යවසායකයින් සහ ආයතන ප්‍රධානීන් හඳුනා ගන්නවා, ඔවුන්ට මේ වැටුප ගෙවන්න වෙනවා කියලා. එතකොට ඒගොල්ලන් හැම වෙලාවේම උත්සාහ කරනවා, තමන්ගේ capacity එක වැඩි කර ගන්න. මොකද, ගෙවීමට අදාළ මුදල් ප්‍රමාණය කොච්චරද කියලා ඒගොල්ලන් දන්න නිසා ඒගොල්ලන් උත්සාහ ගන්නවා, නව ආයෝජනවලට එළඹෙන්න. ඒ වාගේම වැටුප් වැඩි වෙච්ච කෙනා තමන්ගේ රැකියාවේ සුරක්ෂිතභාවයක් ඇතිවීම සහ තමන්ගේ රැකියාව පිළිබඳ උනන්දුව වැඩිවීමත් එක්ක නිරන්තරයෙන් ඔවුන්ගේ capacity එකත් වැඩිකර ගන්නවා. ආයතන හිමිකරුවන්ගේ, ව්‍යවසායකයන්ගේ පැත්තෙන් ඔවුන්ගේ capacity එකත් වැඩි වෙන්න මේක හේතුවක් වෙනවා. මෙය, ලංකාවේ ආර්ථිකය විශාල කිරීමට අවස්ථාවක් විධියට තමයි අපි දකින්නේ. පසුගිය කාලයේ මේ රටේ තරුණයින්, "ඉන්න හිතෙන රටක්" වෙනුවට "යන්න හිතෙන රටක්" කියමින් අපේ රට ගැන සමාජ මාධ්‍යවල ඔවුන්ගේ මතය ප්‍රකාශ කරන්න පෙළඹුණා. නමුත් පසුගිය කාලයේ ඔවුන් දැවැන්ත දේශපාලන විප්ලවයක් කරලා; දේශපාලන පරිවර්තනයක් කරලා තමයි ජනාධිපතිවරයා ප්‍රමුඛ මේ ආණ්ඩුව පත්කර ගනු ලැබුවේ. ඉතින්, මේ වැටුප් වැඩිවීමත් එක්ක අලුතින් සේවයට එකතු වීමට සිටින තරුණයන්ට උනන්දුවක් ඇති වෙනවා. ඒ වාගේම අවම වැටුපක් නියෝජනය කරන මේ රටේ ආන්තික ජන කොටස්වල ETF එක, EPF එක වැඩි වෙනවා; gratuity එක වැඩි වෙනවා. ඊට අමතරව බෝනස් එකක් හිමි වෙනවා නම්, බෝනස් එකේ ප්‍රමාණයත් වැඩි වෙනවා. ඒක ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට හේතුවක් වෙනවා. අපි හදන්නේ පොහොසත් රටක් නම්, ඒ රට ඇතුළේ ජීවත් වෙන මිනිසුන්ගේ ජීවිත ලස්සන වෙන්න නම්, ඔවුන් ආර්ථික වශයෙන් ශක්තිමත් මිනිස්සු බවට පත් කළ යුතුයි. ඊට අවශ්‍ය වැඩ පිළිවෙළ තමයි අපි මේ සකස් කරමින් යන්නේ.

ආණ්ඩුව විසින් රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කර, PAYE Tax එකේ සීමාව අඩු කිරීම නිසා පෞද්ගලික අංශයේ සේවකයන්ගේ PAYE Tax එක පවා අඩු වුණා. මේ වෙනකොට උද්ධමනයත් අඩු වෙලා තිබෙනවා; රුපියල ශක්තිමත් වෙලා තිබෙනවා. අපේ ජාතික අරමුණ, ජාතික දැක්ම ඉෂ්ට කර ගැනීම වෙනුවෙන්, වැටිලා තිබෙන මේ රට ගොඩනැඟීම වෙනුවෙන් වැඩි වුණු වැටුප් සහිත සේවකයන්, කම්කරු ප්‍රජාව මේ ආණ්ඩුවත් එක්ක අත්වැල් බැඳ ගනීවි.

[ගරු ඔෂානි උමංගා මහත්මිය]

අපට මතකයි, අපි පාර්ලිමේන්තුවට ආපු මුල් කාලයේදී විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිව්වා, මේක ළදරු ආණ්ඩුවක්, ළදරු පාර්ලිමේන්තුවක් කියලා. ඉතින් ළදරු පාර්ලිමේන්තුවේ, ළදරු අය වැය මඟින් මේ රටේ ජන ජීවිත සුව පහසු ජීවිත බවට පත් කරන්න කටයුතු කරලා තිබෙනවා. ඉදිරි අවුරුදු කිහිපය තුළ අපට පුළුවන් වේවි, අපි බලාපොරොත්තු වෙන ඒ පොහොසත් රට ගොඩනඟන්න අවශ්‍ය සියලුම වැඩ පිළිවෙළ සකස් කරගෙන ඒ වෙනුවෙන් වැඩ කටයුතු කරන්න.

මේ වෙලාවේ මම කියන්න කැමැතියි, ලංකාව තුළ සෘජු විදෙස් ආයෝජන ප්‍රමාණය පසුගිය අවුරුද්දට සාපේක්ෂව දෙගුණයකින් වර්ධනය වෙලා තිබෙන බව. මේ මාස හයට ව්‍යාපෘති 57කට BoI approval එක ලැබී තිබෙනවා. මේ ව්‍යාපෘති ලංකාවට පැමිණීමත් සමඟම පෞද්ගලික අංශයේ රැකියා ප්‍රමාණය 14,000කින් විතර වර්ධනය වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට නියමිත කාලය අවසන්.

ගරු ඔෂානි උමංගා මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ව්‍යාපාර හිමි හාම්පුතුන් කැමැති වෙලා තිබෙනවා, මේ වැටුප් වැඩි කිරීමට. නමුත්, ආණ්ඩුවේ මේ ඉදිරිගාමී වැඩ පිළිවෙළට ආශිර්වාදයක් වෙනවා වෙනුවට සමහර පුංචි කණ්ඩායම් පසුගාමී අදහස් දරමින් ආණ්ඩුව ගෙන යන ක්‍රියාදාමය කඩාකප්පල් කරන්න වැඩ කළාට, අපට කියන්න තිබෙන්නේ ඔබට කවදාවත් අපි යන මේ ගමන කඩාකප්පල් කරන්න බැහැ, අපි මේ රට පොහොසත් රටක් බවට පත් කරලා මේ රටේ පුරවැසියන් සියලුදෙනාගේම ජීවිත ලස්සන ජීවිත බවට පත් කරන්න මේ රටේ රාජ්‍ය නිලධාරීන් සමඟ එකතු වෙලා වැඩ කටයුතු කරනවා කියන එකයි.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු අටක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.11]

ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்றையதினம் இச்சபையில் வேலையாளர்களின் தேசிய குறைந்தபட்ச வேதனம் (திருத்தம்) சட்டமூலம் தொடர்பாக விவாதிக்கப்படுகின்றது. கௌரவ இராதாகிருஷ்ணன் அவர்கள் இச்சட்டமூலத்துக்குத் திருத்தம் ஒன்றைக் கொண்டுவந்து இருக்கிறார். அது பின்வருமாறு:

"2(2) எவ்வாறாயினும், தோட்டத் தொழிலாளர்களின் வேதனம்தொடர்பில் மேற்குறிப்பிட்ட திருத்தத்தில் குறிப்பிடப் பட்டுள்ள குறைந்தபட்ச வேதனம் நாளொன்றுக்கு ஆயிரத்து எழுநூறு ரூபாய் அல்லது அதற்கு நேரொத்த மாதாந்த வேதனமாக இருத்தல் வேண்டும்."

மேற்படி திருத்தத்தைச் சட்டமூலத்தில் சேர்த்துக்கொள்ள வேண்டுமெனக் கேட்டுக்கொண்டு, இன்றைய விவாதத் தலைப்புக்கு அப்பாற்பட்ட ஒரு விடயத்தைக் கூறலாமென நினைக்கின்றேன். இது யூலை மாதம்! வெலிக்கடைச் சிறைச்சாலையில் தமிழ் அரசியல் கைதிகள் படுகொலை செய்யப்பட்ட மாதம்! அது தொடர்பில் இந்த அரசாங்கம் விசாரணை செய்ய வேண்டுமெனக் கேட்டுக்கொண்டு, அந்த விடயம் சம்பந்தமாக சில கருத்துகளைச் சொல்லலாமென விழைகின்றேன்.

தமிழ் இனத்தின் விடுதலைக்காக, உரிமைக்காக முதன்முதலில் ஆயுதம் எடுத்துப் போராடிய தலைவர் தங்கத்துரை, தளபதி குட்டிமணி போன்றோர் பருத்தித்துறை மணற்காடு கடற்கரையில் வைத்து 1981ஆம் ஆண்டு சித்திரை மாதம் 05ஆம் திகதி இலங்கை கடற்படையினரால் கைது செய்யப்பட்டார்கள். 1983ஆம் ஆண்டு யூலை மாதம் 25ஆம், 27ஆம் திகதிகளில் தமிழ் அரசியல் கைதிகள் மற்றும் பொதுமக்களென மொத்தம் 53 பேர் கொடூரமாகச் சிங்களக் காடையர்களால் கொல்லப்பட்டார்கள். இதற்கு பொலிஸார், சிறைக்காவல் அதிகாரிகள் எனப் பலரும் உடந்தையாக இருந்தார்கள். குட்டிமணி உட்பட பலரின் கண்கள் பிடுங்கி எடுக்கப்பட்டன. இரண்டு நாட்களாக இந்தப் படுகொலைகள் நடைபெற்றுக்கொண்டிருந்த சூழலில், தலைவர் தங்கத்துரை, தளபதி குட்டிமணி, ஜெகன், நடேசதாசன், தேவன், சிவபாதம், சிறிக்குமார், மரியாம்பிள்ளை, குமார், குமாரகுலசிங்கம், வைத்தியர் ராஜசுந்தரம் உட்பட 53 பேர் படுகொலை செய்யப்பட்டார்கள். 1982இல் குட்டிமணி வட்டுக்கோட்டைத் தொகுதிக்குரிய நியமன MPஆக பெயர் குறிப்பிடப்பட்டார். எனினும், அந்தச் சமயத்தில் சிறைச்சாலை ஆணையாளர் அவரை விடுதலை செய்யவில்லை என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். இந்தத் தருணத்தில், எங்களுடைய தலைவர் தங்கத்துரை, தளபதி குட்டிமணி ஆகியோர் நீதிமன்றில் சொன்ன விடயங்களை நான் இங்கு குறிப்பிட லாமென நினைக்கின்றேன்.

"நாம் வன்முறைமீது காதல் கொண்டவர்களோ, மனநோயாளிகளோ அல்லர்; உரிமை மறுக்கப்பட்ட ஓர் இனத்தின் விடுதலைக்காகப் போராடும் உண்மையான போராளிகள்!" இது எங்களுடைய தமிழீழ விடுதலை இயக்கத்தின் ஸ்தாபகரும் தலைவருமான தங்கத்துரை அவர்கள் சொன்ன விடயம்! தளபதி குட்டிமணி அவர்கள், "ஒரு குட்டிமணியைத் தூக்கில் போடுவதன்மூலம் ஆயிரமாயிரம் குட்டிமணிகள் உருவாகுவார்கள்; உங்களால் அதைத் தடுக்க முடியாது" என்று சொன்னார். அவருடைய கூற்றுப்படியே 1983இல் எங்களுடைய இளைஞர், யுவதிகள் ஆயுதப் போராட்டத்தை ஆதரித்துக் களமிறங்கினார்கள்.

1983ஆம் ஆண்டில் இடம்பெற்ற கறுப்பு யூலை கலவரத்தின்போது, 2,000 தமிழர்கள் கொலை செய்யப் பட்டார்கள்; கொழும்பில் 4,000க்கும் மேற்பட்ட தமிழர்களின் கடைகள் அழிக்கப்பட்டன. அது ஒரு திட்டமிட்ட இனப் படுகொலையாகும். தமிழீழ விடுதலை இயக்கமானது, இந்த மாதத்தை தமிழ்த் தேசிய வீரர்கள் மாதமாகப் பிரகடனப்படுத்தி, அதை நினைவுகூருகிறது. மேற்குறிப்பிட்ட நிகழ்வு தொடர்பில் இந்த அரசாங்கம் உடனடியாக

விசாரணைகளை மேற்கொள்ள வேண்டும். இந்த நிகழ்வு வெலிக்கடைச் சிறைச்சாலையிலே நடந்தது. கண்கள் பிடுங்கப்பட்டும், சித்திரவதை செய்யப்பட்டும் அவர்கள் படுகொலை செய்யப்பட்டார்கள். அவர்கள் எங்கே புதைக்கப் பட்டார்கள் என்பதை அறிய முடியவில்லை. உயிர்த்த ஞாயிறு தின தாக்குதல் உட்பட பல கொலைகளை விசாரணை செய்ய முற்படுகின்ற இந்த அரசாங்கம், ஜே. ஆர். ஜயவர்த்தன அவர்களுடைய ஆட்சிக் காலத்தில் வெலிக்கடைச் சிறைச்சாலையில் நடந்த இப்படுகொலை தொடர்பிலும் விசாரணைகளை மேற்கொள்ள வேண்டுமென நான் இச்சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று மன்னார் மாவட்டத்தின் பேசாலையை அண்டியுள்ள கிராமங்களிலுள்ள மக்கள் அச்சத்தில் இருக்கிறார்கள். இரண்டு விடயங்கள் சார்ந்த பிரச்சினைகள் காரணமாகவே அந்த மக்கள் அப்படி அச்சத்தில் இருக்கிறார்கள். ஒன்று, கனிய மணல் அகழ்வு. அடுத்தது, காற்றாலை மின் உற்பத்தி. பேசாலை உட்பட பல கிராமங்களில் கனிய மணல் அகழ்வுக்காக யார் வருகிறார்கள், யார் போகிறார்கள் என்பதை அறிய முடியாமல் இருக்கின்றது. குறிப்பாக, இல்மனைட் அகழ்வுக்காக அடிக்கடி யார் யாரோ எல்லாம் வருகின்றார்கள். மக்கள் அதை எதிர்க்கின்றார்கள். எனினும், அங்கு வந்து அவர்கள் செயற்படுகின்ற நிலையை நாங்கள் காண்கின்றோம். மேலும், காற்றாலை மின் உற்பத்தி நடவடிக்கையால் மன்னார் நகரம் பாதிக்கப்படுகின்ற சூழல் காணப்படுகின்றது. எனவே, சம்பந்தப்பட்ட அமைச்சர்கள் அங்கு சென்று, அம்மக்களுடன் உரையாட வேண்டும். அந்த வகையில், அவர்களுடைய பிரச்சினைகளைத் தீர விசாரித்து ஒரு முடிவுக்கு வருவதுதான் சாலச் சிறந்தது. அவ்வாறில்லாமல், வெளியார் அங்கு மணல் அகழ்வுக்கும் காற்றாலை மின் உற்பத்தி நடவடிக்கைக்கும் வந்தால், மக்களோடு பிரச்சினைப்படுகின்ற, முரண்படுகின்ற ஒரு துர்ப்பாக்கிய நிலைமைதான் ஏற்படும் என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன்.

மன்னாரில் கடல் மட்டமும் நில மட்டமும் சமமாக இருக்கின்றது. மாண்புமிகு சனாதிபதி அவர்கள் அல்லது விடயத்துக்குப் பொறுப்பான அமைச்சர்கள் அந்தப் பிரதேசத்தைச் சேர்ந்த மக்கள் பிரதிநிதிகளிடமும் தலைவர் களிடமும் பிரச்சினைகள் தொடர்பில் ஆராய்ந்து, உரிய நடவடிக்கைகளை மேற்கொள்வதன் ஊடாகத்தான் இப்பிரச்சினைகளைத் தீர்க்க முடியும். திடீர் திடீரென்று யார் யாரோ அங்கு களமிறங்குவதால், எங்களுடைய மக்கள் அச்சமடைகிறார்கள். அவர்கள் காலையில் வந்தாலும் சரி அல்லது மாலையில் வந்தாலும் சரி, எங்களுடைய மக்கள் ஓடவேண்டி இருக்கின்றது. எங்களுடைய பிரச்சினைகளை எங்களால் தீர்க்க முடியாமல் இருக்கின்றது. எங்களுடைய மக்களால் தங்களுடைய அன்றாட நடவடிக்கைகளை மேற்கொள்ள முடியாமல் இருக்கின்றது. எனவே, இந்த இரண்டு பிரச்சினைகளையும் தீர்ப்பதற்கு அரசாங்கம் உடனடியாக நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். அரசாங்கம் இதைச் செய்யச் சொல்லிவிட்டுப் பேசாமல் இருக்கிறதா? அல்லது அரசாங்கத்துக்குத் தெரியாமல் அவர்கள் வருகின்றார்களா? என்ற கேள்விகள் எங்களுக்குள் எழுகின்றன.

நாங்கள் இது பற்றி அரசாங்க அதிபருடன் பேசினோம். அவரும் பிரச்சினைக்கு மத்தியில் இருக்கிறார். இதை எப்படி நிறுத்துவதென்று தெரியாமல் அவர் இருக்கிறார். அரசாங்கம் எடுக்கின்ற முடிவின் பிரகாரம், இதை எப்படி அரசாங்க அதிபர் தடுத்து நிறுத்த முடியும் என்ற நிலை அங்கு காணப்படுகின்றது. எனவே, அரசாங்கத்தின் முக்கிய அமைச்சர்கள் அங்கு வந்து, அங்குள்ள மக்கள் பிரதிநிதிகளோடு பேசி, இந்தப் பிரச்சினை களுக்கு முற்றுப்புள்ளி வைக்க வேண்டுமென நாங்கள் கேட்டுக் கொள்கின்றோம். காற்றாலை மின் உற்பத்தியையும் இல்மனைட் அகழ்வையும் உடனடியாக நிறுத்துவதற்குரிய நடவடிக்கைகளை மேற்கொள்வதற்காக பேசாலை கிராம மக்கள் அரசாங்கத்தோடு பேசுவதற்குத் தயாராக இருக்கிறார்கள். இந்த நடவடிக்கைகள் நிறுத்தப்படாவிட்டால், அங்கு அந்நடவடிக்கைகளுக்காக வருபவர்களோடு பிரச்சினை ஏற்படும். அதனைத் தடுக்கும்போது, மக்கள் அவர்களை என்ன செய்வார்கள் என்று தெரியாது. எனவே, இப்பிரச்சினை களுக்கு முற்றுப்புள்ளி வைப்பதற்கான நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமெனக் கேட்டு விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.21]

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද අපේ විවාදයට ලක් වන පනත් කෙටුම්පත් තුනක් තිබෙනවා. ඒවා තමයි, සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත, සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන) පනත් කෙටුම්පත සහ සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත් කෙටුම්පත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට, අද මේ විවාදයට ගැනෙන පනත් කෙටුම්පත් තුන ගත්තාම, විශේෂයෙන්ම සේවකයන්ගේ අය වැය සහන දීමනාව සම්බන්ධ පනත් කෙටුම්පත් දෙක අද පාර්ලිමේන්තුවේදී තුනෙන් දෙකක බහුතරයකින් සම්මත වීමේ අවශ්‍යතාවක් පවතිනවා. ඒ අවශ්‍යතාව මතු වන්නේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දී ඇති තීන්දුවේ ප්‍රතිඵලයක් ලෙසයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තීරණය සහ මේ තුනෙන් දෙකක බහුතරයකින් සම්මත වීමේ අවශ්‍යතාව මතු වෙන්නේ ඇයි කියන එක මේ විවාදය බලන සහ මේක අහගෙන ඉන්න පොදු ජනතාව දැනගැනීම වැදගත් කියලා මම හිතනවා. මොකද, එහෙම නැත්නම් අපි අවකාශයක් සකස් කරනවා, මෙවැනි යහපත් නීති ප්‍රතිසංස්කරණයක්; කම්කරුවන්ගේ අවම වැටුප්, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප් ඉහළ දමන නීති ප්‍රතිසංස්කරණයක් වුණත් ප්‍රහාරයට ලක් කිරීමට, අපවාදයට ලක් කිරීමට සූදානම් කණ්ඩායම්වලට. එවැනි කණ්ඩායම් විපක්ෂය තුළත්, අපේ පාර්ලිමේන්තුව තුළත්, එළියේත් ඉන්නවා. මොකද, නැත්නම් මේ පනත් කෙටුම්පත් දෙක තුනෙන් දෙකක බහුතරයකින් සම්මත වීමට අවශ්‍ය පදනම වෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දී තිබෙන නියෝගය; තීන්දුව. ඒ කියන්නේ, 2005 අංක 36 දරන සේවකයන්ගේ අය වැය සහන දීමනා (සංශෝධන) පනත සහ 2016 අංක 4 දරන සේවකයන්ගේ අය වැය සහන දීමනාව (සංශෝධන) පනත මඟින් ලබා දී තිබුණු රුපියල් 3,500ක අය වැය සහන දීමනාව මෙම සංශෝධන යටතේ ඉවත් කරනවා, ඒ ඉවත් කිරීම නිසා දැනට කම්කරු ජනතාව විසින් භුක්ති විඳින යම් අයිතිවාසිකමක් ඔවුන්ට අහිමි වෙනවා කියන පදනම මත තමයි ශ්‍රේෂ්ඨාධිකරණයේදී මේ

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

පනත් කෙටුම්පත අභියෝගයට ලක් කරමින් පෙත්සමක් ගොනු කර තිබෙන්නේ. මේ පනත් කෙටුම්පත සම්බන්ධ තීන්දුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් බොහොම පැහැදිලිව ප්‍රකාශ කර සිටිනවා, මේ පනත් කෙටුම්පත මඟින් මේක අහිමි කර තිබෙන බව ඇත්ත කියලා. ඒ කියන්නේ දැනට අපි ගෙනැල්ලා තිබෙන සේවකයන්ගේ අය වැය සහන දීමනා සම්බන්ධ සංශෝධන පනත් කෙටුම්පත් දෙක මඟින් ඉස්සෙල්ලා 2005දී සහ 2016දී ලබා දී තිබුණු අය වැය සහන දීමනාව ඉවත් කරන බව ඇත්ත. නමුත් අවම වැටුප් සංශෝධනය මඟින් ඒ අය වැය සහන දීමනාව එතැනින් ඉවත් වුණාට සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත මඟින් ඒ අය වැය සහන දීමනාව නැවත වැටුපට අවශෝෂණය කරනවා. මේකෙන් අය වැය සහන දීමනාවට කප්පාදුවක් සිද්ධ කරන්නේ නැහැ. ඒක දැනට තිබෙන වැටුපට අවශෝෂණය කිරීමක් තමයි සිද්ධ කරන්නේ. ඒ නිසා මුලින්ම සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත වෙනවා නම් මේ පනත් කෙටුම්පත් දෙක තුනෙන් දෙකේ බහුතරයකින් සම්මත වීමේ අවශ්‍යතාවක් නැහැ. ඒ කියන්නේ, ඒ අවශෝෂණය වීම මුලින් සිද්ධ වුණොත්, අය වැය සහන දීමනා සම්බන්ධ සංශෝධන පනත් කෙටුම්පත් දෙක තුනෙන් දෙකේ බහුතරයකින් සම්මත වීමේ අවශ්‍යතාවක් නැහැ කියන කාරණය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පාර්ලිමේන්තුවට දැනුම් දී තිබෙනවා.

මෙතැනදී මේ පනත් කෙටුම්පත් තුනම අද සම්මත වෙන නිසා තමයි අපිට සිද්ධ වෙන්නේ තුනෙන් දෙකක බහුතරයකින් මේ සේවකයන්ගේ අය වැය සහන දීමනා සම්බන්ධ පනත් සංශෝධනය සිද්ධ කරන්න. එහෙම නැතුව මේ සංශෝධන තුළින් කිසිම සේවකයෙකුගේ අයිතිවාසිකම් කප්පාදුවක් හෝ වැටුප් කප්පාදුවක් සිද්ධ වන බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දු කරලා නැහැ. මොකද, මේ පනත් කෙටුම්පත් තුන එකට තමයි කියවන්නට අවශ්‍ය. අද මේ ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත් තුන එකට කියවන්නට අවශ්‍යයි. නමුත් මේ පෙත්සම්කරුවන් විසින් පනත් කෙටුම්පත් දෙකක් සම්බන්ධයෙන් විතරක් ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සම් ගොනු කර තිබෙන නිසා ඒ පනත් කෙටුම්පත් දෙක සම්බන්ධයෙන් පමණක් ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් ලබා දීලා තිබෙනවා. මේ නිසා අපේ පොදු මහ ජනතාවට පැහැදිලි වෙන්න ඕනෑ, තුනෙන් දෙකේ බහුතරයකින් මේක අද සම්මත වෙන්නේ ඇයි කියාත්, ඒ තුළින් ව්‍යවස්ථානුකූලව ඔවුන්ට තිබෙන අයිතියක් කප්පාදු නොවන බවත්. අද සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කරලා, ලබන මාසයේ සේවකයන්ගේ අය වැය සහන දීමනා සම්බන්ධ සංශෝධන පනත් කෙටුම්පත් දෙක සම්මත කළා නම් මේ තුනෙන් දෙකක බහුතරය අවශ්‍ය වෙන්නේ නැහැ. නමුත් අද මේ පනත් කෙටුම්පත් තුනම එකවර සම්මත වන නිසා අපට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයක් අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ නිසා තමයි මේ තුනෙන් දෙකේ බලය අද පාවිච්චි කරන්නේ, මේ පනත් සම්මත කිරීම සඳහා. ඒක සේවකයින්ගේ අවම වැටුප් වැඩි කිරීම සඳහා යොදා ගන්නා බලයක් මිසක සේවකයින්ගේ වැටුප් කප්පාදුවක් සඳහා යොදා ගන්නා බලයක් නොවෙයි කියන එක මුලින්ම මම පැහැදිලි කරන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි තේරුම් ගන්නට අවශ්‍යයි මේ පනත්වල කාල රාමුව ඉතාම වැදගත් කියන එක. මොකද, අපේ රටේ අවම වැටුප් සම්බන්ධයෙන් පනතක් තිබුණේ නැහැ, 2016 වර්ෂය වෙනකම්. අපි දන්නවා, ලංකාවේ රාජ්‍ය අංශයේ සේවකයින්ට රජය මැදිහත් වෙලා පඩි වැඩි කරන බව. නමුත්, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුපවත් තීරණය කර ගැනීම සඳහා 2016 වෙනකම් පනතක් -නීත්‍යානුකූල රාමුවක්- තිබුණේ නැහැ. අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ, ඒ කාලයේ රජය මේ නීති රාමුව අපේ රටට හඳුන්වා දී තිබීම ගැන. ඒක තමයි, සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත. නමුත් ඊට පෙර 2005 වර්ෂයේදී අය වැය සහන දීමනාවක් ලෙස ගෙනාපු නීතියක් හැටියට කම්කරුවන්ගේ වැටුප වැඩි කළා. එහිම කොටසක් හැටියට තමයි 2016දී නැවත මේ අය වැය සහන දීමනාව මඟින් පෞද්ගලික අංශයේ කම්කරුවන්ගේ වැටුප වැඩි වෙන්නේ. ඒ කියන්නේ, අවම වැටුප් නීති රාමුවක් රහිත කාලයකදී ගත්ත ප්‍රතිපත්ති තීන්දුවක් තමයි මේ අය වැය සහන දීමනාව. ඒක පළමුවෙනි කාරණය. මේ අය වැය සහන දීමනාව අදාළ වෙන්නේ රුපියල් 40,000ට අඩුවෙන් වැටුප් ලබන සේවකයන්ටයි. අපි ක්‍රමිකව අවම වැටුප් නීති රාමුවකට යමින් තිබියදී, අවම වැටුප වැඩි කරන හැම අවස්ථාවකදීම ඒ අවම වැටුපට උඩින් අය වැය සහන දීමනාව තියනවා. ඒ කියන්නේ, රුපියල් 3,000කින් වැඩි කළොත් ඒක රුපියල් 21,500ක් වෙනවා. මොකද, ඒකට රුපියල් 3,500ක් එකතු වෙනවා අය වැය සහන දීමනාව හැටියට. මේක තමයි තිබුණු නීති රාමුව. අවම වැටුප වැඩි කරනවා. ඒකට අය වැය සහන දීමනාව එකතු වෙනවා. අපි මේ අය වැය සහන දීමනාව අවශෝෂණය කරන්නේ නැතුව අවම වැටුප වැඩි කළා නම්, රුපියල් 27,000ට අවම වැටුප වැඩි කරද්දී තවත් රුපියල් 3,500ක් එකතු වෙලා රුපියල් 30,500ක් දක්වා මේ වර්ෂයේදී වැටුප් වැඩි වෙනවා.

කම්කරුවන්ගේ පැත්තෙන් ගත්තොත්, පෞද්ගලික අංශයේ සේවකයන් පැත්තෙන් ගත්තොත් අවම වැටුප් වැඩි වීම කියන එක අපි හැමෝම කැමැති දෙයක්. මම පුද්ගලික අංශයේ සේවකයන් වෙනුවෙන් බොහෝ කාලයක් වැඩ කරලා තිබෙන නීතිඥවරියක්. මම දන්නවා, ඔවුන්ට ඒ සම්බන්ධයෙන් තිබෙන අවශ්‍යතාව. අපි හැමෝම කැමැතියි, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප වැඩි කරන්නට. ඒකට නීතිමය මැදිහත් වීමක් රජය පළමුවැනි අය වැයෙන්ම කරන්නෙත් ඒ අවශ්‍යතාව නිසාමයි. මේක අවම වැටුපට අදාළ පනතක් නිසා මහා පරිමාණ කර්මාන්තවලට විතරක් නොවෙයි, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලටත්, අපි මේ දකින එදිනෙදා තිබෙන අවිධිමත් කර්මාන්තවලටත් මේ වැටුප් සංශෝධනය එලෙසම ක්‍රියාත්මක වෙනවා. එතකොට අපි හැමෝටම ඒක පිළිගන්න පුළුවන්. අපේ රටේ සමහර කර්මාන්ත තිබෙනවා, ඒවා රුපියල් 27,000ට, 30,000ට වඩා වැටුප් ගෙවන්න ඕනෑ. ඒ වාගේම සමහර කර්මාන්ත තිබෙනවා,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, කාලය අවසන්.

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මට තව සුළු වේලාවක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

සමහර කර්මාන්ත තිබෙනවා, මෙවැනි වැටුප් වැඩි කිරීමක් එකවර දරා ගන්නට නොහැකි. ඒ දෙපැත්තම බලලා තමයි මේ වැටුප් වැඩි කිරීම සිදු කරන්න ඕනෑ. සේවකයන්ට ජනවාරි මාසය වෙනකොට අවම වැටුප රුපියල් 30,000 දක්වා වැඩි වෙනවා. නමුත් ඒක ක්‍රමිකව අපේ කර්මාන්තවලට දරාගත හැකි ආකාරයට කරන්න ඕනෑ. ඒ නිසා තමයි අය වැය සහන දීමනාව අවශෝෂණය කරමින් මේ නීති සම්පාදනය කරන්නේ. අපි ඒක කප්පාදු කරන්නේ නැහැ. දැනට ලැබෙන අය වැය සහන දීමනාව හැම සේවකයකුටම ඉදිරියේදී ලැබෙනවා.

ගරු ඇමතිතුමාට යෝජනාවක් කරමින් මගේ කථාව අවසන් කරන්නම්. ලංකාවේ පෞද්ගලික අංශයේ කම්කරුවන්ගේ වැටුප්

වැඩි කිරීම සඳහා යම්කිසි නිත්‍ය ක්‍රමයක් අවශ්‍යයි. නීති සම්පාදනය මඟින්ම වැටුප් වැඩි කරනවා වෙනුවට යම්කිසි ක්‍රමයක් මඟින්, periodically review වෙන ක්‍රමයක් මඟින් වැටුප් වැඩි කරන්න පුළුවන් නම් හොඳයි. එතකොට මේ ප්‍රශ්න ගොඩක් විසඳෙනවා. ඒ සඳහාත් ඇමතිවරයාගේ අවධානය යොමු වෙයි කියලා බලාපොරොත්තු වෙමින් මම කථාව අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි මේ කාලය ලබා දුන්නාට.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.30]

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධනය) පනත් කෙටුම්පත ද ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ ඒ පිළිබඳව අදහස් කිහිපයක් දක්වන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් මේ සේවකයන්ගේ ජාතික අවම වැටුප වූ රුපියල් 21,000 ලබන වසරේ ජනවාරි මාසයේ සිට රුපියල් 30,000 දක්වා වැඩි කරන්න ගත්තා වූ තීරණය ගැන අපි සතුටු වෙනවා. ඒ වාගේම ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. නමුත්, මෙතැනදී අපට මතු වෙලා තිබෙන ප්‍රශ්නය මෙයයි. රජයේ සේවකයන්ගේ පැත්තෙන් ගත්තත්, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ පැත්තෙන් ගත්තත් මා දන්නා තරමින් හැම කෙනාම දෛනිකව රුපියල් 1,200ට වැඩි අවම වැටුපක් ලබනවා. ඒ වාගේම ජාතික අවම වේතනය රුපියල් 21,000 වුණත්, ඊට වඩා වැටුපක් අපි හැම කෙනාම මේ වෙනකොට ලබා ගන්නවා කියන එක අපි කවුරුත් දන්නා කාරණයක්. නමුත් වතු කම්කරු ජනතාවගේ පැත්තෙන් ගත්තොත්, මෙතැනදී පොඩි අසාධාරණයක් වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

වතු කම්කරු ජනතාවට රුපියල් 1,350ක අවම වේතනයක් ලබා දෙන්න කටයුතු කළා වුණත්, අද ඒක ප්‍රමාණවත් වෙලා නැහැ. අපි දන්නා තරමින් වතු කම්කරුවනුත් ඒ වාගේම වෘත්තීය සමිති නායකයනුත් නිරන්තරයෙන් ඒ ගැන අදහස් දක්වලා වතු කම්කරුවන් කරන සේවයට සරිලන වැටුපක් සකස් කර දෙන්න, එහෙම නැත්නම් වැටුප වැඩි කර දෙන්න කියලා නිරන්තරයෙන් ඉල්ලීම් කෙරුවා. අපට මතකයි, ජනාධිපතිවරණය වෙලාවේත්, ඒ වාගේම පාර්ලිමේන්තු මැතිවරණය වෙලාවේත් විශේෂයෙන් වර්තමාන ජනාධිපතිතුමාත් ඒ වාගේම වෘත්තීය සමිතිත්, තමුන්නාන්සේලාගේ නායකයෝ හැමදෙනාමත් එදා වතු කම්කරු ජනතාවට පොරොන්දු වුණේ අනිවාර්යයෙන්ම දෛනික වැටුප රුපියල් 1,700ක් කරනවා කියලායි. මේ රජය බලයට ඇවිල්ලා දැන් අවුරුද්දකට කිට්ටු කාලයක් ගත වෙලා තිබෙනවා. නමුත් තවම වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1,700ක තියන්න අඩුම තරමින් සමාගම් එක්ක සාකච්ඡා කරන්නවත් වැඩ පිළිවෙළක් සකස් කරලා නැහැ කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

එදා වතු කම්කරු ජනතාවට පොරොන්දු රාශියක් දුන්නා. එදා කිව්වේ මොකක්ද? "අවුරුදු ගණනාවක් තිස්සේ මේ හිටපු මැති ඇමතිවරු ඒ වාගේම නායකයෝ මේ වතු කම්කරු ජනතාව ගැන බැලුවේ නැහැ. ඒ වාගේම ඒ අයගේ නිවාස ප්‍රශ්නය ගැන බැලුවේ නැහැ. ඒ අයගේ අවම අවශ්‍යතා සම්බන්ධයෙන් කිසිම සොයා බැලීමක් කරන්නේ නැතුව අද වතු කම්කරු ජනතාව ඉතාම දුක්ඛිත ජීවිතයක් ගත කරනවා" කියන එක තමයි දැන් මේ ඉන්න මැති-ඇමතිවරු එදා ඡන්දය කාලයේ ප්‍රකාශ කෙරුවේ.

නමුත් අද වෙනකොට වතු කම්කරු වැටුප කෙසේ වෙතත්, තමුන්නාන්සේලා පොරොන්දු වෙච්ච නිවාස ප්‍රශ්නය විසඳන්න, යටිතල පහසුකම් ප්‍රශ්නය විසඳන්න, මේ කිසිම දෙයක් සම්බන්ධව අඩුම තරමින් මේ වෙනකම් සාකච්ඡාවක්වත් සිද්ධ වෙලා නැහැ කියන එක මම මතක් කරන්න ඕනෑ. එදා තමුන්නාන්සේලා වතු කම්කරු ජනතාව වෙනුවෙන් පෙනී සිටියා. නමුත්, දැන් තමුන්නාන්සේලා බලයට ඇවිල්ලා වසරකට ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා. එම නිසා මේ යෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේදී මම ඉල්ලා සිටින්න කැමැතියි, අනිවාර්යයෙන්ම වතු කම්කරුවකුගේ දෛනික වැටුප රුපියල් 1,700 කිරීමේ ක්‍රියාදාමයට අවතීර්ණ වෙන්න කියලා. ඔබතුමන්ලා ඒ සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියාත්මක වෙන්න. ජනාධිපතිතුමාත් අය වැයේදී යෝජනා කර තිබුණා, අනිවාර්යයෙන්ම වතු කම්කරුවකුගේ දෛනික වැටුප රුපියල් 1,700 කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කරනවා කියලා. අඩුම තරමේ මම ඉල්ලා සිටිනවා, එළැඹෙන අය වැයේදීවත් වැවිලි සමාගම් එක්ක සාකච්ඡා කරලා ඒකට යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා.

අනෙක් පැත්තෙන් වතු කම්කරුවන් සම්බන්ධ වෙලා ඉන්න ප්‍රධාන වැවිලි ක්ෂේත්‍රයක් තමයි තේ කර්මාන්තය. මම දන්නා තරමින් තේ කර්මාන්තයත් මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න, මේ රටට විදේශ විනිමය ගේන්න විශාල දායකත්වයක් ලබා දෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් කියන්න කනගාටුයි; අද තිබෙන තත්ත්වයත් එක්ක තේ කර්මාන්තය ඉතාමත් කනගාටුදායක ලෙස කඩා වැටෙමින් පවතිනවා. අද කුඩා තේ වතු හිමියන් ඉතාමත් අසරණ තත්ත්වයට පත්වෙලා ඉන්නවා. අපි දන්නා තරමින් කුඩා තේ වතු හිමියන් තමයි මේ රටේ තේ අපනයනයට සියයට 75ක පමණ දායකත්වයක් දරන්නේ. ඒ සියයට 75ක පමණ දායකත්වයක් දරන කුඩා තේ වතු හිමියන් අද වන විට අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි ඉතිරිව තිබෙන්නේ.

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම කාලයට අමතරව මට තවත් විනාඩි දෙකක කාලයක් වැඩිපුර ලබා දෙන්න.

මේ වෙලාවේදීත් කුඩා තේ වතු හිමියන් අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා. මොකද, ඒ අයගේ තේ දලුවලට අවශ්‍ය කරන මිල ලබා ගන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. අද තේ දලු කිලෝග්‍රෑම් එකකට රුපියල් 150යි, 160යි ලැබෙන්නේ. මම දන්නා තරමින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මේ සම්බන්ධයෙන් මැදිහත්වීමක් කරලා නැහැ. ඒ වාගේම, එම ගොවීන්ට අස්වැන්න වැඩි කර ගන්න ක්‍රමයක් නැහැ. අපි දන්නා තරමින් පසුගිය ආණ්ඩුවෙන් ගත්ත වැරදි තීරණ නිසා කලට වේලාවට පොහොර ටික ලබා ගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ නිසාත් අස්වැන්න පහළට ගිහිල්ලා තිබෙනවා. ඒ

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

වාගේම, දැන් වෙනකොට මේ ගොවීන්ට පොහොර මිටියක් ලබා ගන්න බැහැ. අද පොහොර මිටියක මිල රුපියල් 10,000යි, 11,000යි. මේ සම්බන්ධයෙන් අපි ඔබතුමන්ලාට නිරන්තරයෙන්ම කිව්වා. ඔබතුමන්ලා අවස්ථා ගණනාවකදීම පොරොන්දු වුණා, කුඩා තේ වතු හිමියන්ට සහන මිලට පොහොර ටික ලබා දෙනවා කියලා. නමුත්, අද වෙනකම් ඒ දේ කරන්න කටයුතු කරලා නැහැ. අපි දන්නා තරමින් ලක්ෂ 20ක විතර විශාල පිරිසක් මේ වගා සම්බන්ධයෙන් ඍජු ලෙස හා අනියම් ආකාරයෙන් දායකත්වය දරනවා. ඒ වාගේම, විදේශ විනිමය පැත්තෙන් විශාල ආයෝජනයක් එන්න තිබෙන අවස්ථාවක්. එම නිසා මම ඉල්ලා සිටින්නේ ඔබතුමන්ලා මේ සම්බන්ධයෙන් සොයා බලන්න කියලායි.

ඒ වාගේම ආයෝජකයින් ගැනත් ඔබතුමන්ලා හුඟාක් අවස්ථාවලදී කථා කෙරුවා. අපට දැනගන්න තිබෙන ආකාරයට මේ වෙනකම් අපේ රටේ සංවර්ධනයට, අපේ රටේ ආර්ථිකයට දායකත්වය දෙන්න පැහැදිලි ආයෝජකයෙක් ඇවිල්ලා නැහැ. පසුගිය ආණ්ඩු කාලයේ තමුන්නාන්සේලා කිව්වේ මොකක්ද? කැසිනෝ ව්‍යාපාරය සම්බන්ධයෙන්, එහෙම නැත්නම් අනෙකුත් ගනුදෙනු සම්බන්ධයෙන් කටයුතු කරන ආයෝජකයන් විතරයි ඒ රජයන් කාලයේ ආවේ කියලා එදා ඔබතුමන්ලා කිව්වා. දැන් මට කියන්න තිබෙන්නේත් ඒකම තමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි දන්නා තරමින් ආයෝජකයින් නැති වුණත්, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඊයේ-පෙරේදා විශාල කැසිනෝ ආයෝජනයකට අනුමැතිය ලබාදී තිබෙනවා. අපට දැනගන්න තිබෙන හැටියට ඒ ආයෝජකයන්ට, අවශ්‍ය කරන බලපත්‍ර ගාස්තුව තවම ගෙවලා නැතිවත් අනුමැතිය ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. අපි දන්නා තරමින් "City of Dreams Sri Lanka" කියන හෝටල් සංකීර්ණයේ තමයි මේක ආරම්භ කරන්න බලාපොරොත්තු වන්නේ. අපි දන්නා තරමින් මේ සඳහා බලපත්‍ර ගාස්තුවත් ගෙවලා නැහැ. ඒ වාගේම, දන්නා තරමින් සියයට 40ක බදු ගිවිසුමට යටත් වෙලා තිබෙනවා ද කියන එකත් ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. කැසිනෝ ව්‍යාපාරයට විරුද්ධ වෙච්ච රජය, ඒ සම්බන්ධයෙන් දැඩි ලෙස විවේචනය කරපු රජය දැන් මොකක්ද කරන්නේ? මේ අයත් කැසිනෝ ව්‍යාපාරයට බදු සහන ලබාදීලා, කැසිනෝ ව්‍යාපාරය ආරම්භ කරන්නට අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒකත් අද බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට විනාඩියයි අවශ්‍ය කරන්නේ. අපේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා මේ ගරු සභාවේ ඉන්න වෙලාවේ සබරගමුව පළාත් සභාවේ ආයුර්වේද කොමසාරිස්වරයා පත් කිරීම සම්බන්ධයෙන් එතුමාගේ දැනුවත්වීම පිණිස පුංචි අදහසක් ඉදිරිපත් කරන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය දැන් අවසානයි.

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්.

මේ ආයුර්වේද කොමසාරිස්තුමා පත් කර ගන්න මීට අවුරුද්දකට ඉස්සෙල්ලා ගැසට් නිවේදනයක් නිකුත් කෙරුවා. ඒ ගැසට් නිවේදනය අනුව සම්මුඛ පරීක්ෂණය තිබ්බා. නමුත්, සම්මුඛ පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ලබා ගත් අයට ඒ තනතුර ලබා දෙන්න කටයුතු කළේ නැහැ. මෙතෙක් කල් වැඩ ආවරණය කරන්න සුදුසුකම් නැති කෙනෙක් පත් කරන්න කටයුතු කර තිබෙනවා. මේකට සුදුසුකම් ලබපු උදවිය ඒ සම්බන්ධයෙන් අධිකරණයට යන්න සූදානම් වෙනකොට එම කොන්දේසි යටතේම, නැවත වරක් ගැසට් නිවේදනයක් නිකුත් කරන්න කටයුතු කර තිබෙනවා. විශාල වියදමක් දරලා සම්මුඛ පරීක්ෂණයක් කරලා නැවත වරක් එම කොන්දේසි යටතේම මේ කටයුතු නැවතත් සිදු කිරීම බරපතළ ප්‍රශ්නයක්. එම නිසා අපි රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමා සබරගමුව පළාත් සභාවේ ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා යම්කිසි මැදිහත්වීමක් කරලා සර්ව සාධාරණව ඒකේ ලකුණු ගත්ත අයට ඒ අවස්ථාව ලබා දෙන්න කටයුතු කරන්න කියලා. එසේ ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු වසන්ත පියතිස්ස නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.37]

ගරු වසන්ත පියතිස්ස මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை பிரதி அமைச்சர்)
(The Hon. Wasantha Piyathissa - Deputy Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත ඇතුළුව පනත් තුනක් අද දින සංශෝධනයට ලක් කරනවා. ඒ අනුව මේ රටේ පෞද්ගලික අංශයේ සේවය කරන 5,000,000කට අධික කම්කරුවන්ට -වැඩ කරන ජනතාවට- සහනයක් ලැබෙන්න නියමිතව තිබෙනවා. ඒ, පසුගිය අය වැයේදී ගත්තු තීරණයක් පරිදියි. ඒ තීරණය නීත්‍යනුකූලව බලාත්මක වන දවසක්, අද දවස. ඒ නිසා අද දවස ඓතිහාසික දවසක්, අපේ රටේ වැඩ කරන ජනතාවට.

වත්මන් ආණ්ඩුවේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" නමැති සංවර්ධන දැක්මට අනුව, ඒ සංවර්ධන තේමාවට අනුව අපි මේ රටේ ජනතාව වෙනුවෙන් විශාල වැඩ කොටසක් කිරීමේ කටයුත්ත පියවරෙන් පියවර ආරම්භ කරලා තිබෙනවා; ඒ සියලු වැඩ කටයුතු සහ වැඩසටහන් ක්‍රමානුකූලව ඉතා සාර්ථකව ඉදිරියට යමින් තිබෙනවා. හැබැයි සාම්ප්‍රදායිකව බොරු, මඩ, අවලාද තමයි විවේචන විධියට මේ විපක්ෂයේ ඉන්න දෙන්නා තුන්දෙනා ආණ්ඩුව වෙත ඉදිරිපත් කරන්නේ.

මෙතුමන්ලා මුලින්ම රිළවුන්ගේ ප්‍රශ්නයක් ගෙනාවා. ඊට පස්සේ අලින්ගේ ප්‍රශ්නයක් ගෙනැල්ලා මාසයක් විතර ඒකෙන් ජීවත් වුණා. ඊට පස්සේ "හාල් නැහැ" කියන ප්‍රශ්නය ගෙනැල්ලා

මාසයක් විතර ජීවත් වුණා. "ලූණු නැහැ" කියලා ආපහු සති දෙකක් විතර ජීවත් වුණා. "මේ රටේ පොල් නැහැ" කියලා, ඒකෙන් සති දෙකක් විතර ජීවත් වුණා. අද මේ විපක්ෂය මේ රජයට, මේ ආණ්ඩුවට නිසි ලෙස විවේචනයක් එල්ල කර ගන්න බැරුව ඉන්නවා.

ඒ වාගේම, මේ ආණ්ඩුව වඩා හොඳ දේශපාලන සංස්කෘතියක් ක්‍රියාවට නඟමින්, මහ ජනතාවගේ දේපළ හොරකම් කරපු සහ අනිසි විධියට අත්පත් කර ගත්තු අයට මේ රටේ පොදු ජනතාව බලාපොරොත්තු වෙච්ච විධියට, නීත්‍යනුකූලව දඬුවම් කිරීම ද ආරම්භ කරලා තිබෙනවා. ඒක කරන කොට මෙතුමන්ලා කියනවා, දේශපාලන පළිගැනීම් කරන්න පටන් අරගෙන තිබෙනවා කියලා. දේශපාලන පළිගැනීම් කරනවා ලු. හැමදාම මේ විධියට කරලා අපට ආණ්ඩු කරන්න බැරි ලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහා සංවර්ධන සැලැස්මක එක ප්‍රධාන පියවරක් විතරයි, එය. සමහර විට, එය දශමයක් විතරයි. අපි ඒක දන්නවා. ඊට වඩා දැවැන්ත කාර්ය භාරයක් කළ යුතු බව රජයක් විධියට, ආණ්ඩුවක් විධියට අපි තේරුම් අරගෙන ඉන්නවා. හැබැයි තමුන්නාන්සේලා දැනගන්න ඕනෑ, රටක මූල්‍ය ප්‍රතිපත්තියක් නැත්නම්, ජනාධිපතිවරයාට, ඇමතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට, ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන්ට මූල්‍ය විනයක් නැත්නම් ඒ රට හදන්න බැරි බව. එවැනි විනයක් නැති දශක හතක් තමයි තමුන්නාන්සේලාගේ පාලන කාල සීමාව. කවදාවත් එකතු වෙන්නේ නැති වෙයි කියලා, කවදාවත් එකතු වෙන්න පදනමක් නැහැ කියලා ජනතාවට පෙන්නපු -නමුත්, එහෙම නොවෙයි කියලා අපි නම් දැනගෙන හිටියා- තමුන්නාන්සේලා මේ ජනතාවාදී ආණ්ඩුවට එරෙහිව බොරු මඩ, අවලාද නඟනවා. හැබැයි අද දවසේ මේ වැදගත් පනත් කෙටුම්පත් තුන තුනෙන් දෙකක බහුතරයකින් සම්මත කරන්න කටයුතු කරනවා වාගේම ජනතාවට වැඩ කිරීම, මේ රට වෙනස් කිරීම අපි විශාල වශයෙන් ආරම්භ කරලා තිබෙනවා.

අද එක් පැත්තකින්, "එක මිටට ගොවි බිමට" වැඩසටහන ක්‍රියාත්මක කරමින් තිබෙනවා. අනෙක් පැත්තෙන්, "එක මිටට හොරු හිර ගෙට" නේද? "එක මිටට ගොවි බිමට" වැඩසටහන යටතේ කෘෂි කර්මාන්තය නඟා සිටුවීමට දැවැන්ත වැඩසටහනක් ක්‍රියාත්මක වන වෙලාවක්, මෙය. වැව් 30,000ක් තිබිච්ච, මහා වාරි පද්ධතියකින් සමන්විත වෙච්ච රටක්, මේ රට. දශක ගණනාවක් තිස්සේ ඒවා ප්‍රතිසංස්කරණය කරන්නේ නැතුවයි තිබුණේ; කෘෂිකර්මාන්තයට ඉවහල් වන අයුරින්, වඩා හොඳ ප්‍රයෝජනයක් ගන්න පුළුවන් තත්ත්වයට පත් කරන්න බැරි තත්ත්වයකයි තිබුණේ. "වාරි මහිම අපේ උරුමය" වැඩසටහන යටතේ ඒ සියල්ල ප්‍රතිසංස්කරණය කිරීම ආරම්භ කරලා තිබෙනවා, රුපියල් මිලියන 76,000ක් වෙන් කරලා. එය, ඉතිහාසයේ අය වැයකින් වෙන් කළ වැඩිම මුදල. ඒ කටයුත්ත ඉතා සාර්ථකව ඉදිරියට කරගෙන යනවා. ඒ වාගේම, "කිරි ඉතිරෙන රටක්" ව්‍යාපෘතිය යටතේ අපේ රටේ පශු සම්පත් ක්ෂේත්‍රය ඉතා විශාල වශයෙන් දියුණු කරන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි, පසුගිය කාලයේ තමුන්නාන්සේලාගේ ආණ්ඩු මොනවාද කළේ? අපේ රටේ කිරි ගොවි පොළවල් විසිගණනක් විකුණන්න සැලසුම් කළා. ඒ ක්ෂේත්‍රය ගැන අවධානය යොමු කරලා, අපේ කිරි ගොවීන්ට නිසි සංවර්ධන සැලසුම් හදලා දීලා උදවු කළේ නැහැ. පිට රටින් ගෙනෙන රුපියල් ලක්ෂ 4ක් වටිනා එළදෙනුන් පවා මැති ඇමතිවරුන් හොර නාමලේඛන හදාගෙන බෙදාගත්තා. එහෙමයි තමුන්නාන්සේලා වැඩ කළේ. හැබැයි, අද අපි අපේ රට තුළ දිනකට කිරි ලීටර් දසලක්ෂයක් ලබා ගන්නවා. එය කිරි ලීටර් තිස්ලක්ෂය දක්වා වර්ධනය කිරීම තමයි අපේ අරමුණ. ඒ ක්ෂේත්‍රය ගොඩනැඟීම සඳහා තමයි, අපි "කිරි ඉතිරෙන රටක්" කියන තේමාව යටතේ කටයුතු කරමින් ඉන්නේ.

අප භාර ගත්තේ ආර්ථිකය කඩා වට්ටපු රටක් වුණත් අපි අපේ පළමු අය වැයෙන්ම ඉතිහාසයේ වැඩිම මුදලක් -රුපියල් කෝටි 40,000ක් තරම් විශාල මුදලක්- ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහාත්, පාලම්, බෝක්කු සෑදීම සඳහාත් වෙන් කර තිබෙනවා. "පුනරුදයට මග" කියන තේමාව යටතේ අපේ බලාපොරොත්තුව මේ රටේ සෑම සියලු මාර්ගයක්ම ප්‍රතිසංස්කරණය කිරීමයි; අලුතින් හදන්න ඕනෑ පාරවල් සාදා නිම කර දීමයි. ඒ අවශ්‍යතාව මත අපි කටයුතු කරනවා. අපි ඒ සඳහා විශාල මැදිහත්වීමක් සිද්ධ කරමින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ඔබට ගෙයක් - රටට හෙටක්" කියන තේමාව යටතේ වතුකරයේ ජනතාවගේත්, අනෙකුත් ජනතාවගේත් නිවාස අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා අපි කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම නාගරික සංවර්ධන අධිකාරිය සම්බන්ධ කර ගනිමින් නාගරික පළාත්වල නිවාස සංකීර්ණ ඉදි කරමින් නිවාස ප්‍රශ්නය වෙනුවෙන් විශාල මැදිහත්වීමක් අපි සිදු කරමින් සිටිනවා. ඒ වාගේම දරුවන්ට පීඩනයක් වූ, දෙමව්පියන්ට බරක් වූ, රටේ ආර්ථිකයට නිසි සම්බන්ධතාවක් නැති මේ අධ්‍යාපන ක්‍රමය වෙනස් කිරීම සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ආරම්භ කර තිබෙනවා. ඒ ආරම්භයත් සමඟ විරැකියාවෙන් පෙළෙන තරුණයෙක්, තරුණියක් සමාජයට බිහි වෙන්නේ නැහැ. 2028දී අ.පො.ස. (සාමාන්‍ය පෙළ), 2030දී අ.පො.ස. (උසස් පෙළ) විභාග අවසන් වුණාට පස්සේ යම්කිසි වෘත්තීය නිපුණතාවක් සහිත තරුණයෙක්, තරුණියක් තමයි පාසලෙන් එළියට යන්නේ. එහෙම නැත්නම්, විශ්වවිද්‍යාලය දක්වා යන ඉදිරි අධ්‍යාපන ක්‍රියාවලියට යොමු වන දරුවෙක් තමයි ඉදිරියට නිර්මාණය වන්නේ. එවැනි බරපතළ දේශපාලන වෙනස්කම් කරන ලද ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව ඉතිහාසගත වනවා. ඒ වාගේම, ඩිජිටල්කරණය ඔස්සේ විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

අපේ ආණ්ඩුවේ ප්‍රධාන දැක්ම තමයි, ග්‍රාමීය හා නාගරික ජනයාගේ දුප්පත්භාවය තුරන් කිරීම. ඒ වෙනුවෙන් වූ "ප්‍රජා ශක්ති" වැඩසටහන යටතේ ගම් බිම්වල ජනයාගේ දූගී දුප්පත්භාවය තුරන් කිරීමට අපි කටයුතු කරනවා. එය සහනාධාර බෙදා දීමක් නොවෙයි, එහෙම නැත්නම් තවත් බඩු මල්ලක් බෙදා දෙන වැඩසටහනක් නොවෙයි. සෑම පවුලක්ම අධ්‍යයනයකට ලක් කරලා, ඔවුන් එක්ක එකතු වෙලා පවුල් සංවර්ධන සැලැස්මක් හදලා, එහෙම නැත්නම් ප්‍රජාව සම්බන්ධ කරගෙන සමුපකාර සමිති හදලා ඒ සියලුදෙනාගේ ආර්ථිකය ගොඩ නැඟීම වෙනුවෙන් වූ ඓතිහාසික මහා සංවර්ධන පියවරක් මේ රජය ආරම්භ කර තිබෙනවා. ඒ ආකාරයට අපි මේ රට වෙනස් කිරීම වෙනුවෙන් කටයුතු කරමින් ඉන්න වෙලාවක තමයි අප මේ පනත් කෙටුම්පත් අද දවසේ සම්මත කරන්නේ. ඒ නිසා අපි මේ රටේ ජනතාවට කියනවා, විපක්ෂය නඟන බොරු චෝදනා, අවලාද ශත පහකට ගණන් ගන්න එපා කියලා. ජනතාවාදී රජයක් විධියට ඔබේ බලාපොරොත්තු තමයි මේ එකින් එක ඉෂ්ට වෙන්නේ. මහා මොළ තිබෙනවා කියන දැන් විපක්ෂයේ ඉන්න මේ අයට -හිටපු පාලකයන්ට- අවුරුදු 76ක් ගිහිල්ලාත් මේ රට හදන්න බැරි වුණා නම්, මේ අය දැන් බොරුවට කියන කයි කතන්දර අපි කවුරුවත් ශත පහකටවත් ගණන් ගත යුතු නැහැ. හොඳ දෙයක් තිබුණොත් විතරක් අපි එය අහනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලක්ෂ 50කට අධික කම්කරු ජනතාව වෙනුවෙන් මේ සංශෝධන පනත් කෙටුම්පත් සම්මත කරන අද දිනය ඓතිහාසික දවසක් බවට පත් වෙනවා. මේ සංශෝධන ජනතාවට විශාල සහනයක් බවට පත් වෙනවා, ලබන ජනවාරියේ සිට. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කවින්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 6ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.48]

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வேலையாளர்களின் தேசிய குறைந்தபட்ச வேதனம் (திருத்தம்) சட்டமூலத்தை இந்த அரசாங்கம் கொண்டுவந்திருப்பதையிட்டு நாங்கள் மகிழ்ச்சியடைகின்றோம். விசேடமாக, இந்த நாட்டிலே மிகவும் பாரிய பங்காற்றுகின்ற ஓர் ஊழியப்படை யாகத் தோட்டத் தொழிலாளர்கள் காணப்படுகின்றார்கள். அவர்களின் வாக்குகளைப் பெறுவதற்காகக் கடந்த காலத்தில் மாறிமாறி வந்த ஒவ்வோர் அரசும், அவர்களுக்குச் சம்பள உயர்வைப் பெற்றுத் தருவதாகக் கூறி தொடர்ச்சியாக அவர்களை ஏமாற்றி வந்திருக்கின்றது. ஆனால், தற்பொழுது ஆட்சிக்கு வந்திருக்கின்ற இந்த அரசு தனியார் துறையிலே வேலை செய்கின்றவர்களுக்கான நியாயமான சம்பளத்தைப் பெற்றுக்கொடுப்பதற்கான முயற்சியை மேற்கொண்டிருக் கின்றது. அது மட்டுமல்லாமல், இந்த அரசானது ஏற்கெனவே அரச ஊழியர்களுக்கான அடிப்படைச் சம்பளத்தைக்கூட கூட்டியிருந்தது. உண்மையாக அது வரவேற்கத்தக்க விடயம். இருந்தாலும், இன்று இந்த நாட்டிலே பொருட்கள், சேவைகளின் விலை என்பது மிகப் பாரதூரமாக உயர்ந்துசெல்கின்ற நிலைமை காணப்படுகின்றது. சம்பள உயர்வுக்கு ஏற்றதாக அல்லாது, பொருட்களின் விலைகள் மிகவும் கூடுதலாக உயர்ந்து செல்கின்றது. அதாவது, சம்பள அதிகரிப்பு என்பது ஆமை வேகத்தில் அதிகரிக்கின்ற அதேவேளை, பொருட்கள் மற்றும் சேவைகளின் விலை என்பது அதி வேகத்தில் அதிகரிக்கின்றது. எனவே, இந்த இரண்டு விடயங்களையும் அரசு கவனத்தில் எடுத்து, ஊழியர்களுக்கான சம்பள அதிகரிப்பை வழங்க வேண்டு மென்ற விடயத்தை இந்த இடத்திலே குறிப்பாகக் கூற விரும்புகின்றேன்.

விசேடமாக, இந்த அரசு சில பூர்வாங்க விடயங்களைக் கவனத்தில் எடுத்திருக்கின்றது. செம்மணிப் புதைகுழி விடயம் அதில் ஒன்றாகும். அதாவது, நடந்த தமிழினப் படுகொலை விடயத்தை ஆராய்கின்ற நோக்கில், செம்மணிப் புதைகுழி தோண்டப்பட்டுக் கொண்டிருக்கின்றது. அங்கு மனித எச்சங்கள் கண்டெடுக்கப்பட்டுக் கொண்டிருக்கின்றன. இளைஞர், யுவதிகள் மட்டுமல்லாமல், சிறுவர்கள், குழந்தைகள், பெரியோர்கள் என அனைத்துத் தரப்பினரதும் எச்சங்கள் அங்கு கண்டெடுக்கப்பட்டிருக்கின்றன. விசேடமாக, தமிழ்த் தாயின் கருவைக்கூட அழித்திருக்கிறார்கள்.

தமிழினப் படுகொலை இடம்பெற்றதற்கான ஓர் அத்தாட்சியாக இது காணப்படுகின்றது. இந்த ஆய்வானது ஒரு சர்வதேச நியமத்தின் அடிப்படையிலே, சர்வதேச நாடுகளின் ஒத்துழைப்புடன் அல்லது சர்வதேச நீதிமன்றங்களின் ஒத்துழைப்புடன் நடைபெற வேண்டும். ஏனென்றால், கடந்த கால அரசுகள் உள்நாட்டுப் பொறிமுறையின் மூலம் இந்த விடயங்களைச் செய்து பொய்யான தகவல்களைத்தான் வெளிப்படுத்தியிருந்தன. எமது மக்கள் அதில் நம்பிக்கையிழந்தவர்களாக இருக்கின்றார்கள்.

செம்மணிப் படுகொலை மட்டுமல்லாமல், தமிழினப் படுகொலையானது வட, கிழக்கில் கூடுதலான இடங்களில் நடைபெற்றிருக்கின்றது. விசேடமாக, அம்பாறை மாவட்டத்தில் வீரமுனைப் படுகொலை, திராய்க்கேணிப் படுகொலை, உடும்பன்குள படுகொலை, 'சென்ரல் கேம்' படுகொலை, சத்துருக்கொண்டான் படுகொலை, கிழக்குப் பல்கலைக்கழகத்தில் நடந்த படுகொலை மற்றும் திருகோணமலை மாவட்டத்தில் நடந்த படுகொலைகள் என அதிகளவான தமிழினப் படுகொலைகள் இடம்பெற்றுள்ளன. அம்பாறை மாவட்டத்தில் நடந்த படுகொலைகள், ஸ்ரீலங்கா படையினருடன் 'ஜிகாத்' எனப்படும் முஸ்லிம் ஊர்காவல் படையினர் சேர்ந்து தமிழர்கள் பூர்வீகமாக வாழ்ந்த இடத்தை இல்லாமற் செய்வதற்காக நடத்தப்பட்டவைகளாகும். சிறுவர்கள், பெரியோர்கள், குழந்தைகள் என்று பராபட்சம் இல்லாமல் அங்கு வாழ்ந்த தமிழ் மக்கள் படுகொலை செய்யப்பட்டார்கள்; தாயினுடைய வயிற்றை வெட்டி குழந்தையைக்கூட கொன்றிருக்கின்றார்கள்.

இவையெல்லாம் தமிழினப் படுகொலை நடைபெற்றதற் கான ஓர் அத்தாட்சியாகும். தனிப்பட்ட ரீதியில் தமிழினத்தை அழிக்க வேண்டுமென்ற நோக்கில் நடைபெற்ற ஒரு செயற்பாடாகவே இதனை நாங்கள் பார்க்கின்றோம். இன்றுகூட நீங்கள் அம்பாறை மாவட்டத்தில் உள்ள வீரமுனைப் பிரதேசத்தைத் தோண்டினால் அங்கு மனித எச்சங்கள் கூடுதலாகக் காணப்படலாம். அதேபோல திராய்க்கேணி, திருக்கோவில், மட்டக்களப்புப் பகுதியில் தோண்டினாலும் அங்கும் மனித எச்சங்கள் காணப்படலாம். வடக்கு, கிழக்கிலே எங்கு தோண்டினாலும் தமிழினம் அழிந்ததற்கான அல்லது திட்டமிட்டுக் கொலை செய்யப்பட்டதற்கான அத்தாட்சியும் ஆவணங்களும் கிடைக்கும். தமிழர்களின் இருப்பை இல்லாமல் செய்ய வேண்டுமென்பதற்காக, தமிழினமே இலங்கையில் அடியோடு அழிக்கப்பட வேண்டுமென்பதற்காக இலட்சக்கணக்கான மக்கள் கொலை செய்யப்பட்டிருக்கின்றார்கள். இலங்கை சுதந்திரம் அடைந்த காலத்திலிருந்து 2009ஆம் ஆண்டு வரை திட்டமிடப்பட்ட முறையிலே தமிழினம் கொலை செய்யப்பட்டிருக்கின்றது. இதற்கான நீதி விசாரணையென்பது சர்வதேச ரீதியாக நடைபெற வேண்டும். அதற்கான நீதியையும் நியாயத்தையும் நாங்கள் சர்வதேசத்திடம் வேண்டி நிற்கின்றோம். அதற்கான நீதி, நியாயம் கிடைக்க வேண்டுமென்று இந்தச் சபையின் ஊடாகக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.54]

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ උත්තරීතර සභාවේ විවාදයට ගනු ලබන පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමට අදාළ පනත් කෙටුම්පත් පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්නට ලැබීම ගැන මා ඉතා සතුටු වෙනවා.

මීට ප්‍රථම මේ උත්තරීතර සභාව ආමන්ත්‍රණය කරපු අපේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා මේ සංශෝධිත පනත් කෙටුම්පත් තුළින් අපි බලාපොරොත්තු වන්නේ කුමන දෙයක්ද කියන එක සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කළා. අපි බලාපොරොත්තු වෙනවා, 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත සංශෝධනයට ලක් කරලා, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප රුපියල් 30,000 දක්වා අදියර දෙකකින් ඉහළ නංවන්න. 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත තුළින් ජාතික අවම මාසික වැටුප වශයෙන් තිබුණේ රුපියල් 10,000ක් හා ජාතික

අවම දෛනික වැටුප ලෙස තිබුණේ රුපියල් 400ක් බව. ඊට පස්සේ, 2021 අංක 16 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත මඟින් ජාතික අවම මාසික වැටුප රුපියල් 12,500 දක්වාත්, ජාතික අවම දෛනික වැටුප රුපියල් 500 දක්වාත් සංශෝධනයට ලක් වුණා. ඊට පස්සේ, 2024 අංක 48 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත මඟින් 2024 සැප්තැම්බර් මාසයේ සිට පෞද්ගලික අංශයේ සේවකයන්ගේ ජාතික අවම මාසික වැටුප රුපියල් 17,500 දක්වාත්, ජාතික අවම දෛනික වැටුප රුපියල් 700 දක්වාත් ඉහළ දමන්නට කටයුතු කරලා තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ශ්‍රම සම්පත කාර්යක්ෂම කරන්නේ කොහොමද, එහෙම නැත්නම් පෞද්ගලික අංශයේ සේවකයාට වෘත්තීය ගරුත්වයක් ලබා දෙන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් අපි මැතිවරණයේදී ජනතාවට ඉදිරිපත් කරපු "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 68 පිටුවේ සිට 72 වන පිටුව දක්වා කරුණු සඳහන් කරලා තිබෙනවා. අපි ඒ ඉදිරිපත් කරපු වැඩ පිළිවෙළ තුළ කියලා තිබෙනවා, වැටුප් විෂමතා අවම කරන හා සේවකයා දිරිගන්වන ජාතික වැටුප් ව්‍යුහයක් සකස් කරන්නට කටයුතු කරනවා කියන එක. අපි ඒ විධියට ප්‍රතිඥා දීලා තිබුණා. මම මේ ගරු සභාවට දැනුම් දෙන්න කැමැතියි, අපි අද මේ සම්මත කර ගන්නා පනත් කෙටුම්පත් තුළින් ඒ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් අපි ලබා දුන් ප්‍රතිඥාව ඉදිරියට ගෙන යන්න ආරම්භයක් වෙන බව.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ අපේ සමාජයේ බොහෝ පිරිසක් කථා කරපු මාතෘකාවක් තමයි ජාතික ආරක්ෂාව කියන එක. මීට මොහොතකට ඉහතදී මේ ගරු සභාව ආමන්ත්‍රණය කරපු විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙකුත් ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් යම් කිසි කාරණාවක් මතු කළා. ඇත්තටම ජාතික ආරක්ෂාව කියන්නේ, සරල මාතෘකාවක් නොවෙයි. ඒක ඉතා පෘථුල, සංකීර්ණ විෂය පථයක්. ඒ සම්බන්ධයෙන් අපි මීට ඉහතදීත් මේ පාර්ලිමේන්තුවේදී අදහස් ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ සංකීර්ණ විෂය පථය තුළ economic security කියන එක, එක element එකක් විතරයි, එක සාධකයක් පමණයි. ඒ වාගේම, there are many elements in the concept of national security. Economic security කියන මේ සාධකය, එහෙම නැත්නම් ආර්ථික සුරක්ෂිතභාවය කියන සාධකය අපි රැක ගත්තොත්, අපි ආරක්ෂා කර ගත්තොත් තමයි මේ රට සංවර්ධන මාවත කරා ගෙන යන්නට හැකියාව ලැබෙන්නේ.

ඉතින්, පසුගිය කාලයේ ආර්ථික වශයෙන් දුර්වල වුණු රටවලට අත් වුණු ඉරණම මොකක්ද කියලා අපි දන්නවා. මේ අවස්ථාවේදී මම කියන්න කැමැතියි, ආර්ථික සංවර්ධනය සඳහා එහෙම නැත්නම් economic security ඇති කරන්න රාජ්‍ය අංශයේ රාජ්‍ය සේවකයා වාගේම පෞද්ගලික අංශයේ සේවකයනුත් එක හා සමාන කැප වීමක් කරන බව. ඔවුන් එක හා සමාන වගකීමක් ඉටු කරනවා. එම නිසා අපි රාජ්‍ය සේවකයා වාගේම පෞද්ගලික අංශයේ සේවකයාත් ධෛර්යවත් කළොත් තමයි අපට මේ ආර්ථික සංවර්ධනය ළඟා කර ගන්නට හැකියාව ලැබෙන්නේ. ඒ අනුව අපි මේ අවුරුද්දේ ඉදිරිපත් කරපු අයවැය තුළින් රාජ්‍ය සේවකයාට විශාල වැටුප් වැඩි වීමක් ලබා දීලා ඔවුන්ව ධෛර්යවත් කරලා තිබෙනවා, මේ වැඩ පිළිවෙළ ඉදිරියට අරගෙන යන්න. මේ අයවැය අවසන් වූ වහාම පෞද්ගලික අංශයේ සේවකයාටත් මේ වැටුප් වැඩි වීම ලබා දීලා ඔවුන් ධෛර්යවත් කරන්නට කටයුතු කරන්නට අපි උත්සාහ කළත්, නොයෙකුත් බාධාවන් නිසා අපට ඒ අවස්ථාව උදා වුණේ නැහැ.

ඒ වාගේම මට තව එක දෙයක් කියන්න අවශ්‍යයි. අපේ රටේ මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව අපි කවුරුත් දන්නවා. රජයේ වගකීම මොකක්ද කියන එක සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් කරුණු පැහැදිලි කිරීමක් කර තිබෙනවා. මම එය උපුටා දක්වන්නම්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VI වන පරිච්ඡේදයේ 27. වන ව්‍යවස්ථාවේ (7) වන අනුව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙනවා:

> "ආර්ථික සහ සාමාජික වරප්‍රසාද හා විෂමතා ද, මිනිසා විසින් හෝ රජය විසින් හෝ මිනිස් ශ්‍රමය අයථා පරිදි උපයෝගී කර ගැන්ම ද, රජය විසින් තුරන් කළ යුත්තේ ය."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ වගවීම රජයන් නොදරපු නිසා තමයි පසුගිය කාලයේ පෞද්ගලික අංශයේ සේවකයන්ට ඔවුන්ගේ වෘත්තීය අයිතිවාසිකම් දිනා ගැනීම වෙනුවෙන් එළියට ඇවිල්ලා සටන් කරන්න සිද්ධ වුණේ. 2011 වර්ෂයේදී වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරන්නට එළියට බැහැපු කටුනායක ප්‍රදේශයේ රොෂේන් චානක කියන තරුණයා ජීවිතක්ෂයට පත් වුණා, අපට මතකයි. පසුගිය රජයන් වගවීමක් නොමැති ආකාරයෙන් ක්‍රියා කරපු නිසා තමයි අපේ තරුණයන්ට එවැනි අභාග්‍ය සම්පන්න සිදුවීම්වලට මුහුණ දෙන්නට සිද්ධ වුණේ. අපේ රජය මේ කාර්යය ඉතාම හොඳින් අවබෝධ කරගෙන තිබෙනවා. ඉතින් ඒ කාර්යය අපි ඉටු කරනවා කියන එකත් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒ වාගේම මම තව එක දෙයක් කියන්න අවශ්‍යයි. තව කොට්ඨාසයක් ඉන්නවා, අපේ රටේ පෞද්ගලික අංශයේ ආරක්ෂක සේවයේ යෙදී සිටින විශ්‍රාමික ත්‍රිවිධ හමුදා විරුවන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වෙලාව අවසන්.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඔවුන්ගේ ශ්‍රමය සූරා කෑමට ලක් වන බව නොයෙකුත් අවස්ථාවල අපට දැනුම් දීලා තිබෙනවා. අපි අද ඉදිරිපත් කරන පනත් කෙටුම්පත් තුළින් පෞද්ගලික ආරක්ෂක සේවයේ යෙදී සිටින පිරිස්වලට තමන් වැය කරන ශ්‍රමයට සාධාරණ වැටුපක් ලැබෙනවා කියන එක මට හොඳටම විශ්වාසයි. අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, අපි මේ පනත් කෙටුම්පත් සම්මත කරන්නේ පෞද්ගලික අංශයේ සේවකයා දිරිමත් කරන්න පුළුවන් ආකාරයට ඔවුන්ට වැටුප් වැඩිවීමක් ලබා දීලා, අපේ රටේ ආර්ථික වර්ධනයට අවශ්‍ය දායකත්වය ලබා ගන්නට ඔවුන්ට ශක්තියක් වෙන්න කියන එක. මම මේ අවස්ථාවේදී ඒ සියලු පාර්ශ්වවලින් - මේකට නොයෙක් ආකාරයෙන් බාධා කරන්න උත්සාහ කරපු පිරිස්වලින් - ඉල්ලීමක් කරනවා, අපි හැමෝම රාජ්‍ය අංශයේ සේවකයා වාගේම පෞද්ගලික අංශයේ සේවකයාවත් දිරිමත් කරමු, ශක්තිමත් කරමු කියලා. ඔවුන් ශක්තිමත් කිරීම තුළින් අපේ රටේ ආර්ථික සංවර්ධනය ශීඝ්‍රයෙන් ළඟා කරගෙන අවසාන බලාපොරොත්තුව වුණු සංවර්ධිත රාජ්‍යයක් කරා ගමන් කරන කටයුත්තට එක් වෙන්නට අපට හැකියාව ලැබෙනවා. ඒ නිසා අපි සියලු දෙනාම ඒ කටයුත්තට සහයෝගය ලබා දෙමු කියලා ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසාන කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අතම්බාවා මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.04]

ගරු අබූබකර් අතම්බාවා මහතා
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற வேலையாளர்களின் தேசிய குறைந்தபட்ச வேதனம் (திருத்தம்) சட்டமூலம்மீதான விவாதத்தில் எனக்கும் உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இந்த நாட்டில் தனியார் துறையில் பல்வேறு மட்டங்களிலும் இருக்கின்ற உழைக்கும் வர்க்கத்தினருக்கு ஊதிய அதிகரிப்பை வழங்குவதற்கான சந்தர்ப்பம் இப்போது ஏற்பட்டிருக்கின்றது. தனியார் துறையில் ஊழியர்களாகக் கடமையாற்றுகின்றவர்களை சாரதிகள், பாதுகாப்பு உத்தியோகத்தர்கள், சுத்திகரிப்பாளர்கள் என்று பட்டியல் இட்டுக்கொண்டே செல்லலாம். இவர்கள் கடந்த காலங்களில் மாறி மாறி ஆட்சிக்கு வந்த ஆட்சியாளர்களால் ஏமாற்றப்பட்டு இருக்கிறார்கள். இவர்களின் வாழ்வாதாரத்துக்கான சம்பளத்தை அவர்கள் வழங்கவில்லை. இருந்தாலும், இவர்களின் முயற்சியின் காரணமாக இன்று சந்தோஷமான ஒரு நிலையை அடைந்திருக்கின்றார்கள். இன்றைய நாள் இவர்களுக்கு வரலாற்றில் முக்கியமானதொரு நாளாக அமையுமென நாங்கள் நினைக்கின்றோம்.

எமது அரசாங்கம் ஆட்சிக்கு வந்ததைத் தொடர்ந்து, இந்த நாட்டில் உழைக்கும் வர்க்கத்தினரின் - அரச ஊழியர்களினதும் தனியார் துறையினரதும் - சம்பளத்தை அதிகரிப்பதற்கான முயற்சிகள் மேற்கொள்ளப்பட்டன. அந்த வகையில், அரசாங்கம் தனது முதலாவது வரவு செலவுத்திட்டத்தில் அதற்கான ஏற்பாடுகளைச் செய்தபோது, எதிர்க்கட்சியில் இருந்தவர்கள் அதைப் பொய்யென உரைத்தார்கள். இந்த நாட்டு மக்களை ஏமாற்றுவதற்காக அரசாங்கம் இவ்வாறு செய்வதாக இந்தப் பாராளுமன்றத்தில் கூறி மக்களை உசுப்பேற்றினார்கள். நாங்கள் நாடுபூராவும் பயணிக்கும்போது, இந்த நாட்டிலுள்ள உழைக்கும் வர்க்கத்தினரான அரச ஊழியர்களும் தனியார் துறை ஊழியர்களும் எங்களிடத்தில் கேட்டார்கள், "நீங்கள் அதிகரித்திருக்கின்ற சம்பளம் எங்களுக்குக் கிடைக்குமா?" என்று. அதற்கு நாங்கள் சொன்னோம், "சந்தர்ப்பம் வரும்போது நீங்கள் அதனை உணர்வீர்கள்" என்று. அதாவது, ஏப்பிரல் மாதமாகும்போது நீங்கள் அதனை உணர்வீர்கள் என்று கூறினோம். தமது அடிப்படைச் சம்பளத்தில் உயர்வு இருந்தை அவர்கள் கடந்த ஏப்பிரல் மாதம் உணர்ந்தார்கள். கடந்த ஆட்சியில் அரச ஊழியர்களின் அடிப்படைச் சம்பளம் ஒரு முறைதான் அதிகரிக்கப்பட்டது. எங்களுடைய தேசிய மக்கள் சக்தி அரசாங்கம் அரச, தனியார் துறை ஊழியர்களின் அடிப்படைச் சம்பளத்தில் அதிகரிப்பைச் செய்ததை வரலாற்று முக்கியத்துவம்மிக்க ஒரு நிகழ்வாகவே நாங்கள் பார்க்கின்றோம்.

நாங்கள் இந்த நாட்டிலுள்ள தனியார் துறை ஊழியர்களின் சம்பள அதிகரிப்பு பற்றி பேசும்போது, 200 வருடகால வரலாற்றைக்கொண்ட எங்களுடைய மலையக மக்கள் பற்றி பேசாமல் இருக்க முடியாது. தேயிலைக் கொழுந்து பறிக்கின்ற அவர்கள் இந்த நாட்டின் பொருளாதாரத்தின் முதுகெலும்பாக இருக்கிறார்கள். தேசிய மக்கள் சக்தி அரசாங்கமானது, அவர்களுடைய சம்பள உயர்வு தொடர்பாகப் பல்வேறு மட்டங்களிலும் பேச்சுவார்த்தைகளை நடத்தி வருகின்றது என்பதை நான் இந்தச் சந்தர்ப்பத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

தோட்டத் தொழிலாளர்களை ஏமாற்றி, அவர்களுடைய வாக்குகளைப் பெற்று, கடந்த கால அரசாங்கங்களில் அமைச்சர்களாக இருந்தவர்கள் அவர்களுக்கு எந்தவிதமான உதவிகளையும் செய்யவில்லை. ஆனால், தேசிய மக்கள் சக்தி அராசங்கமானது, அவர்களை எதிர்காலத்தில் எந்த இடத்துக்குக் கொண்டு செல்ல வேண்டுமென நினைக்கின்றதோ, அந்த இடத்துக்குக் கொண்டுசெல்வதற்கான வேலைகளைச் செய்வதில் சித்தமாக இருக்கின்றது. அதுமாத்திரமன்றி, கீழ்நிலைப்படுத்தப்பட்ட சம்பளத்தைப் பெறுகின்றவர்களுக்குக் கொடுப்பனவு வழங்கப்பட இருக்கின்றது. அந்தக் கொடுப்பனவின் நிலுவையையும் நாங்கள் எதிர்காலத்தில் வழங்க இருக்கின்றோம் என்ற செய்தியை இந்தச் சந்தர்ப்பத்தில் கூறிக்கொள்கின்றேன். .

குறிப்பாக, வேலையாளர்களின் தேசிய குறைந்தபட்ச வேதனம் (திருத்தம்) சட்டமூலத்தை நிறைவேற்றி, எதிர் காலத்தில் அவர்களுக்குக் கொடுப்பனவுகள் வழங்குவதோடு, எதிர்வருகின்ற வரவு செலவுத்திட்டத்தில் அவர்களுடைய சம்பளத்தை மேலும் அதிகரித்து, அவர்களுக்கான நிலுவைச் சம்பளத்தையும் வழங்குவதற்கு நாங்கள் கடமைப்பட்டு இருக்கின்றோம்.

இந்த நாட்டில் 50,000க்கும் மேற்பட்ட தனியார் துறையைச் சேர்ந்த ஊழியர்கள் இருக்கிறார்கள். அவர்களுடைய எதிர்காலமும் சிறப்பாக அமைய வேண்டும். இந்த அரசாங்கம் அவர்களுக்குத் தொடர்ந்தும் உதவிகளைச் செய்யும். அதற்கான பங்களிப்பினை இந்த அரசாங்கத்துக்கு எதிர்க்கட்சியினர் வழங்க வேண்டுமென்று நான் இந்தச் சந்தர்ப்பத்திலே கேட்டுக் கொள்கின்றேன்.

பாராளுமன்றத்துக்கு வந்து எதிர்க்கட்சியில் அமர்ந்து கொண்டு, நாட்டு மக்களை ஏமாற்றுகின்ற நடவடிக்கைகளில் அவர்கள் ஈடுபடுவதை நாங்கள் வன்மையாகக் கண்டிக்கின்றோம். மக்களைப் பிழையாக வழிநடத்துகின்ற பல்வேறு சந்தர்ப்பங்களை இந்தப் பாராளுமன்றத்தில் நாங்கள் பார்த்திருக்கின்றோம். அன்புக்குரிய இந்த நாட்டு மக்கள் இதைத் தெளிவாக உணர்ந்துகொள்ள வேண்டும். கடந்த காலங்களில் பல்வேறு ஊழல் மோசடிகள் நடைபெற்றதன் பிரகாரம் இந்த நாடு பாரிய இன்னல்களுக்கு உள்ளானது. இருந்தாலும், மாண்புமிகு சனாதிபதி அவர்கள் பொருளாதார நிலைமையைச் சிறப்பாகக் கையாண்டதன்மூலம் விரைவாக இந்த நாட்டைப் பொருளாதார வீழ்ச்சியிலிருந்து எங்களால் மீட்க முடிந்தது. அத்தோடு, நாட்டு மக்களுடைய வாழ்வாதாரத்தில், அவர்களுடைய மீட்சியில், நாட்டினுடைய கட்டுமானப் பணியில் நாங்கள் அதிகளவு பங்கு கொள்கின்றோம் என்பதையும் மக்களாகிய நீங்கள் விளங்கிக்கொள்ள வேண்டுமென இந்தச் சந்தர்ப்பத்தில் கூறிக்கொள்கிறோம்.

இனவாதம் பேசுகின்ற சிலர் இன்று எதிர்க்கட்சியில் இருக்கின்றார்கள். மக்களை இனவாதத்தின்பால் தூண்டி, தொடர்ந்தும் இனவாதக் கட்சிகளின் பின்னால் மக்கள் பயணிப்பதற்கு அவர்கள் முயற்சி செய்துகொண்டிருப்பதை நாங்கள் வன்மையாகக் கண்டிக்கின்றோம். இங்கு பேசிய கௌரவ பாராளுமன்ற உறுப்பினர் கோடீஸ்வரன் அவர்கள், தமிழர்கள் கொல்லப்பட்டிருப்பதாகச் சொன்னார். தமிழர்கள் மாத்திரமல்ல, முஸ்லிம்களும் சிங்களவர்களும் கொல்லப் பட்டிருக்கின்றார்கள் என்று பேசியிருந்தால் சிறப்பாக இருந்திருக்குமென நாங்கள் கருதுகிறோம். ஆகவே, மீண்டும் மீண்டும் கடந்த கால சம்பவங்களைப் பேசுவதன்மூலம் இந்த நாட்டை மேலும் கீழ் நிலைக்குக் கொண்டு செல்வதற்கு

அனுமதிக்க முடியாது. இந்த நாட்டைக் கட்டியெழுப்புவதற் குரிய அனைத்து வேலைத்திட்டங்களிலும் எதிர்க்கட்சியும் பங்கெடுக்க வேண்டுமென இந்தச் சந்தர்ப்பத்திலே அன்பாகக் கேட்டுக் கொள்கிறோம். ஏனெனில், இந்த நாட்டு மக்கள் மிகவும் நொந்து போனவர்களாக இருந்துகொண்டு இருக்கிறார்கள்.

வளமான இந்த நாட்டை அழகுமிக்க நாடாக மாற்றுவதற்கு எங்களுடைய அரசாங்கம் மக்களுக்கு வழங்கிய வாக்குறுதிகளைப் படிப்படியாக நிறைவேற்றி வருவதைக் காணக்கூடியதாக இருக்கின்றது. இன்று தமிழர்கள், சிங்களவர்கள், முஸ்லிம்கள் என அனைத்து மக்களும் இந்த நாட்டினுடைய ஆட்சியாளர்கள்மீது - தேசிய மக்கள் சக்திமீது - நம்பிக்கையை வளர்த்த வண்ணம் இருந்துகொண்டு இருக்கிறார்கள். இன்று எதிர்க்கட்சியிலே இருக்கின்ற ஒருசில பாராளுமன்ற உறுப்பினர்கள் கடந்த காலங்களிலே இந்த நாட்டு மக்களைப் பிழையாக வழிநடத்தியிருந்தாலும், இன்று மக்கள் தெளிவு பெற்றிருக்கிறார்கள் என்பதைக் கூறிக் கொண்டு, இச்சந்தர்ப்பத்துக்கு மீண்டும் நன்றி கூறி விடைபெறுகிறேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ටී.කේ. ජයසුන්දර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.12]

ගරු ටී.කේ. ජයසුන්දර මහතා
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී මට කථා කරන්න ලැබීම ඇත්තටම සතුටට කරුණක්. ඒකට හේතුව තමයි, 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනතටත්, 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනතටත්, 2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනතටත් සංශෝධන සිදු කරමින් අද ගෙනෙන පනත් කෙටුම්පත් සම්මත කිරීම. ඒ තුළින් අපේ රටේ වැඩ කරන ජනතාවට -විශේෂයෙන් රජයේ සේවයේ නොවන වැඩ කරන ජනතාවට- සහන සැලසෙනවා. මෙතෙක් කල් ඔවුන් යම් දීමනාවක් ලබා ගත්තා නම් එය ලබා ගත්තේ සටන් කරලා. හැබැයි ජනතාවගේ රජයක් විධියට, ජනතාවගේ අයිතිවාසිකම් රකින රජයක් විධියට අපි ජනතාව වෙනුවෙන් කටයුතු කරනවා.

මෙච්චර කල් කම්කරු ජනතාව ලබා ගත් රුපියල් 21,000ක පොදු වැටුප මේ රජය යටතේ ලබන ජනවාරි වෙනකොට -මේ අවුරුද්දේ දෙසැම්බර් 31න් පසු- රුපියල් 30,000ක් දක්වා වැඩි කර තිබෙනවා. ඇත්තටම මේක ඔවුන්ට සෑහෙන වැටුපක් කියා කියන්න බැහැ. මොකද, මේ රටේ තිබෙන ආර්ථික තත්ත්වය යටතේ තමයි අපි මේ ගැන කථා කරන්න ඕනෑ. අපි දන්නවා, පෞද්ගලික අංශයේ සේවකයන්ට සමහර වෙලාවට මීට වඩා විශාල වැටුපක් ලැබෙන බව. හැබැයි, මේ තුළින් අපි පහළම මට්ටමේ සිටින සේවකයන්ට යම් සහනයක් ලබා දී තිබෙනවා. අපි සියයට 50කට ආසන්න වැටුප් වැඩිවීමක් කිරීම තුළ සමස්ත සේවකයින්ට වැටුප් ලබා දීමේදී ඒ හාම්පුතුන්ට මේ ගැන සලකා බලන්න සිද්ධ වෙනවා. ඒ විතරක් නොවෙයි. මේ නිසා පාරිතෝෂික ලබා ගැනීමේදීත්, ETF ලබා ගැනීමේදීත් විවිධ ආකාරයෙන් සේවකයින්ට ප්‍රතිලාභ ලැබෙනවා.

අපි බලන්න ඕනෑ, ඇයි මෙහෙම වැටුප් වැඩි කළේ, ඇයි රජයට මෙහෙම වැටුප් වැඩි කරන්න හිතුණේ, ඇයි මේ රජය විසින් මේ වාගේ වැටුප් වැඩි කිරීමේ ක්‍රියාමාර්ගයක් ගත්තේ කියලා. මීට කලින් අපි රජයේ සේවකයන්ගේත් වැටුප් වැඩි කළා. නමුත්, රජයේ සේවකයන් නොඉල්ලපු අවස්ථාවක තමයි අපි එයත් කළේ. ඒ වාගේම පෞද්ගලික අංශයේ සේවකයිනුත් සටන් කරලා වැටුප් වැඩි කිරීමක් නොඉල්ලන අවස්ථාවක තමයි රජය විසින් මේ වැටුප් වැඩි කිරීම කළේ. ඇයි එහෙම වුණේ? අපේ රජයේ අරමුණ මොකක්ද?

මෙතැනදී මූලික වශයෙන් සිද්ධියෙන් සිද්ධිය, රුපියලෙන් රුපියල ගැන කථා කරනවාට වඩා ඇත්තටම මේ රජයේ අරමුණ, මේ රජය යන path එක - රජය යන මඟ - මොකක්ද කියන එක මේ වැටුප් වැඩි කිරීම ඇතුළේ පෙන්නුම් කරනවා. මේ රජයේ එක් අරමුණක් තමයි, ජන සහභාගිත්ව ආර්ථිකයක් ඇති කිරීම. ඒ ජන සහභාගිත්ව ආර්ථිකය ඇතුළේ සිදුවන ප්‍රධානම කාරණය තමයි, සියලු ජනයා ආර්ථිකයට සහභාගි වීම. ඒ විතරක් නොවෙයි. ඒ සහභාගිත්ව ආර්ථිකයෙන් ලැබෙන ප්‍රතිලාභ ජනතාව අතට පත් වෙනවා. මෙන්න මේක තමයි අපේ මූලධර්මය.

මෙච්චර කල් පැවති රජයන් මොකක්ද කළේ? මෙච්චර කල් පැවති රජයන් ජනතාව සහභාගි කර ගත්තේ ශ්‍රමය සූරාකෑම සඳහායි. හැබැයි, ඒකේ ප්‍රතිලාභ ජනතාවට ලැබුණේ නැහැ. ඒ නිසා තමයි සූරාකෑම කියන වචනය පාවිච්චි කරන්න පුළුවන් වෙන්නේ. හැබැයි, දැන් අපි ක්‍රම ක්‍රමයෙන් මේ රට ඉහළට ගෙනෙනවා. දැන් ජනතාව ආර්ථිකයට සහභාගි වෙනවා. ඒ විතරක් නොවෙයි. එහි ප්‍රතිලාභ ජනතාවට ලැබෙනවා. රජයේ සේවකයාට වෙන්න පුළුවන්, පෞද්ගලික අංශයේ සේවකයාට වෙන්න පුළුවන්, මේ වැටුප් වැඩිවීම ඇතුළේ මුදල් සංසරණය වැඩි වෙනවා. ඒ නිසා මිනිස්සුන්ගේ ක්‍රය ශක්තිය වැඩි වෙනවා. ක්‍රය ශක්තිය වැඩි වෙනකොට, කර්මාන්තකරුවාට ඔවුන්ගේ නිෂ්පාදන වැඩි කරන්න සිද්ධ වෙනවා. හැම කර්මාන්තකරුවෙකුටම ඒ තුළින් වේගයෙන් වෙළෙඳ පොළ දක්වා ගමන් කරන්න පුළුවන් වෙනවා. ඒ නිසාම තමයි අපේ රටේ ආර්ථිකය ප්‍රසාරණය වෙනවා කියන්නේ. ඒ ආර්ථිකය ප්‍රසාරණය වීමේ වාසිය නැවත වතාවක් මේ රටේ ජනතාවට ලැබෙනවා. ඒ නිසා මේක අපේ රට ගමන් කරන මාර්ගය පිළිබඳ සලකුණු කිරීමක්. මේක ජනතා ආර්ථිකය පිළිබඳ සලකුණු කිරීමක්. ඒ විතරක් නොවෙයි. ප්‍රතිලාභ ජනතාවට බෙදී යනවා කියන සංකේතය තමයි මෙතැනින් ලැබෙන්නේ.

මෙච්චර කල් මොකක්ද වුණේ? යම් කණ්ඩායම් විසින්, විදේශිකයින් විසින් මෙච්චර කල් අපේ රටේ ජනතාව සූරාකෑමට ලක් කළා. හැබැයි, සාමාන්‍ය ජනතාවට ලැබිය යුතු ප්‍රතිලාභය ලැබුණේ ඉහළ පෙළේ අයට. අපි දන්නවා, මේ රටේ හිටපු ඉහළ පෙළේ අය බැංකුවලින් ගත් ණය නොගෙවා සිටීම නිසා ඒවා බොල් ණය විධියට කපා හැරපු බව. ඒ නොගෙවූ ණය ගැන ඉතිහාසයේදී කථා වුණා. මහජන බැංකුව, ලංකා බැංකුව වැනි බැංකුවලින් ණය ලබාගෙන ඒවා නොගෙවූ අය හිටියා. හැබැයි, ඔවුන් පෞද්ගලිකව හෙලිකොප්ටර් පවා පාවිච්චි කළා. ඔවුන් සමහර වෙලාවට එක්සත් ජාතික පක්ෂයේ වෙන්න පුළුවන්, නැත්නම් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ වෙන්න පුළුවන්, එහෙමත් නැත්නම් සමගි ජන බලවේගයේ වෙන්න පුළුවන්. අපට හිතාගන්න බැහැ, ඔවුන්ගේ පක්ෂය මොකක්ද කියලා. ඒ ප්‍රධාන පක්ෂවල ඉහළින් සිටි අයට, කෘත්‍යාධිකාරී මණ්ඩලවල සිටි ප්‍රධානීන්ට හෙලිකොප්ටර් තිබුණා, garment factories තිබුණා. ඒ දේවල් තබාගෙන ඒ අය මහජන බැංකුවෙන් සහ ලංකා බැංකුවෙන් ණයත් ගත්තා. හැබැයි, ඒවා බොල් ණය වුණා. එවැනි යුගයක් තමයි පසුගිය කාලයේ තිබුණේ. ජනතාව මහන්සි වෙලා හම්බ කළ ධනය ඒ මිනිස්සු හොරා කෑවා. එසේ හොරා කෑමේ ප්‍රතිඵලයක් විධියට තමයි අපේ රටේ ජනතාව දුප්පත් වෙලා තිබෙන්නේ. එදා එලෙස අපේ මිනිස්සු දුප්පත් වීමේ ප්‍රතිඵලයක් විධියට තමයි තවම ඔවුන්ට ඔළුව ඔසවා ගන්න බැරි වෙලා

[ගරු ටී.කේ. ජයසුන්දර මහතා]

තිබෙන්නේ. හැබැයි එසේ හොරකම් කළ මිනිස්සුම මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා හඬ නඟනවා, කෝ, අරවා ඉක්මනින් දෙන්න, මේවා ඉක්මනින් දෙන්න කියලා. ඒක තමයි පුදුමය. මේ මිනිස්සුන්ට හදවතක් තිබෙනවාද කියලා අපට ප්‍රශ්නයක් මතුවනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ රටේ ඉතිහාසයේ -මෑත ඉතිහාසයේ පමණක් නොවෙයි, ඈත ඉතිහාසයේත්- සිට මේ දක්වා සටන් කරලා තමයි කම්කරුවන් වැටුප් වැඩිවීම් දිනාගෙන තිබෙන්නේ. අපි දන්නවා, 1893දී මුද්‍රණ කම්කරුවන්ගේ සටනේ සිට 1980 ජූලි වර්ජකයන් දක්වා වූ සටන් ඉතිහාසයක් අපට තිබෙන බව. ඒ අය කීයක් හෝ දිනාගෙන තිබෙන්නේ සටන් කරලා තමයි. කඳුළු ගෑස් ප්‍රහාරවලට ලක්වෙලා, ලේ දහදිය වගුරා සටන් කරලා තමයි ඔවුන් කීයක් හෝ දිනාගෙන තිබෙන්නේ. අපි දන්නවා, 1980 ජූලි වර්ජනයේදී රුපියල් 10ක වැටුප් වැඩිවීමක් ඉල්ලූ අවස්ථාවේ එවකට පැවති එක්සත් ජාතික පක්ෂයේ ජේ.ආර්. ජයවර්ධන - ආර්. ප්‍රේමදාස රජය 114,000කගේ වැඩ තහනම් කළ බව. ඒ විතරක් නොවෙයි. ඒ ආණ්ඩුව මැර හමුදා - thugලා - පාවිච්චි කරලා තමයි ඒ අයට ගැහුවේ. ඒ අවස්ථාවේ පැවති රජයෙන් සෝමපාල කියන කම්කරුවා මරා දැම්මා. එවැනි යුගයක් තමයි අපි පසුකර තිබෙන්නේ.

පසුගිය කාලයේ අපි ගුරු සටන්වල හිටියා. ඒ කාලයේ මේ රටේ හිටපු ඇමතිවරුන් අපේ ගුරුවරුන්ට බැන්නේ කාලකණ්ණි කියලායි. ඒ සමහර ඇමතිවරුන් අද සිර ගෙවල්වල ඉන්නවා. ඒ වාගේම මෙතැනත් ඉන්නවා, ඒ යුගවල හිටපු අය, ඒවාට අත ඔසවපු අය. ඒ අය කැලණි ගඟෙන් නාලා ඇවිල්ලාද, කිරිවලින් නාලා ඇවිල්ලාද මම දන්නේ නැහැ, අද මෙතැනට ඇවිල්ලා විකාර කථා කියන්නේ. රාජ්‍ය අංශයේ සේවකයන්ගේ විතරක් නොවෙයි, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කර දීම තුළිනුත් සමස්ත සමාජයටම පණිවුඩයක් යනවා, මේ රජය වැඩ කරන ජනතාවගේ රජයක් කියලා. ඒක තමයි වැදගත් සිග්නල් එක. ඒ විතරක් නොවෙයි. අපි සාකච්ඡා සිදුකර තමයි අද මේ කටයුත්ත කරන්නේ; ජාතික කම්කරු උපදේශක සභාවේදී හාම්පුතුන්, වෘත්තීය සමිති සහ රජය මැදිහත්ව සාකච්ඡා කරලා තමයි මේ වැටුප් වැඩිවීම් සිදු කර තිබෙන්නේ.

මේ වෙලාවේ විපක්ෂයේ අය කලබල වෙන එක සාධාරණයි. මොකද, ජනතාව මේ කාරණා සම්බන්ධයෙන් සතුටු වෙන්න, සතුටු වෙන්න මෙතැන ඉන්න විපක්ෂයේ අය කලබල වෙන එක සාධාරණයි. අපි දැක්කා, මෙතැනදී ඒ අය කොහොමද දැඟලුවේ කියලා. අම්බිකා මන්ත්‍රීතුමිය කියපු කථාවක් සඳහන් කර එක මන්ත්‍රීතුමෙක් මෙතැනදී කිව්වා, ඒ සේවකයන්ගේ ප්‍රශ්න වෙනුවෙන් අපට සමාව ගන්න කියලා. හැබැයි, ජනතාව කියන්නේ ඒක නොවෙයි. ජනතාව අපට කියන්නේ, හොරු ටික ඉක්මනට ඇතුළට දැම්මේ නැත්නම්, අපට සමාව ගන්න වෙනවා කියලායි. පසුගිය දවස්වල සමහරුන් අත්අඩංගුවට ගන්නකොට ජනතාවගේ මුහුණු ප්‍රීතියෙන් පිනාගියා.

මේ වෙලාවේ අපට කියන්න තිබෙන්නේ අද අපේ ජාතියට සතුටු වෙන්න පුළුවන් දවසක් කියන එකයි. මතක තබාගන්න, මේ විපක්ෂයේ ඔක්කෝම එකතු වෙලා ප්‍රාදේශීය සභා බෙදාගන්න සාකච්ඡා කළා. සජබයේ අය එකක් ගන්නම්, පොහොට්ටුවේ අය වෙන එකක් ගන්නම් කියා ප්‍රාදේශීය සභා බෙදාගෙන බොහොම සමගියෙන් ජෝඩු දමාගෙන යන යුගයක් මේ තිබෙන්නේ. ඒ කියන්නේ මොකක්ද? හොරු සෙට් එක එකට එකතු වෙලා තමයි එන්නේ. මේ රටේ ජනතාව වෙනුවෙන් පත් වුණු මේ රජය පෙරළන්න පුළුවන්ද කියා බලන්න මේ හොරු සෙට් එක එකතු වෙනවා. හැබැයි, ඒක කරන්න හම්බ වෙන්නේ නැහැ. මොකද, අදට වඩා හෙට ජනතාව අපිත් එක්ක එකතු වෙනවා. ඒක විශ්වාසයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වැනි ජයග්‍රාහී දවසක වචන කිහිපයක් කථා කරන්න මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගමගෙදර දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට මිනිත්තු 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.21]

ගරු ගමගෙදර දිසානායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கமகெதர திசாநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Gamagedara Dissanayake - Deputy Minister of Buddhasasana, Religious and Cultural Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදයට ගන්නා පනත් කෙටුම්පත් අතරින් විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම මාසික වැටුප වැඩි කිරීම සඳහා සාකච්ඡා වනවා. ඒ සම්බන්ධව අදහස් කිහිපයක් දක්වන්න අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා.

අපි රාජ්‍ය අංශයේ සේවකයන්ට පසුගිය අය වැයෙන් සැලකිය යුතු වැටුප් ප්‍රමාණයක් වැඩි කරනකොට ඊට සමාන්තරව පෞද්ගලික අංශයේ සේවකයන් වෙනුවෙනුත් සැලකිය යුතු වැටුප් වැඩි කිරීමක් සඳහා යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබුවා. මෑත ඉතිහාසයේ පෞද්ගලික අංශයේ සේවකයන් වෙනුවෙන් මෙවැනි ආකාරයේ වැටුප් වැඩිවීමක් සිද්ධ වෙච්ච පළමුවැනි අවස්ථාව හැටියට තමයි අපි මේ අවස්ථාව දකින්නේ. මේ ගරු සභාවේ මීට කලින් අවස්ථා ගණනාවකදීම කථා වුණා වාගේ 2016දී පෞද්ගලික අංශයේ සේවකයින්ගේ ආරම්භක අවම මාසික වැටුප රුපියල් 10,000කින් තමයි පටන් ගත්තේ. නැවත වතාවක් 2021 අවුරුද්ද වනවිට එය රුපියල් 12,500ක් දක්වා වැඩි වුණා. ඒ අවුරුදු 5ක කාල සීමාව තුළ අවම වැටුපේ වැඩිවීම දැක්වෙන්නේ රුපියල් 2,500ක් ලෙසයි. එයින් අනතුරුව 2024දී එය රුපියල් 17,500ක් දක්වා වැඩි වුණා. එතැනදීත් ඒ අවුරුදු තුනට අවම වැටුපේ වැඩිවීම ගණනය කරන්නේ රුපියල් 5,000ක් හැටියටයි. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා කෙටි කාලයක් ඇතුළත 2025 අය වැය යෝජනා සමඟ අපි පෞද්ගලික අංශයේ සේවකයාගේ අවම මාසික වැටුප රුපියල් 27,000 දක්වා වැඩි කරන්න යෝජනා කරනවා. 2021දී ඊට කලින් තිබුණු අවම මාසික වැටුපට වඩා රුපියල් 2,500කිනුත්, 2024දී රුපියල් 17,500ක් දක්වා රුපියල් 5,000කිනුත් වැඩි වුණු පෞද්ගලික අංශයේ සේවකයාගේ අවම මාසික වැටුප මේ අවස්ථාවේදී අපි එකවර රුපියල් 9,000කින් වැඩි කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ අනුව මම හිතන විධියට මේ තත්ත්වය යටතේ තව මාස හයක් වාගේ ඉතා කෙටි කාලයක් ඇතුළත එම අවම මාසික වැටුප රුපියල් 30,000 දක්වා වැඩි වෙනවා. 2024දී රුපියල් 17,500ක තිබුණු අවම මාසික වැටුප ආණ්ඩුවක් හැටියට අපි පත් වෙලා තවත් මාස හයක් ගත වනකොට රුපියල් 30,000 දක්වා වැඩි වෙනවා. රුපියල් 12,500ක වැඩිවීමක් මේ කෙටි කාල සීමාව තුළ ආණ්ඩුවක් හැටියට පෞද්ගලික අංශයේ සේවකයන්ට ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා. මෙන්න මේක තමයි අපේ ආණ්ඩුවේ විශේෂත්වය.

මීට පෙරාතුව පැවැති හැම ආණ්ඩුවක්ම පෞද්ගලික අංශයේ සේවකයන් පිළිබඳව ඉතා අඩු අවධානයක් තමයි යොමු කළේ. ඒ නිසා තමයි රාජ්‍ය අංශයේ සේවකයාගේ වැටුප් රුපියල් 5,000කින්, රුපියල් 10,000කින් වැඩි වෙනකොට පෞද්ගලික අංශයේ සේවකයාගේ වැටුප රුපියල් 2,500කින්, රුපියල් 3,000කින් වැඩි කරන්න තමයි මේ අය කටයුතු කරලා තිබුණේ. හැබැයි, ජනතාවාදී ආණ්ඩුවක් හැටියට අපි මේ පත් වෙච්ච කෙටි කාල සීමාව තුළ 2026 ජනවාරි මාසය වනවිට රුපියල් 12,500කින් මේ අයගේ වැටුප් වැඩි කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒක විශේෂත්වයක්.

දැන් විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු තර්ක කරනවා, මේ වැටුප් වැඩිවීම හරහා මේ දක්වා පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුපට එල්ලා තිබුණු රුපියල් 3,500ක දීමනාව යම් ප්‍රමාණයකට අහිමි වෙනවාය කියලා. මම හිතන විධියට, රාජ්‍ය සේවයත්, පෞද්ගලික අංශයේ සේවාවත් පිළිබඳව අවබෝධයක් තිබෙන අය දන්නවා, කෙනෙකුගේ මූලික වැටුපට එකතු වන මුදල පදනම් කරගෙන තමයි ප්‍රතිලාභ ලැබෙන්නේ කියලා. හැබැයි, අතිරේක වශයෙන් වැටුපට එල්ලා තිබෙන ඒවා ඕනෑ වෙලාවක ඉවත් කිරීමට හැකියාවකුත් නැතුවා නොවෙයි. ඒ නිසා මේ වෙලාවේ වැඩ කරන ජනතාව පිළිබඳව අවධානය යොමු කරපු පාලනයක් හැටියට අපි රාජ්‍ය සේවකයාගේත්, පෞද්ගලික අංශයේ සේවකයාගේත් වැටුප් වැඩි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. මෙහෙම තත්ත්වයක් පෞද්ගලික අංශයේ ලක්ෂ සංඛ්‍යාත සේවකයන්ට ඇති කර තිබියදී තමයි එක්තරා කණ්ඩායමක් මේක අභියෝගයට ලක් කරලා අධිකරණ ක්‍රියාමාර්ගවලට ගියේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට තේරෙන්නේ නැහැ, ඒ අය කොයි විධියටද මේ කම්කරුවා පිළිබඳව තක්සේරු කරන්නේ කියලා. කම්කරුවන්ට යම් ආකාරයක සහනයක් ලැබෙනවා නම්, යම් ප්‍රතිලාභයක් ලැබෙනවා නම්, ඊට ආශිර්වාද කිරීම තමයි වෘත්තීය සමිති ව්‍යාපාරයකත්, ඒ වාගේම දේශපාලන ව්‍යාපාරයකත් කාර්යභාරය විය යුත්තේ. හැබැයි, අපට පෙනෙනවා, මේ වෙලාවේදී මේ කම්කරුවන්ට ලැබෙන්න තිබෙන ප්‍රතිලාභය යම් මට්ටමකට හෝ අඩපණ වෙන්න, ප්‍රමාද වෙන්න මේ අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම හේතුවක් වුණා කියලා. මේ සම්බන්ධයෙන් කථා බහ කරපු විපක්ෂයේ බොහෝ දෙනා පෞද්ගලික අංශයේ කම්කරුවන් ගැන, වතු කම්කරුවන් ගැන බොහොම කනගාටුවට පත් වෙනවා; ශෝචනීය වෙනවා; කිඹුල් කඳුළු හෙළනවා. හැබැයි, අපි කවුරුත් දන්නවා, මේ දක්වා බලයේ හිටියේ මේ උදවිය බව. ඒ උදවියට වාගේම ඔවුන්ට උදවු පදවු කරපු අනිකුත් පාර්ශ්වයන්ට පසුගිය කාලය ඇතුළත ඕනෑ තරම් ඉඩකඩ තිබුණා, පෞද්ගලික අංශයේ කම්කරුවා වෙනුවෙන් තමන්ගේ මැදිහත්වීම ලබා දීලා ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරන්න අවශ්‍ය කරන දායකත්වය ලබා දෙන්න. නමුත්, ඒ කිසිවක් ඔවුන් කළේ නැහැ. මේ වෙලාවේදී ජනතාවාදී තීන්දුවක් අරගෙන පෞද්ගලික අංශයේ සේවකයාට ප්‍රතිලාභ ලැබෙන වැඩ පිළිවෙළ හදනකොට එය ඉවසා දරා ගත නොහැකිව මේ බොහෝ දෙනා කිඹුල් කඳුළු හෙළනවා, තමතමන්ගේ දේශපාලන මතවාද මතු කර ගැනීම සඳහා.

විපක්ෂයේ සමහර මන්ත්‍රීතුමන්ලා අදහස් දැක්වීමේදී කිව්වා, මේ අවස්ථාවේදී දීමනා හැටියට ලබා දෙන මේ අයවැය සහන දීමනා නතර කිරීම ඉදිරියේදී අය වැය සහන නොලැබී යන්න හේතුවක් බවට පත් වෙයි කියලා. එතුමන්ලා එසේ උපකල්පනය කරනවා. ඒක කිසිදු තර්කානුකූල පදනමක් ඇතුව ඉදිරිපත් කරන මතයක් නොවෙයි. ඒ වාගේම විපක්ෂයේ ප්‍රධාන යැයි කියන, අත්දැකීම් තිබෙන මන්ත්‍රීතුමන්ලා මේ සභාවටත්, රටටත් වැරදි අර්ථ ගැන්වීමක් කරන්න උත්සාහ ගත්තා, පෞද්ගලික අංශයේ සේවකයන්ට ලබා දෙන ප්‍රතිලාභ ආරක්ෂක අංශවලටත්, පිරිසිදු කිරීමේ සේවාවල නිරත වෙලා ඉන්න අයටත්, ඒ වාගේම manpower servicesවල වැඩකටයුතු කරන අයටත් ලැබෙන්නේ නැහැ කියලා. ඒක සම්පූර්ණයෙන් අසත්‍යයක්. මේ මඟින් යෝජනා කරලා තිබෙන ඒ සියලු ප්‍රතිලාභ සියලුම ක්ෂේත්‍ර නියෝජනය කරන අයට ලබා දෙන්න කටයුතු සිද්ධ වෙනවා කියන එක මේ වෙලාවේදී මම මතක් කරන්න ඕනෑ. ඒ වාගේම අපි දන්නවා, විධිමත් පෞද්ගලික ක්ෂේත්‍රයෙන් ඔබ්බේ තිබෙන සමහර අවිධිමත් ක්ෂේත්‍රවල පිරිස්වලට සමහර ගැටලුකාරී තත්ත්වයන් පැන නැඟිලා තිබෙන බව. ඒ තත්ත්වය සැලකිල්ලට අරගෙන මේ වෙද්දී අපි ආණ්ඩුවක් හැටියට ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ සාකච්ඡාවක් පටන් අරගෙන තිබෙනවා, අවිධිමත් ක්ෂේත්‍රයේ රැකියාවල නිරත වෙලා ඉන්න පිරිස් විධිමත්භාවයක් සහිත රැකියාවල නිරත කරමින් පෞද්ගලික ක්ෂේත්‍රයට ඇතුළත් කර ගන්නේ කොහොමද, ඒ සඳහා තිබෙන ඉඩකඩ කෙසේද කියන කාරණය සම්බන්ධයෙන්. මෙවැනි ආකාරයට, පුළුල් දැක්මක් සහිතව කටයුතු කරන ආණ්ඩුවක් හැටියට මේ වෙලාවේදී පෞද්ගලික අංශයේ සේවකයා වෙනුවෙන් ඒ මැදිහත්වීම කිසිදු අඩුවක් නැතුව ලබා දෙන්න අපි කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලික අංශයේ සේවකයාගේ අවම මාසික වේතනය මේ අවුරුද්දේ රුපියල් 27,000ක් වාගේම ලබන අවුරුද්දේ රුපියල් 30,000ක් කළාම ඒ හරහා ලැබෙන අතුරු ප්‍රතිලාභ ගණනාවක් තිබෙනවා. අප දන්නවා, මේ මූලික වැටුප් පදනම් කරගෙන තමයි EPF සහ ETF ගණනය කිරීම සිද්ධ වෙන්නේ කියලා. එවැනි අවස්ථාවක ඒ සේවකයන්ට වාසිදායක අතුරු ප්‍රතිලාභ ගණනාවක් ලබා ගන්න පුළුවන්කම තිබෙනවා.

ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ වෙලාවේ අප විසින් ගනු ලබන තීරණ සමඟ පෞද්ගලික අංශයේ සේවකයාට විශාල ප්‍රතිලාභ ප්‍රමාණයක් ලබාගන්න පුළුවන් වෙයි කියලා.

මම මේ වෙලාවේ මෙම කාරණයත් විශේෂයෙන් සිහිපත් කරන්න ඕනෑ. හාම්පුතුන්ගේ සංගම් ත්‍රෛපාර්ශ්වීය ගිවිසුම්වලට එකඟ වෙලා යම් සාධනීය මැදිහත්වීමක් ලබා දීලා තිබෙන වෙලාවක යම් යම් පාර්ශ්ව අධිකරණයේදී මේක අභියෝගයට ලක් කළ නිසා පෞද්ගලික අංශයේ සේවකයාට ලැබිය යුතුව තිබූ ප්‍රතිලාභය ඒ නිශ්චිත වෙලාවේ ලබාගන්න බැරි තත්ත්වයක් ඇති වුණා. ජනතාවාදී ආණ්ඩුවක් හැටියට ඒ සේවකයන් පිළිබඳව නිරන්තරයෙන් කල්පනා කරන අපි විශ්වාස කරනවා, අවම වැටුප වන රුපියල් 27,000 මේ වෙලාවේ ජීවත් වීම සඳහා ප්‍රමාණවත් නැහැ කියලා. රුපියල් 30,000ක් ලබන ජනවාරි මාසයේ ඉඳලා ලැබුණත්, ඒකත් ප්‍රමාණවත් නැහැ. හැබැයි, මේ අවම මූලික වැටුප මත පදනම් වෙලා ආයතන මට්ටමින් තව තවත් එකතු කිරීම් කරන්න ඉඩ කඩ තිබෙනවා. ජනතාවාදී, විශේෂයෙන් කම්කරුවන් වෙනුවෙන් මැදිහත් වෙච්ච විශාල නියෝජනයක් මේ ආණ්ඩුව තුළ තිබෙන නිසා කිසිදු වෙලාවක රාජ්‍ය අංශයේ සේවකයාටත්, පෞද්ගලික අංශයේ සේවකයාටත්, වතු සේවකයාටත් අසාධාරණයක් සිද්ධ වෙන්න ඉඩ කඩ තියන්නේ නැහැ කියන කාරණය මේ වෙලාවේ සිහිපත් කරමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.33]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ආණ්ඩුව විසින් මේ වැදගත් පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම පිළිබඳ අපේ ස්තුතිය පිරිනමනවා. මේ රටේ කම්කරු ජනතාවත්, පෞද්ගලික අංශයේ ජනතාවත් අද පවතින ජීවන වියදම අනුව ඉතාම අමාරු, අසීරු තැනක තමයි ඉන්නේ කියලා අපි දන්නවා. අද ඔවුන්ගේ ආදායම් මාර්ග කඩා වැටිලා, ජීවන වියදම විශාල වශයෙන් වැඩිවෙලා ජීවත් වෙන්න විධියක් නැති තැනකට තල්ලු වෙලා තිබෙන්නේ. පවතින තත්ත්වය කියන තරම් සුමට සහ සතුටුදායක තත්ත්වයක් කියලා මම විශ්වාස කරන්නේ නැහැ.

මට කලින් කථා කළ අපේ නියෝජ්‍ය ඇමතිතුමා මේ සම්බන්ධව කථා කරනකොට කිව්වා, පසුගිය කාලයේ පැවැති ආණ්ඩු මේ කිසිවක් වැඩි කරලා නැහැ කියලා. නැහැ, වැඩි කරලා තිබෙනවා. ඔබතුමා කරුණාකරලා බලන්න, විවිධ අය වැයවලින් ඒ සඳහා කටයුතු කර තිබෙනවා. මම මේ එක එක ආණ්ඩු ආරක්ෂා කරනවා නොවෙයි. සෑම ආණ්ඩුවක්ම එක තැනක ඉඳලා පටන් ගත්තාට පස්සේ පෞද්ගලික අංශයට මේ ක්‍රියාදාමය කරන්න අවශ්‍ය කරන උපදෙස් ටික දුන්නා විතරක් නොවෙයි, සමහර වෙලාවට නීති ගෙනැල්ලා සම්මත කරලා තිබෙනවා, මෙන්න මේ ප්‍රමාණයෙන් වැඩි කරන්න කියලා. ඒවා ක්‍රියාත්මක වෙලාත් තිබෙනවා. ඒ අනුව තමයි අද මෙතැනට එනකම් ඇවිත් තිබෙන්නේ. ඔබතුමන්ලා අද ඒක තව ටිකක් වැඩි කරලා තිබෙනවා. ඒක ගැන අපි සන්තෝස වෙනවා සහ ස්තුතිවන්ත වෙනවා. ඒක තමයි කළ යුතුව තිබෙන්නේ. *[බාධා කිරීමක්]* අන්න ඒක තමයි තිබෙන ප්‍රශ්නය. මේ ප්‍රමාණය ඇතිද කියන ප්‍රශ්නය තමයි දැන් තිබෙන්නේ. ඔබතුමාම කිව්වා, ඒක මදි තමයි කියලා. ඉස්සර ආණ්ඩුවක් රුපියල් 10,000කින් පඩි වැඩි කළාම රුපියල් 20,000ක් තමයි ඔබතුමන්ලා ඉල්ලන්නේ.

මේ අවම මාසික වැටුප රුපියල් 50,000ක් දක්වා ගේන්න කියලා අද පෞද්ගලික අංශයේ සේවකයින් ඉල්ලනවා. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා අරගෙන බැලුවාම, සාමාන්‍ය කම්කරු ජනතාවත් එක්ක කථා කරලා බැලුවාම, හතර දෙනෙක් ඉන්න පවුලකට යන වියදමට සාපේක්ෂව මේක රුපියල් 50,000ක් දක්වා වැඩි කරන්න කියලා ඔවුන් අද ඉල්ලනවා. ඔබතුමන්ලා මේ වැටුප අද රුපියල් 27,000ට ගෙනැල්ලා තිබෙනවා, ලබන අවුරුද්ද වෙනකොට එය රුපියල් 30,000 දක්වා වැඩි කරන්න නියමිතයි. මේක අත්‍යවශ්‍ය කාරණයක්. ඒ නිසා තමයි මේ සඳහා අපේ සහයෝගය ලබා දෙන්නේ. විවේචනය වාගේම අපි ලබා දෙන්න පුළුවන් සහයෝගයත් තමුන්නාන්සේලාට ලබා දෙනවා. මොකද, මේක වැදගත් කාරණයක් නිසා. මේකේදීත් අනෙක් පැත්තට පෙරළලා විපක්ෂයට බණින්න හදන්න එපා. මොකද, අද අපි ආණ්ඩුවේ නොවෙයි ඉන්නේ. ආණ්ඩුවල සිටි කාල වකවානුවල අපිත් මේ වැඩ කරලා තිබෙනවා. එහෙම නැහැ කියන්න බැහැ. අද මෙතැනට එනකම් ආවේ එහෙමයි.

ඒ වාගේම වතු කම්කරුවන් ගැනත් මම කියන්න ඕනෑ. දැන් වතු කම්කරුවන් බලාගන්න කවුරුවත් නැහැ. ඔවුන්ගේ පඩි වැඩි කිරීම සම්බන්ධව තමුන්නාන්සේලා කිව්වා, දිනක වැටුප රුපියල් 2,000 දක්වා වැඩි කරනවා කියලා. හැබැයි, දැන් මොකද වෙලා තිබෙන්නේ? තමුන්නාන්සේලා කිව්වා දැනට ඒක රුපියල් 1,700ට ගේනවා කියලා, හාම්පුතුන් සමඟ සාකච්ඡා කරනවා කියලා. ඒ වාගේම ජනාධිපතිතුමා අය වැය ඉදිරිපත් කරමින් කිව්වා මේක රුපියල් 1,700 කරනවා කියලා. නමුත් තවමත් හම්බ වෙන්නේ රුපියල් 1,300යි. මේක වැඩි කරන්න අවශ්‍ය කටයුතු ටික ඒගොල්ලන් කරන්නේ නැහැ. හාම්පුතුන් එක්ක සාකච්ඡා කරලායි කිව්වා ඒක කළේ. හැබැයි, පහුවදා උදේම හාම්පුතුන් කිව්වා එහෙම සාකච්ඡාවක් කළේ නැහැයි කියලා. ඒ නිසා අද වතු කම්කරුවන්ට මේ වැඩ පිළිවෙළ තුළ කිසිදු සහනයක් හම්බ වෙන්නේ නැහැ. ඒක තමයි තිබෙන ප්‍රශ්නය. ඒ නිසා අපි වතු කම්කරුවන්ට දෙන මූලික වැටුප් වැඩි කිරීමේ ක්‍රියාවලිය තවත් ශක්තිමත් කරන්න ඕනෑ.

ඒත් එක්කම මතක තියා ගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ ක්‍රියාදාමය කරනකොට අද පෞද්ගලික අංශයේ හාම්පුතුන්, නැත්නම් ව්‍යාපාරිකයන් එවැනි වැටුපක් දෙන්න පුළුවන් තත්ත්වයක ඉන්නවාද කියලා ඊළඟට අපි කල්පනා කරන්න ඕනෑ. ලෝකයේ පෙට්‍රල්, ඩීසල් මිල අඩු වෙනකොට තමුන්නාන්සේලා ඒවා වැඩි කරනවා. එහෙම කරන්න නම් ආණ්ඩුවක් ඕනෑ නැහැ කියලා තමුන්නාන්සේලාමයි කිව්වේ. පෙට්‍රල්වල මිල වැඩි කරනකොට වැඩි කරන්නයි, අඩු කරනකොට අඩු කරන්නයි ආණ්ඩු ඕනෑ නැහැයි කිව්වා, පිටකොටුවේ මුදලාලි කෙනෙක් ඇති කිව්වා. ඒ වාගේම ලියලා තියා ගන්න කිව්වා, වසන්ත සමරසිංහ මහත්තයා එක හාල් ඇටයක් පිට රටින් ගේන්නේ නැහැයි කිව්වා. හැබැයි, පහුවදාම හාල් මෙට්‍රික්ටොන් 40,000ක් ලංකාවට ගේන්න තීන්දුවක් ගත්තා. දැන් ලාල් කාන්ත මහත්තයා කියනවා, අපි වවලා අපි කනවා කියලා එකක් නැහැ, හාල් ඕනෑ තරම් ගේනවා කියලා. ඉතින්, මම දන්නේ නැහැ මොකක්ද මේ ආණ්ඩුවේ ක්‍රියාදාමය කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පහළ ඉන්න මිනිහාට වැටුප් වැඩි කරන මේ වෙලාවේ මතක තියා ගන්න ඕනෑ කාරණය තමයි, මේ රටේ 263,000ක් අහිංසක මිනිස්සුන්ට රක්ෂා දුන්නු මිනිස්සු අද පරාටේ ක්‍රමය හින්දා පාරට වැටිලා තිබෙනවා කියන එක. ලක්ෂ 10ක් ව්‍යාපාරිකයෝ අසරණ වෙලා තිබෙනවා. මේ මාස කිහිපය ඇතුළත ඔවුන්ගේ සියලු දේපොළ පවරා ගන්න යනවා. ඒකට කිසිම විසඳුමක් නැහැ. අපි පාර්ලිමේන්තුවෙන් යෝජනා සම්මත කරලා කියනවා පෞද්ගලික අංශයට වැටුප වැඩි කළා කියලා. හැබැයි, පෞද්ගලික අංශයට වැටුප් වැඩි කරනකොට දවස ගානේ පෞද්ගලික අංශයේ රක්ෂා නැති වෙනවා. ඒ නිසා මම හිතනවා අපි මෙහිදී ඒ ගැනත් කල්පනා කළ යුතුයි කියලා.

රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ආණ්ඩුව යටතේ "උරුමය" කියලා වැඩසටහනක් පටන් ගත්තා. ඒ උරුමය වැඩසටහන යටතේ මේ රටේ ලක්ෂ 20කට, තමන්ට කියලා ඉඩමක අයිතිය නැති මිනිස්සුන්ට ඉඩමක අයිතිය දෙන වැඩ පිළිවෙළ පටන් ගත්තා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව යටතේ අද උරුමය, කරුමයක් වෙලා තිබෙන්නේ. මොකද, හේතුව? 2025 පෙබරවාරි 14වන දා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා ලාල් කාන්ත මැතිතුමා සමාලෝචන කමිටුවක් පත් කරනවා. ඒ සමාලෝචන කමිටුවේ තීන්දුව මේ වෙනකොට දීලා ඉවරයි. අවසර පත්‍ර සහ දීමනා පත්‍ර ඉල්ලන මිනිස්සු ලක්ෂ 4කට වැඩි ප්‍රමාණයක් මේ මොහොත වෙනකොට තමුන්ගේ ඔප්පුව භාර දීලා ඉවරයි ආණ්ඩුවට. දැන් ඒ මිනිස්සුන්ට ඔප්පුවත් නැහැ, ආණ්ඩුව දෙනවා කියපු කරුමයත් නැහැ, බලපත්‍රයත් නැහැ. ඒ මිනිස්සු දැන් යන එන මං නැතිව කල්පනා කරනවා, "දැන් මොකක්ද අපි කරන්නේ?" කියලා. මොකක්ද තිබෙන ප්‍රශ්නය? රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ අත්සනින් යුක්තව ලූ, ඒ ඔප්පු හදලා තිබෙන්නේ. ඒක තමයි තිබෙන ප්‍රශ්නය. දැන් ඒක ඔබතුමන්ලාට දී ගන්න බැහැ. දැන් ඒවායේ අනුර දිසානායක මහත්තයාගේ නම ගහ ගන්නකම් දී ගන්න විධියක් නැතිව තියාගෙන ඉන්නවා. ඉඩම් කොමසාරිස් ළඟ දීමනා පත්‍ර ප්‍රමාණයක් තිබෙනවා, තමන්ගේ ඔප්පු භාර දීපු 93,289කගේ. ඉඩම් කොමසාරිස් ජෙනරාල්වරයා යටතේ තිබෙනවා 50,484ක්. මහවැලි අධිකාරිය යටතේ

තිබෙනවා 42,805ක් ඔප්පු. තර්කය මොකක්ද? මේ උරුමය වැඩසටහනින් ලබා දුන් ඉඩම් අන්සතු කිරීම මඟින් කුඩා කැබලි කොටස් බවට පත් වෙනවා කියන තර්කය තමුන්නාන්සේලා දිගින් දිගටම ඉදිරිපත් කළා. සමහර අයට මේකේ සැක සංකාවක් තිබුණා. හැබැයි, මොකක්ද වෙලා තිබෙන්නේ? අවුරුදු 100ට වඩා පැරණි ගොවි බිම්වල අයිතිය ඒ මිනිස්සුන්ට තිබුණේ නැහැ, ගොවීන්ට තිබුණේ නැහැ. උරුමය වැඩසටහන යටතේ ලබා දීලා තිබුණු නිදහස් ප්‍රදාන පත්‍ර, දැනට ලබා දීලා තිබෙන තත්ත්වය තමුන්නාන්සේලාගේ ඒ තර්කය නිසා බොඳ කරන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අම්පාරේ දුන්නා ප්‍රදාන පත්‍ර 2,533ක්. ඒකෙන් ඔවුන් විකුණලා තිබෙන්නේ 135යි. අනුරාධපුරයේ 2,306ක් **ඔප්පු** දුන්නා, ඒකෙන් 15යි ඔවුන් යම් කෙනෙකුට පවරලා තිබෙන්නේ. කිලිනොච්චියේ ඉඩම් කට්ටි 2,147කට ඔප්පු දුන්නා. ඒකෙන් 16යි ඔවුන් තවත් කෙනෙකුට, ඒ පවුලේම කෙනෙකුට පවරා තිබෙන්නේ. උරුමය වැඩසටහන යටතේ මුලතිව්වල ඉඩම් කට්ටි 1,724ක් දුන්නා. ඒකෙන් 12යි පවරා තිබෙන්නේ. කුරුණෑගල 981ක් දුන්නා. ඒකෙන් තමන්ගේ නෑදෑයෙකුට හෝ තමන්ගේ සහෝදරයෙකුට නැත්නම් පවුලේ කෙනෙකුට හෝ පවරා තිබෙන්නේ 34යි. රත්නපුර ප්‍රදේශයේ ඔප්පු 233ක් දුන්නා; 8යි පවරා තිබෙන්නේ. එහෙම නම්, මේ ක්‍රියාදාමය තුළ මේ නිදහස් ප්‍රදාන පත්‍ර පිළිබඳව තමුන්නාන්සේලා මවපු බොරු ආකල්පය, මවපු ඒ භීතිය බොරුවක් බවට අද පත් වෙලා තිබෙනවා. මිනිස්සු ලක්ෂ තුනහතරක් තමන්ගේ ඔප්පු ටික දීලා බලාගෙන ඉන්නවා, දැන් තමන්ට ඒ අවසර පත්‍ර, දීමනා පත්‍ර හම්බ වෙයි කියලා. කරුණාකර ඒ මිනිසුන්ට ඔප්පු ටික දෙන්න. ඒ ඔප්පු ටික දැන් තිබෙන්නේ, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ. ඒගොල්ලන් කියනවා, "ඒවා දැන් මෙහාට එවලා තිබෙනවා" කියලා. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවල, මහවැලි අධිකාරිය ආදි හැම තැනකම දැන් ඒ ෆයිල් ගොඩ ගැහිලා තිබෙනවා. කරුණාකර මේ සම්බන්ධව තීන්දුවක් ගන්න. එම නිදහස් ප්‍රදාන පත්‍ර නිකුත් කිරීම නිසා දැන් ඉඩම් වෙළෙඳ පොළ සක්‍රිය වෙලා තිබෙනවා කියලා එම සමාලෝචන කමිටුවම කියනවා. ඒ කමිටුවේ නිර්දේශවලින් එහෙම කියන්නේ. ඉඩම් ගනුදෙනු වර්ධනය වී ඉඩමට නියම වටිනාකමක් ලැබී තිබෙන බව කියනවා; මුද්දර ගාස්තු නියමාකාරයෙන් ගෙවීමෙන් රාජ්‍ය ආදායම් වැඩි වෙලා තිබෙන බව කියනවා; ඉඩම් හිමියාට නියම තක්සේරු වටිනාකමක් ලැබී තිබෙන බව කියනවා. ඒ අය මේ වාගේ කාරණා ගණනාවක් දැන් කියනවා. ඒ ඉඩම් ටික කරුණාකර බෙදලා දෙන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලනවා.

පසුගිය කාලයේ තමුන්නාන්සේලා විශාල අදහසක් ඉදිරිපත් කළා, Colombo Port City එක සම්බන්ධයෙන්. ඒක කවුරු හැදුවත්, ඒ ව්‍යාපෘතිය කවුරු ගෙනාවත් ඒ ක්‍රියාදාමය තුළ විවිධ ස්ථාන යට වෙනවා කියලා තමුන්නාන්සේලා විශාල භීතියක් ඇති කළා. මට මතක හැටියට, මීගමුව පැත්තේ අපේ කතෝලික ජනතාව ඒ විධියට බය කළා. හැබැයි, දැන් ඒක හොඳට තියෙනවා. කිසි ගැටලුවක් නැහැ. මේ වාගේ බය කිරීම් ගණනාවක් තමුන්නාන්සේලා ඇති කළා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් Colombo Port City එකට අදාළව හොරෙන්ම බදු සහන දීලා. ජනාධිපතිතුමාගේ, 2025 ජූලි මාසයේ 14 දිනැති අංක 2445/02 අති විශේෂ ගැසට් පත්‍රය යටතේ බදු සහන සහ දිරිගැන්වීම් ලබා දෙනවා Ceylon Real Estate Holdings (Pvt.) Limited එකට. ඒකට අවුරුදු 35කට අදාළව බදු සහන ආදිය දෙනවා. ඒ වාගේම Clothespin Management and Development (Pvt.) Limited එකටත් බදු සහනයක් දෙනවා. ඒ වාගේම 2025 ජූලි 14 දිනම අංක 2445/03, 2445/04, 2445/05 දරන අති විශේෂ ගැසට් නිවේදනවලින් තමයි මේ සහන දෙන්නේ. ඒ වාගේම IFC Colombo (Pvt.) Limited සහ ICC Port City (Pvt.) Limited යන සමාගම්වලටත් බදු සහන දෙනවා. 2025.07.01 දිනයේ කැබිනට් තීරණවල සමාගම්වලට බදු සහන ලබා දීමක් ගැන සඳහන් වෙන්නේ නැහැ. එමෙන්ම ජූලි 07වන දා කැබිනට් තීරණයේත් මේ ගැන සඳහන් වෙන්නේ නැහැ. එහෙම නම්, මුළු රටටම ඒක හංගලායි තිබෙන්නේ. අපට කියන්න, තමුන්නාන්සේලා මොනවාද දුන්නේ කියලා. ඒ වාගේම කැබිනට් තීරණ දැනුම් දීමේ ප්‍රකාශයෙනුත් ඒක අයින් කරලා. එහිදී දැනුම් දෙන්නේත් නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு அரவிந்த செனரத் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. ARAVINDA SENARATH left the Chair, and THE HON. SPEAKER took the Chair.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඉතින්, රාජපක්ෂවරුන් මේ මේ සහන දුන්නා, ඒ අය කැමති කැමති අයට බදු සහන දුන්නා කිය කියා තමුන්නාන්සේලා කයිය ගහලා අවසානයේ තමුන්නාන්සේලාත් බදු සහන දෙනවා. දැන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් - IMF එකත් - කියනවා, මේ බදු සහන දෙන්න එපා කියලා. හැබැයි තමුන්නාන්සේලා බදු සහන දෙනවා. අපි ඒකට විරුද්ධ නැහැ. ඒකට විරුද්ධ වෙච්ච කට්ටිය වෙච්ච තමුන්නාන්සේලායි දැන් ඒක කරන්නේ. ඒකයි මම කියන්නේ. ඒ කාලයේ තමුන්නාන්සේලා මොනවාද කිව්වේ? දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ අය සුරාබදුවලින් නිදහස්; රේගු බදුවලින් නිදහස්; වැට් එකෙන් නිදහස්; වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදුවලින් නිදහස්. පැල් බදුවලින් නිදහස්; ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතෙන් නිදහස්; කම්කරුවන්ගේ රක්ෂාව අවසාන කිරීමේ (විශේෂ විධිවිධාන) පනතින් නිදහස්; විදේශ විනිමය පනතෙන් නිදහස්. දැන් මේ ඔක්කොගෙන්ම නිදහස් කරලායි තිබෙන්නේ. හොඳයි නේද, වසන්ත සමරසිංහ ඇමතිතුමා? හොඳයිද මේක? *[බාධා කිරීමක්]* තමුන්නාන්සේලා කථා කළේ ඕවා නොවෙයි. අපට ප්‍රශ්නයක් නැහැ. අපි කිව්වේ සහන දීලා පුළුවන් තරම් ආයෝජකයන් ගෙන්වාගන්න කියලා. තමුන්නාන්සේලා මොකක්ද කිව්වේ? තමුන්නාන්සේලා දිගටම කිව්වේ, "ආයෝජකයන්ට ඕනෑ විධියට නටනවා, අවුරුදු 35, 40 බදු සහන දෙනවා" කියලායි. "මෙහෙම කරන්න ආණ්ඩු ඕනෑද?" කියලා තමයි ඇහුවේ. දැන් තමුන්නාන්සේලාම සහන දෙනවා. ඕක තමයි යථාර්ථය. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලාට දැන් ඒක තේරෙනවා. මොකද, කෙට්ටුවට හිටපු වසන්ත සමරසිංහ මහත්මයා දැන් පොඩ්ඩක් මහත් වෙලා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
කොහේද?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අර හිර වෙන්න ඇඳපු චූටි ඇඳුම දැන් ටිකක් ලොකු කරලා ඇඳගෙන තිබෙනවා. පොඩ්ඩක් දුවන්න, උදේට හවසට. ඇමතිකම් ගත්තාම ඔහොම තමයි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමාත් එනවාද දුවන්න?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අපේ අගමැතිතුමියත් මහත් වෙලා පොඩ්ඩක්. දුවන්න උදේට එහේට මෙහේට පොඩ්ඩක්. මොකද, තමුන්නාන්සේලා විපක්ෂයේ හිටියේ හීනි, කෙට්ටු ශරීර සහිතව. නලින්ද ජයතිස්ස සහෝදරයා තමයි යන්තම් ගාණට ඉන්නේ. ඒ, එතුමා කන්නේ නැති හින්දා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන්.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු ඇමතිතුමා, තමුන්නාන්සේලා ආණ්ඩු ගත්තාම හැදෙන විධිය ගැන මට දැන් හොඳට පේනවා. තමුන්නාන්සේලා පටන් ගත්තු තැන නොවෙයි දැන් ඉන්නේ. අපේ නිහාල් ගලප්පත්ති සහෝදරයා දැන් මෙතැන නැහැ. මට මතකයි, 1994 එතුමා ආවේ රතුම රතු පාට වෙල්වට් රෙද්දෙන් මහපු කෝට් එකක් ඇඳලා කියන එක. මම දන්නේ නැහැ, වෙල්වට් රෙද්දෙන් කෝට් අඳිනවාද කියලා. නමුත් එතුමා වෙල්වට් රෙද්දෙන් කෝට් එක ඇඳලා, උඩට එනකල් බොත්තම් ටික දාලා ආවා මට හොඳට මතකයි. එතුමා ත්‍රීවීල් එකේ ආවේ. හැබැයි, එතුමාට අද ඇමතිකමක්වත් නැහැ. පව්! නමුත්, අද තමුන්නාන්සේලා අද ඇමතිකම් අරගෙන බඩ මහත් වෙලා හොඳ තැනකට එන එක ගැන අපි සන්තෝෂ වෙනවා. මෙහෙම බදු නිදහස දීලා *[බාධා කිරීමක්]* කොහොමහරි ආදායම වර්ධනය කරගන්න කියලාත් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා.

[අ.භා. 4.48]

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු කථානායකතුමනි, රස්සා නැති වුණාට පස්සේ විපක්ෂයේ කට්ටිය අලුත් රස්සා හොයා ගන්නවා කියලා මම දැනගත්තා, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා දැන් කියපු කථාවෙන්. එතුමා මේ දවස්වල බර කිර කිරා යනවා ලු. Charge එක කීයද දන්නේ නැහැ. රුපියල් 5 ද, බර කිරන්න ගන්නේ? රුපියල් 5 ද බර කිරන්න ගන්නේ, එක්කෙනෙකුගෙන්? ගරු කථානායකතුමනි, විපක්ෂයේ කථාවෙන් පෙනුණා, ආණ්ඩුවේ ක්‍රියාමාර්ග පිළිබඳව එතුමන්ලා කොපමණ භීතියට පත් වෙලාද කියන එක. අනාගතය තමන්ට කොපමණ අඳුරුද කියලා එතුමන්ලාට පේන්න පටන් අරගෙන තිබෙනවා.

අද මේ පාර්ලිමේන්තුවේ පැවැත්වෙන්නේ අපේ රටේ පෞද්ලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප වැඩි කිරීම සම්බන්ධයෙන් වන පනත් කෙටුම්පත් පිළිබඳ විවාදය. අපි දන්නවා, සාමාන්‍යයෙන් අපේ රටේ ශ්‍රම බලකායේ විශාලම කොටස නියෝජනය කරන්නේ පෞද්ගලික අංශයේ සේවකයන් කියලා. ඒ අය තමයි ආර්ථිකයේ එන්ජිම බවට පත් වෙන්නේ. ඒ පෞද්ගලික අංශයේ සේවකයා නියෝජනය කරන, මේ රටේ අතිබහුතරයක් සාමාජිකත්වය දරන අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපතිවරයා ලෙසත් මා කටයුතු කරන නිසාම තමයි මා මේ සංවාදයට එකතු වෙන්නේ. අපි කාලයක් තිස්සේ පඩි වැඩි කරවා ගැනීමේ අරගළය කරපු මිනිස්සු. ඒ නිසා අපේ ආණ්ඩුව හදලා පළමුවැනි අය වැයෙන් රුපියල් 9,000කින් රජයේ සේවකයන්ගේ අවම වැටුප වැඩි කරන්න අපි තීරණයක් ගත්තා. අපේ ආණ්ඩුව ඒ තීරණය ගත්තාම අප ගත්තු ඒ තීරණය පිළිබඳව අද විපක්ෂය මොකද කියන්නේ? ඒ අය අපේ තීරණය තුළ අඩු පාඩු හොයන්න හදනවා. එසේ අඩු පාඩු හොයන්න හදන ගමන් "අනේ අපොයි අපිට වෙච්ච දේ!" කියලා පාර්ලිමේන්තු කාලය පාවිච්චි කරලා අද මෙතැන මහා අඬ ඇඬියාවක් තමයි නහමින් යන්නේ. එතුමන්ලා දුක කියනවා. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට සෑහෙන දුක හිතිලා තිබෙන්නේ. අනෙක් දවසේ tape එකක් අරගෙන ආවා නම් ඔක්කෝම මැනගෙන ගියහැකි. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කෝ අර- *[බාධා කිරීමක්]* ඒක ගෙනැත් දෙන්න කෝ, කරුණාකරලා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒක ඔබතුමා ඉල්ලාගෙන ගියා නේ.

දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා Colombo Port City එක ගැන කිව්වා, ඉඩම් ඔප්පු ගැන කිව්වා. ගරු මන්ත්‍රීතුමනි, තව ඉතුරු වෙච්ච මොනවා හරි තිබෙනවා නම් හෙට අනිද්දාට ඔබතුමාට කියන්න පුළුවන්. මේ විවාදය ඇතුළේ අපි කථා කරන, මේ රටේ වැඩිම ශ්‍රම බලකාය නියෝජනය කරන සංවිධානාත්මක සහ අසංවිධාන්තමක ක්ෂේත්‍රයේ හැටපන් ලක්ෂයක් ඉන්නවා. ඒ හැටපන් ලක්ෂය නියෝජනය කරන අයගේ වැටුප පිළිබඳයි මේ තීරණය ගන්නේ. අද ඒක ගැනයි අපි කියන්නේ. අද අප ඒක ගැන කියනකොට විපක්ෂය වතු සේවකයා පිළිබඳ ප්‍රශ්නයක් කියන්න හදනවා. වතු සේවකයා පිළිබඳ ප්‍රශ්නයක් නහමින් ඒ නීතිය පිළිබඳවත් ප්‍රශ්නයක් නහනවා. අපේ මන්ත්‍රීවරු දෙපළක් ඒ සම්බන්ධයෙන් පනත් සංශෝධනයකුත් ඉදිරිපත් කරන්න කථා කරලා තිබෙනවා මම දැක්කා. වතු සේවකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් ආණ්ඩුවක් හැටියට අප පෙනී ඉන්නවා කියන එක අපි සහතික කරලා තිබෙනවා. අපි ඒ වෙනුවෙන් මැදිහත් වෙනවා. හැබැයි මේ වතු සේවක වැටුප් පිළිබඳ ප්‍රශ්නය උසාවියේදීත් අවසන් කර ගන්නවා. මොකද, 2019-2021, වතු කම්කරුවන්ගේ වැටුප් පිළිබඳ සාමූහික ගිවිසුම අවසන් වුණාට පස්සේ වැටුප් වැඩිවීමක් නොලැබුණාම වෘත්තීය සමිති ගිවිසුම් නැතිව ඉන්නවා. වතු ක්ෂේත්‍රයේ වෘත්තීය සමිති තුනයි ගිවිසුම අත්සන් කරන්නේ. එකක් CWC එක, අනෙක් එක LJEWU එක, අනෙක් එක සියලුදෙනා එකතු වෙච්ච Joint Plantation Trade Union Centre එක - එතැන unions 14ක් තිබෙනවා - ඉතින් ඒ අය තමයි දිගටම ගිවිසුම් ගහගෙන ආවේ. එසේ ගිවිසුම් ගහගෙන ඇවිල්ලා, පසුගිය සැප්තැම්බර් මාසය වනකල් අපේ Wages Board එකේ fight එකක් දීලා Wages Board එක වතු කම්කරුවන්ගේ වැටුප රුපියල් 1,700ට ගෙනාවාම හාම්පුතුන්

ගියා උසාවි. හාම්පුතුන් උසාවි ගියාට පස්සේ ඒ ගොල්ලෝ ඒ රුපියල් 1,700ත් discrete කරලා එහෙම නැත්නම් බෙදලා කිව්වා, මූලික පඩියට රුපියල් 1,350යි, වැඩි වන තේ දලු කිලෝ එකකට රුපියල් 50යි කියලා. ගරු කථානායකතුමනි, විවිධ වතුවල ඵලදායීතාව මත ඒ කිලෝ ගණන වෙනස් වෙනවා. රුපියල් 1,350ක් හම්බ වෙන්නේ දෛනික වැටුප හැටියට. සමහර වතුවල කිලෝ 13යි, 15යි, 18යි, 20යි, 22යි කඩන්න පුළුවන්. විවිධ වතුවල ඵලදායීතාව මත ඒක වෙනස් වෙනවා. දවසකට ඊට වඩා කිලෝ එකක් කැඩුවොත් රුපියල් 50ක් ලැබෙනවා. ඒ අනුව තව කිලෝ හතක් දක්වා යන්න අවස්ථාවක් තිබෙනවා කියලා තමයි රුපියල් 1,700 දක්වා මේ ගණන ගෙනාවේ. මේ වැටුප් වැඩි වීම ගැන Wages Board එකේ සාකච්ඡා කරද්දී විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු එතැන හිටියා. රුපියල් 1,700 ගැන උසාවියට යනකොටත් එතුමන්ලා හිටියා. 2024 සැප්තැම්බර් මාසයේ 10වැනි දා මේක settle වෙලා අවසන් කරනවා, Wages Board එකෙන්. දැන් ඒ සාමූහික ගිවිසුම තිබෙනවා. එහෙම නම් සාකච්ඡා කරලා වතුවල සේවකයන් අද සටනට එනවාද? නැහැ.

ගරු කථානායකතුමනි, මේ වැටුප් වැඩි වීම ඇතුළේ දෛනික වැටුප රුපියල් 1,350 කියන එක තිබෙනවා. ඒකත් එක්ක තව රුපියල් 350ක් එකතු වුණාම රුපියල් 1,700යි. සියයට 80ක් වතුවල මේ රුපියල් 350, එහෙම නැත්නම් over-kilo rate එකට ලැබෙන ගණන ලබා ගැනීමේ අවස්ථාව තිබෙනවා. අපි හාම්පුතුන්ට කියන්නේ ඒකත් සහතික වෙන විධියට සේවකයන්ට දෛනිකව රුපියල් 1,700ක වැටුපක් ලැබෙන විධියට පහසුකම හදන්න කියලායි. ඒක සහතික කරන්න තමයි අපි මැදිහත් වෙන්නේ.

ඒ එක්කම, පෞද්ගලික අංශයේ සේවකයන් ගැන විශේෂයෙන් කියන්න ඕනෑ. පෞද්ගලික අංශයේ සේවකයන්ට අවම පඩිය ලෙස තිබුණේ රුපියල් 17,500යි. අයවැය සහන දීමනා පනත් දෙකක් මේ පාර්ලිමේන්තුවේදී සම්මත කරලා තිබෙනවා. ඒ දෙකටම අපි මැදිහත් වුණා. ඒ තමයි, 2005 අංක 36 අයවැය සහන දීමනා පනත සහ 2016 අංක 04 දරන අය වැය සහන දීමනා පනත. ඒ දෙකෙන් තමයි තව රුපියල් 3,500ක් එකතු වෙන්නේ. ඒ අනුව තමයි රුපියල් 17,500 රුපියල් 21,000 වෙන්නේ. රුපියල් 17,500 රුපියල් 21,000 වෙනවා. ඒක ප්‍රමාණවත් නැති නිසා තමයි අපි, කම්කරු ඇමතිතුමා, නියෝජ්‍ය ඇමතිතුමා, හාම්පුතුන්ගේ සම්මේලනය, විවිධ හාම්පුතුන් ඒකාබද්ධ කරලා කිව්වේ, "එළැඹෙන අය වැයේ පඩි වැඩිවීමේ යෝජනාවේදී අපේ යෝජනාව මේක" කියලා. වෘත්තීය සමිති හැටියට අපි එතැන හිටියා. ඒ යෝජනාව අනුව තමයි අපි කිව්වේ, අවම වැටුප රුපියල් 30,000ක්වත් වෙන්න ඕනෑ කියලා. ඒක නිසා පළමුවැනි අවුරුද්දේ පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප රුපියල් 6,000කින් වැඩි වුණා.

ගරු කථානායකතුමනි, අවම වැටුප වැඩි වෙනකොට, එතැනින් උඩ අයගේ වැටුප් විෂමතාවක් ඇතිවන එක නවත්වන්න, ඒ ඉහළ අයගේ වැටුපත් වැඩි කිරීමේ වුවමනාවක් එනවා. පෞද්ගලික අංශයේ සේවකයන්ට ඉතිහාසයේ වැඩිම මූලික වැටුප් වැඩි වීම ලබා දුන්නේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් කියන කාරණය අපි අද සහතික කරලා කියනවා. අතීතයේ කවුරුවත් එහෙම මැදිහත් වීම් කළේ නැහැ. අපට මතකයි, 2005 අංක 36 අයවැය සහන දීමනා පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න යන වෙලාවේ, වෘත්තීය සමිති ඔක්කෝම එකතු වෙලා රුපියල් 1,500ක් කියලා කිව්වාම, ආණ්ඩුව ඒකෙන් රුපියල් 500ක් අඩු කළා. එදා තමයි ආණ්ඩුව හාම්පුතුන් වෙනුවෙන් පෙනී සිටියේ. අපි රුපියල් 5,000ක් ඉල්ලුවා. 2016 අංක 04 දරන අයවැය සහන දීමනා පනත් කෙටුම්පත පිළිබඳව අපි කථා කරලා එකඟ වෙලා ගියා. නමුත් අවසානයේදී රුපියල් 1,500යි, 1,000යි විධියට 2,500යි ලැබුණේ. ඉල්ලූ ගණනින් සියයට 50ක් කපලා තිබුණේ.

හැබැයි, අපි ජාතික ජන බලවේග ආණ්ඩුව හාම්පුතුන් එක්ක එකඟ වුණා කීයද වැඩි කරන්නේ කියලා. රුපියල් 9,000යි. කොහොමද ඒක වැඩි කරන්නේ? මේ අවුරුද්දේ අප්‍රේල් 01වැනි දා ඉඳලා රුපියල් 6,000යි. ලබන ජනවාරි ඉඳලා රුපියල් 3,000යි. මෙහෙම තමයි අපි යෝජනා කළේ. හැබැයි, අපි ගණන අඩු කළේ නැහැ. අපි ඒක හාම්පුතුන්ට කිව්වා; එකඟ වුණා. ඒ අනුව පෞද්ගලික අංශයේ සේවකයන්ට අපි මේ ගණන වැඩි කරලා දුන්නා. ඒ නිසා පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම පිළිබඳව ඉතිහාසයේ සිදු කරන හොඳම වැටුප් සංශෝධනය තමයි අපි මේ කරමින් තිබෙන්නේ. මෙතැනින් පස්සේ cleaning service එකක වෙන්න පුළුවන්, private security service එකක වෙන්න පුළුවන්, manpower company එකක වෙන්න පුළුවන්, කඩේක-සාප්පුවක සේවකයෙක් වෙන්න පුළුවන් දින 25ක් වැඩ කරන ඕනෑම කෙනෙකුගේ මාසික අවම වැටුප ලබන ජනවාරි වෙනකොට රුපියල් 30,000ක් දක්වා වැඩි වෙනවා. ඒක අනිවාර්යයයි.

ඒ වැටුප් වැඩි වීම ලබා ගන්න යන කොට අපි දැක්කා අද විපක්ෂයේ කට්ටිය බොහොම සෝචනීය කථා ටිකක් කියනවා. මම දැක්කා, නීතිය ක්‍රියාත්මක කරන එක පිළිබඳවත් දැන් ප්‍රශ්න කරනවා.

ගරු කථානායකතුමනි, සමහර මන්ත්‍රීවරුන්ගේ දරුවෝ බීලා අහුවෙන කථාව අද කථාවක් නොවෙයි. අතීතයේ අපි දන්නවා, එහෙම සිද්ධියක් වෙනවා, පහුවදාට ඉවර වෙනවා. සමහරු වාහන ගෙන්වනවා. සමහරු වාහන ගෙනැල්ලා බඩ් කරනවා; පදිනවා. අහුවුණාම ඒ සිද්ධිය දවස් දෙකින් අතුරුදහන් වෙනවා. ඇමතිවරු බීලා අහුවෙනවා. වාහන ගෙන්වනවා. ඒ සිද්ධිය අහු වුණාම අතුරුදහන් වෙනවා. පසුවදාට ඒවා ඉවරයි. අද පාර්ලිමේන්තුවේ සමහර මන්ත්‍රීවරු බීලා වාහන පැදලා අහුවුණාම දුක කියනවා, අනේ, අපොයි බේරෙන්න විධියක් නැහැ කියලා. නීතිය හැමෝටම එකයි. ඒක තමයි ජාතික ජන බලවේගයේ අපේ ආණ්ඩුවේ මූලික සංකල්පයක් වුණේ. රටේ ක්‍රියාත්මක වන නීතිය හැමෝටම එක හා සමානව ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒ නීතිය ක්‍රියාත්මක කරන්න යද්දීත් අද කෙඳිරියක් යනවා. ඒ නිසා දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට ඒ කෙඳිරිය එහෙම තමයි තිබෙන්නේ. රටේ නීතිය ක්‍රියාත්මක කරද්දීත් අද කෙඳිරි ගානවා. රට සංවර්ධනය කරන්න යද්දීත් කෙඳිරි ගානවා. වැටුප් ගැන කථා කරන්නේ නැහැ. වැටුප් වැඩි වුණාම අනෙක් පැත්තෙන් රස්සා නැති වෙනවා කියනවා. නැහැ, මේ රටේ හාම්පුතුන් සියලුදෙනා එක්ක එකතු වෙලා තමයි අපි මේ කථාව කරන්නේ. *[බාධා කිරීමක්]* ඔව්, හීන් කෙඳිරියක් එනවා. මොකටද? මේ වැඩ කරන්න එපා, එපා කියනවා වාගේයි ගරු කථානායකතුමනි එහෙම කියන්නේ. අපි ඒ වැඩ කරපුවාම, ඒ අයගේ ගමන මෙතැනින් ටික ටික තවත් ඉවර වෙනවා. ආණ්ඩුවේ ක්‍රියාමාර්ග සාර්ථක වෙනකොට, රට ගොඩ නැඟෙන කොට, ජනතාවගේ අපේක්ෂා ඉටු වෙනකොට විපක්ෂයට යන එන මං නැති වෙනවා.

ගරු කථානායකතුමනි, අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු මේ සංශෝධනය ඇතුළේ අපට සාකච්ඡා කරන්න වුවමනාව තිබුණේ මේ රටේ පෞද්ගලික අංශයේ සේවකයා මේ රට වෙනුවෙන් දක්වන දායකත්වය ගැන, පෞද්ගලික අංශයේ සේවකයාගේ කැප කිරීම ගැන. මේ නිසා අද ඇත එපිට ගම්මාන ආශ්‍රිතව තිබෙන ඇඟලුම් කර්මාන්තශාලාවල පවා වැඩ කරන සේවකයන්ගේ අවම වැටුප රුපියල් 30,000 දක්වා වැඩි වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! අද දින සභාවේ කටයුතු අවසාන වනතෙක් කාලය ලබා දීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, අපේ රටේ පෞද්ගලික අංශයේ සේවකයාගේ ආරක්ෂාව වෙනුවෙන් අද මේ ආණ්ඩුව අඛණ්ඩ මැදිහත්වීමක් කරමින් තිබෙන්නේ. අපේ රටේ වතු සේවකයා, පෞද්ගලික අංශයේ සේවකයා, අවිධිමත් අංශයේ සේවකයා කියන මේ හැමකෙනාම මේ සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත් කෙටුම්පතෙන් ආවරණය කරලා තිබෙන්නේ. ඒ නිසා අද අපට කථා කරන්න තිබෙන කාරණා ඇතුළේ හරි නම් කථා කරන්න තිබුණේ මොනවාද? මේ රට ගොඩ නඟන්න බදු සහන දෙන්න ඕනෑ වෙලා තිබෙනවා. අපි මේ වෙනකොටත් සාකච්ඡා කරමින් පවතින කාරුණු කාරණා තිබෙනවා. ජාතික බදු ප්‍රතිපත්තිය සාකච්ඡා කරන්න ඕනෑ. අමුද්‍රව්‍ය සඳහා බදු සහන ඕනෑ. ලෝකයේ වෙළෙඳ පොළත් එක්ක තරග කරන්න පුළුවන් නිෂ්පාදකයන් අපි ඇති කරන්න ඕනෑ. රට ඇතුළේ රැකියා වැඩිපුර ප්‍රමාණයක් බිහි කරන්න ඕනෑ. රට ඇතුළේ රැකියා වැඩිපුර බිහි වෙනකොට ඒ රැකියා කරන සේවකයන්ට ජීවත් වෙන්න පුළුවන් පඩියක් ලැබෙන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මේ වැටුප් සංශෝධනය නිසා අපේ රටට එන ආයෝජකයා දන්නවා, ඔවුන් සේවකයෙකුට ගෙවන්න ඕනෑ අවම වැටුප රුපියල් 30,000යි කියලා. ඒ නිසා කට්ටි පනින්න බැහැ. දැන් කම්කරු දෙපාර්තමේන්තුවට හරියට ජොබ් එක තිබෙනවා. ඒ මොකක්ද? මාසික අවම වැටුප රුපියල් 30,000ක් ලෙස ගණන් හදලා EPF සහ ETF ගෙවන්න ඕනෑ. ඒ නිසා වෙන දා විවිධ විධියට වැටුප් වෙනස් වෙලා තිබුණ නිසා අය වැය සහන දීමනා පනත්වලට අදාළ නඩු තවමත් අපි කථා කරනවා. අය වැය සහන දීමනා පනත්වලට අදාළ නඩු තවමත් අපි කථා කරනවා. මොකද, සමහර තැන්වල සේවකයන්ට මේ වැටුප් ගෙව්වේ නැහැ. බලය තිබෙන තැන්වල, හැකියාව තිබෙන තැන්වල, වෘත්තීය සමිති තිබෙන තැන්වල අපි සාකච්ඡා කරලා මේවා අත්පත් කර ගත්තා. හැබැයි, සමහර තැන්වල ඒවා දුන්නේ නැහැ. ඒවා ගණන් හදලා කම්කරු දෙපාර්තමේන්තුව නඩු දාලා තිබෙනවා. සමහර නඩු තවමත් විභාග වෙනවා. අය වැය සහන දීමනාව ගන්න හිටපු ඒ සේවකයා සමහර විට අද ජීවතුන් අතරත් නැහැ. ඒ සියල්ල එකතු කරලා අය වැය සහන දීමනා පනත් දෙකක් තිබුණා. 2005 අංක 36ත්, 2016 අංක 4ත් කියන මේ පනත් දෙකත්, සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පතත් එකතු කරලා තමයි සියලු සේවකයන්ගේ අවම වැටුප හැදුවේ.

අපි දන්නවා අපට ඉස්සරහට එන අභියෝග මොනවාද කියලා. නිෂ්පාදන ක්ෂේත්‍රයේ, විශේෂයෙන්ම අපනයන කර්මාන්තයට අදාළව අපට අභියෝග ප්‍රමාණයක් තිබෙනවා. ඒ අපනයන කර්මාන්තයට අදාළව එන අභියෝග තමයි ඇමෙරිකාව පනවලා තිබෙන සමහර බදු. ඒ නිසා අපට නව වෙළෙඳ පොළවල් හොයන්න වෙලා තිබෙනවා. ඒ වාගේම, අපි අපේ නිෂ්පාදකයන්ට සහන දෙන්න ඕනෑ වෙලා තිබෙනවා. ඒ වාගේම, රැකියා කරන ලක්ෂ 5කගේ, 6කගේ රැකියා සුරක්ෂිත කරන්න වෙලා තිබෙනවා. ආණ්ඩුව මේ අභියෝගය බාර අරගෙන තිබෙන්නේ. ආණ්ඩුව ඒ අභියෝගය බාර අරගෙන තමයි විවිධ ක්ෂේත්‍ර ඇතුළේ රජයේ ආදායම් අහිමි කර ගන්නේ නැතිව ආයෝජන සඳහා වැඩි අවස්ථාවක් හදන්නේ. Port City වාගේ ආයතන සුදු අලි කරන්නේ නැතිව අපි ඒක තවදුරටත් ඉස්සරහට යන්න පුළුවන් ක්‍රමයකට ගේන්න ඕනෑ. ඒ වාගේම, රට අභ්‍යන්තරයේ සිටින අනෙකුත් නිෂ්පාදකයන්ට, කර්මාන්තකරුවන්ට, අපනයනකරුවන්ට ඒ අයගේ කර්මාන්තය ආරක්ෂා කරමින් අපනයන කර්මාන්තයට ශක්තියක් වෙන්න පුළුවන් නිෂ්පාදන කරන්න අවශ්‍ය අමුද්‍රව්‍ය සඳහා වෙච්ච ඒ බදු වර්ග යම් ප්‍රමාණයක් හෝ අඩු කරන්න ඕනෑ.

ඒ වාගේම, අපට dumping තිබෙනවා. ඒ රටවල නිෂ්පාදන පිරිවැයටත් වඩා අඩු මිලට ලංකාවට ගෙනැල්ලා සමහර බඩු විකුණනවා. ලංකාවට ගෙනැල්ලා නිෂ්පාදන පිරිවැයටත් වඩා අඩුවෙන් බඩු විකුණද්දී ඒක අපේ රටේ දේශීය කර්මාන්තයට ප්‍රශ්නයක්. අන්න ඒ වෙනුවෙන් අපි නීති හැදුවා. Anti-Dumping and Countervailing Duties Act එක ගෙනාවා. අපේ රටේ නිෂ්පාදන කර්මාන්තවලට සම වෙළෙඳ පොළක් තුළ තරග කරන්න පුළුවන් වන ආකාරයට අපි නීති සකස් කරලා තිබෙනවා. ඒ සියල්ල කරමින් තිබෙන්නේ, රටේ ආර්ථිකය ස්ථාවර කරන්න; රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න. ඒ ශක්තිමත් කරන ආර්ථිකය තුළ පෞද්ගලික අංශය ස්ථාවර වෙද්දී, පෞද්ගලික අංශයේ රැකියා කරන, පෞද්ගලික අංශයේ රස්සාවකට එකතු වෙන හැම කෙනාටම අවම වශයෙන් රුපියල් 30,000ක වැටුපක් ලබා දෙන්න ජාතික ජන බලවේගයේ අපේ ආණ්ඩුව කටයුතු කරනවා. ඒ සඳහා නීති සංශෝධනය තමයි අපි මේ කරලා තිබෙන්නේ. අපි අය වැයෙන් පොරොන්දු වෙච්ච ආකාරයට මේ අයට රුපියල් 30,000ක් දුන්නා.

ගරු කථානායකතුමනි, මේ රටේ වැඩ කරන පන්තිය වෙනුවෙන්, වැඩ කරන පන්තියේ අයිතිවාසිකම් වෙනුවෙන් මැදිහත් වෙච්ච ආණ්ඩුවක් හැටියට අපි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කියන්න ඕනෑ, රාජ්‍ය සේවකයාගේ පඩිය, විශ්‍රාමිකයාගේ විශ්‍රාම වැටුප් විෂමතා ඇතුළු විශ්‍රාම වැටුප්, පෞද්ගලික අංශයේ සේවකයාගේ වැටුප් වැඩි කිරීම සඳහා, ඒ වාගේම වතු සේවකයාගේ රුපියල් 1,700ක දෛනික වැටුප තහවුරු කිරීම සඳහා අවශ්‍ය මැදිහත්වීම් සියල්ල අපි කරමින් සිටින බව. ඒ නිසා නීතිය ක්‍රියාත්මක වෙනකොට පාර්ලිමේන්තු කාලය පාවිච්චි කරලා ඒ ගැන කිඹුල් කඳුළු හෙළලා වැඩක් නැහැ. රට හොඳින් ඉදිරියට ගෙන යන්න ජාතික ජන බලවේගයේ ආණ්ඩුව මේ ගෙන යන ක්‍රියාමාර්ග අඛණ්ඩව, ශක්තිමත්ව ගෙන යන බව ප්‍රකාශ කරමින්, මේ සඳහා සහයෝගය ලබා දුන් හැමෝටම ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 1, සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීම, සභාව එකඟද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
බෙදීමක් ඉල්ලා සිටිනවා, ගරු කථානායකතුමනි.

බෙදුම් සීනුව නාද වී අවසන් වූණාට පසු -
பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -
At the conclusion of the Division Bell -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුන්ට දැන් ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීමට පක්ෂ නම් කොළ පාටත්, විරුද්ධ නම් රතු පාටත්, ඡන්දය දීමෙන් වැළකී සිටිනවා නම් කහ පාටත් භාවිත කළ හැකියි.

(මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.)
(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)
(At this stage, the Voting commenced.)

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි තහවුරු කරගන්න.

මගේ දකුණු අත පැත්තේ ඡන්දය දීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂව ද, විපක්ෂව ද?

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)
පක්ෂයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මගේ වම් අත පැත්තේ ඡන්දය දීමට නොහැකි වුණු මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂව ද, විපක්ෂව ද?

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
පක්ෂයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියලා තවත් සිටිනවාද?

ගරු ගයාන් ජනක මහතා
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂව ද, විපක්ෂව ද?

ගරු ගයාන් ජනක මහතා
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)
පක්ෂයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -
வாக்கெடுப்பின் பின் -
On conclusion of the Voting -

මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සහා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.
(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)
(At this stage, the following names appeared on the digital screen in the Chamber.)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 179; විරුද්ධව 0; වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.
இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 179; எதிராக 0; விலகியிருந்தோர் 0.
According to Electronic Voting, Parliament divided: Ayes 179; Noes 0; Abstain 0.

G 001. K.V. Samantha Viddyarathna	Yes
G 002. Sunil Handunnetti	Yes
G 003. K.D. Lal Kantha	Yes
G 004. Vijitha Herath	Yes
G 005. Nalinda Jayathissa	Yes
G 006. Bimal Rathnayake	Yes
G 007. Harini Amarasuriya	Yes
G 009. Ramalingam Chandrasekarn	Yes
G 010. Wasantha Samarasinghe	Yes
G 011. A.H.M.H. Abayarathna	Yes
G 012. Chrishantha Abeysena	Yes
G 013. Anil Jayantha	Yes
G 014. Harshana Nanayakkara	Yes
G 015. Dammika Patabendi	Yes
G 016. Saroja Savithri Paulraj	Yes
G 017. Ananda Wijepala	Yes
G 018. Hiniduma Sunil Senevi	Yes
G 019. Sunil Kumara Gamage	Yes
G 020. Kumara Jayakody	Yes
G 021. Rizvie Salih	Yes
G 022. Anura Karunathilaka	Yes
G 023. Upali Pannilage	Yes
G 024. Nihal Galappaththi	Yes
G 025. Nihal Abeysinghe	Yes
G 026. Namal Karunaratne	Yes
G 027. Wasantha Piyathissa	Yes
G 028. Gamagedara Dissanayake	Yes
G 029. R.M. Jayawardhana	Yes
G 030. Sunil Watagala	Yes
G 031. Rathna Gamage	Yes
G 032. Mahinda Jayasinghe	Yes

G 033. Chathuranga Abeysinghe Yes
G 034. Eranga Gunasekara Yes
G 035. Upali Samarasingha Yes
G 036. T.B. Sarath Yes
G 037. Nalin Hewage Yes
G 038. Prasanna Gunasena Yes
G 039. Anton Jayakody Yes
G 040. Sundaralingam Pradeep Yes
G 041. Hemali Weerasekara Yes
G 042. Ruwan Ranasinghe Yes
G 043. Muneer Mulaffer Yes
G 044. Susil Ranasinghe Yes
G 045. Hansaka Wijemuni Yes
G 046. Eranga Weeraratne Yes
G 047. Namal Sudarshana Yes
G 048. P. Ruwan Senarath Yes
G 049. Madhura Senevirathna Yes
G 050. Arun Hemachandra Yes
G 051. Janitha Ruwan Kodithuwakku Yes
G 052. Aruna Jayasekera Yes
G 054. Ashoka Ranwala Yes
G 055. Lakshman Nipuna Arachchi Yes
G 056. R.M. Gamini Rathnayake Yes
G 057. Manjula Suraweera Arachchi Yes
G 058. K. Ilankumaran Yes
G 059. Shantha Pathma Kumara Subasingha Yes
G 060. Samanmali Gunasingha Yes
G 062. Ajith Agalakada Yes
G 063. Sagarika Athauda Yes
G 064. Roshan Akmeemana Yes
G 065. U. P. Abeywickrama Yes
G 066. L.M. Abeywickrama Yes
G 067. M.K.M. Aslam Yes
G 068. Kaushalya Ariyarathne Yes
G 069. Asitha Niroshana Egoda Vithana Yes
G 070. Arkam Ilyas Yes
G 071. Oshani Umanga Yes
G 072. Krishnan Kalaichelvi Yes
G 073. Upul Kithsiri Yes
G 074. Wasantha Pushpa Kumara Yes
G 075. Chaminda Lalith Kumara Yes
G 076. Sarath Kumara Yes
G 077. Nilanthi Kottahachchi Yes
G 078. M.A.C.S. Chathuri Gangani Yes
G 079. Lasith Bhashana Gamage Yes
G 080.Thilanka U. Gamage Yes
G 081. Nilusha Lakmali Gamage Yes
G 082. Ajantha Gammeddage Yes
G 083. Ajith Gihan Yes
G 084. Jagath Gunawardana Yes
G 085. Aboobucker Athambawa Yes
G 086. Ruwanthilaka Jayakody Yes
G 088. T.K. Jayasundara Yes
G 089. Mayilvaganam Jegatheeswaran Yes
G 090. Rajeevan Jeyachandramoorthy Yes
G 091. Sellaththamby Thilaganathan Yes
G 092. Anushka Thilakarathne Yes
G 093. Chandana Thennakoon Yes
G 094. Thanura Dissanayake Yes
G 095. Dharmapriya Dissanayake Yes
G 096. Sujeewa Dissanayake Yes
G 097. Sugath Wasantha de Silva Yes
G 098. Susantha Dodawatta Yes
G 099. Susantha Kumara Nawarathna Yes
G 100. Sena Nanayakkara Yes
G 101. Najith Indika Yes
G 102. Aruna Panagoda Yes
G 103. Nimal Palihena Yes
G 104. Nishantha Perera Yes
G 105. Stepni Fernando Yes
G 106. Kanthasamy Prabu Yes
G 107. Lal Premanath Yes
G 108. Nanda Bandara Yes
G 109. Padmasiri Bandara Yes
G 110. Ravindra Bandara Yes
G 111. Sudath Balagalla Yes
G 112. Sri Bavanandarajah Yes
G 113. E. M. Basnayaka Yes
G 114. Wijesiri Basnayake Yes
G 115. Lakmali Hemachandra Yes
G 116. S. Sandaruwan Madarasinghe Yes
O 005. Rauff Hakeem Yes
O 006. R.M.Ranjith Madduma Bandara Yes
O 007. Gayantha Karunathilleka Yes
O 021. Dayasiri Jayasekara Yes
O 027. J. C. Alawathuwala Yes
O 029. Hector Appuhamy Yes
O 032. Sujith Sanjaya Perera Yes
O 036. Rohini Kumari Wijerathna Yes
O 039. Kaveenthiran Kodeeswaran Yes
O 040. Gnanamuththu Srineshan Yes
O 043. Waruna Liyanage Yes
O 044. Kins Nelson Yes
O 045. Rohana Bandara Yes
O 046. W.H.M. Dharmasena Yes
O 048. B. Ariyawansha Yes
O 049. Chamindranee Kiriella Yes
O 050. Chathura Galappaththi Yes
O 056. Chanaka Madugoda Yes
O 057. M.S. Uthumalebbe Yes
O 058. Abthul Wazeeth Yes
O 060. Thurairasa Ravikaran Yes
O 064. Nissam Kariyappar Yes
O 065. Prageeth Madhuranga Yes
O 066. Jagath Manuwarna Yes
O 067. Ruwan Mapalagama Yes
O 068. Nandana Millagala Yes
O 069. Riyas Farook Yes
O 070. Danushka Ranganath Yes
O 071. Sanjeewa Ranasingha Yes
O 072. Sunil Rathnasiri Yes
O 079. Elayathamby Srinath Yes
O 080. Pathmanathan Sathiyalingam Yes
O 081. Manjula Sugath Rathnayaka Yes
O 082. A.M.M.M. Rathwaththe Yes
O 083. Manoj Rajapaksha Yes
O 084. Sunil Rajapaksha Yes
O 085. Hasara Liyanage Yes
O 086. Deepthi Wasalage Yes
O 087. Kanchana Welipitiya Yes
O 088. R. G. Wijerathna Yes
O 089. Nishantha Samaraweera Yes
O 090. Priyantha Wijerathna Yes
O 091. Ruwan Wijeweera Yes
O 092. Darmapriya Wijesinghe Yes
O 093. Hiruni Wijesinghe Yes
O 094. Athula Welandagoda Yes
O 095. Fasmin Sharif Yes
O 096. Dinindu Saman Yes
O 097. Thilina Samarakoon Yes

O 098. Ambika Samivel	Yes
O 099. Dewananda Suraweera	Yes
O 100. Chandana Sooriyaarachchi	Yes
O 101. G.D. Sooriyabandara	Yes
O 102. Aravinda Senarath	Yes
O 103. Kitnan Selvaraj	Yes
O 104. Janaka Senarathna	Yes
O 105.Chandima Hettiaratchi	Yes
O 106. Champika Hettiarachchi	Yes
O 107. Dinesh Hemantha	Yes
O 108. Geetha Herath	Yes
O 109. Bhagya Sri Herath	Yes
O 110. Muhammad Faizal	Yes
O 111. Ashoka Gunasena	Yes
O 112. Nandana Pathmakumara	Yes
O 113. Sunil Biyanwila	Yes
O 114. Samantha Ranasingha	Yes
O 115. Nishantha Jayaweera	Yes

Electronic Voting Result:

Participants:

	Present	179
Votes:		
	Yes	179
	No	0
	Abstain	0

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්ද 179යි; නැඟී සිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 03යි. ඒ අනුව පක්ෂව ලබා දුන් මුළු ඡන්ද සංඛ්‍යාව 182යි.

විරුද්ධව 0යි; වැළකී සිටි 0යි.

ඒ අනුව, න්‍යාය පත්‍රයේ විෂය අංක 1, සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීම ඡන්ද 182කින්, එනම් විශේෂ බහුතර ඡන්දයෙන්, සම්මත, වූ බව දන්වනු කැමැත්තෙමි.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

தீர்மானிக்கப்பட்டது:
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Anil Jayantha]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
[THE HON. SPEAKER in the Chair.]

1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 1 to 3 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.
சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.
Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported without Amendment..

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙසද ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, බෙදීමක් අවශ්‍යයි.

බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -
பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -
At the conclusion of the Division Bells -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුන්ට දැන් ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත් කෙටුම්පත තුන්වන වර කියවීමට පක්ෂ නම් කොළ පාටත්, විරුද්ධ නම් රතු පාටත්, ඡන්දය දීමෙන් වැළකී සිටිනවා නම් කහ පාටත් භාවිත කළ හැකියි.

(මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.)
(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)
(At this stage, the Voting commenced.)

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි තහවුරු කරගන්න.

මගේ දකුණු අත පැත්තේ ඡන්දය දීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

කිසිවකු නොමැති බවයි පෙනී යන්නේ.

මගේ වම් අත පැත්තේ ඡන්දය දීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂව ද, විපක්ෂව ද?

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
පක්ෂයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියලා තවත් සිටිනවාද?

ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -
வாக்கெடுப்பின் பின் -
On conclusion of the Voting -

(මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.)
(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)
(At this stage, the following names appeared on the digital screen in the Chamber.)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 180; විරුද්ධව 0; වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.
இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 180; எதிராக 0; விலகியிருந்தோர் 0.
According to Electronic Voting, Parliament divided: Ayes 180 ; Noes 0; Abstain 0.

G 001. K.V. Samantha Viddyarathna	Yes
G 002. Sunil Handunnetti	Yes
G 003. K.D. Lal Kantha	Yes
G 004. Vijitha Herath	Yes
G 005. Nalinda Jayathissa	Yes
G 006. Bimal Rathnayake	Yes
G 007. Harini Amarasuriya	Yes
G 009. Ramalingam Chandrasekarn	Yes
G 010. Wasantha Samarasinghe	Yes
G 011. A.H.M.H. Abayarathna	Yes
G 012. Chrishantha Abeysena	Yes
G 013. Anil Jayantha	Yes
G 014. Harshana Nanayakkara	Yes
G 015. Dammika Patabendi	Yes
G 016. Saroja Savithri Paulraj	Yes
G 017. Ananda Wijepala	Yes
G 018. Hiniduma Sunil Senevi	Yes
G 019. Sunil Kumara Gamage	Yes
G 020. Kumara Jayakody	Yes
G 021. Rizvie Salih	Yes
G 022. Anura Karunathilaka	Yes
G 023. Upali Pannilage	Yes
G 024. Nihal Galappaththi	Yes
G 025. Nihal Abeysinghe	Yes
G 026. Namal Karunaratne	Yes
G 027. Wasantha Piyathissa	Yes
G 028. Gamagedara Dissanayake	Yes
G 029. R.M. Jayawardhana	Yes
G 030. Sunil Watagala	Yes
G 031. Rathna Gamage	Yes
G 032. Mahinda Jayasinghe	Yes
G 033. Chathuranga Abeysinghe	Yes
G 034. Eranga Gunasekara	Yes
G 035. Upali Samarasingha	Yes
G 036. T.B. Sarath	Yes
G 037. Nalin Hewage	Yes
G 038. Prasanna Gunasena	Yes
G 039. Anton Jayakody	Yes
G 040. Sundaralingam Pradeep	Yes
G 041. Hemali Weerasekara	Yes
G 042. Ruwan Ranasinghe	Yes
G 043. Muneer Mulaffer	Yes
G 044. Susil Ranasinghe	Yes
G 045. Hansaka Wijemuni	Yes
G 046. Eranga Weeraratne	Yes
G 047. Namal Sudarshana	Yes
G 048. P. Ruwan Senarath	Yes
G 049. Madhura Senevirathna	Yes
G 050. Arun Hemachandra	Yes
G 051. Janitha Ruwan Kodithuwakku	Yes
G 052. Aruna Jayasekera	Yes
G 054. Ashoka Ranwala	Yes
G 055. Lakshman Nipuna Arachchi	Yes
G 056. R.M. Gamini Rathnayake	Yes
G 057. Manjula Suraweera Arachchi	Yes
G 058. K. Ilankumaran	Yes
G 059. Shantha Pathma Kumara Subasingha	Yes
G 060. Samanmali Gunasingha	Yes
G 061. Gayan Janaka	Yes
G 062. Ajith Agalakada	Yes
G 063. Sagarika Athauda	Yes
G 064. Roshan Akmeemana	Yes
G 065. U. P. Abeywickrama	Yes
G 066. L.M. Abeywickrama	Yes
G 067. M.K.M. Aslam	Yes
G 068. Kaushalya Ariyarathne	Yes
G 069. Asitha Niroshana Egoda Vithana	Yes
G 070. Arkam Ilyas	Yes
G 071. Oshani Umanga	Yes
G 072. Krishnan Kalaichelvi	Yes
G 073. Upul Kithsiri	Yes
G 074. Wasantha Pushpa Kumara	Yes
G 075. Chaminda Lalith Kumara	Yes
G 076. Sarath Kumara	Yes
G 077. Nilanthi Kottahachchi	Yes
G 078. M.A.C.S. Chathuri Gangani	Yes
G 079. Lasith Bhashana Gamage	Yes
G 080.Thilanka U. Gamage	Yes
G 081. Nilusha Lakmali Gamage	Yes
G 082. Ajantha Gammeddage	Yes
G 083. Ajith Gihan	Yes
G 084. Jagath Gunawardana	Yes
G 085. Aboobucker Athambawa	Yes

G 086. Ruwanthilaka Jayakody Yes
G 087. Thushari Jayasingha Yes
G 088. T.K. Jayasundara Yes
G 089. Mayilvaganam Jegatheeswaran Yes
G 090. Rajeevan Jeyachandramoorthy Yes
G 091. Sellaththamby Thilaganathan Yes
G 092. Anushka Thilakarathne Yes
G 093. Chandana Thennakoon Yes
G 094. Thanura Dissanayake Yes
G 095. Dharmapriya Dissanayake Yes
G 096. Sujeewa Dissanayake Yes
G 097. Sugath Wasantha de Silva Yes
G 098. Susantha Dodawatta Yes
G 099. Susantha Kumara Nawarathna Yes
G 100. Sena Nanayakkara Yes
G 101. Najith Indika Yes
G 102. Aruna Panagoda Yes
G 103. Nimal Palihena Yes
G 104. Nishantha Perera Yes
G 105. Stepni Fernando Yes
G 106. Kanthasamy Prabu Yes
G 107. Lal Premanath Yes
G 108. Nanda Bandara Yes
G 109. Padmasiri Bandara Yes
G 110. Ravindra Bandara Yes
G 112. Sri Bavanandarajah Yes
G 113. E. M. Basnayaka Yes
G 114. Wijesiri Basnayake Yes
G 115. Lakmali Hemachandra Yes
G 116. S. Sandaruwan Madarasinghe Yes
O 005. Rauff Hakeem Yes
O 006. R.M.Ranjith Madduma Bandara Yes
O 007. Gayantha Karunathilleka Yes
O 021. Dayasiri Jayasekara Yes
O 027. J. C. Alawathuwala Yes
O 029. Hector Appuhamy Yes
O 032. Sujith Sanjaya Perera Yes
O 036. Rohini Kumari Wijerathna Yes
O 039. Kaveenthiran Kodeeswaran Yes
O 040. Gnanamuththu Srineshan Yes
O 043. Waruna Liyanage Yes
O 044. Kins Nelson Yes
O 045. Rohana Bandara Yes
O 046. W.H.M. Dharmasena Yes
O 048. B. Ariyawansha Yes
O 049. Chamindranee Kiriella Yes
O 050. Chathura Galappaththi Yes
O 056. Chanaka Madugoda Yes
O 057. M.S. Uthumalebbe Yes
O 058. Abthul Wazeeth Yes
O 060. Thurairasa Ravikaran Yes
O 064. Nissam Kariyappar Yes
O 065. Prageeth Madhuranga Yes
O 066. Jagath Manuwarna Yes
O 067. Ruwan Mapalagama Yes
O 068. Nandana Millagala Yes
O 069. Riyas Farook Yes
O 070. Danushka Ranganath Yes
O 071. Sanjeewa Ranasingha Yes
O 072. Sunil Rathnasiri Yes
O 079. Elayathamby Srinath Yes
O 080. Pathmanathan Sathiyalingam Yes
O 081. Manjula Sugath Rathnayaka Yes
O 082. A.M.M.M. Rathwaththe Yes
O 083. Manoj Rajapaksha Yes
O 084. Sunil Rajapaksha Yes
O 085. Hasara Liyanage Yes
O 086. Deepthi Wasalage Yes
O 087. Kanchana Welipitiya Yes
O 088. R. G. Wijerathna Yes
O 089. Nishantha Samaraweera Yes
O 090. Priyantha Wijerathna Yes
O 091. Ruwan Wijeweera Yes
O 092. Darmapriya Wijesinghe Yes
O 093. Hiruni Wijesinghe Yes
O 094. Athula Welandagoda Yes
O 095. Fasmin Sharif Yes
O 096. Dinindu Saman Yes
O 097. Thilina Samarakoon Yes
O 098. Ambika Samivel Yes
O 099. Dewananda Suraweera Yes
O 100. Chandana Sooriyaarachchi Yes
O 101. G.D. Sooriyabandara Yes
O 102. Aravinda Senarath Yes
O 103. Kitnan Selvaraj Yes
O 104. Janaka Senarathna Yes
O 105.Chandima Hettiaratchi Yes
O 106. Champika Hettiarachchi Yes
O 107. Dinesh Hemantha Yes
O 108. Geetha Herath Yes
O 109. Bhagya Sri Herath Yes
O 110. Muhammad Faizal Yes
O 111. Ashoka Gunasena Yes
O 112. Nandana Pathmakumara Yes
O 113. Sunil Biyanwila Yes
O 114. Samantha Ranasingha Yes
O 115. Nishantha Jayaweera Yes

Electronic Voting Results

Participants:

Present 180

Votes:

Yes 180

No 0

Abstain 0

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්ද 180යි; නැඟී සිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 01යි. ඒ අනුව පක්ෂව ලබා දුන් මුළු ඡන්ද සංඛ්‍යාව 181යි.

විරුද්ධව 0යි; වැළකී සිටි 0යි.

ඒ අනුව, සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත් කෙටුම්පත තුන්වන වර කියවා සංශෝධන රහිතව ඡන්ද 181කින්, එනම් විශේෂ බහුතර ඡන්දයෙන්, සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.

அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Bill accordingly read the Third time, and passed.

සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන) පනත් කෙටුම්පත
வேலையாளர்களின் வரவுசெலவுத்திட்ட நிவாரணப்படி (திருத்தம்) சட்டமூலம்
BUDGETARY RELIEF ALLOWANCE OF WORKERS (AMENDMENT) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, බෙදීමක් අවශ්‍යයි.

බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -
பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -
At the conclusion of the Division Bell -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුන්ට දැන් ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

න්‍යාය පත්‍රයේ විෂය අංක 2, සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීම සම්මත කිරීමට පක්ෂ මන්ත්‍රීවරයන් කොළ පැහැති බොත්තමත්, විරුද්ධ මන්ත්‍රීවරයන් රතු පැහැති බොත්තමත්, ඡන්දය දීමෙන් වැළකී සිටින මන්ත්‍රීවරයන් කහ පැහැති බොත්තමත් භාවිත කර ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

(මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.)
(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)
(At this stage, the Voting commenced.)

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි තහවුරු කරගන්න.

මගේ දකුණු අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

කිසිවෙකු නොමැති බවයි පෙනෙන්නේ.

මගේ වම් අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආචාර්ය වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂව ද, විපක්ෂව ද?

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
පක්ෂයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියලා තවත් සිටිනවාද?

ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -
வாக்கெடுப்பின் பின் -
On conclusion of the Voting -

මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.
(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)
(At this stage, the following names appeared on the digital screen in the Chamber.)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 179; විරුද්ධව 0; වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.
இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 179; எதிராக 0; விலகியிருந்தோர் 0.
According to Electronic Voting, Parliament divided: Ayes 179; Noes 0; Abstain 0.

G 001. K.V. Samantha Viddyarathna	Yes
G 002. Sunil Handunnetti	Yes
G 003. K.D. Lal Kantha	Yes
G 004. Vijitha Herath	Yes
G 005. Nalinda Jayathissa	Yes
G 006. Bimal Rathnayake	Yes
G 007. Harini Amarasuriya	Yes
G 009. Ramalingam Chandrasekarn	Yes
G 010. Wasantha Samarasinghe	Yes
G 011. A.H.M.H. Abayarathna	Yes
G 012. Chrishantha Abeysena	Yes
G 013. Anil Jayantha	Yes
G 014. Harshana Nanayakkara	Yes
G 015. Dammika Patabendi	Yes
G 016. Saroja Savithri Paulraj	Yes

G 017.	Ananda Wijepala	Yes
G 018.	Hiniduma Sunil Senevi	Yes
G 019.	Sunil Kumara Gamage	Yes
G 020.	Kumara Jayakody	Yes
G 021.	Rizvie Salih	Yes
G 022.	Anura Karunathilaka	Yes
G 023.	Upali Pannilage	Yes
G 024.	Nihal Galappaththi	Yes
G 025.	Nihal Abeysinghe	Yes
G 026.	Namal Karunaratne	Yes
G 027.	Wasantha Piyathissa	Yes
G 028.	Gamagedara Dissanayake	Yes
G 029.	R.M. Jayawardhana	Yes
G 030.	Sunil Watagala	Yes
G 031.	Rathna Gamage	Yes
G 032.	Mahinda Jayasinghe	Yes
G 033.	Chathuranga Abeysinghe	Yes
G 034.	Eranga Gunasekara	Yes
G 035.	Upali Samarasingha	Yes
G 036.	T.B. Sarath	Yes
G 037.	Nalin Hewage	Yes
G 038.	Prasanna Gunasena	Yes
G 039.	Anton Jayakody	Yes
G 040.	Sundaralingam Pradeep	Yes
G 041.	Hemali Weerasekara	Yes
G 042.	Ruwan Ranasinghe	Yes
G 043.	Muneer Mulaffer	Yes
G 044.	Susil Ranasinghe	Yes
G 045.	Hansaka Wijemuni	Yes
G 046.	Eranga Weeraratne	Yes
G 047.	Namal Sudarshana	Yes
G 048.	P. Ruwan Senarath	Yes
G 049.	Madhura Senevirathna	Yes
G 050.	Arun Hemachandra	Yes
G 051.	Janitha Ruwan Kodithuwakku	Yes
G 052.	Aruna Jayasekera	Yes
G 054.	Ashoka Ranwala	Yes
G 055.	Lakshman Nipuna Arachchi	Yes
G 056.	R.M. Gamini Rathnayake	Yes
G 057.	Manjula Suraweera Arachchi	Yes
G 058.	K. Ilankumaran	Yes
G 059.	Shantha Pathma Kumara Subasingha	Yes
G 060.	Samanmali Gunasingha	Yes
G 061.	Gayan Janaka	Yes
G 062.	Ajith Agalakada	Yes
G 063.	Sagarika Athauda	Yes
G 064.	Roshan Akmeemana	Yes
G 065.	U. P. Abeywickrama	Yes
G 066.	L.M. Abeywickrama	Yes
G 067.	M.K.M. Aslam	Yes
G 068.	Kaushalya Ariyarathne	Yes
G 069.	Asitha Niroshana Egoda Vithana	Yes
G 070.	Arkam Ilyas	Yes
G 071.	Oshani Umanga	Yes
G 072.	Krishnan Kalaichelvi	Yes
G 073.	Upul Kithsiri	Yes
G 074.	Wasantha Pushpa Kumara	Yes
G 075.	Chaminda Lalith Kumara	Yes
G 076.	Sarath Kumara	Yes
G 077.	Nilanthi Kottahachchi	Yes
G 078.	M.A.C.S. Chathuri Gangani	Yes
G 079.	Lasith Bhashana Gamage	Yes
G 080.	Thilanka U. Gamage	Yes
G 081.	Nilusha Lakmali Gamage	Yes
G 082.	Ajantha Gammeddage	Yes
G 083.	Ajith Gihan	Yes
G 084.	Jagath Gunawardana	Yes
G 085.	Aboobucker Athambawa	Yes
G 086.	Ruwanthilaka Jayakody	Yes
G 087.	Thushari Jayasingha	Yes
G 088.	T.K. Jayasundara	Yes
G 089.	Mayilvaganam Jegatheeswaran	Yes
G 090.	Rajeevan Jeyachandramoorthy	Yes
G 091.	Sellaththamby Thilaganathan	Yes
G 092.	Anushka Thilakarathne	Yes
G 093.	Chandana Thennakoon	Yes
G 094.	Thanura Dissanayake	Yes
G 095.	Dharmapriya Dissanayake	Yes
G 096.	Sujeewa Dissanayake	Yes
G 097.	Sugath Wasantha de Silva	Yes
G 098.	Susantha Dodawatta	Yes
G 099.	Susantha Kumara Nawarathna	Yes
G 100.	Sena Nanayakkara	Yes
G 101.	Najith Indika	Yes
G 102.	Aruna Panagoda	Yes
G 103.	Nimal Palihena	Yes
G 104.	Nishantha Perera	Yes
G 105.	Stepni Fernando	Yes
G 106.	Kanthasamy Prabu	Yes
G 107.	Lal Premanath	Yes
G 108.	Nanda Bandara	Yes
G 109.	Padmasiri Bandara	Yes

G 112.	Sri Bavanandarajah	Yes
G 113.	E. M. Basnayaka	Yes
G 114.	Wijesiri Basnayake	Yes
G 115.	Lakmali Hemachandra	Yes
G 116.	S. Sandaruwan Madarasinghe	Yes
O 005.	Rauff Hakeem	Yes
O 006.	R.M.Ranjith Madduma Bandara	Yes
O 007.	Gayantha Karunathilleka	Yes
O 021.	Dayasiri Jayasekara	Yes
O 027.	J. C. Alawathuwala	Yes
O 029.	Hector Appuhamy	Yes
O 032.	Sujith Sanjaya Perera	Yes
O 036.	Rohini Kumari Wijerathna	Yes
O 039.	Kaveenthiran Kodeeswaran	Yes
O 040.	Gnanamuththu Srineshan	Yes
O 043.	Waruna Liyanage	Yes
O 044.	Kins Nelson	Yes
O 045.	Rohana Bandara	Yes
O 046.	W.H.M. Dharmasena	Yes
O 048.	B. Ariyawansha	Yes
O 049.	Chamindranee Kiriella	Yes
O 050.	Chathura Galappaththi	Yes
O 056.	Chanaka Madugoda	Yes
O 057.	M.S. Uthumalebbe	Yes
O 058.	Abthul Wazeeth	Yes
O 060.	Thurairasa Ravikaran	Yes
O 064.	Nissam Kariyappar	Yes
O 065.	Prageeth Madhuranga	Yes
O 066.	Jagath Manuwarna	Yes
O 067.	Ruwan Mapalagama	Yes
O 068.	Nandana Millagala	Yes
O 069.	Riyas Farook	Yes
O 070.	Danushka Ranganath	Yes
O 071.	Sanjeewa Ranasingha	Yes
O 072.	Sunil Rathnasiri	Yes
O 079.	Elayathamby Srinath	Yes
O 080.	Pathmanathan Sathiyalingam	Yes
O 081.	Manjula Sugath Rathnayaka	Yes
O 082.	A.M.M.M. Rathwaththe	Yes
O 083.	Manoj Rajapaksha	Yes
O 084.	Sunil Rajapaksha	Yes
O 085.	Hasara Liyanage	Yes
O 086.	Deepthi Wasalage	Yes
O 087.	Kanchana Welipitiya	Yes
O 088.	R. G. Wijerathna	Yes
O 089.	Nishantha Samaraweera	Yes
O 090.	Priyantha Wijerathna	Yes
O 091.	Ruwan Wijeweera	Yes
O 092.	Darmapriya Wijesinghe	Yes
O 093.	Hiruni Wijesinghe	Yes
O 094.	Athula Welandagoda	Yes
O 095.	Fasmin Sharif	Yes
O 096.	Dinindu Saman	Yes
O 097.	Thilina Samarakoon	Yes
O 098.	Ambika Samivel	Yes
O 099.	Dewananda Suraweera	Yes
O 100.	Chandana Sooriyaarachchi	Yes
O 101.	G.D. Sooriyabandara	Yes
O 102.	Aravinda Senarath	Yes
O 103.	Kitnan Selvaraj	Yes
O 104.	Janaka Senarathna	Yes
O 105.	Chandima Hettiaratchi	Yes
O 106.	Champika Hettiarachchi	Yes
O 107.	Dinesh Hemantha	Yes
O 108.	Geetha Herath	Yes
O 109.	Bhagya Sri Herath	Yes
O 110.	Muhammad Faizal	Yes
O 111.	Ashoka Gunasena	Yes
O 112.	Nandana Pathmakumara	Yes
O 113.	Sunil Biyanwila	Yes
O 114.	Samantha Ranasingha	Yes
O 115.	Nishantha Jayaweera	Yes

Electronic Voting Results:

Participants:

Present	179

Votes:

Yes	179
No	0
Abstain	0

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්ද 179යි; නැඟී සිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 01යි. ඒ අනුව, පක්ෂව ලබා දුන් මුළු ඡන්ද සංඛ්‍යාව 180යි.

විරුද්ධව 0යි; වැළකී සිටි 0යි.

ඒ අනුව න්‍යාය පත්‍රයේ විෂය අංක 02, සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීම ඡන්ද 180කින්, එනම් විශේෂ බහුතර ඡන්දයෙන්, සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

தீர்மானிக்கப்பட்டது:
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த]
Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Anil Jayantha]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[THE HON. SPEAKER in the Chair.]

1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 1 to 3 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.
சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported without Amendment..

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙසද ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, බෙදීමක් අවශ්‍යයි.

බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -
பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -
At the conclusion of the Division Bell -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුන්ට දැන් ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

න්‍යාය පත්‍රයේ විෂය අංක 2, සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන) පනත් කෙටුම්පත තුන්වන වර කියවීම සම්මත කිරීමට පක්ෂ මන්ත්‍රීවරුන් කොළ පැහැති බොත්තමත්, විරුද්ධ මන්ත්‍රීවරුන් රතු පැහැති බොත්තමත්, ඡන්දය දීමෙන් වැළැකී සිටින මන්ත්‍රීවරුන් කහ පැහැති බොත්තමත් භාවිත කර ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.
(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)
(At this stage, the Voting commenced.)

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි තහවුරු කරගන්න.

මගේ දකුණු අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

කිසිවෙකු නොමැති බවයි පෙනෙන්නේ.

මගේ වම් අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආචාර්ය වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂව ද, විපක්ෂව ද?

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
පක්ෂයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියලා තවත් සිටිනවාද?

ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව-
வாக்கெடுப்பின் பின் -
On conclusion of the Voting -

මේ අවස්ථාවේ පහත සඳහන් නම් සහ ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.
(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)
(At this stage, the following names appeared on the digital screen in the Chamber.)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 180; විරුද්ධව 0; වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.

இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 180; எதிராக 0; விலகியிருந்தோர் 0.

According to Electronic Voting, Parliament divided: Ayes 180; Noes 0; Abstain 0.

G 001. K.V. Samantha Viddyarathna	Yes
G 002. Sunil Handunnetti	Yes
G 003. K.D. Lal Kantha	Yes
G 004. Vijitha Herath	Yes
G 005. Nalinda Jayathissa	Yes
G 006. Bimal Rathnayake	Yes
G 007. Harini Amarasuriya	Yes
G 009. Ramalingam Chandrasekarn	Yes
G 010. Wasantha Samarasinghe	Yes
G 011. A.H.M.H. Abayarathna	Yes
G 012. Chrishantha Abeysena	Yes
G 013. Anil Jayantha	Yes
G 014. Harshana Nanayakkara	Yes
G 015. Dammika Patabendi	Yes
G 016. Saroja Savithri Paulraj	Yes
G 017. Ananda Wijepala	Yes
G 018. Hiniduma Sunil Senevi	Yes
G 019. Sunil Kumara Gamage	Yes
G 020. Kumara Jayakody	Yes
G 021. Rizvie Salih	Yes
G 022. Anura Karunathilaka	Yes
G 023. Upali Pannilage	Yes
G 024. Nihal Galappaththi	Yes
G 025. Nihal Abeysinghe	Yes
G 026. Namal Karunaratne	Yes
G 027. Wasantha Piyathissa	Yes
G 028. Gamagedara Dissanayake	Yes
G 029. R.M. Jayawardhana	Yes
G 030. Sunil Watagala	Yes
G 031. Rathna Gamage	Yes
G 032. Mahinda Jayasinghe	Yes
G 033. Chathuranga Abeysinghe	Yes
G 034. Eranga Gunasekara	Yes
G 035. Upali Samarasingha	Yes
G 036. T.B. Sarath	Yes
G 037. Nalin Hewage	Yes
G 038. Prasanna Gunasena	Yes
G 039. Anton Jayakody	Yes
G 040. Sundaralingam Pradeep	Yes
G 041. Hemali Weerasekara	Yes
G 042. Ruwan Ranasinghe	Yes
G 043. Muneer Mulaffer	Yes
G 044. Susil Ranasinghe	Yes
G 045. Hansaka Wijemuni	Yes
G 046. Eranga Weeraratne	Yes
G 047. Namal Sudarshana	Yes
G 048. P. Ruwan Senarath	Yes
G 049. Madhura Senevirathna	Yes
G 050. Arun Hemachandra	Yes
G 051. Janitha Ruwan Kodithuwakku	Yes
G 052. Aruna Jayasekera	Yes
G 054. Ashoka Ranwala	Yes
G 055. Lakshman Nipuna Arachchi	Yes
G 056. R.M. Gamini Rathnayake	Yes
G 057. Manjula Suraweera Arachchi	Yes
G 058. K. Ilankumaran	Yes
G 059. Shantha Pathma Kumara Subasingha	Yes
G 060. Samanmali Gunasingha	Yes
G 061. Gayan Janaka	Yes
G 062. Ajith Agalakada	Yes
G 063. Sagarika Athauda	Yes
G 064. Roshan Akmeemana	Yes
G 065. U. P. Abeywickrama	Yes
G 066. L.M. Abeywickrama	Yes
G 067. M.K.M. Aslam	Yes
G 068. Kaushalya Ariyarathne	Yes
G 069. Asitha Niroshana Egoda Vithana	Yes
G 070. Arkam Ilyas	Yes
G 071. Oshani Umanga	Yes
G 072. Krishnan Kalaichelvi	Yes
G 073. Upul Kithsiri	Yes
G 074. Wasantha Pushpa Kumara	Yes
G 075. Chaminda Lalith Kumara	Yes
G 076. Sarath Kumara	Yes
G 077. Nilanthi Kottahachchi	Yes
G 078. M.A.C.S. Chathuri Gangani	Yes
G 079. Lasith Bhashana Gamage	Yes
G 080.Thilanka U. Gamage	Yes
G 081. Nilusha Lakmali Gamage	Yes
G 082. Ajantha Gammeddage	Yes
G 083. Ajith Gihan	Yes
G 084. Jagath Gunawardana	Yes
G 085. Aboobucker Athambawa	Yes
G 086. Ruwanthilaka Jayakody	Yes
G 087. Thushari Jayasingha	Yes
G 088. T.K. Jayasundara	Yes
G 089. Mayilvaganam Jegatheeswaran	Yes
G 090. Rajeevan Jeyachandramoorthy	Yes
G 091. Sellaththamby Thilaganathan	Yes
G 092. Anushka Thilakarathne	Yes
G 093. Chandana Thennakoon	Yes
G 094. Thanura Dissanayake	Yes
G 095. Dharmapriya Dissanayake	Yes
G 096. Sujeewa Dissanayake	Yes
G 097. Sugath Wasantha de Silva	Yes
G 098. Susantha Dodawatta	Yes
G 099. Susantha Kumara Nawarathna	Yes
G 100. Sena Nanayakkara	Yes
G 101. Najith Indika	Yes
G 102. Aruna Panagoda	Yes
G 103. Nimal Palihena	Yes
G 104. Nishantha Perera	Yes
G 105. Stepni Fernando	Yes
G 106. Kanthasamy Prabu	Yes
G 107. Lal Premanath	Yes
G 108. Nanda Bandara	Yes
G 109. Padmasiri Bandara	Yes
G 110. Ravindra Bandara	Yes
G 111. Sudath Balagalla	Yes
G 112. Sri Bavanandarajah	Yes
G 113. E. M. Basnayaka	Yes
G 114. Wijesiri Basnayake	Yes
G 115. Lakmali Hemachandra	Yes
G 116. S. Sandaruwan Madarasinghe	Yes
O 005. Rauff Hakeem	Yes
O 006. R.M.Ranjith Madduma Bandara	Yes
O 007. Gayantha Karunathilleka	Yes
O 021. Dayasiri Jayasekara	Yes
O 027. J. C. Alawathuwala	Yes
O 029. Hector Appuhamy	Yes
O 032. Sujith Sanjaya Perera	Yes
O 036. Rohini Kumari Wijerathna	Yes
O 039. Kaveenthiran Kodeeswaran	Yes
O 040. Gnanamuththu Srineshan	Yes
O 043. Waruna Liyanage	Yes
O 044. Kins Nelson	Yes
O 045. Rohana Bandara	Yes
O 046. W.H.M. Dharmasena	Yes
O 048. B. Ariyawansha	Yes
O 049. Chamindranee Kiriella	Yes

O 050. Chathura Galappaththi	Yes
O 056. Chanaka Madugoda	Yes
O 057. M.S. Uthumalebbe	Yes
O 058. Abthul Wazeeth	Yes
O 060. Thurairasa Ravikaran	Yes
O 064. Nissam Kariyappar	Yes
O 065. Prageeth Madhuranga	Yes
O 066. Jagath Manuwarna	Yes
O 067. Ruwan Mapalagama	Yes
O 068. Nandana Millagala	Yes
O 070. Danushka Ranganath	Yes
O 071. Sanjeewa Ranasingha	Yes
O 072. Sunil Rathnasiri	Yes
O 079. Elayathamby Srinath	Yes
O 080. Pathmanathan Sathiyalingam	Yes
O 081. Manjula Sugath Rathnayaka	Yes
O 082. A.M.M.M. Rathwaththe	Yes
O 083. Manoj Rajapaksha	Yes
O 084. Sunil Rajapaksha	Yes
O 085. Hasara Liyanage	Yes
O 086. Deepthi Wasalage	Yes
O 087. Kanchana Welipitiya	Yes
O 088. R. G. Wijerathna	Yes
O 089. Nishantha Samaraweera	Yes
O 090. Priyantha Wijerathna	Yes
O 091. Ruwan Wijeweera	Yes
O 092. Darmapriya Wijesinghe	Yes
O 093. Hiruni Wijesinghe	Yes
O 094. Athula Welandagoda	Yes
O 095. Fasmin Sharif	Yes
O 096. Dinindu Saman	Yes
O 097. Thilina Samarakoon	Yes
O 098. Ambika Samivel	Yes
O 099. Dewananda Suraweera	Yes
O 100. Chandana Sooriyaarachchi	Yes
O 101. G.D. Sooriyabandara	Yes
O 102. Aravinda Senarath	Yes
O 103. Kitnan Selvaraj	Yes
O 104. Janaka Senarathna	Yes
O 105.Chandima Hettiaratchi	Yes
O 106. Champika Hettiarachchi	Yes
O 107. Dinesh Hemantha	Yes
O 108. Geetha Herath	Yes
O 109. Bhagya Sri Herath	Yes
O 110. Muhammad Faizal	Yes
O 111. Ashoka Gunasena	Yes
O 112. Nandana Pathmakumara	Yes
O 113. Sunil Biyanwila	Yes
O 114. Samantha Ranasingha	Yes
O 115. Nishantha Jayaweera	Yes

Electronic Voting Results:

Participants:

Present	180

Votes:

Yes	180
No	0
Abstain	0

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 180යි; නැඟී සිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 01යි. ඒ අනුව, පක්ෂව ලබා දුන් මුළු ඡන්ද සංඛ්‍යාව 181යි.

විරුද්ධව 0යි; වැළකී සිටි 0යි.

ඒ අනුව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2, සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන) පනත් කෙටුම්පත තුන්වන වර කියවා සංශෝධන රහිතව වැඩි ඡන්ද 181කින්, එනම් විශේෂ බහුතර ඡන්දයෙන්, සම්මත කරන ලද බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන් වන වර කියවා සම්මත කරන ලදී.

அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Bill accordingly read the Third time, and passed.

සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත
வேலையாளர்களின் தேசிய குறைந்தபட்ச வேதனம் (திருத்தம்) சட்டமூலம்
NATIONAL MINIMUM WAGE OF WORKERS (AMENDMENT) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.

இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.

Order for Second Reading read.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය:

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

தீர்மானிக்கப்பட்டது:

"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த]

Resolved:

"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Anil Jayantha]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[THE HON. SPEAKER in the Chair.]

1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 1 ordered to stand part of the Bill.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

දෙවන වගන්තිය සඳහා සංශෝධනය ඉදිරිපත් කිරීමට ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා.

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
Sir, I move the following Amendment:

"In page 1, insert New Cluase after Clause 2(1):

'2(2) However, with regard to the wages of plantation workers, the minimum wage mentioned in the above amendment should be one thousand and seven hundred rupees per day or an equivalent monthly salary.' "

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
එම සංශෝධනයට සභාව එකඟද?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු සභාපතිතුමනි, ගරු රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සංශෝධනයට එකඟ වන්නේ නැහැ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඒ අනුව, 2 වන වගන්තිය ඇති සැටියෙන් සම්මතයි.

2 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
2ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 2 ordered to stand part of the Bill.

3 සහ 4 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
3ஆம், 4ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 3 and 4 ordered to stand part of the Bill.

අලුත් වගන්ති
புதிய வாசகங்கள்
NEW CLAUSES

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් අලුත් වගන්ති ඉදිරිපත් කරනවා:

"2 වන පිටුවේ, 16 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'වේතන සහ දීමනා අඩු කිරීම මත වන තහනම

4. මේ පනත යටතේ 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනතට සිදු කරන ලද සංශෝධන මගින් ජාතික අවම වේතනයට සිදු කරන ලද වැඩි කිරීම නිෂේධනය වන යම් ආකාරයකින් යම් සේවායෝජකයකු විසින්, 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත, 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත, හෝ 2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත යටතේ ගෙවිය යුතු යම් දීමනා ඇතුලුව යම් කර්මාන්තයක හෝ සේවාවක නියුක්තව සිටින යම් සේවකයකුගේ මාසික වේතනය අඩු නොකළ යුතු ය.

ජාතික අවම වේතනය වැඩි කිරීම ක්‍රියාත්මක කිරීම

5. කොමසාරිස් ජනරාල්වරයා විසින්, අතරමැදියකු හෝ කොන්ත්‍රාත්කරුවකු හරහා යම් කර්මාන්තයක හෝ සේවාවක යම් සේවකයකුගේ සේවා ලබා ගන්නා අවසාන සේවායෝජකයා ඇතුලු යම් සේවායෝජකයකුට, මේ පනත යටතේ 2016 අංක 3 දරන ජාතික අවම වේතන පනතට සිදු කරන ලද සංශෝධන මගින් ජාතික අවම වේතනයට කරන ලද වැඩි කිරීම නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගන්නා ලෙස විධාන නිකුත් කළ යුතු ය.' "

ඉදිරිපත් කරන ලදින්, පළමුවන වර කියවන ලදී.
கொண்டுவரப்பட்டு முதன்முறை மதிப்பிடப்பட்டது.
Brought up, and read the First time.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු සභාපතිතුමනි, "අලුත් වගන්ති දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අලුත් වගන්ති පනත් කෙටුම්පතට එකතු කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
අලුත් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
புதிய வாசகங்கள் சட்டமூலத்தில் சேர்க்கப்பட வேண்டுமென்ற வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
புதிய வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Question, that the New Clauses be added to the Bill, put and agreed to.
New Clauses ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.
சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරැදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.
Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

දේශීය සීනි කර්මාන්තය රැකගැනීම
உள்நாட்டு சீனிக் கைத்தொழிலைப் பாதுகாத்தல்
SAFEGUARDING LOCAL SUGAR INDUSTRY

[අ.භා. 5.54]

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"වර්තමානය වන විට මෙරට සීනි සමාගම්වල සේවකයන් සහ ඒ ආශ්‍රිත ගොවි පවුල් මුහුණ දී ඇති අර්බුදය හේතුවෙන් ඔවුන්ගේ ජීවිත සීනි තරම් රසවත් වී නැත.

මොනරාගල හා අම්පාර දිස්ත්‍රික්කවල උක් වගා කරන ගොවි පවුල් 50,000ක් පමණ පැල්වත්ත, සෙවනගල, ඇතිමලේ හා ගල්ඔය සීනි කර්මාන්තශාලා ආශ්‍රිතව සිය ජීවිකාව පවත්වාගෙන යමින් ඇති අතර, එම කර්මාන්තශාලා ආශ්‍රිතව සේවකයන් පිරිස 10,000ක් පමණ වේ.

අද වනවිට එම කර්මාන්තශාලාවල නිෂ්පාදිත සීනි සහ අතුරු ඵලයක් වූ එතනෝල් අලෙවි කරගත නොහැකිවීමෙන් සේවකයන්ගේ වැටුප් ගෙවීමට නොහැකි වී ඇති අතර, ගොවීන්ගේ උක් මිලදී ගැනීමද, ඒ සඳහා මුදල් ගෙවීමද දැඩි ලෙස සීමා වී ඇත.

රටට අවශ්‍ය සීනි සහ එතනෝල් දේශීය වශයෙන් නිෂ්පාදනය කරන පසුබිමක ඒවා පිටරටින් ආනයනය කිරීමට අවසර ලබා දීම මෙම අර්බුදය උත්සන්නවීමට තවත් හේතුවකි.

එබැවින්, එම කර්මාන්තශාලා ආශ්‍රිතව ගොඩ ගැසී ඇති සීනි තොග සහ එතනෝල් අලෙවි කර සේවකයන්ගේ වැටුප් හා ගොවීන්ගේ මුදල් ගෙවීමටත්, එම කර්මාන්තශාලා සාමාන්‍ය පරිදි පවත්වා ගෙන යාමටත් අවශ්‍ය කටයුතු කඩිනමින් සම්පාදනය කළ යුතු බවටත් මෙම ගරු සභාවට යෝජනා කර සිටිමු."

ගරු කථානායකතුමනි, අද වනවිට මේ රටේ උක් කර්මාන්තය කඩා වැටෙන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අපි දන්නවා, සෙවනගල සහ පැල්වත්ත කියන සීනි සමාගම් දෙකම රජය සතු සීනි සමාගම්. ගල්ඔය සීනි සමාගම සහ ඇතිමලේ සීනි සමාගම කියන්නේ පෞද්ගලික අංශය සතු සීනි සමාගම්. සෙවනගල සහ පැල්වත්ත සමාගම් ආරම්භ කරලා මේ වනවිට අවුරුදු 40ක් පමණ වෙනවා. නමුත් මෙවැනි තත්ත්වයකට කිසි දාක මේ සීනි සමාගම්වල සේවකයෝ හෝ ගොවියෝ පත් වෙලා නැහැ. රජයේ ප්‍රතිපත්තිවල අඩුපාඩු නිසා, තීරණවල තිබෙන ප්‍රශ්න නිසා අද වනවිට ඒ ගොවීන් අන්තිම අසරණ තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

මේ කර්මාන්තශාලා තුන තිබෙන්නේ මොනරාගල දිස්ත්‍රික්කයේ - පැල්වත්ත, සෙවනගල සහ ඇතිමලේ. අනෙක් එක තිබෙන්නේ අම්පාරේ, ගල්ඔය.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! Will an Hon. Member propose the Hon. Aravinda Senarath to the Chair?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
ගරු කථානායකතුමනි, "ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அரவிந்த செனரத் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and THE HON. ARAVINDA SENARATH took the Chair.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොවි පවුල් 50,000ක් පමණ, ස්ථිර සේවකයන් 10,000ක් පමණ මෙවායේ සේවය කරනවා. ට්‍රැක්ටර් හිමිකරුවන් 8,000ක් විතර ඉන්නවා. ඒ වාගේම සේවා සැපයුම් කරන පවුල් 10,000ක් විතරත් මේ කර්මාන්තය තුළින් ජීවත් වෙනවා. වත්මන් රජය කිව්වේ මේ සමාගම්වල පවතින දූෂණය, වංචාව සහ හොරකම නවත්වලා මේවායේ සේවකයන්ට හොඳ ජීවිතයක් ගත කරන්න අවස්ථාව ලබා දෙනවා කියලායි. නමුත් අද වනවිට තමුන්නාන්සේලා ඒ සියල්ල කඩාකර තිබෙනවා. පැල්වත්ත, සෙවනගල සීනි සමාගම් මාස 3කින් ගොවීන්ට උක්ගස්වලට මුදල් ගෙවලා නැහැ, ට්‍රැක්ටර් ගාස්තු ගෙවලාත් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇතිමලේ සහ ගල්ඔය සීනි සමාගම් මාස 2කින් ගොවීන්ට උක්ගස්වලට මුදල් ගෙවලා නැහැ, සේවකයන්ට නියම වෙලාවට වැටුප් ගෙවලා නැහැ.

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

ලංකාවට වාර්ෂිකව සීනි මෙට්‍රික්ටොන් 650,000ක් අවශ්‍යයි. අපි මෙට්‍රික්ටොන් 570,000ක්-580,000ක් පමණ ආනයනය කරනවා. මේ රටේ නිෂ්පාදනය කරන්නේ මෙට්‍රික්ටොන් 80,000යි. ඒක අවශ්‍ය ප්‍රමාණයෙන් සියයට 13යි. ප්‍රශ්නය වෙලා තිබෙන්නේ මේ සීනි සමාගම්වල නිෂ්පාදනය කරන සීනි විකුණා ගන්න ක්‍රමයක් නැතිකමයි. මොකද, පිට රටින් ඊට වඩා ලාභයට ගෙනෙනවා. සීනි සමාගම්වලින් සීනි කිලෝ එකකට සියයට 18ක VAT එකක් අය කරනවා. එතකොට සාමාන්‍යයෙන් සීනි කිලෝ එකක තොග මිල රුපියල් 200ක් වුණොත් රුපියල් 36ක් VAT එකට ගෙවන්න ඕනෑ. පිටරටින් ගෙනෙන සීනිවලට VAT එක නැහැ. බද්දක් හැටියට රුපියල් 50ක් විතරයි අය කරන්නේ. ඒ වාගේම මේ සීනි සමාගම් බදු ගෙවන්න ඕනෑ, සීනිවලට සියයට 30කක්, එතනෝල්වලට සියයට 45ක්. Molasses ටොන් එකකට 10,000ක් ගෙවන්න ඕනෑ. මේවා කොම්පැනිවලින් අය කළත්, අන්තිමට ගොවීන්ගෙන් තමයි මේවා අය වෙන්නේ.

මේ සමාගම් අද පාඩුවට දුවන්නේ. සීනි ටොන් දහස් ගණනක් අද ගබඩාවල තිබෙනවා. එතනෝල් විකුණා ගන්න විධියක් නැහැ. අද ලංකාවේ එතනෝල් අවශ්‍යතාව අවුරුද්දකට ලීටර් මිලියන 35ක්. අරක්කු මිල වැඩි වුණ නිසා, නීති විරෝධී මත්පැන් නිසා දැනට එතනෝල් ලීටර් මිලියන 25ක් ඕනෑ. හැබැයි, ලංකාවේ නිෂ්පාදනය කරන්නේ කොච්චරද? 2023දී ලංකාවේ නිෂ්පාදනය කර තිබෙන්නේ ලීටර් මිලියන 13යි.

2024 ලීටර් මිලියන 12.9යි. මම හිතන විධියට ඊට ඉස්සෙල්ලා අවුරුද්දේ මිලි ලීටර් මිලියන 21ක් නිෂ්පාදනය කරලා තිබෙනවා. එය එන්න එන්න අඩු වෙලා තිබෙනවා. අපට මතකයි, මීට අවුරුදු කිහිපයකට ඉස්සෙල්ලා අපේ නිෂ්පාදන තිබෙන නිසා පිටරටින් ගෙනෙන එක නැවැත්තුවා. එතනෝල් ලීටරය වික්කා, රුපියල් 1,200ට. මේ සමාගම් ලාභයට දිව්වා. නමුත් මෑත කාලයේ මොනවාද කළේ? නීතියෙන් පිට හෝ නීතියෙන් හෝ හොරෙන් හෝ අවසර ඇතුව හෝ පිටරටින් හෝ එතනෝල් ගෙනැල්ලා තිබෙනවා. ඒ නිසා අද එතනෝල් මිල රුපියල් 400ට බැස්සා. දැන් රුපියල් 400ත්, 800ත් අතර මිල දෝලනය වෙනවා. මේ සමාගම්වලට අද ලාභයට දුවන්න බැහැ. තමුන්නාන්සේලාගේ වැරදි තීන්දු, වැරදි තීරණ නිසා මේ ගොවියා අද අන්තිම අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේවා නිවැරදි කරන්න කියලායි අපි යෝජනා කරන්නේ. තමුන්නාන්සේලා මේවා හරියට පාලනය නොකරපු නිසා මේ රටේ සීනි කර්මාන්තය කඩා වැටිලා තිබෙනවා.

මට මතකයි, ඉස්සෙල්ලාම පටන් ගත්තේ ගල් ඔය සීනි කර්මාන්තශාලාව. ඒ, සේනානායක සමයේ ගල් ඔය ව්‍යාපාරයත් එක්ක. ඒ වාගේම එදා ජේ.ආර්. ජයවර්ධන අවධියේ තමයි සෙවනගලයි, පැල්වත්තයි පටන් ගත්තේ. යහ පාලන ආණ්ඩුව කාලයේ තමයි ඇතිමලේ සීනි සමාගම පටන් ගත්තේ. ඉන් පිටත කවුරුත් සීනි සමාගම් පටන් අරගෙන නැහැ. අපට ඕනෑ කරන නිෂ්පාදනයෙන් සියයට 13යි අපි නිෂ්පාදනය කරලා තිබෙන්නේ. අපට වර්ෂයකට සීනි ගෙනෙන්න - සීනි කන්න - රුපියල් බිලියන 117ක් වැය වනවා. පොහොරවලට වැය වන්නේ රුපියල් බිලියන 60යි. පාන්පිටිවලට වැය වන්නේ රුපියල් බිලියන 88යි. ඉතින් අපි කියන්නේ, සීනි කර්මාන්තය වෙනුවෙන් තමුන්නාන්සේලාගේ අවධානය මදි කියන එකයි. මේ සම්බන්ධයෙන් මීට වැඩිය තීන්දු ගන්න ඕනෑ.

1993 වෙනකොට මේ රටේ පැල්වත්ත සීනි කර්මාන්තශාලාවේ ටොන් 50,000ක් නිෂ්පාදනය කළා, මට මතකයි. සෙවනගල සීනි කර්මාන්තශාලාවේ ටොන් 20,000ක් නිෂ්පාදනය කළා. නමුත් පසුගිය වකවානුවේ මේ කර්මාන්තශාලාවල අවශ්‍ය නඩත්තු කටයුතු නොකරපු නිසා දැන් ඒ නිෂ්පාදන බැහැලා තිබෙනවා. වගාව හරියට නඩත්තු නොකරපු නිසා නිෂ්පාදනය බැහැලා තිබෙනවා. අලුත් උක් ප්‍රභේද සොයා ගත්තේ නැති නිසා අස් වැන්න අඩු වෙලා තිබෙනවා, recovery එක අඩු වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා ආවේ මේවා හදනවා කියලායි. මේ ආණ්ඩුවේ - ජේවීපී පක්ෂයේ - ඉන්න ඇමතිවරයෙක් කිව්වා මට මතකයි, - මම ඒ ඇමතිවරයාගේ නම කියන්න කැමැති නැහැ - "අපි කන්තලේ සීනි සමාගම නැවත ආරම්භ කරලා ආසියාවටම සීනි දෙනවා" කියලා. එහෙමයි තමුන්නාන්සේලා රටට කයිවාරු ගැහුවේ; ජනතාව රැවැට්ටුවේ එහෙමයි. මම හිතන විධියට අද ඉඩම් ටිකත් දීලා ඉවරයි, කන්තලේ සීනි සමාගම පටන් අරගෙනත් නැහැ. මේ ඉඩම් ටිකත් බෙදලා දීලා ඉවරයි.

ඒ විතරක් නොවෙයි. මම මතක් කරන්න ඕනෑ, ජනතා විමුක්ති පෙරමුණ මේ සීනි කර්මාන්තයට කරපු හානිය. අතීතයේදී පැල්වත්ත, සෙවනගල සීනි සමාගම්වල තමුන්නාන්සේලා දිගටම වර්ජන කළා. පැල්වත්ත සීනි කර්මාන්තශාලාව පටන් ගනිද්දී, තමුන්නාන්සේලා පාරවල උද්ඝෝෂණ කළා. එදා ඉන්දියාවේ මෝතා සමාගම ඇවිල්ලා සියඹලාණ්ඩුව සීනි සමාගම පටන් ගන්න හදපු වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණේ තමුන්නාන්සේලා මොනවාද කළේ? හිටපු කළමනාකරු ඒ සමාගමේ ආයෝජකයෙක්. මට මතකයි, ඉන්දියාවේ මෝතා සමාගමෙන් ආපු බන්සාල් මහත්මයා සහ තවත් තුන් දෙනෙක් තමුන්නාන්සේලා මැරුවා. ලංකාවේ පරිපාලන සේවයේ හිටපු දක්ෂ නිලධාරියකු වන සිංහ සේනානායක මහත්මයාව මරලා ගිනි තිබ්බා. තමුන්නාන්සේලා අතීතයේ සීනි කර්මාන්තයට කරපු හානිය විශාලයි.

අද පෙට්‍රල්, ඩීසල්වලට වැඩියෙන් විදේශ විනිමය යන්නේ සීනි සඳහා. දෙවැනියට මේ රටේ විදේශ විනිමය යන්නේ සීනිවලට. තමුන්නාන්සේලාගේ අතීතය මම මතක් කරලා දෙන්න කැමැතියි. මේ සීනි කර්මාන්තශාලා මේ විධියට වැටෙන්න දෙන්නේ ඇයි කියලා මම අහනවා. අදත් පැල්වත්තේ උද්ඝෝෂණ, අදත් සෙවනගල උද්ඝෝෂණ. ගොවියන්ට මුදල් ගෙවන්නේ නැතුව, අද ඒ ගොවියෝ උද්ඝෝෂණ කරනවා. තමුන්නාන්සේලා ආවේ මේවා හදනවා, නිවැරදි තීන්දු ගන්නවා කියලා. සීනි කර්මාන්තය නංවා ආසියාවටම සීනි බෙදනවා කියලා තමයි ආවේ.

මේක වැටෙන්න දෙන්න එපා කියලායි අපි තමුන්නාන්සේලාට කියන්නේ. මොකද, මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවියන්ගෙන් සියයට 30ක් ජීවත් වෙන්නේ මේ සීනි කර්මාන්තශාලාවෙන්. බුත්තල නගරය දියුණු වුණේ, වැල්ලවාය නගරය දියුණු වුණේ, සෙවනගල, තණමල්විල දියුණු වුණේ, සියඹලාණ්ඩුව දියුණු වුණේ මේ සීනි කර්මාන්තශාලාව ආශ්‍රිතවයි. අද ඒ කර්මාන්තශාලාව කඩා වැටිලා තිබෙනවා. එක පැත්තකින් ජනතාව දුප්පත් වෙනවා. අනෙක් පැත්තෙන් අපට විදේශ විනිමය නැති වනවා.

අපි කියන්නේ මේකයි. මට මතකයි මේ ඇමතිවරු ගිහිල්ලා - අපේ හිතවත් සහෝදර කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිතුමා - මේ ගොවීන් එක්ක උද්ඝෝෂණය කළා. අද එතුමා පළාතකවත් යන්නේ නැහැ. මම ඒ ගැන කනගාටු වෙනවා. අද අපිට යන්න සිද්ධ වෙලා තිබෙනවා. *[බාධා කිරීමක්]* යන්න, මේවාට උත්තර දෙන්න. අපේ නොවෙයි ආණ්ඩුව, තමුන්නාන්සේලාගේ. කථා කරන්නේ අපේ ආණ්ඩුව වාගෙයි. කරුණාකරලා මේ ගොවියන්ව මේ ප්‍රශ්නයෙන් තමුන්නාන්සේලා බේරා ගන්න. මේ කර්මාන්තශාලා දියුණු කරන්න. ඕනෑ නම් තවත් සීනි කර්මාන්තශාලා කිහිපයක් ආරම්භ කරන්න තිබුණා, වව්නියාවේ සහ වැල්ලවායේ, හම්බෙගමුවේ. මේ කර්මාන්තශාලා ආරම්භ

කරලා මේවායේ කාර්යක්ෂමතාව වැඩි කරන්න. මේවාට නවීන තාක්ෂණය හඳුන්වා දෙන්න. තමුන්නාන්සේලා මොකද කරන්නේ? ඒ වෙනුවට පිට රට සීනිවලට VAT එක නැහැ. අපේ සීනිවලට VAT එක තිබෙනවා. පිටරටින් එතනෝල් ගෙනෙනවා. කන්ටේනර් 300 ගණනක ආවේ එතනෝල්ද කියලා අපි දන්නේ නැහැ. කරුණාකරලා මේවා නවත්වන්න. අපිට ඕනෑ එතනෝල් ප්‍රමාණයෙන් භාගයයි නිෂ්පාදනය කරන්නේ. අනෙක් ඒවා එන්නේ කොහෙන්ද? මේකෙන් නැති වෙන්නේ ගොවියායි. මේකෙන් නැති වෙන්නේ මේ රටේ විදේශ විනිමයයි.

අපිට අද ණය ගෙවන්න තිබෙනවා. මම අහගෙන මුදල් ඇමතිතුමාත්, අනෙක් ඇමතිවරුත් කිව්වා, "අපි නිෂ්පාදනය පදනම් වෙච්ච සංවර්ධනයකට යන්නේ" කියලා. අපිට නම් එහෙම පෙනෙන්නේ නැහැ. තමුන්නාන්සේලා බදු පදනම් කරගෙන මිනිස්සු මිරිකලා අරගෙන තිබෙනවා. වැටුප් වැඩි කළාට ප්‍රමාණවත් නැහැ, ඒ වැටුප බද්දෙන් ආපහු ගන්නවා නම්.

අද නිෂ්පාදනය එක පැත්තකින්වත් නැහැ. ගොවියා අන්තිම අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මට මතකයි 1994දී අපි රට භාර දෙනකොට දළ දේශීය නිෂ්පාදනයෙන් ගොවියාට තිබුණු පංගුව සියයට 20යි. මේකට PA එකත්, SLFP එකත් වගකියන්න ඕනෑ. තමුන්නාන්සේලාත් ඒ වගකීම අරගෙන තිබෙනවා. දැන් ගොවියාට තිබෙන පංගුව සියයට 8යි. දැන් මේ රටේ දුප්පත්කම වැඩි වෙලා. යහ පාලන ආණ්ඩුව තිබෙනකොට 2017 අපේ සංඛ්‍යා ලේඛන හා අපේ මැනුම් අනුව මේ රටේ දුප්පත් කියන කොටස; දරිද්‍රතාවයෙන් පිරිණු කොටස සියයට 4.4ට වැටුණා. දැන් ඒක සියයට 51ට නැඟලා තිබෙනවා. තමන්ගේ මූලික අවශ්‍යතාවන් වන කෑම ටික, නවාතැන්, විදුලිය, ළමයින්ගේ අධ්‍යාපනය ඒ මූලික දේවල්වත් කර ගත නොහැකි සියයට 52ක් දැන් ඉන්නවා. දැන් දරිද්‍රතා රේඛාවේ පහළින් සියයට 52ක් ඉන්නවා.

තමුන්නාන්සේලා මේ දේවල් ගැන තීන්දු ගන්නේ නැති එකෙන් දවසෙන් දවස වැටෙනවා. අපේ මේ සීනි නිෂ්පාදනය විකුණා ගන්න ක්‍රමයක් හදන්න. අපි කියන්නේ කර්මාන්තශාලා හිමියාගේ VAT එක නොවෙයි. ඒක අය කරන්නෙත් ගොවියාගෙන්. මේ VAT එක කරුණාකරලා ඉවත් කරන්න. ඒක ඉවත් කරලා පිට රට සීනිත් එක්ක තරග කරන්න පුළුවන් විධියට මේ කර්මාන්තශාලාව හදන්න. ලාභ නම් තමයි බදු ගෙවන්න ඕනෑ. බලන්න, ඉන්දියාවේ අද උක් ටොන් එකකට ඉන්දියාවේ ගොවියාට රුපියල් 14,000ක් - ලංකාවේ මුදලින් -ගෙවනවා. අපේ රටේ ගෙවන්නේ රුපියල් 10,000යි. ඉන්දියාවේ විදුලි බිල ලාභයි. ඉන්දියාවේ තෙල් ටික ලාභයි. ඉන්දියාවේ කම්කරු ගාස්තු අඩුයි. බඩු මිල අඩුයි.

නමුත් අපේ ගොවියා අද අන්තිම අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා. ඉන්දියාව අල්ලපු රට. ඉන්දියාවේ නිෂ්පාදන වියදම අඩුයි. උක් ටොන් එකකට රුපියල් 14,000ක් ගෙවනවා. අපේ රටේ ගෙවන්නේ රුපියල් 10,000යි. අලුත් ප්‍රභේද, විදුලි බිල, තෙල් මිල, තාක්ෂණය මේ සියල්ල එක්ක ඉන්දියාවේ නිෂ්පාදන වියදම අඩු වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා බලයට ආවේ මේ රට හදන්න. තමුන්නාන්සේලා අවුරුදු ගණනක් වැරදි බල බලා හිටියා. කරුණාකරලා මේ ගොවියාව බේරා ගන්න කටයුතු කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

පසුගිය මාස ගණනාවක් තිස්සේ ට්‍රැක්ටර් හිමියන්ට මුදල් ගෙව්වේ නැති නිසා දැන් ට්‍රැක්ටර්වල ලීසිං වාරික මුදල් ගෙවාගන්න බැරිව ඉන්නවා. මේ නිසා finance companiesවලින් මේ ට්‍රැක්ටර් අරගෙන යනවා. මම ඉල්ලන්නේ කරුණාකරලා තමුන්නාන්සේලා කථා කරන විධියටම වැඩේත් කරන්න කියලායි. වැඩේ කරලා මේ ගොවියාව බේරාගන්න. ගොවියාගේ හිඟ මුදල් ටික ගෙවන්නේ කවදාද කියලා කරුණාකරලා අපට කියන්න. සීනි ටික අළෙවි කරගන්න ක්‍රමය හදන්නේ කවදාද කියන්න. එතනෝල් ටික පිට රටින් ගේන්නේ නැතිව අපේ එතනෝල් ටික විකුණා ගන්න ක්‍රමයක් හදන්න කියා යෝජනා කරමින්, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිය ප්‍රකාශ කරමින් මම නවතිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

යෝජනාව ස්ථිර කිරීම, ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු හතක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.10]

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා -හිටපු අමාත්‍යතුමා- ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කරන ගමන් මම මේ කාරණය කියන්න කැමැතියි. ලංකා සීනි සමාගමේ පැල්වත්ත කර්මාන්තශාලාව, සෙවනගල කර්මාන්තශාලාව, ඇතිමලේ කර්මාන්තශාලාව සහ ගල්ඔය කර්මාන්තශාලාව කියන කර්මාන්තශාලා තුළින් මොනරාගල දිස්ත්‍රික්කයට අසීමිත සේවාවක් ඉෂ්ට වුණා. මේ කර්මාන්තශාලා ඉදිකිරීම තුළින් මොනරාගල දිස්ත්‍රික්කයේ ජනතාවගේ ආර්ථිකය ඉතාම ශක්තිමත් වුණා. 1982 වර්ෂයේදී මෙහි මූලික කටයුතු ආරම්භ කරලා, 1986දී විවෘත කළාට පස්සේ මේ දිස්ත්‍රික්කය දවසින් දවස ඉතාම දියුණු දිස්ත්‍රික්කයක් බවට පත් වුණා.

1817දී ඉංග්‍රීසින් විසින් අපේ මුළු වෙල්ලස්සම විනාශ කරලා අපව දුප්පතුන් බවට පත් කළා. 1986දී මේ රටේ ජනාධිපතිවරයා විධියට සිටි ජේ.ආර්. ජයවර්ධන මහතා මොනරාගල දිස්ත්‍රික්කයේ තිබෙන දරිද්‍රතාව නැති කරන්න මෙම කර්මාන්තශාලා අපේ දිස්ත්‍රික්කයට ලබා දුන්නා. විශේෂයෙන් පැල්වත්ත සීනි කර්මාන්තශාලාව සහ සෙවනගල සීනි කර්මාන්තශාලාව තුළින් අපේ දිස්ත්‍රික්කයේ ජනතාවට රැකී රක්ෂා ලබා ගැනීමේ අවස්ථාවත්, ව්‍යාපාරිකයන්ට ව්‍යාපාරික කටයුතු කර ගැනීමටත්, ගොවි මහතුන්ට ගොවිතැන් කර ගැනීමටත්, ඒ තුළින් ආර්ථිකය ගොඩනඟා ගැනීමටත් අවස්ථාව ඇති කළේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමායි. අපේ රංජිත් මද්දුම බණ්ඩාර හිටපු ඇමතිතුමා කිව්වා වාගේම එදා මේ කර්මාන්තශාලා ආරම්භ කරනකොට ඔබතුමන්ලා මොකක්ද කළේ? වර්තමානයේ ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුව, එහෙම නැත්නම් NPP ආණ්ඩුව වෙන්න පුළුවන්, එදා මේ කර්මාන්තශාලා ආරම්භ කරන්න යෝජනාව ගෙනෙනකොට ඔබතුමන්ලා මොනරාගල කච්චේරිය වටලා උද්ඝෝෂණ කළා, ඒ වාගේම සීනි සමාගමට යන මාර්ග අහුරලා උද්ඝෝෂණ කළා. ඒ බාධා කිරීම් මධ්‍යයේ එදා මේ කර්මාන්තශාලා ආරම්භ කරපු නිසා තමයි බුත්තල, මොනරාගල, වැල්ලවාය, ඇඹිලිපිටිය යන නගර දියුණු වෙන්න පටන් ගත්තේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති අමාත්‍යතුමනි, මේ කර්මාන්තශාලා කඩා වැටෙන්න ඉඩ තියන්න එපා. ඔබතුමන්ලා අපේ දිස්ත්‍රික්කයේ ජීවත් වන ජනතාව ගැන හිතලා බලන්න. මම හිතන විධියට මේ දිස්ත්‍රික්කයේ ජීවත් වන 5,000කට එහා ගිය ජනතාවක් සෙවනගල සහ පැල්වත්ත කර්මාන්තශාලාවල රැකියා කරනවා. ඒ වාගේම ඊට එහා ගිය ගොවි ජනතාවක් මේ කර්මාන්තශාලා නිසා තම ගොවිතැන් කටයුතු සාර්ථකව කරනවා. අද වෙනකොට ගොවි මහත්වරුන්ට රුපියල් මිලියන 300කට එහා ගිය හිඟ මුදලක් ගෙවන්න තිබෙනවා. ඒ වාගේම සැපයුම්කරුවන්ට රුපියල් මිලියන 400කට එහා ගිය මුදලක් ගෙවන්න තිබෙනවා. ඒ වාගේම

[ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා]

ඔබතුමන්ලා ලංකා බැංකුවෙන් ගත් රුපියල් මිලියන 1,500ක ණය සහ ඊට අදාළ පොලිය වශයෙන් තවත් විශාල මුදලක් ගෙවන්න තිබෙනවා. ඒ වාගේම EPF, ETF වෙනුවෙන් රුපියල් මිලියන 350කට වැඩි මුදලක් මේ වෙනකොටත් ගෙවන්න තිබෙනවා. මේ තත්ත්වය තුළ අපේ පැල්වත්ත, සෙවනගල, ඇතිමලේ කර්මාන්තශාලා වැසී යන තත්ත්වයට පත් කරන්න එපා කියන ඉල්ලීම මම තමුන්නාන්සේලාගෙන් කරනවා. මේ කර්මාන්තශාලාවල රැකියා කරන සේවකයින්ගේ වෛද්‍ය රක්ෂණය මේ වෙනකොට නතර කරලා තිබෙනවා.

ඒ වාගේම සේවකයින්ට බෝනස් එක ලබා දෙන්නේත් නැහැ, ස්ථිර කිරීම් නැති වෙලා තිබෙනවා, උසස්වීම් නැති වෙලා තිබෙනවා, නිසි වෙලාවට සේවකයන්ගේ පඩිය ලබා නොදෙන තත්ත්වයකුත් දැන් ඇති වෙලා තිබෙනවා. මේ වෙනකොට එක් එක් පක්ෂ එකතු වෙලා ගොවි ජනතාවත් එකතු කරමින් මේ සම්බන්ධව උද්ඝෝෂණ පවත්වමින් යනවා. මේවා නරක අතට හැරෙන්න කලින් මේ කර්මාන්තශාලාව ආරක්ෂා කර ගන්න. සෙවනගල කර්මාන්තශාලාව කියන්නේ ලාභ ලබන කර්මාන්තශාලාවක්, ගරු ඇමතිතුමනි. පැල්වත්ත කර්මාන්තශාලාවට වඩා ලාභ ලබනවා, සෙවනගල කර්මාන්තශාලාව. ඒ නිසා මේ කර්මාන්තශාලා දෙක ඇතුළු අනෙකුත් කර්මාන්තශාලා ආරක්ෂා කරලා, මොනරාගල ජනතාව ආරක්ෂා කර දෙන්න කියන ඉල්ලීම කරමින්, අවස්ථාව ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත පියතිස්ස නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.37]

ගරු වසන්ත පියතිස්ස මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை பிரதி அமைச்சர்)
(The Hon. Wasantha Piyathissa - Deputy Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2006දී තිබුණේ සන්ධාන ආණ්ඩුව. ඒ වෙනකොට හිඟුරාන සීනි කර්මාන්තශාලාව වසා දමා තිබුණේ. වසර 7කට අධික කාලයක් හිඟුරාන සීනි කර්මාන්තශාලාව වසා දමා තිබුණා. ඒ වෙලාවේ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විධියට හිටියේ අනුර ප්‍රියදර්ශන යාපා මහතා. මම මේ පාර්ලිමේන්තුවට සභාව කල්තැබීමේ යෝජනාවක් ගෙනාවා, ඒ හිඟුරාන සීනි කර්මාන්තශාලාව යළි ආරම්භ කරන්න ඕනෑ, එක්කෝ එය රජයට පවරා ගන්න ඕනෑ, එහෙම නැත්නම් රජය සහ පෞද්ගලික අංශය ඒකාබද්ධ වෙලා එය යළි ආරම්භ කරන්න ඕනෑය කියලා. ඒ අනුව තමයි ඇත්තටම ඊට මාස කිහිපයකට පස්සේ ශ්‍රී ලංකා රජයත්, LOLC සහ බ්‍රවුන්ස් සමාගමත් ඒකාබද්ධ වෙලා සියයට 51ක් රජයටත්, සියයට 49ක් පෞද්ගලික සමාගමටත් ලබා දෙමින් ගල්ඔය වැවිලි සමාගම ලෙස යළි ඒ කර්මාන්තශාලාව ආරම්භ වුණේ.

ඊට කලින් ඒ කර්මාන්තශාලාව කොහොමද තිබුණේ? ගල්ඔය ව්‍යාපාරය ආරම්භ කරලා, ඩී.එස්. සේනානායක සමුද්‍රයේ වම් ඉවුර වී වගාව සඳහාත්, එහි දකුණු ඉවුරේ ප්‍රධාන ඇළෙන් විශේෂ ව්‍යාපෘතියක් ලෙස උක් වගාව කරන්නත් තීරණය වුණා. ඒ අනුව ඉඩම් අක්කර 5,000ක උක් වවන්න තීරණය වුණා. 1960 දශකයේදී රුසියානු රජයේ ආධාර මත ඒ කර්මාන්තශාලාව ආරම්භ කරලා ඉස්සරහට කරගෙන ආවා. ඒ තුළින් පහසුකම් රාශියක් ජනතාවට ලැබුණා. ඉඩම් ලැබුණා, ගෙවල් ලැබුණා, යටිතල පහසුකම් ඉතා හොඳින් තිබුණා, සුබසාධන කටයුතු ඉතා හොඳින් තිබුණා.

ඊට පස්සේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ ප්‍රධාන ක්‍රියාවලියක් බවට පත් වුණා, රාජ්‍ය ආයතන විකිණීම. අන්න ඒ ක්‍රියාවලිය තුළ තමයි එතෙක් හොඳට පැවති හිඟුරාන සීනි සමාගම 1993දී ඉතාම අඩු මුදලකට වීරබාහු කියන ව්‍යාපාරිකයාට ලබා දෙන්නේ. අන්න ඒ ක්‍රියාවලියත් එක්ක හරියට ඒ කර්මාන්තශාලාවේ පරිපාලනය සිද්ධ නොවුණු නිසා කම්කරුවන්ගේ උද්ඝෝෂණ පැන නැඟුණා, ගොවීන්ගේ විරෝධතා පැන නැඟුණා. ඊට පස්සේ ක්‍රමානුකූලව ඒ සමාගමේ කටයුතු අභාවය කරා ගියා. අවසානයේ එහි තිබුණු යකඩ ටිකත් විකුණාගෙන තමයි වීරබාහු පැනලා ගියේ. ඒ අනුව වඩා හොඳින් තිබුණු, සියලු යටිතල පහසුකම් තිබුණු, ගොවි ජනතාවට වඩා හොඳ පහසුකම් ලැබුණු, ආදායමක් ලැබුණු කර්මාන්තශාලාවක් වැහිලා ගියා. ඒ කාලයේ අපි කිව්වේ අම්පාර ආර්ථිකයේ හදවත හිඟුරාන සීනි සමාගම කියලායි. එදා එය පෞද්ගලික අංශයට පවරලා එවැනි විනාශයක් කළ නිසා තමයි අද හිඟුරානට මෙහෙම තත්ත්වයක් උදා වෙලා තිබෙන්නේ. ඒ නිසා එක්සත් ජාතික පක්ෂය ඒකට වග කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම කන්තලේ සීනි සමාගමට මොකක්ද වුණේ? ඒකත් වැහිලා යන තත්ත්වයට පත් වෙලා තිබෙනවා, අද වන විට ඒ දැවැන්ත කර්මාන්තශාලාව සහමුලින්ම විනාශ වෙලා තිබෙනවා, එවක සිටි පාලකයන්ගේ වැරදි ආර්ථික ප්‍රතිපත්ති නිසා.

අද මොකද වෙලා තිබෙන්නේ? අද මේ හිඟුරාන සීනි සමාගම, ගල්ඔය වැවිලි සමාගම නමින් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ගොවි ජනතාවට අතිවිශාල ප්‍රශ්න ප්‍රමාණයක් තිබෙනවා. මොනවාද ඒ ප්‍රශ්න? උක්වලට සාධාරණ මිලක් ලැබෙන්නේ නැහැ. සමාගම සහ ගොවියා අතර සාධාරණ ගිවිසුමක් නැහැ. අනෙකුත් අදාළ යටිතල පහසුකම් ටික ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ පරිපාලනය තනිකරම කටයුතු කරන්නේ මැර හමුදාවක් විධියට. ඇයි, අපි එහෙම කියන්නේ? ඉතා සාධාරණ විධියට ඉල්ලීම් ඉදිරිපත් කරලා ඒවාට උත්තර නැති වෙනකොට ගොවි ජනතාව, ගොවි වෘත්තීය සමිති උද්ඝෝෂණ කරන්න පටන් ගත්තා. ඒ උද්ඝෝෂණය කරපු අයට පහර දුන්නා. මට මතකයි, ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ ස්ටිකාර් කියලා සාමාන්‍යාධිකාරිවරයෙක් හිටියා. පසුගිය දවසක ඒ මහත්තයාට සහ තවත් කිහිප දෙනෙකුට මේ පාලන අධිකාරිය විසින් ඇඳුම් ගලවා පහර දුන්නා. ඒ නඩුව තවම තිබෙනවා. ගොවීන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් අද වෙනකොට කිසි කෙනෙකුට කථා කරන්න අයිතියක් නැහැ. ඒ හැම කෙනෙකුටම මේ පාලන අධිකාරිය විසින් පහර දෙනවා; පළිගැනීම් කරනවා.

ඒ වාගේම තමයි, මේ සමාගම ආණ්ඩුවට රුපියල් බිලියන ගණනක වන්දි ගෙවලා නැහැ. සියයට 51ක වන්දිය ගෙවලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙත් ලාභාංශ බොරුවට පෙන්නුවා. බැංකුවලින් ණය ගත්තා. රක්ෂණය ගන්නේත් මේ සමාගම. බැංකු ණය ගන්නේත් ගොවියාගේ නමින් අත්සන් කරලා මේ සමාගම. එහෙම කරලා එහි පරිපාලනය අන්තිම දුර්වල තැනකට අද වනකොට පත් කර තිබෙනවා. ඒක පාඩු ලබන තැනක් බවට පත් කළේ මේ සමාගමයි. රජයට සියයට 51ක

කොටස් තිබුණාට ගල්ඔය වැවිලි සමාගමේ කළමනාකාරිත්වය තමයි සියයට සියයක්ම තීන්දු තීරණ ගැනීම කරන්නේ. මේ සමාගම මෙවැනි තත්ත්වයකට පත් වීම පිළිබඳව ඔවුන් වගකිව යුතුයි. හොඳ දැක්මක් සහ හොඳ වැඩ පිළිවෙළක් සහිතව ගොවි ජනතාවත් එක්ක ඒකාබද්ධ වෙලා කටයුතු කරනවා නම් මේ තත්ත්වය උදා වෙන්නේ නැහැ. මේ නිසා අද ඒ ගොවි ජනතාව ඉතා අමාරු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. උක් ගස් ටික කපා ගන්න විධියක් නැහැ. රට හොරෙන් ඇවිල්ලා උක් වගාවට ගිනි තියලා ඊට පස්සේ ඒවා කපන්න කියනවා. එක වෙලාවක කියනවා, මාස අටෙන් කපන්න කියලා. තව වෙලාවක කියනවා, මාස 14න් කපමු කියලා. සීනි වෙනුවට වැඩිපුරම හැදුවේ එතනෝල්. ඒකට කමක් නැහැ. හැබැයි, ඒ හැම එකකම ප්‍රතිලාභය ගොවි ජනතාවටත්, සියලුදෙනාටත් බෙදිලා යන්න ඕනෑ. නමුත්, පාලන අධිකාරිය තමයි ඒකේ ලාභාංශය රුපියල් ලක්ෂ ගණන්වලින් බෙදා ගත්තේ. අද ගොවියා අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එය නිවැරදි කිරීම සඳහා වර්තමාන රජය විධියට ගත යුතු හැම ක්‍රියාමාර්ගයක්ම ඉදිරියේදී ගන්නවා. ඒ පිළිබඳව ඇමතිතුමා ප්‍රකාශ කරයි. හැබැයි, මේ තත්ත්වයට හිඟුරාන සීනි සමාගම සහමුලින්ම වගකියන්න ඕනෑය කියන කාරණය අවධාරණය කරමින්, මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු අටක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.23]

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට නිකම් රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාගෙන් අහන්න හිතුණා, "අනේ රංජිත්, නොදුටු මොක්පුරද?" කියලා. මම එහෙම අහන්න හේතුව මෙයයි. අපේ ධර්මසේන මන්ත්‍රීතුමාත්, රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාත් දෙදෙනාම කථා කරමින් කිව්වා, පැල්වත්ත, සෙවනගල, ඇතිමලේ ඇතුළු සීනි සමාගම් වත්මන් ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය තුළ තමයි බිඳ වැටුණේ කියලා. ඒක තමයි එතුමන්ලාගේ දැක්ම. හැබැයි ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණය කියන්න ඕනෑ. ඔබතුමන්ලාගේ ලියුම් කැලිවලින් ඔය පැල්වත්ත, සෙවනගල කර්මාන්තශාලාවල කී දෙනෙක් රස්සාවල් කරනවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම,- *[බාධා කිරීමක්]* මෙතැනදී කියපු සමහර සංඛ්‍යා වැරදියි. උක් හෙක්ටෙයාර 14,000ක් වගා කරනවා, ලංකා සීනි සමාගමෙන්. ඒ වාගේම ගොවියෝ 10,000කට ආසන්න පිරිසක් සමාගම් සතුව ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ආයතන දෙකම ලංකා සීනි සමාගම හැටියට, එක ආයතනයක් විධියට ගැසට් කරලා 2024 දෙසැම්බර් මාසයේ තමයි අපේ ඇමතිතුමා භාර ගන්නේ. පසුගිය ජූලි මාසයේ 30වැනි දා වෙනකොට මේ ආයතනයට අදාළව කොයි තරම් ණය කන්දරාවක් තිබෙනවාද, අවභාවිතාවන් කොයි තරම් තිබෙනවාද කිව්වොත්, ඒ ප්‍රමාණය රුපියල් බිලියන 7.47ක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ කියන්නේ, රුපියල් කෝටි 747ක් අවභාවිත කරමින් වංචාසහගත ලෙස විවිධ දේවල් කරපු එකේ ප්‍රතිඵලයක් විධියට මේ ආයතන දෙකටම පාඩු වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවභාවිතාව ලෙස තිබුණු ඒ රුපියල් බිලියන 7 අද අපිට තිබුණා නම් මේ ආයතනය හොඳට දියුණු කරන්න පුළුවන්. කොහොමද ඒක වුණේ?

ඒ විතරක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආයතනයේ ඉන්න සේවක සංඛ්‍යාව කොපමණද? 2022 ජනවාරි මාසය වෙනකොට මේ ආයතනයේ සිටි ස්ථිර සේවකයන් ප්‍රමාණය 959යි. හැබැයි, 2022 දෙසැම්බර් මාසය වෙනකොට ස්ථිර සේවකයෝ 2,999ක් පැල්වත්ත සීනි කර්මාන්තශාලාවේ විතරක් ඉන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒවාට සේවකයන් දමන්නේ කවුද? ධර්මසේන මන්ත්‍රීතුමා ලජ්ජා වෙන්න ඕනෑ. මොකද, ධර්මසේන මන්ත්‍රීතුමා කිව්වා, මොනරාගල දිස්ත්‍රික්කයේ සේවකයෝ පන්දහස් ගණනක් සෙවනගල සහ පැල්වත්ත සීනි කර්මාන්තශාලා දෙකේ ඉන්නවාය කියලා. ඇමතිකම් කරපු අය රත්නපුරය, හම්බන්තොට ආදී විවිධ ප්‍රදේශවල අය මේකේ සේවකයින් හැටියට දැම්මා. පළාත් සභාවේ හිටපු උප සභාපතිවරයාගේ පුතා මේකේ HR section එකට දැම්මා, කිසිම සුදුසුකමක් නැතුව. ඔහුට ඒ සඳහා සුදුසුකම් තිබුණේ නැහැ. හැබැයි, සුදුසුකම් නැතුව දාලා යන්තම් මාස 6 - දින 180 - සම්පූර්ණ වෙනකොට ඔහුට ස්ථිර වෙන්න ඕනෑ හින්දා සේවකයෝ දෙදහස් ගණනක් එක සැරේ ස්ථිර කළා. ඒ නිසා එම ආයතනයේ සේවක අතිරික්තයක් තිබෙනවා. මෙහිදී සේවකයන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් වැරදි විධියටයි සිදු කර තිබෙන්නේ. ඒ අනුව සේවකයෝ 159දෙනෙක් කිසිම අනුමැතියකින් තොරව බඳවාගෙන තිබෙනවා. ඒ වාගේම සේවකයෝ 510කට කිසිදු අනුමැතියකින් තොරව උසස්වීම් ලබා දුන්නා. මේ ඔක්කොමත් එක්ක ආයතනයේ සම්පූර්ණ ගෙවීම් ප්‍රමාණය වැඩි වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් පැල්වත්ත සීනි කර්මාන්තශාලාවේ සේවකයන් 5,567ක් සහ සෙවනගල සීනි කර්මාන්තශාලාවේ 3,922ක් ඉන්නවා. ඒ අනුව එම කර්මාන්තශාලා දෙකේ ඉන්න සමස්ත සේවක සංඛ්‍යාව 9,489ක්. ලංකා සීනි සමාගමට අයත් මේ ආයතන දෙකේ DGM (HR) තුන්දෙනෙක් ඉන්නවා. අපි අහනවා, මේ වැරදි කළේ අපිද කියලා. මට තව ගොඩක් දේවල් කියන්න තිබෙනවා. මම දන්නවා, අපේ ආනන්ද කුමාරසිරි හිටපු මන්ත්‍රීතුමාගේ ලියුම්වලට අනුව මේ ආයතනවලට සේවකයන් දැම්මා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව කාරණයක් කියන්නම්. ධර්මසේන මන්ත්‍රීතුමා සංඛ්‍යාලේඛන ගොඩක් වැරදියටයි කිව්වේ. 2025.06.30වැනි දා වෙනකොට රුපියල් තිස්නවකෝටි අනූහතරලක්ෂ දසදහස් හත්සියඑකොළහක් තිබෙනවා, සැපයුම්කරුවන් සඳහා ගෙවිය යුතු හිඟ මුදල් විධියට. ඒක හරි. ඊළඟට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොවීන් සඳහා ගෙවන්න තිබෙනවා, රුපියල් විසිතුන්කෝටි දසදහස් දෙසියහතරක්. ඒ කියන්නේ, ජූලි මාසය වෙනකොට ගෙවන්න තිබෙන මුදල. ඊට පස්සේ ඒ ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සියල්ලටම වඩා තිබෙන ප්‍රශ්නය මේකයි. මේ ආයතනය සම්බන්ධයෙන් කරන ලද විගණනය අනුව අනුමත නොකළ ගෙවීම් විතරක් තිබෙනවා, රුපියල් දෙසියතිස්කෝටි තිස්තුන්ලක්ෂ දහනවදහස් අටසියහතළිස්තුනක්. එහෙම තමයි විගණන වාර්තාවල සඳහන්ව තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහෙම හරි මේවා තිබෙන එක ගැන පුදුමයි. ඒ වාගේම ආගන්තුක නිවාසවලට

[ගරු ආර්.එම්. ජයවර්ධන මහතා]

රුපියල් එක්කෝටි ගණනක් ගෙවලා තිබෙනවා කියලා මේ විගණන වාර්තාවේ සඳහන්ව තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුමැතියකින් තොරව සිදු කළ කපා හැරීම් කියලා තිබෙනවා, රුපියල් හතළිස්හත්කෝටි තිස්දෙලක්ෂ හැත්තෑහතරදහසක්. ඒ විතරක් නොවෙයි. සෙවනගල සීනි කර්මාන්තශාලාවේ බොයිලේරුව සඳහා අත්තිකාරම් කියලා වැඩක් නැතුව ගෙවලා තිබෙනවා, රුපියල් හාරකෝටි අසූහයලක්ෂයක්. ඒ වාගේම, ඉන්ධන දීමනා විධියට ගෙවලා තිබෙනවා, රුපියල් එක්කෝටි ගණනක්. ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකිරීම නිසා සෙවනගල සීනි කර්මාන්තශාලාවට පාඩු වෙලා තිබෙනවා, රුපියල් එක්කෝටි ගණනක්. සෙවනගල සීනි කර්මාන්තශාලාවේ ධාරිතාව පුළුල් කිරීමේ ප්‍රමාද ගාස්තුව විධියට රුපියල් තිස්හයලක්ෂයකට වැඩි මුදලක් ගෙවලා තිබෙනවා. මේක විශේෂ එකක්. දැවිතෙල් වෙනුවට කළු තෙල් මිලට ගැනීමට ගෙවා තිබෙන මුදල රුපියල් තිස්හතරකෝටි දහසයලක්ෂ අසූහත්දහස් පන්සියහතළිහයි. ඒ විතරක් නොවෙයි, කළු තෙල් යෙද වූ කාලය තුළ බොයිලේරුව අක්‍රිය වීම නිසා සිදු වූ පාඩුව රුපියල් තිස්කෝටියයි. අපිද මේ වැරදි කරලා තිබෙන්නේ? මේ වැරදි කරලා තිබෙන්නේ මේ ආණ්ඩුවද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවශ්‍යතා නිසි පරිදි හඳුනා නොගෙන සිදු කළ මිලදී ගැනීම් සඳහා රුපියල් දහතුන්කෝටි තිස්හයලක්ෂ පණස්තුන්දහසයි. ඒ වාගේම, තවත් අමතර ගෙවීම් වශයෙන් තමයි රුපියල් දෙසියතිස්කෝටියක් ගෙවලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. මේකේ තිබෙනවා, අසම්පූර්ණ ව්‍යාපෘති කියලා එකක්. ඒවාට සල්ලි ගෙවලා තිබෙනවා. ඒ වෙනුවෙන් වැඩ කරලා තිබෙනවා. නමුත්, ප්‍රයෝජනයට ගන්න බැරි තත්ත්වයක තමයි ඒවා තිබෙන්නේ. එවැනි ව්‍යාපෘති තිබෙනවා. පොරමැඩැල්ල වැව සඳහා රුපියල් හතළිස්දෙලක්ෂ ගණනක් ගෙවලා තිබෙනවා. පන්වැව සඳහා රුපියල් දහඅටලක්ෂ හැත්තෑපන්දහසයි. ඉඩම් සංවර්ධන අංගණය සඳහා රුපියල් තිස්නවලක්ෂ දහහත්දහසයි.

ආරක්ෂක වැට සඳහා රුපියල් දහඅටලක්ෂ දහඅටදාහයි. විදුලි මීටර් පෙට්ටි සඳහා රුපියල් එකොළොස් ලක්ෂ තිස්පන්දාහයි. විවේකාගාරයට රුපියල් පන්ලක්ෂ ගණනක්. සුරාබදු කාර්යාලයට රුපියල් දෙලක්ෂ ගණනක්. විදුලි උත්පාදන ව්‍යාපෘති සඳහා රුපියල් විසිලක්ෂයක්. කර්මාන්තශාලා කේන්ද්‍රීය ව්‍යාපෘතිය සඳහා රුපියල් දොළොස් කෝටි අසූලක්ෂයක්. ඒ වාගේම තමයි ජෛව පොහොර ව්‍යාපෘතියත්. ඒක තමයි ලොකුම එක. මේ තිබෙන්නේ, ගේම් ගහපුවා. ඒකට යොදවා තිබෙනවා, රුපියල් එකසියහතළිස්හය කෝටි හතළිස්තුන්ලක්ෂ හැටනවදහස් දෙසියහතළිස්හයක්. කිසිම ප්‍රයෝජනයක් නැතුව තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම ව්‍යාවසාය සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය කියලා, රුපියල් හත්කෝටි දහතුන්ලක්ෂ ගණනක් තිබෙනවා. මෙන්න මෙහෙම තමයි පැල්වත්ත-සෙවණගල ලංකා සීනි සමාගම වැට්ටුවේ.

ඊළඟට බලන්න, අලි වැටට තම-තමන්ගේ විට් කැලි දීලා ගත් සේවකයෝ කොච්චර ප්‍රමාණයක් ඉන්නවාද? අලි වැටට විතරක් 520ක්. ඒ සඳහා වර්ෂයකට වියදම රුපියල් මිලියන පන්සිය ගණනක්. මේවා කරලා දැන් 2,000කට අධික අතිරික්ත සේවකයෝ ඉන්නවා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, HR එකේ සේවකයන් හාරසිය ගණනක් ඉන්නවා. Field එකේ වැඩ කරන සේවකයෝ ඉන්නේ හාරසිය ගණනයි. මුදල් අංශයේ 139දෙනෙක් ඉන්නවා. මේ විධියට තනතුරු දීලා, උසස්වීම් දීලා මේ හැම දේම කරලා පැල්වත්ත-සෙවනගල සීනි සමාගම වට්ටලා දැන් අපට කියනවා, ඒක අපියි වැට්ටුවේ කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කාලය අවසන්.

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

අපි ගත් තීරණ ටිකක් තිබෙනවා. අපි තීන්දුවක් ගත්තා, මේ ආයතනය ගොඩනහන්න. ලංකා සීනි සමාගමට වසර දෙකක් යනකල් කිසි සේවකයෙක් බඳවා ගන්නේ නැහැ කියලා අපි තීරණයක් ගත්තා. අමාත්‍යවරයා පත් වෙලා මාස අටයි. එක සේවකයෙක් දැම්මේ නැහැ. ඉල්ලා අස්වුණු තනතුරු තුනකට තුන් දෙනෙක් ආවා. ඒ, සභාපතිතුමා ඇතුළු ඒ කට්ටිය. එහෙම නැතුව කවුරුවත් ගත්තේ නැහැ. ඒ විතරක් නොවෙයි. අපි මේ ආයතනය වහන්නේ නැහැ කියලා තීන්දු කළා. මේ ආයතනය පවත්වාගෙන යන්න ඕනෑ කියලා තීන්දු කළා. මේ හැම තීන්දුවක්ම ගත්තේ ඒ ආයතනය වෙනුවෙන්.

අපි පිට රටින් සීනි ගෙන්වනවාය කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සීනි ගෙන්වන්නේ නැහැ. අපේ අමාත්‍යාංශය යටතේ ලයිසන් එක තිබෙනවා. දුඹුරු සීනි ගෙනෙන්න අවස්ථාව දීලා නැහැ. මාස ගණනාවකින් ගෙනැල්ලා නැහැ. තව ගොඩාක් දේවල් කියන්න තිබෙනවා. මේක ඇතුළේ තිබෙන හොරකම්, වංචා, දූෂණ ගැන කථා කරනවා නම් දවස් දෙකක් විවාද කරන්න පුළුවන්.

ඒ වාගේම ඇතිමලේ ගැන මෙතුමා කිව්ව නිසාම මේ කාරණය මම කියන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, ඒක අහන්න ඕනෑ ඔබතුමාගේ ඥාති සහෝදරයාගෙන්. අහන්න ඕනෑ නැද්ද?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
කියන්න.

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)
ඒක තමයි මම මේ අහන්නේ. ඇතිමලේ වැට්ටුවේ කොහොමද කියලා, ආපහු ලාභ ලබන්න බැරි තැනට ගෙනාවේ කොහොමද කියලා ඒ ඉන්න සේවකයෝ දවස ගණනේ අපට කථා කරලා කිව්වා. ඇතිමලේත් වැට්ටුවා. මේවාත් වැට්ටුවා. ඔක්කෝම වට්ටලා ලංකා සීනි සමාගම ජාතික ජන බලවේගය ආණ්ඩුවෙන් වැට්ටුවාය කියන කට්ටියට අපි කියනවා, මේ ආණ්ඩුව ඒ ආයතනය වට්ටන්නේ නැහැ, වට්ටන්න දෙන්නේත් නැහැ, අපි උපරිමප වශයෙන් මහන්සි වෙලා මේ ආයතනය අනෙකුත් ලාභ ලබන ආයතන මට්ටමට පත් කරලා සේවකයන්ගේ රැකියා සුරක්ෂිත කරනවා කියලා. විශේෂයෙන්ම ගොවීන් තමයි මූලික. ඒ සියල්ල ආරක්ෂා කරනවා කියන සහතිකය අපි ලබා දෙනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු හතක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.33]

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා විසින් ගෙනාපු සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව සම්බන්ධයෙන් කරුණු කිහිපයක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. මෙම යෝජනාවෙන් පැල්වත්ත සහ සෙවණගල ලංකා සීනි සමාගමට අයත් කර්මාන්තශාලා පිළිබඳව ප්‍රශ්නයක් මතු කළත්, ඒකට යාබදව, අපගේ වසන්ත පියතිස්ස මැතිතුමා අම්පාර දිස්ත්‍රික්කයේ Galoya Plantations (Pvt.) Limited කියන සමාගමට අයිති, කලින් හිඟුරාන කර්මාන්තශාලාව පිළිබඳව කරුණු කිහිපයක් කිව්වා. ඒ පිළිබඳව යම් කරුණු කිහිපයක් එකතු කරන්න මා අදහස් කරනවා. අද උදේ අපි අමාත්‍යතුමන් එතුමාගේ කාර්යාලයේදී හම්බ වුණා. වසන්ත පියතිස්ස මැතිතුමාත් ඒකට එකතු වුණා. උක්ගොවි සංවිධානවල නියෝජිතයන් කිහිප දෙනෙක් පැමිණියා. ඒ අයගේ අඳෝනාවට ඇමතිතුමා හොඳටම ඇහුම්කන් දුන්නා. මම එතුමාට ස්තුවන්ත වෙනවා, ලබන 31වැනි දා පැවැත්වීමට නියමිත දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඇවිල්ලා ඒ උක් ගොවීන්ගේ අඳෝනාවට පිළියම් යෙදීමට එතුමා පෞද්ගලික සහභාගි වීම පිළිබඳව. එතුමා එක්ක ඉන්න අනිල් ජයන්ත අපේ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙනුත් මම ඉල්ලීමක් කරනවා. මේ ප්‍රශ්නයට භාණ්ඩාගාරයත් හවුල්. භාණ්ඩාගාරයේ නිලධාරියෙක් එතුමාගේ ඉල්ලීම මත කරුණාකරලා සම්බන්ධීකරණ කමිටුවට යවන්න. ගොවීන්ගේ අඳෝනාව පිළිබඳව, ගොවීන්ගේ ප්‍රශ්න පිළිබඳව, භාණ්ඩාගාරයට අයත් කොටස් පිළිබඳව කිසිම නිරීක්ෂණයකින් තොරව මේ වෙනකල් මර නින්දේ හිටපු භාණ්ඩාගාර නිලධාරින් පිළිබඳවත් අපි කථා කරන්න ඕනෑ.

මොකද, තමන්ට ලැබිය යුතු ලාභාංශය පිළිබඳව කිසිම තැකීමක් නැහැ. මෙච්චර කල් අපි මේ පිළිබඳව කථා කරනවා. දැන් වසර ගණනක් තිස්සේ මම මේ සභාවේ මේ පිළිබඳව කරුණු කියනවා. නමුත්, භාණ්ඩාගාරය තමන්ට ලැබිය යුතු ලාභාංශය පිළිබඳවවත් කිසිම කටයුත්තක් කරලා නැහැ. විශාල ලාභයක් ලැබෙන කර්මාන්තශාලාවක් බවට මේක පරිවර්තනය කරන්න උත්සාහ කළත්, මෙතැන වෙන කූට උපක්‍රම තිබෙනවා. ඊට උඩින් තමයි අපේ වසන්ත පියතිස්ස මැතිතුමා කියපු අනෙක් කාරණාව තිබෙන්නේ. මැර කණ්ඩායම් යොදාගෙන, මේ ගොවීන් මර්දනය කරමින්, ගොවීන්ගේ වගාවට ගිනි තියමින් කරගෙන යන වැඩ පිළිවෙළ පස්සේත් වෙනත් උපක්‍රමයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මම අද උදේ ගරු ඇමතිතුමාවත් දැනුවත් කළා. වක්‍රාකාරව, ව්‍යංගයෙන් ලංකා සීනි සමාගමට අයත් කර්මාන්තශාලා තමන් සතු කරගන්න යම් උත්සාහයක් තිබෙනවා ද, ඒකාධිකාරයක් ගොඩ නඟලා එතුළින් මේ එතනෝල් ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම control කරන්න, සීනි කර්මාන්තශාලා තමන්ගේ ග්‍රහණයට යටත් කරගන්න වුවමනාවක් තිබෙනවා ද කියන එකත් අපි සොයා බලන්න ඕනෑ. මොකද, මේකේ විගණන වාර්තාව දෙස බැලුවාම, විගණන වාර්තාවේත් නොයෙකුත් දේවල් කියා තිබෙනවා. විගණකාධිපතිතුමා මේ පිළිබඳව විශේෂ වාර්තාවක් ඉදිරිපත් කළා. ඒ වාර්තාවේ කොටස් මා ළඟ තිබෙනවා. ඒකේ නොයෙකුත් කරුණු සඳහන් කර තිබෙනවා. එහි එක් තැනක සඳහන් වෙනවා, "තවද, රාජ්‍ය සමාගමක් වන මෙම සමාගමට අදාළව ප්‍රමාණාත්මක ඍජු අධීක්ෂණයක් මහා භාණ්ඩාගාරයෙන් සිදු නොවීම මෙන්ම කොටස් හිමි ගිවිසුමට අනුව රජයට කිසිදු ලාභාංශයක් ලැබී නොමැති බව නිරීක්ෂණය වූ අතර, මෙම වාතාවරණය තුළ 2020 මාර්තු 31 වන විට සමාගමේ වත්කම් ඉක්මවූ වගකීම් වටිනාකම රුපියල් මිලියන 7,521ක් වී තිබුණි. තවද, කොටස්කරුවන්ගේ ගිවිසුමට එළැඹෙන විට එම ගිවිසුමට ඇතුළත් කරන ලද යම් යම් කොන්දේසි ඉටු කිරීමට දෙපාර්ශ්වයම අසමත් වී තිබුණු අතර, GOPL සමාගෙමහි කළමනාකරණ කටයුතු ඉටු කිරීම සමාගම ගල්ඔය හෝල්ඩින්ග් සමාගම වෙත පවරා දී තිබුණ ද, ඒ තුළින් අපේක්ෂා කරන ලද අරමුණු ඉටු වී නොමැති බව GOPL සමාගෙමහි දිගින් දිගටම පවතින මෙහෙයුම් අකාර්යක්ෂමතාව තුළින් නිරීක්ෂණය විය" යනුවෙන්.

ඉතින්, මේ වාගේ දේවල් පිළිබඳව භාණ්ඩාගාරය මර නින්දේ ඉන්න එක පිළිබඳවත් අපට මහා ප්‍රශ්නයක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි, පොලිස් නිලධාරිනුත් ඉන්නවා. ඒ පොලීසියේ උදවියත් යොදාගෙන, -වසන්ත පියතිස්ස මැතිතුමා මේ ගැන දන්නවා- උද්ඝෝෂණය කරන ගොවීන් මර්දනය කිරීම, නඩු පැවරීම ආදී කටයුතු කරනවා. මම ඇමතිතුමාට පෙන්නුවා. සමාගම වුවමනාවෙන්ම මේ උද්ඝෝෂණය කරපු ගොවි නායකයන්ට විරුද්ධව නඩු පවරා තිබෙන බව. විශාල අලාභයක් එතුමන්ලාගෙන් ගන්න බලාපොරොත්තු වෙනවා. නඩු රාශියක් තිබෙනවා. මේ මර්දනකාරී කටයුතුවල යෙදෙමින් රජය සතු සමාගම් තමන් සතු කර ගන්නද මේ වක්‍රාකාරව උත්සාහ කරන්නේ?

ඒ විතරක් නොවෙයි, මේ කර්මාන්තශාලාවලට අලුතින් ආම්පන්න ගෙනැවිත් ඒවා වැඩිදියුණු කිරීමට උත්සාහයක් තිබෙනවා. ඒ තුළින් මා හිතනවා මේ සමාගමට නුදුරේ එතනෝල් හරහා විදුලිය උත්පාදනය කරන්නත් පුළුවන්කම ලැබෙයි කියලා. අතිරික්ත එතනෝල් හරහා විදුලිය උත්පාදනය කිරීමටත් අවස්ථාව ලැබෙනවා. මෙගාවොට් 6ක්, 7ක් වැනි විශාල ප්‍රමාණයක විදුලිය උත්පාදනය කිරීමේ හැකියාවකුත් මේ තුළ තිබෙනවා කියන එකත් අපි දන්නවා. ඒ විතරක් නොවෙයි, bottling plant එකකටත් දැන් ඒගොල්ලන් ලයිසන් එක අරන් තිබෙනවා. ඒ bottling plant එකට ලයිසන් එක ගැනීම තුළ, backward integration තුළින් තමන්ට ලාභය වැඩි කර ගන්නත්, ඒ වාගේම මත්පැන් නිෂ්පාදනය කිරීමේ වැඩ පිළිවෙළට පිවිසෙන්නත් උත්සාහයක් තිබෙන බව අපට පෙනී යනවා. ඒක හොඳයි. ව්‍යාපාරික ලෝකයේ ඒවා කරන්න උත්සාහයක් තිබෙනවා නම් අපි ඒවා අගය කරනවා. නමුත්, ගොවීන්ට ලැබිය යුතු මිල හරියාකාරයෙන් ලැබෙන්නට ඕනෑ. ගොවීන් මර්දනය කරමින්, ගොවීන්ව මට්ටු කරමින් කරගෙන යන මේ ව්‍යාපාරය නිසා විශාල ආන්දෝලනාත්මක දේශපාලන තත්ත්වයක් උදා වෙනවා කියන එකත් මතක තියා ගන්න ඕනෑ. මම ඇමතිතුමාටත් මතක් කළා, විශේෂයෙන්ම ගල්මඩුව, දීඝවාපිය, වරිපතන්චේන කියන මේ ප්‍රදේශවල නොයෙකුත් කලාපවල ඉන්න ගොවීන් අද විශාල ප්‍රශ්නයක ඉන්නේ කියන එක. ඒගොල්ලන්ට ණය පටවලා, බලහත්කාරයෙන් ණය දීලා තිබෙනවා. රක්ෂණය පවා; තමන්ම ගිහිල්ලා ගිනි තියලා ඊට පස්සේ රක්ෂණයේ ප්‍රතිලාභය ආවාම ඒකත් සමාගමට අරගෙන කටයුතු කරන ආයතනයක් බවට තමයි මේ ගල්ඔය සමාගම දැන් පත්වෙලා තිබෙන්නේ.

ඉතින් මේ කාරණා පිළිබඳව හොයා බලලා කරුණාකරලා මෙවාට හරි තීන්දුවක් ලබා දෙන්න. අපි දන්නවා මේ කියන ප්‍රශ්නය ගැන. දුඹුරු සීනි market කරන්න ප්‍රශ්නයක් තිබෙනවා තමයි. නමුත්, ඒ පිළිබඳව යම් කටයුත්තක් කරන්න අමාත්‍යතුමා සූදානම් වෙනවා. ඒ එක්කම එතනෝල් සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය විසඳන්න, විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කරන සමාගම් සහ එතනෝල් මිල පිළිබඳව ඇති වෙලා තිබෙන තත්ත්වය පාලනය කරන්න අපට යම් ප්‍රවේශයක් ගන්න පුළුවන්. ඒ ප්‍රවේශය පිළිබඳව ගරු ඇමතිතුමාට යම් දැනුමක් තිබෙනවා. ඒ පිළිබඳව සම්බන්ධීකරණ කමිටුවේදී තීරණයක් අරගෙන ගොවීන්ගේ ප්‍රශ්නයට වහාම පිළිතුරක් ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින්, මගේ කථාව සමාප්ත කරනවා. බොහොම ස්තුතියි.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, දූෂණ ගැන. මම වගකීමෙන් කියනවා, ඒ කියපු ඒවා යහපාලන ආණ්ඩුව හෝ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ සිද්ධ වෙච්ච දූෂණ නොවන බව. තමුන්නාන්සේලා ආවේ හොරු අල්ලන්න. කරුණාකරලා ඒ හොරු ටික අල්ලන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පිළිතුරු කථාව, ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.41]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා, මේ කාලීන ප්‍රශ්නය පාර්ලිමේන්තුවේ අවධානයට ලක් කිරීම ගැන. මීට කලින් වතාවකත් මම මේ ගැන කථා කරලා තිබෙනවා. අපේ ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාත් කියපු විධියට අප ආණ්ඩුව භාර ගත්තාට පසුව Lanka Sugar Company (Pvt.) Limited එක විධියට අපට ලැබුණේ, පාඩු ලබන, මහා වැය බරක් තිබෙන, රුපියල් බිලියන තුනක විතර වත්කම් සහිත, පාඩුවට පවත්වාගෙන යන ආයතනයක්. ඒ විතරක් නොවෙයි. අපි එම ආයතන භාර ගන්න කොට තිබුණා, එතනෝල් ලීටර මිලියන 5.5ක්; ලීටර් ලක්ෂ 55ක් තිබුණා. විකුණා ගන්න බැරි සීනි මෙට්‍රික් ටොන් 33,000ක් තිබුණා. එහෙම ආයතනයක් අපට භාරගන්න වුණේ. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමා අර්ථ ගන්වන්න උත්සාහ කළා, අපි ඇවිල්ලා VAT එක ගැහුවා කියලා; VAT පනවපු නිසා තමයි සීනි මිල මෙහෙම වැඩි වුණේ කියලා. නැහැ. VAT එක ගැහුවේ, ඔබතුමාගේ කලින් නායකයා, රනිල් වික්‍රමසිංහ මහත්මයා ජනාධිපති හැටියට ඉන්න කොට, 2024 ජනවාරි 01වැනි දා. *[බාධා කිරීමක්]* 2024 ජනවාරි 01 වැනි දා.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
IMF එකත් එක්ක-

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
එතනෝල් ගෙනෙන එක නැවැත්වුයේ 2020 ජනවාරි 01වැනි දා, ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා. එතනෝල් මෙරටට ගෙනෙන එක -ආනයනය කිරීම- නැවැත්වූවාට පස්සේ ලංකාවේ හදන එතනෝල්වලට ඉල්ලුමක් ආවා. ඒ ඉල්ලුම නිසා ගොවින්ට ගෙවීම් කරන්න පුළුවන් වුණා. ඒ ආයතනවලට ආදායම ලැබෙන්නේ සීනිවලින්ම නොවෙයි, එතනෝල් නිෂ්පාදනයෙන්. සීනි නිෂ්පාදනයේදී අතුරු ඵලයක් හැටියට ලැබෙන මොලෑසස්වලින් හදන එතනෝල්වලින්; ඒ කියන්නේ උක්වලින් සීනි නිෂ්පාදනයේදී හදන එතනෝල්වලින්. ඒ නිසා රුපියල් 3,000ට තිබිච්ච උක් හොණ්ඩරය රුපියල් 5,500 කළා; 7,850 කළා; ඊට පස්සේ 10,000 කළා. එතකොට අපට හම්බ වෙනකොට උක් හොණ්ඩරයට අපි ගෙව්වා, රුපියල් 10,000ක්.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ටොන් එකට?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔව්, ටොන් එකට. සාමාන්‍යයෙන් හොණ්ඩරය කියලා නේ ඒ මිනිස්සු කියන්නේ. ටොන් එකට ගෙව්වා, රුපියල් 10,000ක්. අපට ඒක අඩු කරන්නත් බැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් කියපු ආකාරයට ඒ වෙනකොට එතනෝල් මිල බැහැලා තිබුණා, ලීටරය රුපියල් 475ට. ඒ මිල බහින්න හේතුව වුණේ, බඩඉරිඟු ආදිය එතනෝල් සඳහා පාවිච්චි කරපු නිසා. ඒ තීරණ ගත්තේත් මේ ජාතික ජන බලවේග ආණ්ඩුව නොවෙයි; ඔබතුමන්ලාත් විවිධ ආකාරයෙන් දායක වෙච්ච රාජපක්ෂ, වික්‍රමසිංහ ආණ්ඩුවලින්. ඊට පස්සේ- *[බාධා කිරීමක්]*

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
අපි නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හරි, හරි. වෙච්ච දේ මම මේ කියන්නේ. ඔබතුමා කියපු දේට වැඩිමනත් දේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා නේ, සීනි කර්මාන්තායතනවලින් රාජ්‍ය ආයතන දෙකයි; ගල්ඔය කර්මාන්තායතනය පෞද්ගලිකයි කියලා. ඒ ඔබතුමාගේ ඔළුවේ තිබෙන එක. රාජ්‍ය ආයතනයක කොටසක් තමයි ගල්ඔය සීනි කර්මාන්තායතනය කියන්නේ. සියයට 51ක් රජයේ අයිතිය තිබෙනවා. හැබැයි ඒගොල්ලන් වැඩ කරන්නේ, සියයට 100ක් පෞද්ගලික වාගේ.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
Management එක.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
Management එක. එහෙම ගිවිසුමක් ගහලා තිබෙනවා, පසුගිය ආණ්ඩු කාලයේ. ඒත් අපේ ආණ්ඩුවෙන් නොවෙයි. දැන් ඒවා නිවැරදි කරගෙන යන්නේ. එහෙම තත්ත්වයක් තිබුණු ආයතනයක් අප භාර ගත්තේ. එහෙම ආයතනයක් අපි ක්‍රමානුකූලව හදන්න හදනකොට රවුෆ් හකීම් මන්ත්‍රීතුමා කියපු ක්‍රම, ඒක අඩාළ කිරීමේ, විනාශ කිරීමේ ක්‍රම තමයි පාවිච්චි වෙන්නේ. එවැනි ක්‍රම පාවිච්චි වෙනවා. විවිධ දේවල් කරන්න

උත්සාහ කළා. අපි ඒවාට අහුවුණේ නැහැ. අපි අහු වුණේ නැති නිසා තමයි, කලින් කථා කළ මන්ත්‍රීතුමාත් කිව්වා වාගේ, ඒ ගොවීන්ට ගෙවීම් කරලා නැහැ කියලා කියන්නේ. දැන් ගොවීන්ට ගෙවීම් කරලා නැහැ කියනවා. අපි මේ වෙනකොට කැපුම් ගාස්තු ඔක්කෝම ගෙවලා තිබෙනවා; ප්‍රවාහන ගාස්තු ඔක්කෝම ගෙවලා තිබෙනවා.

ගෙවන්න තිබුණු හිඟ ගාස්තු ඔක්කොම දැන් ගෙවලා තිබෙනවා. තව ගෙවන්න තිබෙනවා, අවසාන ගෙවුම් ගාස්තු. අපි පසුගිය දවස්වල මිලියන 460ක ගෙවීම් කළා, අපේ උක් සීනි විකුණලා ලැබුණු ආදායමෙන්. ඊයේ කැබිනට් මණ්ඩලයේ රැස්වීම පැවැත්වුණා; ගරු ජනාධිපතිතුමා මේ ප්‍රශ්නය දැකලා මැදිහත් වුණා. භාණ්ඩාගාරය අපට රුපියල් මිලියන 1,000ක් වෙන් කරලා තිබෙනවා. ජනාධිපතිතුමා පෞද්ගලිකව මැදිහත් වෙලා, අපේ නියෝජ්‍ය ඇමතිතුමා මැදිහත් වෙලා, අපට දැන් රුපියල් බිලියනයක් වෙන් කර තිබෙනවා. ඒ රුපියල් බිලියනය වෙන් කළාට පස්සේ විපක්ෂය දැන් හදිසියේ මතයක් හදනවා, අප හදන එතනෝල්වල යූරියා තිබෙනවා කියලා. දැන් යූටියුබ් නාළිකාවල ඒ මතය යනවා. ඊළඟට, ඒ සමාන්තරවම දැන් තව මතයක් හදනවා, ආණ්ඩුව පිට රටින් එතනෝල් ගෙන්වන්න හදනවා කියලා. ඒ මොකටද ඒ මතය හදන්නේ? එක පැත්තකින්, එතනෝල්වල යූරියා තිබෙනවා කියනවා. තව පැත්තකින්, පිට රටින් එතනෝල් ගෙනෙන්න හදනවා කියනවා. එහෙම කියන්න හේතුව මොකක්ද දන්නවාද? මෙතුමන්ලා බලාපොරොත්තු වුණා, අපි තුට්ටු දෙකට එතනෝල් දෙයි කියලා. මේ පාර්ලිමේන්තුවේ මම කිව්වා, මීට පස්සේ අපි ගල්ඔය, ඇතිමලේ, සෙවනගල, පැල්වත්ත කර්මාන්තශාලා තුනෙන්ම එතනෝල් ලීටරයක් දෙන්නේ රුපියල් 800ට කියලා. රුපියල් 800ට වඩා අඩු කරන්නේ නැහැ, ඒවා විසි කළත්. අන්න ඒ තීරණය ගත්තාට පස්සේ තමයි, ලංකාවට එතනෝල් පිට රටින් ගෙනෙන්න හදනවා කියන්නේ, එතනෝල්වල යූරියා තිබෙනවා කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ළඟ තිබෙනවා, සුරාබදු කොමසාරිස් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයක්. මෙය සියලු සුරාබදු නිලධාරින්ට දීලා තිබෙන චක්‍රලේඛයක්. ඒ වාගේම, අපේ ආයතන රස පරීක්ෂක වාර්තා දෛනිකව ගන්නවා. එම වාර්තා කිහිපයකුත් දැන් මා ළඟ තිබෙනවා. මා ඉන් එකක් හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා ඉදිරිපත් කරනවා. ඉහත කී ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද අංක 04/2022 දරන චක්‍රලේඛයත්, එකී රස පරීක්ෂක වාර්තාවත් මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

ඒවායේ කොහේවත් නැහැ, යූරියා තිබෙන බවක්. එහෙම නම්, එවැනි මත හදන්නේ ඇයි? ඒක කඩාකප්පල් කරන්න, ඒක වට්ටන්න. අපට ඊයේ පෙරේදා ආපු order එකක් නැවතුණා. මොකද, ආණ්ඩුව පිට රටින් එතනෝල් ගෙනෙන්න හදනවා, ඒක හින්දා ඔයගොල්ලන් ගන්න එපා කියපු නිසා. අපි විපක්ෂයේ ඔබතුමන්ලාට එක දෙයක් කියනවා. හීන හිතේ තියාගත්තාට කමක් නැහැ, හැබැයි ඒවා යථාර්ථයක් වෙන්නේ නැහැ. ඒ ආයතන විකුණන්නේත් නැහැ, වහන්නේත් නැහැ, එතනෝල් අඩුවට දෙන්නේත් නැහැ. මීට පස්සේ සීනි 200 plus VAT අඩු කරන්නේත් නැහැ. ඒවා වෙනස් වෙන්නේ නැහැ; ඒවා වෙනස් වෙන්නේම නැහැ! මේ ආයතන ඔක්කොම එකට වැඩ කරන්න ඕනෑ කියලා අපි තීරණය කළා. අපි දැන් එහෙම වැඩ කරනවා.

දැන් ඔබතුමන්ලා කිව්වා නේ, ගොවීන් උද්ඝෝෂණ කරනවා කියලා. මම එක උද්ඝෝෂකයෙකු ගැන කියන්නම්. ඒ ආයතනයේ මරු මිනිස්සු ඉන්නවා. එක්කෙනෙක් ඉන්නවා, "සමීර" කියලා. එයා ඊයේ උද්ඝෝෂණයක් කළා. ඒ උද්ඝෝෂණයට බුත්තලට ගෙනිච්චේ සෙනග විධියට හිටියේ 222යි. ඒ අය අතරින් 22ක් එක කාඩ්බෝඩ් පක්ෂයක කට්ටිය. 22යි එතැන හිටියේ. ඒ කියපු 200 ඇතුළේ හිටියා, සමීරගේ කට්ටිය. මොකද, සමීර අපේ අලි වැටේ කම්කරුවෙක්. ගරු මන්ත්‍රීතුමනි, මේ කියන අලි වැටේ කම්කරුවාට වාහන 52ක් තිබෙනවා; ලොරි 52ක් තිබෙනවා. එයා යටතේ සේවකයන් 300ක් වැඩ කරනවා. අපේ ඒ අලි වැටේ කම්කරුවාගේ සේවකයන් ඉන්නවා, 300ක්. එයාට අපි ගෙවන්න තිබෙනවා, රුපියල් 9,813,793ක්. එයාට අපි මේ ටිකේම මුදල් ගෙවලාත් තිබෙනවා. 2025.02.23 දින අපි රුපියල් 907,000ක් ගෙව්වා, ඊට පස්සේ තව රුපියල් 387,000ක් ගෙව්වා, තව රුපියල් 553,000ක් ගෙව්වා, රුපියල් 387,000ක් ගෙව්වා. මේ කියන්නේ, අපේ අලි වැටේ කම්කරුවා ගැන. අලි වැටේ සේවකයා පැල්වත්තේ ඒ වැඩවලට ලොරි 52ක් දාලා තිබෙනවා. එයා යටතේ සේවය කරනවා, 300ක්. හැබැයි, එයා යටතේ වැඩ කරන 300වත් එයාට උද්ඝෝෂණයට ගෙනෙන්න බැරි වුණා. ඔය කිව්වේ, එක් කෙනෙක් ගැන. මේ, අපේ අඟේ ඉඳන් කන කන කට්ටිය. මම කිව්වා නේ, ඉස්සෙල්ලා එක්කෙනෙකු අයින් කළා කියලා. තව කට්ටිය ඒකේ ඉන්නවා. ඒගොල්ලන් ඒ ආයතනයෙන් පඩිත් ගන්නවා; ගොවීන් හැටියටත් ඉන්නවා. හැබැයි, ඒ ඉන්න ගමන් එය වට්ටන්න උද්ඝෝෂණත් කරනවා. එහෙම කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ.

ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා, මම ඔබතුමාට දෙයක් කියන්නම්. මම ඒකේ A to Z දන්නවා. මම අද මෙය මේ පාර්ලිමේන්තුවේ ඉඳන් කියන්නේ. මම ඒකේ A to Z දන්නවා. ඒක වට්ටන්න දෙන්නේ නැහැ. මම සහතිකයක් දෙනවා, මේ ආණ්ඩුව තිබෙනකල්, ගරු ජනාධිපතිතුමා ජනාධිපතිවරයා හැටියට වැඩ කරනකල් කවුරු හීන දැක්කත් Lanka Sugar Company (Pvt.) Limited එකවත්, සීනි කර්මාන්තයවත් වැටෙන්න දෙන්නේ නැත. ඒකයි ඇත්ත කථාව. විශේෂයෙන්ම මේ පීඩාව දරාගෙන අපේ ඉල්ලීමට ඇහුම්කන් දීලා, පාරට බහින්නේ නැතිව, මේ ප්‍රශ්නය හරියට තේරුම් ගත්තු මේ රටේ ගොවීන්ට, වැඩ කරන සේවකයන් සියලුදෙනාට, අපේ කාර්ය මණ්ඩලයට, විශේෂයෙන් විධායක ශ්‍රේණියේ වැඩ කරන අයට, සභාපතිතුමිය, ප්‍රධාන විධායක අධ්‍යක්ෂතුමිය ඇතුළු හැමදෙනාට අපි ස්තුතිවන්ත වෙනවා. එතුමියලාට නින්දා, අපහාස කළා.

මේ ගැනු දෙන්නෙක් මොනවාද කරන්නේ කියලා හෙව්වා. ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමා විශ්වාස කරන්න. අද යූටියුබ් එකේ බලන්න, සල්ලිවලට කොච්චර කියවනවාද කියලා. ඇතිමලේ ප්‍රධාන විධායක අධ්‍යක්ෂක කපිල මහත්මයාගේ නෝනා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වැඩ කරනවා කියලා කිසිම සම්බන්ධයක් නැතුව මේ කාරණාවට හේත්තු කළා. ඒ හේත්තු කරලා කරන්න හැදුවේ මොකක්ද? අපේ ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මේ ඔක්කොම එකට ගන්නයි හදන්නේ. ඒක හරි ලේසියි. අපි හෙට කියනවා නම්, දයා ගමගේට දුන්නා වාගේ, වීරබාහුලාට දුන්නා වාගේ, "මෙන්න එන්න ඔක්කොම ටික දෙන්නම්, බන්දේසියේ තියලා දෙන්නම්" කියනවා නම් මේ මොකුත් ප්‍රශ්න නැහැ. එතකොට අපේ එතනෝල්වල යූරියාත් නැහැ. එතකොට ඒවා විකුණා ගන්න බැරිත් නැහැ. ඒ මොකුත් ප්‍රශ්න නැහැ. මට එක්කෙනෙක් ඇවිල්ලා offer එකක් දුන්නා. ඒ මොකක්ද දන්නවාද? සංස්ථා නමයි, රාජ්‍ය ලාංඡනයයි ගහන්න දෙනවා නම් රුපියල් 800 මිලටම ඔක්කොම එතනෝල් ටික ගන්නවා කිව්වා. එහෙමයි කියන්නේ.

ඉස්සර ගල්ඔය ගල් අරක්කු කියලා තිබුණා නේ. සංස්ථා අරක්කු තිබුණා නේ. මෙගොල්ලන්ට වටින්නේ එහෙමයි. මම

** පුස්තකාලයේ තබා ඇත.*
* நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

එයාට මතක් කරලා දුන්නා, ඔබතුමන්ලා තවක්කාල් ගනුදෙනුව කරලා සිමෙන්ති කොම්පැනිය විකුණන කොට ඒ කාලයේ "සංස්ථා සිමෙන්ති" කියන නමත් එක්ක විකුණපු හැටි. ඒ වාගේම තමයි දැන් මේගොල්ලෝත් කරන්න හදන්නේ. අපි සංස්ථා නමයි, රාජ්‍ය ලාංඡනයයි දෙනවා නම්, එතකොට මේ එතනෝල්වල ප්‍රශ්නයක් නැහැ. එතකොට ඒවායේ යූරියා තිබුණත් එකයි, නැතත් එකයි ගන්නම් කියනවා. එහෙමයි මේගොල්ලෝ කථා කරන්නේ. ඒ නිසා මම ආයෙත් කියනවා, මේ කර්මාන්තය වැටෙන්න දෙන්නේ නැහැ කියලා. මම ඇත්තටම ස්තුතිවන්ත වෙනවා, කන කර බඩු උකස් තියලා ජීවත් වෙච්ච මිනිස්සුන්ට, වහ කුප්පිය අරගෙන ජීවත් වෙන මිනිස්සුන්ට. මොකද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ උක් වගා කරපු මිනිස්සුන්ට වෙන ජීවිතයක් නැහැ. ඒගොල්ලන්ට වෙන කර්මාන්තයක් නැහැ, වෙන වගාවක් නැහැ. මේ උක් ටික ෆැක්ටරියට දුන්නොත් විතරයි ඒගොල්ලන්ට ජීවත් වෙන්න පුළුවන්, ළමයින් ඉස්කෝලේ යවන්න පුළුවන්. ඒක අපි දන්නවා. ඒක අපි හොඳින්ම තේරුම් ගත්ත මිනිස්සු. මේ මහ පොළොව එක්ක ජීවත් වෙන ජයවර්ධන සහෝදරයාට, වසන්ත පියතිස්ස සහෝදරයාට මේවා තේරෙන්නේ නැද්ද? තේරෙනවා. හැබැයි, මොකද කරන්නේ? අන්න අර කැපුම් ගාස්තු ගෙවන කාලයට, ප්‍රවාහන ගාස්තු ගෙවන කාලයට අපි ටොන් එකට රුපියල් 10,000ක් ගෙව්වාට, ඒ රුපියල් 10,000ම එකවර දෙන්න අපට බැහැ නේ. සීනි ටික විකුණාවාට පස්සේ තමයි අපි ඒ මුදල් දෙන්නේ. හැබැයි, ඒ වනතුරු අපි කැපුම් ගාස්තු දෙන්න ඕනෑ, ප්‍රවාහන ගාස්තු දෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොවියාගේ කැපුම් ගාස්තු දුන්නොත් තමයි, ඊළඟ සැරේ ආයෙත් උක් ටික ගේන්නේ, කම්කරුවාට මුදල් ගෙවන්නේ. ඒ මුදල ගෙවීම හිර වෙන කාලය එනකොට මේගොල්ලෝ මොකද කරන්නේ? මේගොල්ලෝ උද්ඝෝෂණ පටන් ගන්නවා, උසි ගන්වනවා, අවුස්සනවා. අවුස්සලා කියනවා, මෙට්‍රික්ටොන් 20,000ක් මේ ගොඩ ගහලා තිබෙන්නේ, මේ ටික කීයට හරි විකුණපන් කියලා. අපිත් ඉතින් රුපියල් 175ට විතර විකුණුවාම ආයෙත් බැංකුවට ණය වෙන්න සිද්ධ වෙනවා. ආයෙත් ආණ්ඩුවට ණය වෙන්න අපට සිද්ධ වෙනවා. මොකද, තුට්ටු දෙකට සීනි ටික විකුණලා, වත්ත බද්දට දීලා ඇස්සට දත නියවනවා වාගේ අපට බලාගෙන ඉන්න වෙනවා.

ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමා හොඳටම දන්නවා නේ, එක කාලයකට -යල සහ මහ කන්නවලට- තමයි උක් කපන්නේ. ඒ කාලයට කැපුම් ගාස්තු ගෙවන්න සල්ලි නැත්නම් අපි ණය වෙන්න ඕනෑ. අන්න ඒ නිසා අද ජනාධිපතිතුමා සහ මුදල් අමාත්‍යාංශය මේක හොඳින් තේරුම් අරගෙන අපට සහනයක් දීලා තිබෙනවා. අමාරු කාලයෙන් අපි ගොඩ ගත්තා. අද අපට රුපියල් බිලියනයක් දීලා තිබෙනවා. ඒ නිසා අපි ගොවියාටත් සහනයක් දීලා, පාරිභෝගිකයාටත් සහනයක් දීලා, කර්මාන්තයත් ආරක්ෂා කරගෙන, සීනි කර්මාන්තයත් නඟා සිටුවනවා. ඒකට මේ සහනය අපට හොඳටම ඇති. හැබැයි මම කියනවා, මේ සහනය අතරේ රුපියලකින්වත් එතනෝල් මිල අඩු කරන්නේත් නැහැ, පිටරටින් එතනෝල් ගේන්න ආණ්ඩුව කිසිම තීරණයක් ගන්නේත් නැහැ, මොන කුප්‍රකට කුමන්ත්‍රණ කළත් මේ ආයතන වහන්න දෙන්නේත් නැහැ කියලා. සේවකයන්ටත් අපි ඒක කියලා තිබෙන්නේ. අපි සේවකයෝ අයින් කරන්නේත් නැහැ. කවුරු ගත්තත් අපි අයින් කරන්නේ නැහැ. අපි අලුතින් ගන්නේ නැහැ. අවුරුදු දෙකකට අපි එක්කෙනෙක්වත් ගන්නේ නැහැ.

ඒ වාගේම, ඔබතුමා කියපු ආකාරයට ගොවීන්ගේ ඉඩම්වල අයිතිය ගොවීන්ට දෙන්න ඕනෑ. වගා නොකරන කන්නවලදී වී වගා කරන්න අවස්ථාවක් දෙන්න ඕනෑ. ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමනි, එහෙම දෙන්න ඕනෑ. ඔබතුමා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ඒ තීරණ ගන්න. මේ ඒකාධිකාරය කඩන්න නම්, මේ වහල්භාවයෙන් ගොවියා ගලවන්න ඕනෑ. ඒ අය පව්. ඒ සමහරුන්ට ගිහිල්ලා ගහනවා. සමහර ගොවීන්ගේ ඉඩම් ඒ ගොල්ලෝ ගිනි තියනවා. පැමිණිල්ලක් කරන්න ගියාම පොලීසිය පැමිණිල්ල භාර ගන්නේ නැහැ. මේ වාගේ තත්ත්වයක් තිබෙන්නේ. මේ මැර බලය පාවිච්චි කරන්නේ මොනවාටද? thug හමුදාව පාවිච්චි කරන්නේ මොනවාටද? ඒ, මේ ඉඩම්වල අයිතිය ගන්නයි. මේ වෙල්ලස්සේ ගොවි ජනතාවගේ අයිතිය ඒගොල්ලන්ගේ නූතන වහල්භාවයට ගන්නයි ඒක කරන්නේ. ඒක තමයි මේ කරන්න හදන්නේ. නමුත් අපි ඒකට ඉඩ දෙන්නේ නැහැ. මම ආයෙත් කියනවා, මේ ආයතන වහන්නේත් නැහැ, විකුණන්නේත් නැහැ. ඒ වාගේම ලංකාවට එතනෝල් පිටරටින් ගේන්න දෙන්නෙත් නැහැ, අපි ගේන්නෙත් නැහැ, මිල අඩු කරන්නේත් නැහැ කියලා. ඒ වාගේම, අපි හෙට අනිද්දා හොඳ බෙදා හැරීමේ ක්‍රියාවලියක් පටන් ගන්නවා.

මේ මාෆියාව කඩලා සාමාන්‍ය ජනතාවට සීනි ටික දෙන්න පුළුවන් වන විධියට බෙදා හැරීම් ජාලයක් අපි පටන් ගන්නවා. ආණ්ඩුව දැන් ඒ තීරණ අරගෙන තිබෙනවා. මේක හොඳ case study එකක් අපට; මේක හොඳ case study එකක් අපට, ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන්. එතනෝල් බිස්නස් එකේ ඉන්න කට්ටියයි, අරක්කු වෙළඳාමේ ඉන්න කට්ටියයි, මේ ආයතන, ඉඩම්, තුට්ටු දෙකට ගන්න බලාගෙන ඉන්න කට්ටියයි මෙතෙක් කාලයක් පුරුද්දට කරපු දේවල් කරන්න හිතාගෙන ඉන්නවා නම්, ඒකට ජාතික ජන බලවේගයේ ආණ්ඩුව කිසිසේත්ම ඉඩ තියන්නේ නැහැයි කියන සහතිකය දෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමාට නැවත වතාවක් ස්තුතිවන්ත වෙනවා, මේ පිළිබඳව මේ සභාවේ අවධානය යොමු කළාට.

බොහොම ස්තුතියි.

එකල්හි වේලාව අ.භා. 6.00 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.55ට, 2025 ජූලි 23වන බදාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது நேரம் பி.ப. 6.00 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 6.55க்கு, பாராளுமன்றம் 2025 யூலை 23, புதன்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

It being past 6.00 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 6.55 p.m. until 9.30 a.m. on Wednesday, 23rd July, 2025.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන
නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා
හැන්සාඩ් සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து
அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.